Civil Aviation Authority
Sri Lanka

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

# වාර්ෂික වාර්තාව

# 2012

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 15 වන වගන්තිය ප්‍රකාර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

# සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි තේමා ගීතය

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය
කිත් යසසින් සුදිලේ
හෙලි කොටැ හේළි හෙළේ...//

සක්විති රාවණ ආදි යුගෙන්
දඩු මොණරින් ගුවන දිනා
වික්මැති ලක්දන වා-රිය පොළිනුත්
පෑ විදූ නුවණ මනා...//

''උවදුරු තොර බව සඳහා මුල් වෙමු''
වෙයි පෙර වැකිය අපේ...//
''ඉක්මන් අය මග නැගුමෙහි මුල් වෙමු''
මේ වෙයි දැකුම අපේ...//

රට වැසි යුතුකම් ඉටුවන අයුරින්
මව් බිම හා බැඳෙමු...//
සමාජ මෙහෙවර සාර දහම් රැක
වගකීමෙන් පුදමු...//

| | | |
|---|---|---|
| **පද රචනය** | - | අරිසෙන් අහුබුදු ශූරීන් |
| **ගායනය** | - | ආචාර්ය පණ්ඩිත් ඩබ්ලිව්.ඩී. අමරදේව |
| **සංගීතය** | - | ආචාර්ය පණ්ඩිත් ඩබ්ලිව්.ඩී. අමරදේව |

## ගරු සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පණතේ 15 වන වගන්තියෙහි නියමිත අවශ්‍යතාව සම්පූර්ණ කිරීම් වශයෙන් මෙම වාර්ෂික වාර්තාව සම්පාදනය කර ඇති අතර එයින්, 2012 ජනවාරි 01 දිනයෙන් ආරම්භ වී 2012 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වූ වර්ෂය තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ඉටු කරන ලද කාර්යයන් ආවරණය වේ.



**ජෙනරල් රොහාන් ද සිල්වා දළුවත්ත**
සභාපති
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

2013 පෙබරවාරි 28

# පටුන


ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි තේමා ගීතය 3

සංක්ෂිප්ත යෙදුම් 10

නාමාවලිය 13

සභාපතිගේ සමාලෝචනය 15

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්ගේ සමාලෝචනය 17

පැතිකඩ 20

- හැඳින්වීම 20
- ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි සාමාජිකයින් 20
- සභාපති 21
- උප සභාපති 23
- සාමාජිකයින් 24

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි පාලනය සහ වගකීම 28

- අධිකාරියෙහි කාර්ය භාරය 28
- සංවිධාන ව්‍යුහය 28
- අධිකාරියේ කමිටු 28
  - කාර්ය මණ්ඩල කමිටුව 29
  - මූල්‍ය කමිටුව 29
  - සැලසුම් කමිටුව 29
  - විගණන කමිටුව 30
  - සිවිල් ගුවන් සේවා සංවර්ධන සහ අධ්‍යාපන කමිටුව 30
- හවුල් කරුවන් සමග සම්බන්ධතා පැවැත්වීම 30
- අධිකාරියෙහි සහ ජ්‍යෙෂ්ඨ කළමණාකරණයෙහි වගකීම 30
- වගකිවයුතු බව 31
- බැඳියා පිළිගැටුම් 31
- අභ්‍යන්තර විගණනය 31
- ව්‍යවස්ථාමය අවශ්‍යතාවයන්ට අනුකූල වීම 31
- ආචාර ධර්ම 31


පටුන

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය 33
ඉදිරි දැක්ම 33
මෙහෙවර 33
ආදර්ශ පාඨය 33
දර්ශනය 33
අරමුණු 33
උපාය මාර්ග 33
සාරධර්ම 33
සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි ආසන්න ඉලක්ක 34
ප්‍රතිඵල 34
ප්‍රතිදාන 35
නියාමන විෂය ක්ෂේත්‍රය 36

මෙහෙයවීම හා කළමණාකරණය 38
අධිකාරිය සහ එහි කමිටු 38
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 38
CAASL රැස්වීම් 38
ජ්‍යෙෂ්ඨ කළමණාකරණය 38

අනතුරු විමර්ශන ඒකකය 40

අභ්‍යන්තර විගණන අංශය 42

ගගන නාවික සේවා ශාඛාව 43

ගුවන් සේවා සුරක්ෂිතතා අංශය 43
ICAO විශ්ව සුරක්ෂිතතා විගණනය - 2 වටය - ශ්‍රී ලංකා විගණනය 44
ගුවන් සේවා සුරක්ෂිතතා උපදේශකවරුන් පත් කිරීම 44
අතිවිශේෂ AVSEC සෝදිසි වැඩ සටහන ක්‍රියාත්මක කිරීම 44
ජාත්‍යන්තර සංසදයන්හි රාජ්‍ය නියෝජනය 44
AVSEC පිළිබඳ ICAO ඉහළ මට්ටමේ සම්මේලනයේ ශ්‍රී ලංකා නියෝජනය 44
සී/ස එක්ස්පෝ ඒවියේෂන් (පුද්.) සමාගම සම්බන්ධ AVSEC සුරක්ෂිතතා විගණනය 44
සී/ස එක්ස්පෝ ඒවියේෂන් (පුද්.) සමාගම - උපදේශකයින් සහතික කිරීම 45
සුරක්ෂිතතා සෝදිසි කාර්යයන් 45

විශේෂ ව්‍යාපෘති අංශය 45

COSCAP-SA ව්‍යාපෘතියට සහාය 45
ප්‍රදර්ශන 45
ගුවන් සේවා ඉන්ධන මිළ නිරීක්ෂණය 45
ප්‍රකාශන / වාර්තා 46
සිවිල් ගුවන් සේවා සංවර්ධනය සහ අධ්‍යාපන කමිටුව (CADEC) 46


පටුන

| | |
|---|---|
| ගගන යාත්‍රාංගන හා ගුවන් සංතරණ සේවා අංශය | 46 |
| ගුවන් තල කළමනාකරණය | 46 |
| ගගන යාත්‍රාංගන සහතිකය අළුත් කිරීම - BIA | 47 |
| "මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ" ගොඩනැගීම සහ සහතික කිරීම සඳහා නියාමන සහාය | 47 |
| ATC ප්‍රමාණන තක්සේරුව | 47 |
| සෝදිසි කාර්යයන් | 47 |
| ATC සිදුවීම් විමර්ශනය | 47 |
| උස් ගොඩනැගිලි තැනීම සඳහා අවසර දීම් | 47 |
| ඉහළින් පියාසර කිරීමේ සහ ගොඩබෑමේ අවසර | 48 |
| ගගන නාවික තොරතුරු සේවාව | 48 |
| හෙලිකොප්ටර් - ගුවන්ගත කාර්යයන් | 48 |
| පියසර නිරුපද්‍රිතතා ශාඛාව | 49 |
| පුද්ගල බලපත්‍ර අංශය | 49 |
| පියාසර පිරිස් විභාග සේවා | 49 |
| ශ්‍රී ලංකන් ඒයාර් ලයින්ස් (SLAL) වර්ග ප්‍රමාණන පුහුණු සංවිධානය (TRTO) සහතික කිරීම | 49 |
| විදේශ පියාසර පාසලක් පිළිගැනීම (නිව්සීලන්ඩ් ඉන්ටර්නැෂනල් ඒවියේෂන් ඇකඩමි) | 49 |
| පුද්ගල බලපත්‍ර නිකුත් කිරීම ස්වයංකරණය ආරම්භ කිරීම | 49 |
| 5 වන දකුණු ආසියා කලාපීය ආරම්භනය - 66 කොටස (SARI PART 66) | 49 |
| SARI PART 66 රෙගුලාසි | 50 |
| පියසර පාසල් සහ ගුවන් සේවා පුහුණු සංවිධාන සෝදිසිය | 50 |
| ජාත්‍යන්තර පුහුණු පාඨමාලා වලට සහභාගී වීම | 50 |
| ගුවන් සේවා වෛද්‍ය ඒකකය සඳහා කැඳවුම් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම | 51 |
| ගගන නාවික තොරතුරු චක්‍ර ලේඛයක් නිකුත් කිරීම (AIC) | 51 |
| බහු - එන්ජින් පුහුණු වැඩ සටහනක් අනුමත කිරීම | 51 |
| විදේශ ගුවන් නියමුවන් බඳවා ගැනීම | 51 |
| වෛද්‍ය පරීක්ෂණ / වෛද්‍ය මණ්ඩල රැස්වීම් | 51 |
| නම්කරන ලද රෝහල් සමග වූ ගිවිසුම් අළුත් කිරීම | 51 |
| මෙහෙයුම් අංශය | 51 |
| රෙගුලාසි විකාශනය | 51 |
| මග පෙන්වීමේ ලේඛන විකාශනය | 51 |
| කාර්යය මණ්ඩල පුහුණුව | 51 |
| ගුවන් යානා මෙහෙයුම් කරුවන් සහතික කිරීම | 51 |
| සෝදිසි කටයුතු | 52 |
| බලාත්මක කිරීමේ පියවර | 52 |
| සංවිධානමය කරුණු | 53 |
| ගුවන් යෝග්‍යතා අංශය | 53 |
| අඛණ්ඩ ගුවන් යෝග්‍යතාව | 53 |
| ගුවන්යානා නඩත්තු සංවිධාන | 53 |
| තෙවන පාර්ශවයේ නඩත්තු වැඩ | 53 |
| ගුවන් යානා ලියාපදිංචි කිරීම | 53 |

නිරූපද්‍රිතතා අධීක්ෂණය 53
වීසා සඳහා නිර්දේශ 53
නඩත්තු ඉංජිනේරු බලපත්‍ර 53
අමතර කොටස් සඳහා අනුමැතිය දීම 54

ඒකාබද්ධ ශාඛාව 55

ගුවන් ප්‍රවාහන හා නීති කටයුතු අංශය 55
ගුවන් සේවා සංඛ්‍යා ලේඛන 55
ගුවන් ප්‍රවාහන සමාගම් මෙහෙයුම් 55
මගී සහ නැව් බඩු චලන 55
සංක්‍රමණ මගීන් BIA 57
දේශීය ගුවන් සේවාව 57
සංචාරක නියෝජිතවරු 58
ද්වී පාර්ශවීය ගුවන් සේවා සාකච්ඡා 58
ආසන වෙන් කිරීමේ සහ ගාස්තු ගණනය කිරීමේ පාඨමාලාව 58
වාර සමායෝජනය (SLOT) 58
පොදු ගුවන් සේවා සංවර්ධනය 58
පාරිභෝගික පැමිණිලි පිළිබඳව කටයුතු කිරීම 59
ගුවන් ප්‍රවාහන කර්මාන්තයේ හවුල් කරුවන් සමග රැස්වීම්/වාණිජ දෙපාර්තමේන්තුව 59
උපාධි අපේක්ෂකයින්ට සේවාස්ථ පුහුණුව 59

මානව සම්පත් හා කාර්යාල කළමණාකරණ අංශය 59
CAASL හි 10 වසර සංවත්සරය 59
කාර්ය මණ්ඩලය 59
කාර්ය මණ්ඩල සුභසාධනය 61
පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ, වැඩමුළු, රැස්වීම් හා සම්මේලන 61
තාක්ෂණික පුස්තකාලය 61
CAASL වෙබ් අඩවිය 61
CAASL ඒකාබද්ධ සැළැස්ම සහ ක්‍රියාත්මක වැඩසටහන් 61
කාර්යාල නඩත්තුව සම්බන්ධ කාර්යයන් 62
CAASL ස්වයංකරණය 62
CAASL කාර්යය මණ්ඩලය ලබා ගත් නිවාඩු 62

මූල්‍ය කළමණාකරණ අංශය 62
වැඩසටහන් අයවැය 62
CAASL ආදායම 63
කළමනාකරණ තොරතුරු 63
වාහන ඇණි කළමනාකරණය

2012 කාර්ය සාධක දර්ශක
2012 CAASL කාර්ය සාධනය 64
නිරූපද්‍රිතතා හා සුරක්ෂිතතා අධීක්ෂණ හා රාජකාරි සහ කායභීයන් 64
සංවිධාන/ පුද්ගලයින් සඳහා මුල්වර නිකුත් කළ බලපත්‍ර 64


පටුන

| | |
|---|---|
| සහතික කළ සංවිධාන /පුද්ගලයින් පිළිබඳ සෝදිසි කාර්‍යයන් | 64 |
| 2012 අංශ විශේෂිත කාර්‍යයන් | 65 |
| මෙහෙයවීම සහ කළමණාකරණය | 65 |
| ගුවන් සේවා සුරක්ෂිතතා (AVSEC) අංශය | 65 |
| විශේෂ ව්‍යාපෘති (SP) අංශය | 65 |
| ගුවන් සංතරණ සේවා (ANS) අංශය | 65 |
| පුද්ගල බලපත්‍ර (PL) අංශය | 66 |
| මෙහෙයුම් (OPS) අංශය | 67 |
| ගුවන් යෝග්‍යතා (AW) අංශය | 67 |
| ගුවන් ප්‍රවාහන හා නීති කටයුතු (AT&LA) අංශය | 67 |
| මානව සම්පත් හා කාර්යාල කළමණාකරණ (HR&OM) අංශය | 68 |
| මූල්‍ය කළමණාකරණ (FM) අංශය | 68 |
| අභ්‍යන්තර විගණන (IA) අංශය | 68 |
| ගුවන්යානා අනතුරු සහ සිදුවීම් විමර්ශන (AAII) අංශය | 68 |
| 2012 කර්මාන්තයෙහි කාර්ය සාධනය | 70 |
| 2012 මූල්‍ය ප්‍රකාශ | |
| 2012 දෙසැම්බර් 31 දිනට විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 71 |
| 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය | 72 |
| 2012 දෙසැම්බර් 31 දිනට ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය | 73 |
| 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය | 74 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති | 76 |
| මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් | 86 |
| විගණකාධිපති වාර්තාව | 95 |
| විගණකාධිපති වාර්තාවට පිළිතුරු | 103 |

# සංක්ෂිප්ත යෙදුම්

| | |
|---|---|
| A&NS | ගගන යාත්‍රාංගන හා ගුවන් සංතරණ සේවා |
| AA | සහකාර ගණකාධිකාරී |
| AAI | සහකාර ගගන යාත්‍රාංගන පරීක්ෂක |
| AA(I) | විගණන සහකාර (අභ්‍යන්තර) |
| AASI | සහකාර ගුවන් සේවා සුරක්ෂිතතා පරීක්ෂක |
| AASL | සී/ස ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම |
| AATO | සහකාර ගුවන් ප්‍රවාහන නිලධාරී |
| AAwE | සහකාර ගුවන් යෝග්‍යතා ඉංජිනේරු |
| Acct | ගණකාධිකාරී |
| AFM | සහකාර මූල්‍ය කළමණාකාර |
| AFTN | ස්තබ්ධ ගගන නාවික විදුලි සංදේශ ජාලය |
| AGOI | සහකාර භූමි මෙහෙයුම් පරීක්ෂක |
| AI | ගගන යාත්‍රාංගන පරීක්ෂක |
| AIU | අනතුරු විමර්ශන ඒකකය |
| AISO | ගගන නාවික තොරතුරු සේවා නිලධාරී |
| AME(BL) | ගුවන් යානා නඩත්තු ඉංජිනේරු (මූලික බලපත්‍රය) |
| AML | ගුවන් යානා නඩත්තු බලපත්‍රය |
| AMO | අනුමත නඩත්තු සංවිධානය |
| AMT | ගුවන් යානා නඩත්තු තාක්ෂණ ශිල්පී |
| ANR | ගුවන් සංතරණ රෙගුලාසි |
| ANS | ගුවන් සංතරණ සේවා |
| ANSI | ගුවන් සංතරණ සේවා පරීක්ෂක |
| AOC | ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකය |
| AS | ගගන නාවික සේවා |
| ASI | ගුවන් සේවා සුරක්ෂිතතා පරීක්ෂක |
| ASN | ගුවන් සේවා නිරුපද්‍රිතතා නිවේදනය |
| AT&LA | ගුවන් ප්‍රවාහන හා නීති කටයුතු |
| ATC | ගුවන් ගමන් පාලනය/ගුවන් ගමන් පාලක |

සංක්ෂිප්ත යෙදුම්

| | |
|---|---|
| ATO | ගුවන් ප්‍රවාහන නිලධාරී |
| Av. Sec | ගුවන් සේවා සුරක්ෂිතතාවය |
| Aw | ගුවන් යෝග්‍යතාවය |
| AwE | ගුවන් යෝග්‍යතා ඉංජිනේරු |
| BIA | බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ |
| CAASL | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය |
| CAO | සිවිල් ගුවන් සේවා නිලධාරී |
| CADEC | සිවිල් ගුවන් සේවා සංවර්ධන සහ අධ්‍යාපන කමිටුව |
| CEO | ප්‍රධාන විධායක නිලධාරී |
| CIA | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| COSCAP-SA | මෙහෙයුම් නිරුපද්‍රිතතාව සහ අඛණ්ඩ ගුවන් යෝග්‍යතාවය වර්ධනය කිරීමේ දකුණු ආසියා සහයෝගිතා වැඩසටහන |
| Cp | සංස්ථාපිත |
| CSI | මැදිරි නිරුපද්‍රිතතා පරික්ෂක |
| C of R | ලියාපදිංචි කිරීමේ සහතිකය |
| DCA | සිවිල් ගුවන් සේවා දෙපාර්තුමේන්තුව |
| D | අධ්‍යක්ෂ |
| DD | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| DGCA | සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් |
| DO | ලේඛනික නිලධාරී |
| DPIG | සංවර්ධන සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ සංසදය |
| EASA | යුරෝපා ගුවන්සේවා නිරුපද්‍රිතතා ඒජන්සිය |
| ELP | උපකරණ පැටවීමේ සැලැස්ම |
| EU-SA | යුරෝපා සංගමය - දකුණු ආසියාව |
| FAL | සුසාධනය |
| FIR | පියසර තොරතුරු කලාපය |
| FOI | පියසර මෙහෙයුම් පරීක්ෂක |
| FS | පියසර නිරුපද්‍රිතතාවය |
| GOI | භූමි මෙහෙයුම් පරීක්ෂක |
| GSA | පොදු වෙළඳ නියෝජිත |
| HR&OM | මානව සම්පත් හා කාර්යාල කළමණාකරණය |
| HR&OMA | මානව සම්පත් හා කාර්යාල කළමණාකරණ සහකාර |
| HR&OMO | මානව සම්පත් හා කාර්යාල කළමණාකරණ නිලධාරී |
| IA | අභ්‍යන්තර විගණනය |
| ICAO | ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය |
| MEL | අවම උපකරණ ලැයිස්තුව |
| NOTAM | ගුවන් සේවාවන්හි නිරත වුවන්ට දැනුම් දීම |
| OA | කායාීාල සහායක |
| Ops | මෙහෙයුම් |

| | |
|---|---|
| PA | පෞද්ගලික සහකාර |
| PEL | පුද්ගල බලපත්‍ර නිකුත් කිරීම |
| PLO | පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමේ නිලධාරී |
| PA-AAI | වැඩසටහන් සහකාර - ගුවන් යානා අනතුරු විමර්ශන |
| PA-AE | වැඩසටහන් සහකාර - ගුවන් සේවා විභාග |
| PA-IT | වැඩසටහන් සහකාර - තොරතුරු තාක්ෂණ |
| PA-SP | වැඩසටහන් සහකාර - විශේෂ ව්‍යාපෘති |
| S/CAASL | ලේකම් / සිවිල් ගුවන් සේවා අධිකාරිය |
| SD | ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ |
| SAFA | විදේශ ගුවන් යානා - නිරුපද්‍රිතතා තක්සේරුව |
| SAISO | ජ්‍යෙෂ්ඨ ගගන නාවික තොරතුරු සේවා නිලධාරී |
| SARPs | ප්‍රමිති හා නිර්දේශිත පරිචයන් |
| SARI | දකුණු ආසියා කලාපීය ආරම්භනය |
| SATO | ජ්‍යෙෂ්ඨ ගුවන් ප්‍රවාහන නිලධාරී |
| SAwE | ජ්‍යෙෂ්ඨ ගුවන් යෝග්‍යතා ඉංජිනේරු |
| SFOI | ජ්‍යෙෂ්ඨ පියසර මෙහෙයුම් පරීක්ෂක |
| SLAS | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති |
| SLCAP | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා ප්‍රකාශනය |
| SLFRS | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති |
| SP | විශේෂ ව්‍යාපෘති |
| SMS | නිරුපද්‍රිතතා කළමණාකරණ ක්‍රමය |
| USAP | විශ්ව සුරක්ෂිතතා විගණන වැඩසටහන |
| USOAP | විශ්ව නිරුපද්‍රිතතා අධීක්ෂණ විගණන වැඩසටහන |

# නාමාවලිය

| | | |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | : | **ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,** |
| | | 04, හුණුපිටිය පාර, කොළඹ 02. |
| | | දුරකථන : 94-11-2304632 |
| | | ෆැක්ස් : 94-11-2304644 |
| | | විද්‍යුත් තැපැල් ලිපිනය : info@caa.lk |
| | | වෙබ් අඩවිය : www.caa.lk |
| | | තැපැල් ලිපිනය : තැ.පෙ. 535, කොළඹ |
| | | විදුලි සංදේශ ලිපිනය : එයාර්සිවිල් (AIRCIVIL) |
| | | AFTN ලිපිනය : VCCCYAYX |
| ශාඛා කාර්යාලය | : | **ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,** |
| | | "හිල්ටොප්"නයිකන්ද, මිනුවන්ගොඩ පාර, කටුනායක. |
| | | දුරකථන : 94-11-2251076 |
| | | ෆැක්ස් : 94-11-2251076 |
| | | විද්‍යුත් තැපැල් ලිපිනය : katcaa@caa.lk |
| උප කාර්යාල | : | **ගුවන් යෝග්‍යතා උප කාර්යාලය,** |
| | | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය, |
| | | බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ - කටුනායක. |
| | | දුරකථන : 94-11-2252269 |
| | | විද්‍යුත් තැපැල් ලිපිනය : aidbcaa@caa.lk |
| | : | **ගුවන් යෝග්‍යතා උප කාර්යාලය,** |
| | | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය, කොළඹ ගුවන් තොටුපොළ, රත්මලාන. |
| | | දුරකථන : 94-11-2635756 |
| | | විද්‍යුත් තැපැල් ලිපිනය : aidccaa@caa.lk |
| ගිණුම් පරීක්ෂකවරු | : | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විගණකාධිපති |
| නීතිඥවරු | : | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිපති |
| බැංකුකරු | : | ලංකා බැංකුව |
| රක්ෂණකරුවෝ | : | සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව |
| | | සී/ස සෙලින්කෝ ඉන්ෂුවරන්ස් සමාගම |



# සභාපතිගේ සමාලෝචනය

1912 වර්ෂයේදී, කොළඹ තුරග තරග පිටියේදී ප්‍රථම පාලනය කළ හැකි සහ පවත්වාගෙන යා හැකි බලය යෙදූ පියසරය සාක්ෂාත් කර ගැනීමත් සමග නව මං පෙත් සොයා ගිය ශ්‍රී ලංකා ගුවන් සේවා කර්මාන්තයෙහි ආරම්භය සනිටුහන් විය. ශ්‍රී ලංකා ගුවන් සේවා කර්මාන්තය එහි ප්‍රථම ශත සංවත්සරය සමරණ අතරතුරම ගුවන් සේවා කර්මාන්තය භාර රාජ්‍ය නියාමන ආයතනය වශයෙන් පෙර පැවති සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ අනුප්‍රාප්තික ආයතනය ලෙස 2002 දී පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය ද එහි 10 වන සාර්ථක වර්ෂය සනිටුහන් කළේය.

ඉහළ යන ඉන්ධන මිල, ආර්ථික අවපාතය, ස්වභාවික ආපදා සහ දේශපාලනමය වෙනස්වීම් මධ්‍යයේ වුවද ගෝලීය ගුවන් සේවා කර්මාන්තය සිත් කා වදින අන්දමින් යළි පණ ගැන්වී ඇත. 2012 වර්ෂය තුළ මගීන් බිලියන 2.9ක් ප්‍රවාහනය කළ මගී පිටත්වීම් මිලියන 31ක් වාර්තා වී ඇති අතර ගෝලීය ගුවන් ප්‍රවාහන සමාගම් විසින් ප්‍රවාහනය කරන ලද මගීන් සංඛ්‍යාවෙහි 5% ක වර්ධනයක් වාර්තා වී තිබිණ.

මෙහිදී වෙනත් කලාප අතර ආසියා ශාන්තිකර කලාපය 2011 වර්ෂයට සාපේක්ෂව 6.9%ක වර්ධන වේගයක් සහිතව ආදායම් මගී කිලෝ මීටර් බිලියන 1599ක දායකත්වයක් ලබා දෙමින් මූලිකත්වය ගෙන කටයුතු කර ඇත.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ මගී වෙළඳපොළ මෙන් නොව ගුවන් භාණ්ඩ ප්‍රවාහන වෙළඳ පොළ ලබා ඇත්තේ -1.2%ක් වූ උදාසීන වර්ධන වේගයකි. මෙය 2010න් පසු ගුවන් භාණ්ඩ ප්‍රවාහන වෙළඳපොළ නොකඩවා අඩු වර්ධන වේගයක් අත්දුටු දෙවැනි අවස්ථාවයි.

යුද්ධයෙන් පසු ක්‍රියාත්මක වන සංවර්ධන සැලසුම් සමග ශ්‍රී ලංකාව අති විශාල සංවර්ධන අදියරක් කරා යොමු වීමට අපේක්ෂා කරන අතර, ගුවන් සේවා කාර්යයන් සඳහා වන කේන්ද්‍රස්ථානයක් වශයෙන් කළාපය තුළ ස්ථාවර තත්ත්වයක් ගොඩනගා ගැනීම මගින් ආර්ථික සංවර්ධනය ඉදිරියට මෙහෙයවිය හැකි උත්ප්‍රේරකයක් වශයෙන් සිවිල් ගුවන් සේවාව පැහැදිළිව හඳුනාගනු ලැබ ඇත. මෙම අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීම සඳහා ඉටු කර ඇති පූර්ව අවශ්‍යතා කීපයක් අතරට, කර්මාන්ත හවුල් කරුවන්ගේ හැකියාව වර්ධනය කිරීම සඳහා ප්‍රවර්තන නියාමන කාර්යය පටිපාටි ලිහිල් කිරීම සහ කර්මාන්ත හවුල් කරුවන් සහ ගුවන් සේවාව ආශ්‍රිත උප අංශ සඳහා ඵලදායී යටිතල පහසුකම් සපයා දීම ද ඇතුළත් වේ.

ඉහත කී අරමුණට සමගාමීව රාජ්‍යය සතු ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සමාගම් මගී චලන මිලියන 7.1 ක් සහ සංක්‍රමණ මගී චලන මිලියන 1.1 ක් මෙම වර්ෂය තුළ වාර්තා කර ඇත. මෙය 2011 වර්ෂයට සාපේක්ෂව සම්පූර්ණ මගී සංඛ්‍යාවෙහි 15%ක වර්ධනයක් වන අතර සංක්‍රමණ මගී සංඛ්‍යාවෙහි 61%ක කැපී පෙනෙන වර්ධනයකි. මේ සමගම ගුවන් නැව් බඩු කර්මාන්තය ද ගුවන් භාණ්ඩ මෙට්‍රික් ටොන් 174,204ක් ප්‍රවාහනය කරමින් 9.8% ක වර්ධනයක් වාර්තා කර ඇත. තව දුරටත් 2013 දී ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපොළ වශයෙන් මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ (MRIA) විවෘත කිරීමෙන් රටේ සමාජ ආර්ථික සංවර්ධනය දිරි ගැන්වීමට රජය අපේක්ෂා කරයි.

සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ රාජ්‍ය නියාමක ආයතනය වන සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි ප්‍රධාන අරමුණ වනුයේ ගුවන් සේවා කාර්යයන්හි නිරත වූවන් පිළිබඳ නිරුපද්‍රිතතා අධීක්ෂණ කාර්යයන් ඉටු කිරීමය. මෙම අරමුණ මුදුන්පත් කර ගනිමින්

සමාලෝචනයට භාජනය වන වර්ෂය ගුවන් යානා අනතුරු කිසිවක් සිදු නොවූ වර්ෂයක් වශයෙන් පවත්වා ගැනීමට ශ්‍රී ලංකාව සමත් වී ඇත. ගුවන් සේවා ආශ්‍රිත සිදුවීම් වාර්තා වී ඇත්තේ ද එකක් පමණකි.

2012 වර්ෂය තුළ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) විසින් ශ්‍රී ලංකාව සම්බන්ධව පවත්වන ලද විශ්ව සුරක්ෂිතතා විගණනයේ (USAP) ප්‍රතිඵල අනුව ශ්‍රී ලංකාව ගුවන් සේවා සුරක්ෂිතතාවට අදාළ ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් සමග අනුවෘත්‍යය පවත්වන ප්‍රමාණය 85%ක් බව හෙළිදරව් වී ඇත. මේ සමගම විගණනය කරන ලද රාජ්‍යයන් 145ක ප්‍රතිඵල අනුව ගෝලීය සමාන්‍යය වූයේ 67% කි.

රටේ දේශීය (අභ්‍යන්තර) ගුවන් සේවා කර්මාන්තය ද විශාල වශයෙන් වර්ධනය වී තිබුණි. ජනප්‍රිය ගමනාන්තයක් වන යාපනය - කොළඹ සහ ආපසු ගමන් බණ්ඩය තුළ ගුවන් මඟීන් 5436 ක් වාර්තා වීය.

ප්‍රමිති ක්‍රියාත්මක කිරීමේදී තත්ත්වය පහළ නොහෙළා නියාමන අභිප්‍රාය මුදුන්පත් කරගැනීමට හැකි වන අයුරු නියාමන කාර්යයන් ඉටුකිරීම සඳහා ආයතනය සතුව ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පැවතීම අත්‍යවශ්‍ය වන්නේය. මෙම අවශ්‍යතාව සපුරාලීම සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරිය තවත් සේවකයන් නව (09) දෙනෙකු එහි කාර්ය මණ්ඩලයට බඳවා ගත්තේය. සියළු කාර්යයන් හීදී මානව සම්පත මූලික වන බව මුළු සිතින්ම සලකන අධිකාරිය මානව සම්පත් වර්ධනය සහ පුහුණුව සඳහා විශේෂ වැදගත් කමක් ලබා දෙමින් කාර්යය මණ්ඩලය සඳහා පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ, වැඩමුළු රැස්වීම් සහ සම්මේලන වලට සහභාගී වීමේ අවස්ථා 197 ක් වර්ෂය තුළ ලබා දී ඇත.


ශක්තිමත් ගුවන් සේවා නිරුපද්‍රිතතා පරිසරයක් ගොඩනැගීම සඳහා CAASL හි කාර්ය පද්ධතිය ස්වයංකරණය කිරීම සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ එහි වාර්ෂික වැඩ සටහනෙහි ඇතුළත් කර තිබුණු වැදගත් කාර්යයකි. විද්‍යුත් සැසැඳුම් ලැයිස්තු (e checklist) විසඳුම ස්ථාපනය කිරීම සහ පරීක්ෂණ වාර්තා විකාශනය සහ බෙදා හැරීම ස්වයංකරණය කිරීම සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ සම්පූර්ණ කරන ලදී.

CAASL හි පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමේ අංශයෙහි කටයුතු ස්වයංකරණය කිරීම තව වන තුරුත් සිදු කරමින් පවතින අතර දැනට එම කාර්යයෙන් 80%ක් සම්පූර්ණ කර ඇත. ඉහත කී ස්වයංකරණ ක්‍රියාවලිය සිදු කරන ලද්දේ යුරෝපා ගුවන් සේවා නිරුපද්‍රිතතා ඒජන්සිය (EASA) විසින් රාජ්‍යයන් වෙත හඳුන්වා දෙන ලද නිරුපද්‍රතතා අධීක්ෂණ පහසුකම් සහිත සමෝධාන යෙදුම (SOFIA- Safety Oversight Facilitated Integration Application) නැමැති මෘදුකාංගය මගින්ය. මේ හැරුණු විට CAASL හි මූල්‍ය කළමණාකරණය ඵලදායී ලෙසත් කාර්යක්ෂම ලෙසත් සිදු කිරීම සඳහා සුපයෝජිත මූල්‍ය කළමණාකරණ ක්‍රමයක් ද විකාශනය කර ක්‍රියාත්මක කර ඇත.

ගුවන් සේවා කර්මාන්තයෙහි වර්ධනය සඳහා ශක්තිමත් මානව සම්පත් සහ විශේෂඥ සංචිතයක් සූදානමින් තිබිය යුතුය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කළාප පහක් (05) තුළ අධ්‍යාපනික සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සාර්ථකව පවත්වමින් ගුවන් සේවාව තරුණ පරම්පරාව සහ පොදු ශ්‍රී ලාංකික ජනතාව වෙත ගෙනයාමේ පූර්ව ක්‍රියාකාරී ආරම්භනය CAASL විසින් නොකඩවා ඉදිරියට ගෙන ගොස් ඇත. ඒ සමගම "ගුවන්සර" ගුවන් සේවා අධ්‍යාපනික සඟරාවේ පිටපත් පාසල් දෙදහස් අටසියයක් (2800) අතර බෙදා හැරීම ද සිදු කර ඇත.

2012 වර්ෂය සඳහා CAASL හි මුළු ආදායම සහ වියදම වූයේ පිළිවෙලින් රුපියල් මිලියන 988 ක් සහ රුපියල් මිලියන 370 කි. විදේශ විකුණුම් අධිභාරය, නැව්නැගීමේ ගාස්තු, රැස්කිරීමේ සහ නියාමන සේවා සැපයීමේ සේවා ගාස්තු CAASL හි ප්‍රධාන ආදායම් ප්‍රභවයන් වේ. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ ඉහත කී අංශ වලින් උත්පාදනය කරගත් අතිරේක ආදායම නිසා 31% ක ආදායම් වර්ධනයක් සිදු වී තිබිණ.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි සභාපති වශයෙන් මා වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේ දී ඒ සඳහා ලබා දුන් කැපවීම සහ සහාය වෙනුවෙන් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් වරයා වෙත සහ CAASL හි සමස්ත කාර්ය මණ්ඩලය වෙත මගේ කෘතඥතාව පිරිනමමි. සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය තුමන්ටත් අමාත්‍යාංශයේ ලේකම් තුමන්ට සහ සමස්ත කාර්ය මණ්ඩලයටත් මට ලබා දුන් සහයෝගය සහ මගපෙන්වීම වෙනුවෙන් ස්තුතිය පුද කිරීමට මම මෙම අවස්ථාව යොදා ගනිමි.



ජෙනරාල් රෝහාන් ද සිල්වා දළුවත්ත
සභාපති
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය



# සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්ගේ සමාලෝචනය

### ගෝලීය දසුන

සමාලෝචනයට භාජනය වන වර්ෂය ගෝලීය ගුවන් සේවා කර්මාන්තයට විවිධ අංශ ගණනාවකින් මිශ්‍ර ප්‍රතිඵල උත්පාදනය කළ වර්ෂයක් වීය. ගෝලීය ගුවන් ප්‍රවාහන සමාගම් නිත්‍ය උපලේඛනගත ගුවන් ප්‍රවාහන සේවා මගින් මගී බිලියන 2.9 ක් (+5.0%y/y) ප්‍රවාහනය කරමින් ආදායම් මගී කිලෝමීටර ට්‍රිලියන 5.3ක (+5.5%y/y) සහ ගුවන් නැව් බඩු ටොන් කිලෝ මීටර් බිලියන 180 ක කාර්ය සාධනයක් වාර්තා කර ඇත.

ගුවන් ප්‍රවාහනයේදී සැලකිල්ල දැක්විය යුතු මූලික කාරණය වන නිරුපද්‍රිතතා දෘෂ්ටි කෝණයෙන් බලන කල 2012 වර්ෂය 2004 වර්ෂයෙන් මෙපිට පැවති වඩාමත් නිරුපද්‍රිත වර්ෂය බවට පත්ව ඇත. මරණ සංඛ්‍යාව 372 ක් වූ ගුවන් යානා අනතුරු 99 ක් 2012 වර්ෂය තුළ සිදු වී ඇත. මෙහි සාමාන්‍යය ගුවන් යානා පිටත් වීම් මිලියනයකට අනතුරු 3.2 කි.

රාජ්‍ය නිරුපද්‍රතතා වැඩසටහන් (SSPs) නිරුපද්‍රිතතා කළමනාකරණ ක්‍රම (SMS) ගුවන් සේවා කාර්යයන්හි නිරත වූවන් අතර සහයෝගීතාව වර්ධනය කිරීම, තොරතුරු හුවමාරු කර ගැනීමේ නව ආරම්භන සහ අනාගත නිරුපද්‍රිත මෙහෙයුම් සඳහා අවශ්‍ය තාක්ෂණික සහ මානව සම්පත් මත ආයෝජනය කිරීමට ප්‍රමුඛත්වය ලබාදීම යන කරුණු වලට අදාළව ගෝලීය වශයෙන් එකඟ වූ ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් නියම කෙරෙන නව නිරුපද්‍රිතතා කළමනාකරණ ඇමුණුමක් (19 ඇමුණුම වශයෙන්) ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සම්මුතියට අනුබද්ධව සම්මත කර ගැනීම සඳහා 2012 වර්ෂය තුළ ICAO විසින් කටයුතු ආරම්භ කරන ලදී.

ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් සිවිල් ගුවන් සේවාවෙහි නිරුපද්‍රිතතාවට සහ සුරක්ෂිතතාවට අදාළ ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් සමග රාජ්‍යයන් විසින් අනුවෘත්‍යය පවත්වනු ලබන මට්ටම තක්සේරු කිරීම සහ අධීක්ෂණය කිරීම අරමුණු කරගත් අඛණ්ඩ අධීක්ෂණ ක්‍රමය (CMA) තව දුරටත් නොකඩවා ක්‍රියාත්මක කරන ලදී. විගණන ප්‍රතිඵල සාරාංශය ඔවුන්ගේ නිල වෙබ් අඩවිය හරහා පොදුවේ ප්‍රසිද්ධ කරනු ලැබේ.

කර්මාන්තයේ ප්‍රමුඛතා ගණනාවක් අතර පාරිසරික සමතුලිතතාව ආරක්ෂා කිරීමට දක්වන කැපවීම සහ ගනු ලබන ක්‍රියාමාර්ග විශේෂයෙන් පෙනෙන්නට තිබුණි. Emissions Trading Tax Scheme-EU-ETS නමැති බදු යෝජනා ක්‍රමය තුළට ගුවන් සේවාව අන්තර්ග්‍රහණය කිරීම විවිධ ජාතීන් අතර මතබේධකාරී තත්ත්වයක් ඇතිවීමට හේතු වීය. EU-ETS යෝජනා ක්‍රමය ජාතික ස්වාධිපත්‍යය නොතකන ඒකපාක්ෂික යෝජනා ක්‍රමයක් බව රාජ්‍යයන් බහුතරයක ගේ අදහස වීය. $Co_2$ මෝචන අවම කිරීම සඳහා ගත හැකි පියවර ගණනාවක් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) විසින් කාර්‍ය සැලැස්මක් මගින් සාමාජික රාජ්‍යයන් වෙත යෝජනා කරන ලදී.

### ගුවන් ප්‍රවාහන සමාගම් කර්මාන්තය

ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (IATA) විසින් නිකුත් කරන ලද තොරතුරු අනුව 2012 වර්ෂයේදී මගී ඉල්ලුමෙහි 5.3% (වසරින් වසර) වැඩි වීමක්ද ගුවන් නැව් බඩු සඳහා වන ඉල්ලුමෙහි 1.5% ක අඩු වීමක්ද සිදුවී ඇත. 2012 දී ගුවන් ප්‍රවාහන සමාගම් වල භාර සාධක (Load Factors) වාර්තාවකට ආසන්න වූ 79.1% මට්ටම් වල පැවතුණි. ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ඉල්ලුම දේශීය ප්‍රවාහනය සඳහා වූ ඉල්ලුමට වැඩි වේගයකින් වර්ධනය වීය. ජාත්‍යන්තර ප්‍රවාහනය සඳහා වූ ඉල්ලුමේ වර්ධන වේගය 6.0% ක් වූ අතර දේශීය ඉල්ලුමේ වර්ධන වේගය 4.0% ක් වීය. මෙකී ඉල්ලුම් දෙවර්ගයේම වර්ධනයට

ප්‍රධාන වශයෙන් හේතු වූයේ නැගී එන වෙළඳ පොළය. වර්ෂය සඳහා ගුවන් නැව් බඩු භාර සාධකය (Load Factors) වූයේ 45.2% කි. ආර්ථික පසුබෑම සමග වුවද 2012 වර්ෂය තුළ මගී ප්‍රවාහනය සඳහා ඉල්ලුම බෙහෙවින් වර්ධනය විය. මෙයින් පෙනී ගියේ එකට බැඳුනු වර්තමාන ලෝකයට සමස්ත ගෝලීය ගුවන් ප්‍රවාහනය කෙතරම් වැදගත් වන්නේ ද යන බවය. ඒ සමගම ගුවන් ප්‍රවාහන සමාගම් කෙතරම් ප්‍රවේශමෙන් ධාරිතාව කළමනාකරණය කරන්නේ ද යන්න මෙකී ඉහළ මට්ටම් වල භාර සාධකයන්ගෙන් (Load Factors) පෙනී ගොස් ඇත. වර්ධනයෙත්, වැඩි ගුවන් යානා භාවිතයේත් ආධාරයෙන් අධික ඉන්ධන මිල සමග වුවද 2012 වර්ෂය තුළ ඩොලර් බිලියන 6.7 ක ලාභයක් ලැබීමට ගුවන් ප්‍රවාහන සමාගම් සමත් වී ඇත. කෙසේ වුවද ගුවන් ප්‍රවාහන සමාගම් වල ශුද්ධ ලාභාන්තය යාන්තමට 1.0% රැඳී පැවතුණි. මගී වෙළඳ පොළ වර්ධනයට ප්‍රතිවිරුද්ධ අකාරයට ගුවන් නැව් බඩු වෙළඳපොළ 1.5% කින් සංකෝචනය විය. මීට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ලෝක වෙළඳාමෙහි අඩුවීමත් ලෝක වෙළඳාම වැඩි වශයෙන් විශාල ඉඩකඩ ප්‍රමාණයක් අවශ්‍ය තොග භාණ්ඩ දෙසට හැරීමත්ය. මෙවැනි භාණ්ඩ සඳහා වඩා සුදුසු වන්නේ නැව් මගින් සිදු කෙරෙන මුහුදු ප්‍රවාහනයයි. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ ඉන්ධන සඳහා වූ පිරිවැය ප්‍රමාණය ගුවන් ප්‍රවාහන සමාගමක මෙහෙයුම් පිරිවැයෙන් 33% ක කොටසක් බවට පත් වී තිබුණි. අද ගුවන් ප්‍රවාහන සමාගම් ඔවුන්ගේ ඉන්ධන සඳහා 2003 වැය කළ මුදල මෙන් පස් (5) ගුණයක මුදලක් වැය කරති.

## ගෝලීය ගුවන් සේවා කර්මාන්තයෙහි ආර්ථික දසුන

ගුවන් ප්‍රවාහනය ගෝලීය වශයෙන් සිදු කරන ආර්ථික ක්‍රියාකාරකම් තුළින් ඩොලර් බිලියන 490 ක් උපයමින් සංවර්ධනය වෙමින් පවතින රට වල ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ගුවන් සේවාවෙන් යැපෙන රැකියා මිලියන 35.9 ක් පමණ පදනම් වී ඇත්තේ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් මත වන අතර මෙම රැකියා සංඛ්‍යාව සම්පූර්ණ රැකියා ප්‍රමාණයෙන් හරි අඩකටත් වැඩි වේ. වර්ෂ 2030 වන විට ගුවන් සේවාව විසින් රැකියා මිලියන 82.2 කට අනුග්‍රහ දක්වනු ඇති බව ද ආර්ථික කාර්යයන් සඳහා ඩොලර් ට්‍රිලියන 6.9 ක දයකත්වයක් ලබා දෙනු ඇති බව ද ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (IATA) ඇස්තමේන්තු කර ඇත. වාර්ෂික ගුවන් ප්‍රවාහනය කරනු ලබන භාණ්ඩ වල මුළු වටිනාකම ඩොලර් ට්‍රිලියන 5.3 ක් වන අතර එය සම්පූර්ණ ලෝක වෙළඳාමෙන් 35% කි.

## ගුවන් යානා බාරදීම්

2012 වර්ෂය තුළදී බෝයින් (Boeing) සමාගම (1999 න් පසු) වාර්තාගත ගුවන් යානා 601 ක් බාරදුන් අතර එයාර් බස් සමාගම, සමාගම් වාර්තාවක් පිහිටුවමින් ගුවන් යානා 588 ක් බාර දී ඇත. Boeing සමාගම එහි නවතම B787 වර්ගයේ ගුවන් යානා 49 ක් ගනුදෙණුකරුවන් 8 දෙනෙකුට බාර දී ඇති අතර එයාර් බස් සමාගම A380 ගුවන් යානා 99 ක් ගනුදෙනුකරුවන් 9 දෙනෙකුට භාර දී තිබිණ.

## කලාපීය තත්ත්වය

මීලඟ 20 වසර තුළ ලොව ගුවන් ප්‍රවාහන වර්ධනයෙන් හරි අඩකට ආසන්න ප්‍රමාණයක් මෙහෙයවනු ඇත්තේ ආසියා ශාන්තිකර කළාපය තුළට සහ ඉන් පිටතට ජනනය වන ගුවන් ගමන් විසින් බව කර්මාන්තය පිළිබඳව පළවන පුරෝකථන වලින් හෙළිදරව් වී ඇත. ලොව වඩාමත් කාර්‍යබහුල ගුවන් තොටුපල 20 අතුරෙන් 6 ක් ස්ථානගත වී ඇත්තේ ආසියා ශාන්තිකර කළාපය තුළ වන අතර එයිනුත් බීජිං (Beijing) කාර්‍යබහුලතාවය අතින් ලොව දෙවන(2) ස්ථානයට පත් වී ඇත. බීජිං ගුවන් තොටුපොළ 2012 වර්ෂය තුළ මගීන් මිලියන 74 ක් සඳහා මෙහෙවර සිදුකර ඇත. 2012 වර්ෂය සඳහා මෙම කළාපය 5.4% ශුද්ධ ලාභ වර්ධනයක් වාර්තා කර ඇති අතර එය ලොව අනිකුත් කළාප අතර ද ඉහළම වර්ධන වේගය වීය. 2012 වර්ෂය තුළ ආදායම් ටොන් කිලෝමීටර (RTK) ප්‍රමාණයට අදළව ආසියා ශාන්තිකර කළාපය 2.3% ක වර්ධන වේගයක් වාර්තා කර ඇත. 2012 වර්ෂය තුළ වාර්තා වූ මෙම සියළු ධනාත්මක වර්ධනයන් අතර ඉන්දියානු ගුවන් සේවා අංශයෙහි පිරිහීම කැපී පෙනුනි. ඉන්දියානු ගුවන් ප්‍රවාහන සමාගම් ඩොලර් බිලියන 8 කට වැඩි ප්‍රමාණයක් ණය වී ඇති අතර කිංෆිෂර් ගුවන් ප්‍රවාහන සමාගමේ ණය ප්‍රමාණය ඩොලර් බිලියන 2ක් බව වාර්තා වී ඇත.

## දේශීය තත්ත්වය

2012 වර්ෂය ශ්‍රී ලංකාවේ දේශීය ගුවන් සේවා අංශයට අභියෝගාත්මක වර්ෂයක් වූ නමුත් ඒ සමගම තවත් එක් විශිෂ්ඨ වර්ෂයක් ද විය. ශ්‍රී ලංකාවේ ගුවන් සේවා කර්මාන්තයට එහි ශත සංවත්සරය සැමරීමට මීට වඩා සුදුසු වර්ෂයක් නැති තරමය.

"මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති කේන්ද්‍ර (05) යටතේ ගුවන් සේවා කේන්ද්‍රයක් පිහිටුවීමේ අරමුණ සහිතව, රටේ ආර්ථික සංවර්ධනය ඉදිරියට මෙහෙයවීමේ එක් උත්පේරකයක් ලෙස රජයේ පශ්චාත් - යුධ ආර්ථික ප්‍රතිපත්ති විසින් සිවිල් ගුවන් සේවා අංශය හඳුනාගනු ලැබ ඇත.

2012 වර්ෂය තුළ බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ (BIA) මෙහෙයුම් සිදුකළ මුළු මගීන් සංඛ්‍යාව මිලියන 7.2 සීමාව ඉක්මවා ගිය අතර එය 15% (වසරින්/වසර) ක වර්ධන වේගයකි. සංක්‍රමණ මගීන් සංඛ්‍යාව අති විශාල ප්‍රතිශතයකින් (61%) වර්ධනය විය. ගුවන් යානා චලන සංඛ්‍යාව මිලියන භාගයකට (0.5m) ආසන්න වූ අතර එය 12% ක වර්ධන වේගයක් විය.

BIA හරහා සංක්‍රමණය වූ මගීන්ගෙන් 88% ක් ගෙන ගොස් ඇත්තේ ශ්‍රී ලංකාවේ ජාතික ගුවන් සේවය වන ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම විසිනි. රාජ්‍යය සතු අඩු මිල ගුවන් ප්‍රවාහන සමාගම විසින් කොළඹට පැමිණි මගීන්ගෙන් 8% ක් රැගෙන විත් ඇත. කොළඹ සිට පිටතට ගමන් කළ මගීන් අතර වඩාත් ජනප්‍රිය ගමනාන්ත වූයේ චෙන්නායි, ඩුබායි, සිංගප්පූරුව, මාලේ සහ ඩෝහා ය.

2012 වර්ෂය තුළ දේශීය ගුවන් සේවාවෙහි 200% කටත් අධික ආශ්චර්යමත් වර්ධනයක් සිදු විය. යාපනය-රත්මලාන සහ ආපසු පටු තීරයේ ගමන් කළ ගුවන් මගීන් සංඛ්‍යාවේ වර්ධනය මීට සැහෙන දායකත්වයක් ලබා දී ඇත. දේශීය ගුවන් සේවා අංශය මෙවැනි වර්ධනයක් අත්විඳ ඇති අතර 2011 වර්ෂයට සාපේක්ෂව සාමාන්‍ය ගුවන් සේවා අංශය එහි බැලුම් මෙහෙයුම් ප්‍රමාණයෙහි පසු බැමකට පත්ව ඇත. මීට අමතරව මෙරට සාමාන්‍ය ගුවන් සේවා ඛණ්ඩය තුළට පැරා මෝටරිං ද ඇතුළත් කරන ලදී.

ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) විසින් එහි විශ්ව සුරක්ෂිතතා විගණන වැඩ සටහන (USAP) යටතේ ශ්‍රී ලංකාව සම්බන්ධව පවත්වන ලද විගණනයට ශ්‍රී ලංකාව 2012 දී මුහුණ දුන්නේය. ගුවන් සේවා සුරක්ෂිතතාවට අදාළ ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් (SARPS) සමග අප පවත්වන අනුවෘත්‍යයේ ප්‍රමාණය 85% ක ටත් වැඩි බව විගණන ප්‍රතිඵල වලින් හෙළි විය. රාජ්‍යයන් 145ක ප්‍රතිඵල අනුව මෙහි ලෝක සාමාන්‍යය වූයේ 67% කි. මේ අනුව ශ්‍රී ලංකාව ලබා ඇත්තේ ඉතා උසස් කාර්‍ය්‍ය සාධන මට්ටමකි.


ගුවන්තොටුපළ සහ ගුවන් සේවා සමාගම අප රටේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපොළ වන මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ (MRIA) ඉදිකිරීමේ අවසාන කටයුතු වල කඩිසරව යෙදී සිටියේය. ඊට සහගාමීව සිවිල් ගුවන් සේවා අධිකාරිය ද ගුවන් තොටුපොළ සහතික කිරීමේ කාර්‍යාවලිය ආරම්භ කළේය. 2013 මාර්තු 18 වන දින ගුවන් තොටුපොළේ මෙහෙයුම් ආරම්භ කිරීමට නියමිතව ඇත.

ශ්‍රී ලංකාවේ නිරුපද්‍රිතතා කාර්‍ය සාධනය 2011 කාර්‍ය සාධන මට්ටමට සමානව පැවතුණි. 2012 වසර තුළ බරපතල අනතුරු හෝ සිදුවම් හෝ කිසිවක් වාර්තා නොවීය. කෙසේ වුවද පියසරය අතරතුර මුහුණ පෑමට සිදු වූ වා කැළඹුම් තත්ත්වයන් හේතුවෙන් එක් ශ්‍රී ලංකන් ගුවන් යානයක සේවිකාවකට බරපතල තුවාල සිදුවීමත් ගුවන් මගීන් 12 දෙනෙකුට සුළු තුවාල සිදුවීමත් නිසා සිවිල් ගුවන් සේවා අධිකාරියට නිරුපද්‍රිතතා කාර්‍ය සාධන ඉලක්ක පවත්වාගෙන යාමේ අභිප්‍රාය ඉටුකර ගැනීමට නොහැකිවීම කණගාටුවට කරුණක් විය. ශ්‍රී ලංකාවේ ගුවන් සේවාවට වසර 100 ක් පිරීම සැමරීම සඳහා ක්‍රියාකාරකම් මාලාවක් සංවිධානය කරන ලදී. මෙහි ප්‍රධාන උත්සවය 2012 දෙසැම්බර් මස 07 වන දින අතිගරු ජනාධිපතිතුමන්ගේ සහභාගිත්වයෙන් අරලියගහ මන්දිරයේදී පවත්වන ලදී.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ CAASL හි ආදායම 31% කින් වැඩි වී තිබුණු අතර වියදම 92% කින් වැඩි විය. විදේශ විකුණුම් අධිභාරය සහ නැවී නැගීමේ ගාස්තු රැස්කර දීමෙන් සහ නියාමක සේවා සැපයීමෙන් අයකරගත් සේවා ගාස්තු CAASL හි ප්‍රධාන ආදායම් මාර්ග විය. නව ගුවන් සේවා පනත මත පදනම් වූ නියාමන සංවර්ධන කාර්‍යයන්, ගුවන් සේවා ශත සංවත්සර උත්සව කාර්‍ය මණ්ඩල වියදම් සහ සුහසාධන කාර්‍යයන් සඳහා අයවැයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රධාන වශයෙන් දරණ ලද වියදම් අතර විය.

මෙම කාර්‍යාලයට පැවරී ඇති කාර්‍යයන් ඉටු කිරීමේදී ඒ සඳහා ලබාදුන් සහය සහ සහයෝගය වෙනුවෙන් ගරු සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමන්ටත්, අමාත්‍යාංශයේ ලේකම්තුමන්ටත්, අමාත්‍යාංශයට අනුයුක්ත කාර්‍ය මණ්ඩලයටත් ස්තුති කිරීමට මෙම අවස්ථාව යොදා ගනිමි.

එමෙන්ම මගේ කාර්‍යයන් හීදී වෙහෙස නොතකා මට සහය දුන් සහ මග පෙන්වූ අධිකාරියේ සභාපති තුමන්ටත්, උප සභාපතිතුමන්ටත් සාමාජිකයින්ටත් ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි. ඒ සමගම ඉතා ඕනෑකමින්, හික්මීමෙන් සහ පක්ෂපාතීත්වයෙන් ඔවුන්ගේ රාජකාරි කාර්‍යක්ෂමව ඉටු කළ CAASL කාර්‍ය මණ්ඩලයටත් මාගේ ස්තුතිය පිරිනමමි.



**එච් එම් සී නිමල්සිරි**

**සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් සහ**

**ප්‍රධාන විධායක නිලධාරී**

# පැතිකඩ

### හැඳින්වීම

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා පනත යටතේ වර්ෂ 2002 දෙසැම්බර් මස 27 වන දින ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පිහිටුවන ලද අතර එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තිය යටතේ රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වශයෙන් සළකනු ලැබේ.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි මුලික කාර්යය භාරය වනුයේ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) විසින් සම්මත කරන ලද ජාත්‍යන්තර ප්‍රමිති හා නිර්දේශිත පරිචයන් අනුගමනය කරමින් සහ 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ විධිවිධාන ප්‍රකාර කටයුතු කරමින් සිවිල් ගුවන් සේවාවෙහි නිරුපද්‍රිතතාවය සහ සුරක්ෂිතතාවය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රියාකාරකම් ඉටු කිරීම සහ ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ජීවන තත්වය නගා සිටුවමින් ශ්‍රී ලංකාවේ ගුවන් සේවා අංශය ජාතික ආර්ථික වර්ධනයේ ප්‍රධාන දායක අංශයක් බවට පත් කරවීමය.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සාමාජිකයන් අට (08) දෙනෙකුගෙන් සමන්විත වේ.

ඒ අතරින් පස් (05) දෙනෙකු පත් කරනු ලබන්නේ සිවිල් ගුවන් සේවා විෂය භාර අමාත්‍යවරයා විසිනි.

ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ නියෝජිතයෙකු සහ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්වරයා නිල බලයෙන් සිවිල් ගුවන් සේවා අධිකාරියට පත් වන සාමාජිකයෝ වෙති.

අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන්ගේ නිල කාලය පත් කරනු ලබන දිනයේ සිට වසර තුනක් (3) වේ.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සිවිල් ගුවන් සේවා විෂය භාර අමාත්‍යවරයාගේ මග පෙන්වීමට හා පාලනයට යටත්ව කටයුතු කරයි. දැනට එම අමාත්‍යවරයා වනුයේ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයාය.

### ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි සාමාජිකයින්

**අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයින් :**

ජෙනරාල් රොහාන් ද සිල්වා දළුවත්ත (සභාපති)
ජේ.එම්.එස්.ඩබ්ලිව්. ජයසුන්දර මහතා (උප සභාපති)
කේ.වී.එන්. ජයවර්ධන මහතා (සාමාජික)
සාකී අලීෆ් මහතා (සාමාජික)
දිනේෂ් ගාල්ලගේ මහතා (සාමාජික)

**නිල බලයෙන් පත් වු සාමාජිකයින් :**

ආරක්ෂක ලේකම් (ගෝඨාභය රාජපක්ෂ මහතා)
මුදල් අමාත්‍යාංශයේ නියෝජිත (ඩබ්ලිව්.අයි. තිසේරා මහතා)
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් (එච්.එම්.සී. නිමල්සිරි මහතා)



**සභාපති**

ජෙනරාල් රොහාන් ද සිල්වා දළුවත්ත
WWV, RWP, RSP, VSV, USP, LOM, ndc, psc

සභාපති ජෙනරාල් රොහාන් ද සිල්වා දළුවත්ත, WWV, RWP, RSP, VSV, USP, LOM, ndc, psc පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ මූලික අධ්‍යාපනය ලබා කොළඹ ආනන්ද විද්‍යාලයෙන් ද්විතීය අධ්‍යාපනය ලැබුවේය. ආනන්ද විද්‍යාලයේ දී ඔහු අධ්‍යාපන කටයුතු වලදී මෙන්ම ක්‍රීඩා අංශයේදී ද අති විශිෂ්ඨයෙකු වීය.

1961 දී ශ්‍රී ලංකා යුධහමුදාවට බැදුණු ඔහු ඔහුගේ කැඩෙට් නිලධාරී පුහුණුව සඳහා එක්සත් රාජධානියේ සැන්ඩ්හර්ස්ට් රාජකීය හමුදා ඇකඩමියට යවනු ලැබීය. එහිදී ශ්‍රී ලංකන් කැඩෙට් නිලධාරීන් අතර ප්‍රථම ස්ථානය ලබා පුහුණුව අවසන් කළ ඔහු දෙවන ලුතිනන්වරයෙකු වශයෙන් සන්නාහ සන්නද්ධ බලකායට පත් කරනු ලැබීය. ඉන් පසු ඔහුගේ තරුණ නිලධාරී පුහුණුව සඳහා එක්සත් රාජධානියෙහි බෝවිංටන් රාජකීය සන්නාහ සන්නද්ධ බලකා මධ්‍යස්ථානයට යවනු ලැබීය. එතැන් පටන් ඔහු ඉන්දියාවේ සුප්‍රසිද්ධ වෙලිංටන් මාණ්ඩලික විද්‍යාල පාඨමාලාව, නවදිල්ලියේ ජාතික ආරක්ෂක පාඨමාලාව ඇතුළු පුහුණු පාඨමාලා ගණනාවකින් පුහුණුව ලබා ඇත. වසර 41 ක් වූ ඔහුගේ කීර්තිමත් සේවා කාලය තුළ ඔහු ඒකාබද්ධ මෙහෙයුම්, අණදෙන නිලධාරී, මාණ්ඩලික ප්‍රධානී, සේනාංකාධිපති, බලසේනාධිපති සහ හමුදා පුහුණු මධ්‍යස්ථානයේ සේනාවිධායක ආදී වැදගත් අණදෙන, මාණ්ඩලික සහ පුහුණු කිරීමේ තනතුරු ගණනාවක් දරා ඇත.

තවද ඔහු ඒකාබද්ධ මෙහෙයුම් අණදෙන නිලධාරී වශයෙන් කටයුතු කරමින් 1995 දී යාපනය අර්ධද්වීපය මුදගත් අතිශයින් වැදගත් "රිවිරැස මෙහෙයුම" ඇතුළු මෙහෙයුම් ගණනාවකට නායකත්වය දුන්නේය.

තව දුරටත් ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ ශාන්තිකර හමුදාවේ අණදෙන නිලධාරී වරයා සමග හවුලේ සත්කාරත්වය දරණ ලද ශාන්තිකර හමුදා කළමණාකරණ සම්මන්ත්‍රණය ඇතුළු ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ගණනාවකට සහභාගී වීය. මෙකී සම්මන්ත්‍රණයේදී කැපී පෙනෙන සේවාවක් ඉටුකළ අතිශයින් ප්‍රශංසනීය විලාශය වෙනුවෙන් ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා විසින් ඔහුට LEGION OF MERIT සම්මානය ප්‍රදානය කරන ලදී.

ශ්‍රී ලංකා යුධ හමුදාවේ හමුදාපතිවරයා වශයෙන් සිය වෘත්තීය ජීවිතයේ මුදුන් පෙත්තට ළඟා වූ ඔහු 1998 දෙසැම්බර් මාසයේ දී යුධ හමුදාවෙන් විශ්‍රාම ගත්තේය. ඔහු ඉටු කළ වටිනා සේවය ඇගයීමක් වශයෙන් ඔහු ජෙනරාල් නිලයට උසස් කරමින් ඒකාබද්ධ මෙහෙයුම් කාර්යාංශයේ සභාපති වශයෙන් පත් කරන ලදී. හමුදාව වන්නි ප්‍රදේශයේදී පසුබැමට ලක් වී යාපනය අර්ධද්වීපය අහිමි වීමට ආසන්නව තිබියදී ඔහු ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී තනතුරට පත් කරන ලදුව උතුරේ තත්වය පාලනය කිරීම සඳහා යාපනයට යවන ලදී. එම කාර්ය්‍ය

සාර්ථකව ඉටු කළ ජෙනරාල් දළුවත්ත අවසානයේ 2002 වර්ෂයේ දී සම්පූර්ණ හමුදා සේවයෙන් විශ්‍රාම ගත්තේය. ඉන් අනතුරුව ඔහු බ්‍රසීලයේ තානාපති වශයෙන් පත්කර යවන ලදී. ඒ වන විට බ්‍රසීලයේ තානාපති කාර්යාලයක් නොතිබුණු හෙයින් ඔහුට එහිදී තානාපති කාර්යාලයක් අළුතින් පිහිටුවීමට සිදු වීය. බ්‍රසීලයේ තානාපති ධූර කාලය අවසානයේ දී බ්‍රසීලයත් ශ්‍රී ලංකාවත් අතර මිතුරු සම්බන්ධතා ශක්තිමත් කොට පවත්වාගෙන යාමට ඔහුගෙන් ලැබුණු කැපී පෙනෙන දයකත්වය අගය කරමින් බ්‍රසීල ජනාධිපති තුමන් විසින් ඔහුට කීර්තිමත් "GRAND CROSS OF THE NATIONAL ORDER OF THE SOUTHERN CROSS" සම්මානය ප්‍රධානය කරන ලදී.

ඔහු ශ්‍රී ලංකාවට ආපසු පැමිණි විට 2011 වසරේ දී ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපති/ප්‍රධාන විධායක වශයෙන් පත් කරනු ලැබීය. 2012 දී ඔහු සිවිල් ගුවන් සේවා අධිකාරියේ සභාපති වශයෙන් පත් කරනු ලැබීය. මීට අමතරව කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ කුලපති පදවිය ද පිරිනමා ඇත.

අතිශයින් උද්යෝගී බහු නිපුණ ක්‍රීඩකයෙකු වන ඔහු මළල ක්‍රීඩා, පැසිපන්දු, ක්‍රිකට්, බැඩ්මින්ටන් සහ ටෙනිස් ක්‍රීඩාවෙහි වර්ණ දිනාගෙන ඇත. ඔහු වසර 20ක් ජාතික පැසිපන්දු පිළ නියෝජනය කර එහි නායකත්වය ද දරා ඇත. මලල ක්‍රීඩා අංශයේ ඔහුගේ වඩාත් කැපී පෙනෙන ජයග්‍රහණය වූයේ බ්‍රිතාන්‍ය හමුදා ශූරතා තරගාවලියේ දී තුන් පිම්ම ඉසව්ව ජයග්‍රහණය කිරීමය. බ්‍රිතාන්‍ය ජාතික මලල ක්‍රීඩා තරගයේ දී ඔහු බ්‍රිතාන්‍ය ඒකාබද්ධ සේවා නියෝජනය කළ අතර එහි දී මලල ක්‍රීඩා සඳහා වන බ්‍රිතාන්‍ය ඒකාබද්ධ සේවා වර්ණ දිනා ගැනීමට ද ඔහුට හැකි වී ඇත.

ජෙනරාල් දළුවත්ත සිය වෘත්තීය ජීවිතය පුරාම ඔහු භාරගත් සෑම කාර්යයකදීම විශිෂ්ට කළමනාකරණ නිපුණතා පෙන්නුම් කර ඇත.



## උප සභාපති
### ජේ.එම්.එස්.ඩබ්ලිව්. ජයසුන්දර මහතා

මහනුවර ධර්මරාජ විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ ජේ.එම්.එස්.ඩබ්ලිව්. ජයසුන්දර මහතා විශිෂ්ඨ ක්‍රීඩකයෙක් විය. 1971 වර්ෂයේදී පොලිස් දෙපාර්තමේන්තුවේ සේවයට බැඳුණු ඒ මහතා වසර 37 ක නොකැළැල් සේවා කාලයකින් පසු නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු වශයෙන් විශ්‍රාම ලැබීය. ඔහුගේ කීර්තිමත් සේවා කාලය ඇතුළත පුහුණුව සඳහා ජපානයට, මැලේසියාවට, ස්කොට්ලන්ඩ්යාර්ඩ් පොලීසියට සහ ඇමරිකා එක්සත් ජනපදයට ගොස් ඇත. ඒ මහතා ජාත්‍යන්තර පොලිස් සම්මේලනයෙහි යාවජීව සමාජිකයෙක්ද වෙයි. සී/ස ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමෙහි විශේෂ කාර්යය අධ්‍යක්ෂවරයා වූ ඒ මහතා අනතුරුව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි උප සභාපති සහ සාමාජිකයෙකු වශයෙන් වැඩ භාර ගත්තේය.




## ගෝඨාභය රාජපක්ෂ මහතා- RWP,RSP
### ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්
### (නිල බලයෙන් පත් වූ සාමාජික)

ගෝඨාභය රාජපක්ෂ මහතා - RWP,RSP කොළඹ ආනන්ද විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබුවේය. අනතුරුව දියතලාව හමුදා පුහුණු මධ්‍යස්ථානයෙහි පුහුණුව ලත් ඒ මහතා 1972 මැයි මස 26 වන දින ශ්‍රී ලංකා සංඥා බලකායෙහි අධිකාරියට පත් කරනු ලැබීය.

පසුව 1974 දී ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවටත්, 1980 දී රජරට රයිෆල්ස් බලකායටත්, 1983 දී ගජබා රෙජිමේන්තුවටත් මාරු කරනු ලැබීය. 1991 දී ලූතිනන් කර්නල් නිලයෙන් කාලයට පෙර විශ්‍රාම ලබන තුරු ඔහු ගජබා රෙජිමේන්තුවේ සේවය කළේය. සිය කීර්තිමත් හමුදා සේවා කාලය තුළ ඒ මහතා ඉන්දියාවේ වෙලින්ටන් ආරක්ෂක සේවා මාණ්ඩලික විද්‍යාලයෙහි පාඨමාලාවක් සහ ඇමරිකා එක්සත් ජනපදයේ පාබල නිලධාරීන් සඳහා වූ උසස් පාඨමාලාව ඇතුළු ඉතා වැදගත් පුහුණු පාඨමාලා ගණනාවකට සහභාගී වී ඇත. රාජපක්ෂ මහතා වඩමාරච්චි මෙහෙයුමට සහභාගී වූ රණවිරුවෙකි. මෙම මෙහෙයුමේදී ඔහු ගජබා රෙජිමේන්තුවේ පළමු වන බල ඇණියට අණ දුන්නේය.

1990 දී ක්‍රියාත්මක කරන ලද "ත්‍රිවිධ බලය" සහ "ජයශක්ති" මෙහෙයුම් වලදීද ඔහු මෙකී බලඇණිය අති සාර්ථක ලෙස මෙහෙයවීය. ඔහු කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨයෙහි නියෝජ්‍ය සේනාවිධායක වශයෙන්ද කටයුතු කර ඇත. රාජපක්ෂ මහතාගේ කීර්තිමත් කැපී පෙනෙන සහ සාර්ථක හමුදා සේවය වෙනුවෙන් ඔහු "රණවික්‍රම" සහ "රණශූර" පදක්කම්වලින් පිදුම් ලබා ඇත.



## එච්.එම්.සී. නිමල්සිරි මහතා
### සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී
### (නිල බලයෙන් පත් වූ සාමාජික)

එච්.එම්.සී. නිමල්සිරි මහතා 2002 දී පිහිටුවන ලද ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ආරම්භයේ පටන්ම එහි සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් කටයුතු කරයි. 1987 සිට එවකට පැවති සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවෙහි සහකාර අධ්‍යක්ෂ (මෙහෙයුම්) වශයෙන් කටයුතු කර ඇති ඒ මහතා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට ද මහත් ශක්තියක් වී ඇත. නිමල්සිරි මහතා සිවිල් ගුවන් සේවාවට අදාළ නව නෛතික රාමුව කෙටුම්පත් කිරීමට පුරෝගාමීව කටයුතු කළ නිලධාරීන් කිහිප දෙනාගෙන් එක් අයෙකි. පසු කලෙක සිවිල් ගුවන් සේවා අධිකාරිය පිහිටුවීමටත්, නව සිවිල් ගුවන් සේවා පනත හඳුන්වා දීමටත් මුල් වූ ආයතනික ප්‍රතිසංස්කරණ සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවට හඳුන්වා දුන්නේ නිමල්සිරි මහතාය.

ගුවන් ප්‍රවාහනය, ගුවන් සේවා නිරුපද්‍රිතතාව සහ ගුවන් සුරක්ෂිතතාවය, ගුවන් සංතරණ සේවා, නිරුපද්‍රිතතා විගණනය සහ නිරුපද්‍රිතතා කළමණාකරණ ක්‍රම ආදියට අදාළ පුහුණු පාඨමාලා ගණනාවක් හදාරා ඇති නිමල්සිරි මහතා සතුව සිවිල් ගුවන් සේවාව පිළිබඳ පුළුල් දැනුමක් හා පළපුරුද්දක් ඇත. සිවිල් ගුවන් සේවාව පිළිබඳ විවිධ කලාපීය හා ජාත්‍යන්තර සම්මේලන ගණනාවකට සහභාගී වී ඇති ඔහු පෙර පැවති සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව සහ අනතුරුව සිවිල් ගුවන් සේවා අධිකාරිය නියෝජනය කරමින් විදේශ රාජ්‍යයන් සමග පවත්වන ලද ද්වි පාර්ශවීය ගුවන් සේවා ගිවිසුම් නිගමනය කිරීමේ සාකච්ඡා ගණනාවකටද සහභාගී වී ඇත. 2007 වර්ෂයේ දී ඔහු ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය යටතේ ක්‍රියාත්මක වන (COSCAP-SA) වැඩසටහනෙහි කලාපීය වැඩසටහන් සමායෝජක වශයෙන් වසර 03 ක කාලයක් සඳහා ICAO සංවිධානයට ද්විතීයනය කරනු ලැබීය. ශ්‍රී ලංකා රජය ඔහුට මේ සඳහා නිවාඩු දුන්නේය.

කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී (BSc) උපාධියක් ලබා ඇති නිමල්සිරි මහතා ඊට අමතරව එම විශ්ව විද්‍යාලයෙන්ම පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති (MSc) උපාධියක්ද ලබා ඇත. එමෙන්ම ඔහු රුසියාවේ යුලිනොව්ස්ක් හි පවත්වන ලද පුහුණු පාඨමාලාවක් හැදෑරීමෙන් පසු පියසර මෙහෙයුම් නිලධාරී බලපත්‍රයක් ද ලබා ඇත. ඒ මහතා ගුවන් සේවාව එක් විෂය ධාරාවක් වශයෙන් පවත්වන මොරටුව විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්යය වරයෙකු වශයෙන් ද කටයුතු කරයි.

ආසියා - ශාන්තිකර කලාපයේ රාජ්‍යයන්හි ගුවන් සංතරණ කාර්යයන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ICAO යටතේ ක්‍රියාත්මක වන ආසියා-ශාන්තිකර ගුවන් සංතරණ සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ සංසදයේ (APANPRIG) දෙවන සභාපතිවරයා වශයෙන් ද ඒ මහතා තෝරා ගනු ලැබ ඇත.



## ඩබ්ලිව්.අයි. තිසේරා මහතා
## මුදල් අමාත්‍යංශයේ නියෝජිත
## (නිල බලයෙන් පත් වූ සාමාජික)

අයිවන් තිසේරා මහතා 1982 වර්ෂයේ රජයේ ගණකාධිකාරීවරයෙකු වශයෙන් ඔහුගේ වෘත්තීය ජීවිතය ආරම්භ කළේය. ඔහු 1982 සිට 1993 දක්වා බදුල්ල කච්චේරියේ ගණකාධිකාරී ලෙස සේවය කර ඇත. 1993 දී නියෝජ්‍ය අධ්‍යක්ෂක වශයෙන් උසස් කරනු ලැබූ ඒ මහතා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරනු ලැබීය. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ සේවය කළ කාලය තුළ මුදල් කළමණාකරණය, ආදායම් ආදී විවිධ විෂය ක්ෂේත්‍රයන්හි සේවය කිරීමට ඔහුට අවස්ථාව ලැබී ඇත. එම කාලය තුළ ඔහු අදාළ කමිටුවේ සභාපති වරයා වශයෙන් රජයේ නිශ්චල වත්කම් කළමණාකරණයට අදාළව නව මගපෙන්වීම් මාලාවක් සකස් කර ඉදිරිපත් කළේය. ඊට අමතරව ඔහු ශ්‍රී ලංකා යුධ හමුදාවේ මූල්‍ය කළමනාකරණ ක්‍රමය පිළිබඳ සුපර්යාප්ත අධ්‍යයන වාර්තාවක් ද ඉදිරිපත් කළේය. 2000 ජනවාරි මාසයේදී තිසේරා මහතා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි (SLIDA) මූල්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයෙහි ජ්‍යෙෂ්ඨ උපදේශක සහ ප්‍රධානියා වශයෙන් පත් කරනු ලැබීය. 2004 දී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ උපාධි අපේක්ෂක අධ්‍යාපනයෙහි අදාළත්වය සහ තත්වය වර්ධනය කිරීමේ (IRQUE) ප්‍රතිසම්පාදන විශේෂඥ තනතුර ඒ මහතාට පිරිනමා ඇත. 2004 ඔක්තෝබර් මාසයේදී ජාතික ප්‍රතිසම්පාදන නියෝජිත ආයතනය ආරම්භ කළ විට තිසේරා මහතා එහි ධාරිතා වර්ධනය, පර්යේෂණ හා සංවර්ධන කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරයා වශයෙන් තෝරා ගන්නා ලදී. තිසේරා මහතා පොදු ප්‍රතිසම්පාදනය සම්බන්ධ දේශීය විශේෂඥභාවය වර්ධනය කිරීම සඳහා නව ඩිප්ලෝමා පාඨමාලාවක් හඳුන්වා දී ඇති අතර රාජ්‍ය නිළධාරීන් දහස් ගණනකට පුහුණුව ලබා දී ඇත. ජාතික ප්‍රතිසම්පාදන නියෝජිත ආයතනය වසා දැමීමෙන් පසු එහි කටයුතු රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට ආපසු මාරු කරන ලද අතර තිසේරා මහතා ප්‍රතිසම්පාදන කළමණාකරණය භාර අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල් වශයෙන් පත් කරනු ලැබීය. අනතුරුව 2011 ජනවාරි මාසයේ සිට ඔහු මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ විදේශ ආධාර සහ අයවැය අධීක්ෂණ දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් පත් කරනු ලැබ ඇත.

අයිවන් තිසේරා මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදී - ආර්ථික විද්‍යා(ගෞරව) [BA-Econ(Hons)] උපාධිධාරියෙකු වන අතර ඔහුගේ වාණිජ සහ ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති (Master of Commerce & Economics) උපාධිය ලබා ගෙන ඇත්තේ ඔස්ට්‍රේලියාවේ වොලෝන්ගොන්ග් විශ්ව විද්‍යාලයෙන්ය. ඔහු රාජ්‍ය මුදල් සහ සංවර්ධන ගණකාධිකරණ ආයතනයෙහි යාවජීව සාමාජිකයෙකි. දැනට ඒ මහතා ලංකා ගමනාගමන මණ්ඩලයේත්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේත්, සිවිල් ගුවන් සේවා අධිකාරියේත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරයි.

## කේ.වී.එන්. ජයවර්ධන මහතා



මහනුවර ශාන්ත අන්තෝනි විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා ඇති නිහාල් ජයවර්ධන මහතා 1983 වර්ෂයේ දී නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දී ඇත. 1990-91 අධ්‍යයන වර්ෂයේදී ගුවන් සහ අවකාශ නීතිය පිළිබඳ විශේෂඥභාවය ලබාගනිමින් අදළ පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසුව ඒ මහතාට ලන්ඩන් සරසවි විද්‍යාලයෙන් පොදු ජාත්‍යන්තර නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් (Master's Degree) පිරිනමා ඇත. 1998 සිට 2005 මැයි මාසය දක්වා නීතිපති දෙපාර්තුමේන්තුවේ ගුවන් නීතිය පිළිබඳ අධීක්ෂණ නිලධාරියා වශයෙන් කටයුතු කළ ජයවර්ධන මහතා සතුව ගුවන් සේවා නීතිය පිළිබඳ පුළුල් පළපුරුද්දක් ඇත. පෙර පැවති සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ නීති උපදේශකවරයෙකු වශයෙන් කටයුතු කළ ජයවර්ධන මහතා 2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත සහ 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත් කිරීමට සක්‍රිය ලෙස සහාභාගී විය. ඔහු, විවිධ විදේශ රාජ්‍යයන් සමග පවත්වන ලද ද්විපාර්ශවීය ගුවන් සේවා ගිවිසුම් නිගමනය කිරීමේ සාකච්ඡා වලදී ද ශ්‍රී ලංකා නියෝජිත පිරිසේ නීති උපදේශක වශයෙන් සහභාගී වී ඇත.

2004 දෙසැම්බර් මාසයේදී ජයවර්ධන මහතා මුල්වරට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීය. 2010 මාර්තු මාසයේ මොන්ට්‍රියල් හි පවත්වන ලද ඉහළ මට්ටමේ නිරුපද්‍රිතතා සම්මේලනයට සහභාගීවීමට සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ජයවර්ධන මහතා නම් කරන ලදී. අධිකාරියේ ප්‍රතිපත්ති සම්පාදකයිනට, ජාත්‍යන්තර වශයෙන් පිළිගත හැකි නෛතික රජයනයක්, ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් සුසංගත කිරීමේ දර්ශනය සහ සැලසුම් කරන ලද ක්‍රමෝපායයන් පිළිබඳ සමීප දැනුමක් ලබාදීමේ දීර්ඝකාලීන සැලසුමක මුල් පියවරක් වශයෙන් 2010 සැප්තැම්බර්-ඔක්තෝම්බර් කාලය තුළ පවත්වන ලද ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සම්මේලනයේ 37 වන මහා සභා රැස්වීමට සහභාගී වූ ශ්‍රී ලංකා නියෝජිත පිරිසේ සාමාජිකයෙකු වශයෙන් ද ජයවර්ධන මහතා නම් කරන ලදි.

තවදුරටත් ඔහු 1996 සිට රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිශෝධන කොමිසමේ නීති උපදේශක කණ්ඩායමේ සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කර ඇත. මෙම කණ්ඩායමේ සාමාජිකයෙකු වශයෙන්, 1996-2005 කාලය තුළ, රජය විසින් ක්‍රියාත්මක කරන ලද ජාතික ගුවන් ප්‍රවාහන සමාගම වූ එයාර් ලංකා සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම ඇතුළු රජයට කොටස් අයිතිය තිබුණු රාජ්‍ය ආයතන හා සමාගම් ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන් සියල්ලටම පාහේ ජයවර්ධන මහතා ද සහභාගී වීය. 2003 අප්‍රියෙල් මාසයේ ඔහු මෙහි නීති උපදේශක කණ්ඩායමේ නායකයා බවට පත් වී 2005 මැයි මාසයේ දී රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබන තුරු එම තනතුරෙහි සේවය කළේය.

1993 මැයි මාසයේ සිට ජයවර්ධන මහතා, 2007 අංක 07 දරණ සමාගම් පනත නීතිගත කිරීමට මුල් වූ සමාගම් නීති සංශෝධන ක්‍රියාවලියට සහභාගී වීය. නීති කෙටුම්පත් කිරීමේ කාර්‍යාවලියට ඔහුගෙන් ලැබුණු කැපී පෙනෙන දායකත්වය සැලකිල්ලට ගනිමින් ඒ මහතා 1998 අගෝස්තු මාසයේදී සමාගම් නීති උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීය. 2008 දෙසැම්බර් වන තුරු ඔහු එම තනතුරේ සේවය කර ඇත.

2005 මැයි මාසයේ දී රාජ්‍ය නීතිඥ වෘත්තියෙන් විශ්‍රාම ගැනීමෙන් පසු නැවත පෞද්ගලික නීතිඥ වෘත්තිය ආරම්භ කළේය.

ඔහු කොළඹ හිල්ටන් හෝටලය අයිති සී/ස හොටෙල් ඩෙවෙලොප්පර්ස් (ලංකා) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ද කටයුතු කරයි. ඔහු සී/ස මිල්කො (පෞද්) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ද, සී/ස ලංකා ස.තො.ස සමාගමේ අධ්‍යක්ෂ සහ ආරම්භක සභාපති වශයෙන් ද කටයුතු කර ඇත.

## සාකි අලීෆ් මහතා



සාකි අලිෆ් මහතා ස්ටැසන් සමූහ ව්‍යාපාරයේ (Stassen Group of Companies) අධ්‍යක්ෂවරයෙකි. ඔහු දඹදෙණියේ සංවර්ධන පදනමේ සභාපතිවරයා ද වේ. මීට අමතරව ඒ මහතා හම්බන්තොට සංවර්ධන පදනමේ කළමනාකරණ භාරකාර පදවිය ද දරයි.

## දිනේෂ් ගාල්ලගේ මහතා



දිනේෂ් ගාල්ලගේ මහතා මූලික අධ්‍යාපනය ලැබුවේ ගාල්ල මහින්ද විද්‍යාලයෙන්ය. ඔහුට මොරටුව විශ්ව විද්‍යාලයෙන් ලබාගත් ඉලෙක්ට්‍රෝනික සහ විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාවේදී (ගෞරව)- [BSc(Hons)] උපාධියක් ඇත. ඒ මහතා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) විසින් පිළිගන්නා ලද වරලත් ඉංජිනේරුවරයෙකි. ඔහු රුහුණු විශ්ව විද්‍යාලයේ MBA උපාධියක් ද සම්පූර්ණ කළේය.

දිනේෂ් ගාල්ලගේ මහතා ඔහුගේ වෘත්තීය ජීවිතය ආරම්භ කළේ නව තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ පර්යේෂණ ඉංජිනේරුවරයෙකු වශයෙන් 1999 වර්ෂයේදී ය. අනතුරුව ඔහු ජෛව වෛද්‍ය සේවා ඉංජිනේරුවරයෙකු වශයෙන් සී/ස ජෙනරල් සේල්ස් සමාගමට සම්බන්ධ වී ඇත. ඔහු දත්ත සන්නිවේදනය පිළිබඳ මූලික පුහුණුව සහ පළපුරුද්ද ලබාගෙන ඇත්තේ ඉංජිනේරුවරයෙකු වශයෙන් සී/ස සන්ටෙල් සමාගමේ සේවය කරන අතරතුරදීය.

2001 වර්ෂයේදී ඔහු සන්ටෙල් සමාගමෙන් ඉල්ලා අස්වී කලාපීය කළමණාකරුවකු වශයෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට බැඳී පසුව එම ආයතනයේ මෙහෙයුම් හා නඩත්තු කළමණාකරු වශයෙන් පත් කරනු ලැබ ඇත. 2008 වර්ෂයේදී ගාල්ලගේ මහතා එහි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වශයෙන් උසස් කරනු ලැබ ඇත. ඔහු දැනට එහි දකුණු පළාත භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වශයෙන් සේවය කරයි. ඔහු රුහුණු විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු අධ්‍යයනය අංශයෙහි බාහිර සාමාජිකයෙකි. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) බද්ධ සාමාජිකයෙකි.

# ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි පාලනය හා වගකීම

## අධිකාරියේ කාර්යය භාරය

**අධිකාරියේ ප්‍රධාන කාර්ය භාරයට අයත් කාර්යයන් අතර පහත සඳහන් දෑ ප්‍රමුඛත්වයක් ගනී.**

❖ සිවිල් ගුවන් සේවා අධිකාරියේ සැලසුම් තුළින් අමාත්‍යවරයාගේ සහ රාජ්‍ය අංශයේ හවුල් කරුවන් ගේ අදහස් පිළිබිඹු වන බවට සහතික වීම සඳහා අදාළ පාර්ශවයන් සමග අදහස් හුවමාරු කර ගැනීම.

❖ සිවිල් ගුවන් සේවා අධිකාරියේ රාජකාරි සහ කාර්යයන් ඉටු කළ හැකි සුදුසුකම් සහ නිපුණතා සහිත පුද්ගලයන් සේවයට බඳවා ගැනීම සහ ඔවුන්ගේ වේතන ඇතුළු සේවා කොන්දේසි නිශ්චය කිරීම.

❖ සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයෙහි ප්‍රතිපත්ති සහ ඉලක්ක පිහිටුවීම සහ සිවිල් ගුවන් සේවා අධිකාරියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා සංවිධානමය කාර්ය සාධනය අධීක්ෂණය කිරීම.

❖ නිශ්චිත අරමුණු ඉටු කර ගැනීම සඳහා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරි වෙත වගකීම් පවරා දීම.

❖ සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ අමාත්‍යවරයා වෙත වගකීම.

❖ අභ්‍යන්තර පාලන ක්‍රම පවත්වාගෙන යන බවට සහතික වීම.

## සංවිධාන ව්‍යුහය

ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී ඒ සඳහා පුළුල් පාරාශයක දැනුම අවශ්‍ය වන හෙයින් අධිකාරිය සමන්විත වන්නේ ව්‍යාපාරික, නෛතික සහ ගුවන් සේවා ආදී විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණ සහ හසල අත්දැකීම් සහිත සාමාජිකයන්ගෙනි. අධිකාරියට පත් කරනු ලැබූ පසු එම සාමාජිකයන් සියලු දෙනා අධිකාරියේ පරම යහපත උදෙසා එක්සත්ව සහ එකමුතුව කටයුතු කළ යුතු අතර අධිකාරිය විසින් ගනු ලබන තීරණ සම්බන්ධයෙන් සාමූහිකව වගකීම් දරමින් අධිකාරියේ පාලන කටයුතු පසුපස එක්සත්ව කටයුතු කළයුතු බවත් තනි තනිව පාලන කටයුතු කළ නොහැකි බවත් පිළිගත යුතුය.

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්වරයා පත් කරනු ලබන අතර ඔහු සිවිල් ගුවන් සේවා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා ද වන්නේය. මෙහෙතෙම අමාත්‍ය මණ්ඩලය විසින් නිගමනය කරනු ලබන රැකියා කොන්දේසි සහ නියමයන්ට යටත් වෙමින් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත යටතේ හෝ වෙනත් කිසියම් ලිඛිත නීතියක් යටතේ හෝ එම පනත මගින් හෝ එවැනි වෙනත් ලිඛිත නීතියක් මගින් හෝ ඔහුට පවරන ලද රාජකාරී හා කාර්යයන් ඉටු කළ යුතුය. අධිකාරියේ කාර්යයන් සම්බන්ධව සාමාන්‍ය පරිපාලනය ද ඔහු වෙත පැවරී ඇත. අධිකාරිය විසින් ප්‍රධාන විධායක නිලධාරීවරයාට බලතල හා රාජකාරි පවරා දෙමින් සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි අරමුණු ඉටු කර ගැනීම සඳහා ඔහු මෙහෙයවනු ලැබේ.

## අධිකාරියේ කමිටු

නිශ්චිත වූ කාර්යයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම පිණිස අධිකාරිය විසින් කාර්යය මණ්ඩල කමිටුව, මූල්‍ය කමිටුව, සැලසුම් කමිටුව, විගණන කමිටුව සහ සිවිල් ගුවන් සේවා සංවර්ධන සහ අධ්‍යාපන කමිටුව වශයෙන් හඳුන්වනු ලබන ස්ථාවර කමිටු (05) පිහිටුවා ඇත. අධිකාරිය විසින් නිශ්චය කරන ලද අරමුණු ඉටුකිරීම් වශයෙන් ලබා

ඇති ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ වගකීම එකිනෙක කමිටු වෙත පවරා ඇත.

## කාර්යය මණ්ඩල කමිටුව

**කාර්යය මණ්ඩල කමිටුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අධිකාරිය වෙත වගකීමට බැඳී ඇත.**

1) සංවිධාන ව්‍යුහයක් සම්මත කිරීම සහ අවශ්‍ය තන්හි, අවශ්‍ය අවස්ථාවන්හි එහි සංශෝධන සිදු කිරීම.
2) සේවක සංඛ්‍යාව සහ වැටුප් නිශ්චය කිරීම.
3) තෝරා ගැනීම්, බඳවා ගැනීම්, පත් කිරීම්, උසස් කිරීම්, තනතුරෙන් පහත දැමීම්, විශ්‍රාම ගැන්වීම්, සේවය අවසන් කිරීම් ආදී කාර්යය මණ්ඩලයට අදාළ කටයුතු.
4) කාර්යය මණ්ඩල විනය කටයුතු.
5) CAASL හි වාර්ෂික වැඩසටහන අධීක්ෂණය කිරීම.
6) CAASL සඳහා පරිපාලන රීති කාර්යය පටිපාටි විකාශනය කිරීම.
7) CAASL හි කාර්යය මණ්ඩලය සඳහා විනය කාර්යය පටිපාටි විකාශනය කිරීම.
8) CAASL සඳහා කාර්යාල කාර්යය පටිපාටි විකාශනය කිරීම.
9) CAASL හි කාර්යය මණ්ඩලයට ශිෂ්‍යත්ව ප්‍රධානය කිරීම.
10) සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලය සඳහා කාල පූර්ව විශ්‍රාම ගැනීම වෙනුවෙන් වන්දි යෝජනා ක්‍රම විකාශනය කිරීම.
11) CAASL හි කාර්යය මණ්ඩලය සඳහා සමාජ සහ සුභසාධන යෝජනා ක්‍රම විකාශනය කිරීම.

**කාර්ය මණ්ඩල කමිටුව සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි පහත නම් සඳහන් සාමාජිකයන්ගෙන් සැදුම් ලබයි.**

1. ජෙනරාල් රොහාන් ද සිල්වා දළුවත්ත - සභාපති
2. එච්.එම්.සී. නිමල්සිරි මහතා - DGCA/CEO
3. කේ.වී.එන්. ජයවර්ධන මහතා - සාමාජික

## මූල්‍ය කමිටුව

**මූල්‍ය කමිටුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අධිකාරිය වෙත වගකීමට බැඳී ඇත.**

1) වාර්ෂික අයවැය වැඩ සටහන සකස් කිරීම.
2) CAASL සඳහා මූල්‍ය රීති සහ කාර්යය පටිපාටි විකාශනය කිරීම.
3) උපකරණ පහසුකම් හෝ සේවා මිලදී ගැනීම් අධීක්ෂණය කිරීම
4) CAASL හි ආදායම් මාර්ග අධීක්ෂණය කිරීම සහ
5) CAASL හි සකසුරුවම් කළමණාකරණය

**මූල්‍ය කමිටුව සිවිල් ගුවන් සේවා අධිකාරියේ පහත නම් සඳහන් සාමාජිකයන්ගෙන් සැදුම් ලබයි.**

1. ජෙනරාල් රොහාන් ද සිල්වා දළුවත්ත (සභාපති)
2. එච්.එම්.සී. නිමල්සිරි මහතා - DGCA/CEO
3. ඩබ්ලිව්. අයි. තිසේරා මහතා (මුදල් අමාත්‍යංශයේ නියෝජිත)

## සැලසුම් කමිටුව

**සැලසුම් කමිටුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අධිකාරිය වෙත වගකීමට බැඳී ඇත.**

1) ජාතික සිවිල් ගුවන් සේවා ප්‍රතිපත්තිය විකාශනය කිරීම
2) ජාතික සිවිල් ගුවන් සේවා සංවර්ධන සැලසුමක් විකාශනය කිරීම
3) සිවිල් ගුවන් සේවාවට අදාළ මූලික සහ උපකාරක නීති සමාලෝචනය කිරීම හා අවශ්‍ය තන්හි සංශෝධන හඳුන්වා දීම
4) ජාතික සිවිල් ගුවන් සේවා සුරක්ෂිතතා වැඩ සටහන ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම
5) ජාතික ගුවන් ප්‍රවාහන සුසාධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම
6) සිවිල්-හමුදා සමායෝජනය අධීක්ෂණය කිරීම
7) ගුවන් සේවා මෙහෙයුම් අධීක්ෂණය කිරීම සහ
8) ගගන නාවික සේවා සැපයුම් කරුවන්ගේ කාර්යයන් අධීක්ෂණය කිරීම

අධිකාරියේ සාමාජිකයින් අට(08) දෙනාම සැලසුම් කමිටුවට ඇතුළත් වේ.

## විගණන කමිටුව

විගණන කමිටුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අධිකාරිය වෙත වගකීමට බැඳී ඇත.

1) අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම නිශ්චය කිරීම සහ වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කිරීම.

2) සංවිධානයේ සියලුම කාර්යයන් සඳහා වන අභ්‍යන්තර පාලන ක්‍රම සමාලෝචනය කිරීම හා ඇගයීම

3) පිරිවැය ඵලදායිතාවය ද, නාස්තිකර වියදම් වැළැක්වීම ද අරමුණු කර ගනිමින් සමාන කාල අන්තරයන් හිදී කාර්යය සාධනය සමාලෝචනය කිරීම.

4) බාහිර ගණන් පරීක්ෂකවරුන් සමග සම්බන්ධතාවය පැවැත්වීම සහ විගණකාධිකාරීගේ කළමණාකරණ ලිපි සම්බන්ධ පසු කටයුතු කිරීම.

5) ව්‍යවස්ථා, රෙගුලාසි, රීති හා චක්‍රලේඛ ආදියට අනුකූලව කටයුතු කරන්නේදැයි නිශ්චය කිරීම.

6) ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.

7) නිවැරදි කිරීම් ක්‍රියා මාර්ග ගැනීම සඳහා අභ්‍යන්තර විගණනය /බාහිර විගණන වාර්තා හා කළමනාකරණ ලිපි සමාලෝචනය කිරීම

8) රාජ්‍ය ව්‍යවසාය කමිටුවේ නිර්දේශ /නියෝග ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම

9) වාර්ෂික වාර්තාවට ඇතුල් කිරීම සඳහා කමිටුවේ සොයා ගැනීම් පිළිබඳ වාර්තාවක් සකස් කිරීම සහ

10) අධිකාරිය විසින් සකස් කරන ලෙස ඉල්ලා සිටි විට සියලුම විගණන කාර්යයන් සම්බන්ධව අධිකාරිය වෙත වාර්තා කිරීම.

විගණන කමිටුව පහත නම් සඳහන් සාමාජිකයන්ගෙන් සැදුම් ලබයි.

1. ඩබ්ලිව්.අයි. තිසේරා මහතා - මුදල් අමාත්‍යංශයේ නියෝජිත (සභාපති)
2. සරත් ජයසුන්දර මහතා (උප සභාපති)
3. දිනේෂ් ගාල්ලගේ මහතා (සාමාජික)
4. රොහාන් සෙනෙවිරත්න මහතා (ආරක්ෂක අමාත්‍යංශ ලේකම්ගේ නියෝජිත)
5. කේ.වී.එන්. ජයවර්ධන මහතා
6. එස්.එම්. චන්ද්‍රපාල මහතා (සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ නියෝජිත)

## සිවිල් ගුවන් සේවා සංවර්ධන සහ අධ්‍යාපන කමිටුව (CADEC)

සිවිල් ගුවන් සේවා කාර්යයන් පිළිබඳව පොදු ජනතාව තුළ ඇති දැනුම වර්ධනය කිරීම අරමුණු කර ගනිමින් විශේෂ වැඩසටහන් සැලසුම් කිරීම, විකාශනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි පහත නම් සඳහන් සේවකයින්ගෙන් සමන්විත සිවිල් ගුවන් සේවා සංවර්ධන හා අධ්‍යාපන කමිටුව පිහිටුවන ලද්දේ 2010 අගෝස්තු මාසයේදී ය. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී මෙම කමිටුවේ සභාපතිත්වය දරණ අතර ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂ (ඒකාබද්ධ) ඔහුට සහය වෙයි.

1. දේව් කව්සල සමරජීව මහතා - උප සභාපති
2. ගිම්හාන් දබරේරා මහතා - ලේකම්
3. මංජුලා වික්‍රමනායක මහත්මිය - භාණ්ඩාගාරික

### සාමාජිකයින්

4. දුලාංජලී මාපිටියගේ මහත්මිය
5. සී.එච්. කොඩිතුවක්කු මහත්මිය
6. නිලන්ත තෙන්නකෝන් මහතා
7. ටී.එම්.වයි.බී. තෙන්නකෝන් මහතා
8. ජී.ඊ. මිල්ලවිතානච්චි මහත්මිය
9. එම්.එච්.අයි.කේ. ගුණවර්ධන මහතා
10. එස්.පී.බී. වත්තේවැව මහතා
11. ආර්.එල්. තලගල මහතා

## හවුල්කරුවන් සමග සම්බන්ධතා පැවැත්වීම

විශේෂයෙන්ම සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමන්ගේ අපේක්ෂාවන් සම්බන්ධව දැනුවත්ව සිට ඒ අනුව කටයුතු කිරීම සඳහා හවුල්කරුවන් සමග සම්බන්ධතාව පවත්වා ගැනීම එහි වගකීම බව අධිකාරිය පිළිගත්තේ ය.

## අධිකාරියෙහි සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයෙහි වගකීම

අධිකාරියේත්, ප්‍රධාන විධායක නිලධාරී ප්‍රමුඛ එහි ජ්‍යෙෂ්ඨ කළමනාකාරණයේත් භූමිකාවන් පැහැදිලිව වෙන් කර තිබීම සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්‍යක්ෂමතාව පවත්වාගෙන යාමට උපකාරී වන ඉතා වැදගත් සාධකයකි.

අධිකාරිය ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග පිහිටුවීම කෙරෙහි අවධානය යොමු කරන අතර

ඉන් අනතුරුව අරමුණු කරා ළඟා වීමේ ප්‍රගතිය අධීක්ෂණය කරයි.

මෙම ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති හා උපායමාර්ග ක්‍රියාත්මක කිරීම පිළිබඳව ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සැලැකිලිමත්ව සිටියි.

ගුවන් සංතරණ පනත යටතේ හෝ එම පනත යටතේ පනවා ඇති රෙගුලාසි යටතේ හෝ වෙනත් කිසියම් ලිඛිත නීතියක් යටතේ හෝ සිවිල් ගුවන් සේවා අධ්‍යක්‍ෂ ජෙනරාල් වරයා වෙත පැවරී ඇති නිශ්චිත නියාමක කාර්‍යයන් සම්බන්ධ වගකීමක් අධිකාරියට නැත. අධිකාරිය ඉන් ඉවත් වී කටයුතු කරයි.

සිවිල් ගුවන් සේවා අධ්‍යක්‍ෂ ජෙනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරීවරයාට ලුහුඬින් සහ පූර්ණ වශයෙන් අධිකාරී බලය සහ වගකීම පවරා දී ඇති බවට සහතික වීමෙන් අධිකාරිය සිය කාර්යභාරය පැහැදිලිව ඉටු කරයි.

## වගකිව යුතු බව

උපායමාර්ගික අරමුණු කරා යන ගමනේ ප්‍රගතිය සමාලෝචනය කිරීමටත්, සිවිල් ගුවන් සේවා අධිකාරියේ කටයුතු අධිකාරියේ ප්‍රතිපත්ති සහ උපාය මාර්ගික මගපෙන්වීම් අනුව මෙන්ම එහි තුන් අවුරුදු ව්‍යාපාර සැලැස්මේ සඳහන් අපේක්ෂාවන්ට අනුවත් ඉටු කෙරෙන බව සහතික වීම සඳහාත් අධිකාරියේ රැස්වීම් සහ එහි කමිටු රැස්වීම් නිතිපතා පවත්වනු ලැබේ.

## බැඳියා පිළිගැටුම්

අධිකාරිය සම්බන්ධකම් ලේඛනයක් පවත්වාගෙන යමින් එහි සාමාජිකයින් තම තමන්ගේ විවිධාකාර වූ පිටස්තර සම්බන්ධකම් හෙළිදරව් කර ප්‍රකාශ කිරීමට ඇති වගකීම ගැන දැනුවත්ව සිටින බවට සහතික වෙයි. කාර්යය මණ්ඩලය සඳහා ද මෙවැනි සම්බන්ධකම් ලේඛනයක් පවත්වාගෙන යනු ලැබේ.

## අභ්‍යන්තර විගණනය

අධිකාරියේ කාර්යයන් අතරින් බොහෝමයක් පවරා දී ඇති අතර ඵලදායි සංවිධාන පාලන ක්‍රම පවත්වාගෙන යාමේ අවසාන වගකීම අධිකාරිය මතම රඳා පවතී.

අභ්‍යන්තර පාලන ක්‍රම අතරට අධිකාරියේ නිශ්චිත අරමුණු ඉටු කර ගැනීම සඳහා පිහිටුවා ඇති ප්‍රතිපත්ති, ක්‍රම සහ කාර්යය පටිපාටි ද ඇතුළත් වේ. අධිකාරිය හා ජ්‍යෙෂ්ඨ කළමණාකරණය මෙම වාර්තාවේ ඇතුළත් වී ඇති වගකීම් ප්‍රකාශය අත්සන් කිරීම මගින් ඔවුනොවුන්ගේ වගකීම පිළිගෙන ඇත.

සිවිල් ගුවන් සේවා අධිකාරියේ එකිනෙක අංශ වල අභ්‍යන්තර පාලන ක්‍රම අධීක්ෂණය කිරීමේ වගකීම දරණ අභ්‍යන්තර විගණන අංශයක් අධිකාරිය සතුව ඇත. සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ඉටු කරනු ලබන සියලුම සේවාවන්හි තත්වය පිළිබඳවත්, අධිකාරියට වාර්තා කරනු ලබන මූල්‍ය සහ අනෙකුත් තොරතුරු වල විශ්වාසවන්ත භාවය පිළිබඳවත් මෙම අංශය විසින් නිරීක්ෂණය කරනු ලැබේ.

අභ්‍යන්තර විගණන අංශය කළමණාකරණයෙහි බලපෑමකින් තොරව ස්වාධීනව කටයුතු කරන අතර ඔවුන්ගේ සොයා ගැනීම් සම්මත මාර්ග ඔස්සේ කෙලින්ම සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී (DGCA/CEO) වෙතත් විගණන කමිටුව වෙතත් වාර්තා කරනු ලැබේ.

## ව්‍යවස්ථාමය අවශ්‍යතාවන්ට අනුකූල වීම

තම සංවිධානය සියලුම ව්‍යවස්ථාමය අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කරන බවට සහතික වීම සිය වගකීම වන බව අධිකාරිය පිළිගනියි. විශේෂයෙන්ම තමන්ට අදාළ වන ව්‍යවස්ථාමය අවශ්‍යතාවයන් පිළිබඳව කාර්යය මණ්ඩලයේ සියල්ලන් මනා අවබෝධයකින් සිටින බව සහතික කර ගැනීම සඳහා එවැනි අනුවෘත්‍යය පිළිබඳ ගැටළු ක්‍රමානුකූලව හඳුනා ගැනීම පිණිස උචිත වැඩ පිළිවෙලක් විකාශනය කර ක්‍රියාත්මක කිරීමේ වගකීම අධිකාරිය විසින් ජ්‍යෙෂ්ඨ කළමණාකරණය වෙත පවරා ඇත.

රජයේ සංවිධාන/දෙපාර්තමේන්තු විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ සහ/හෝ විධාන අධිකාරියේ කටයුතු සම්බන්ධයෙන් අදාළ කර ගනු ලබන්නේ එකින් එක ගෙන වෙන වෙනම සළකා බලන පදනම මත අධිකාරිය විසින් නිශ්චය කරනු ලබනතාක් දුරකට පමණකි. එහෙයින් අධිකාරිය අදාළ චක්‍රලේඛයෙහි අන්තර්ගතය පරීක්ෂා කර එහි අඩංගු නියෝග /විධාන කොතෙක් දුරට අදාළ කර ගත යුතුද යන්න තීරණය කරනතාක් රජයේ දෙපාර්තමේන්තු විසින් නිකුත් කරනු ලබන එකිනෙක චක්‍රලේඛ එසැනින්ම අධිකාරියෙහි කළමණාකරණයට අදාළ කර ගැනීමක් සිදු නොකරනු ඇත.

## අචාර ධර්ම

ආචාර ධර්ම රීති සංග්‍රහයක් සකස් කර හඳුන්වා දී ඇති අධිකාරිය එහි කාර්ය මණ්ඩලය සෑම කල්හිම උසස් මට්ටමේ සදාචාර සම්පන්න හැසිරීම් පවත්වාගෙන

යන්නේ ද යන්නත් "යහපත් සංස්ථා පාලනය" කට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නේ ද යන්නෙන් නිරතුරුව නිරීක්ෂණය කරයි. සම්මත ආචාර රීති සමග අනුවෘකාශය පවත්වා ගැනීම අධීක්ෂණය කරනුයේ සේවකයින්ට විරුද්ධව ලැබෙන පැමිණිලි සහ විනය පරීක්ෂණ ආදියෙහි උපනතීන් පිළිබඳව විමසිලිමත් වීම, අභ්‍යන්තර විගණන වාර්තා හෝ ආචාර රීති සංග්‍රහයේ ඇතුළත් ප්‍රතිපත්ති කඩ කිරීම් පිළිබඳ පැමිණිලි හෝ පරීක්ෂා කිරීම් ආදී ක්‍රම උපායයන් මගිනි.

යහපත් සංස්ථා සාමාජිකත්වය යනුවෙන් අදහස් කරනුයේ සමස්ත සේවක පිරිස ඇතුළු අධිකාරියෙහි තම සංවිධානයෙනුත් එය නිරත වී සිටින කර්මාන්තයෙනුත් බැහැර වූ තවත් ප්‍රජාවන් ගණනාවක සාමාජිකයෙකු වන බව පිළිගනිමින් එකී ප්‍රජාවන්ට අයත් සියලුම සාමාජිකයින්ගේ පිළිගත් අයිතිවාසිකම්, වගකීම් සහ සමාජ චාරිත්‍ර ආදියට ගරු කරමින් ඊට අනුකූලව කටයුතු කිරීමට කැප වීමයි.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි (CAASL) පාලනය හා වගකීම

# ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

## ඉදිරි දැක්ම

ජාතික ආර්ථික වර්ධනය උදෙසා ප්‍රධාන උත්ප්‍රේරකයෙකු බවට පත් වීම.

## මෙහෙවර

උපාය මාර්ගික සැලසුම්කරණය සහ ප්‍රබලකර පාලනය මගින් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ නිර්දේශිත පරිචයන්ට අනුකූල, නිරුපද්‍රිත, සුරක්ෂිත සහ කාර්යක්ෂම ජාතික සිවිල් ගුවන් සේවා කර්මාන්තයක් මෙහෙයවීම සුසාධනය කිරීම.

## ආදර්ශ පාඨය

"සැමට නිරුපද්‍රිත අහසක්"

## දර්ශනය

ශ්‍රී ලංකාවට අයත් ගුවන් තලය ශ්‍රී ලංකාවේ අනාගත පරම්පරාවේ ප්‍රගතිය සහ සුභසිද්ධිය සඳහා කළමණාකරණය කළ යුතු පොදු වස්තුවකි.

## අරමුණු

» CAASL විසින් නිශ්චය කරනු ලබන නිරුපද්‍රිතතා ප්‍රතිඵල හා සම්බන්ධ ඉලක්ක ඉටුකර ගැනීම

» අවශ්‍ය සම්පත් ලබා ගැනීම

» වෘත්තීය භාවයට සහ නිපුණත්වයට පත්වීම

» පතළ විශ්වාසය හා පිළිගැනිම දිනා ගැනීම

» එහි සාධනයන් නොකඩවා පවත්වාගෙන යාම සහ

» සිවිල් ගුවන් සේවා කර්මාන්තය සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීමේ කාර්යයන් උදෙසා ශක්තිමත් සුසාධකයෙකු බවට පත්වීම.

## උපාය මාර්ග

» වඩා හොඳින් සහ යථායෝග්‍ය ලෙස ව්‍යවස්ථාපිත කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ සමාජ බැඳීම් ඉටු කිරීම

» සැලකිය යුතු ගුවන් සේවා ගැටළු සඳහා විසඳුම් හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම

» විශේෂිත වූ පිළිවෙත් වෙනස් කිරීමේ නව ප්‍රවේශ හඳුන්වා දීම

» ගුවන් සේවා කර්මාන්තය සමග සහයෝගයෙන් සහ හවුලේ කටයුතු කිරීම.

» විනිවිද භාවයෙන් යුක්තව කටයුතු කිරීම සහ ඵලදායි අභ්‍යන්තර සහ බාහිර සංදේශනයන් පැවැත්වීම සහ

» සියලුම ලිපි ලේඛන, උපකරණ සහ අභ්‍යන්තර කාර්යය පටිපාටි වල ප්‍රබලකර භාවය සහ අදාළත්වය පවත්වාගෙන යාම

## සාරධර්ම

අධිකාරිය සහ එහි කාර්යය මණ්ඩලය:

» නිරුපද්‍රිතතාවයට ඉහළම ප්‍රමුඛත්වය ලබා දෙමින් නිරුපද්‍රිතතා පිළිවෙත් කෙරෙහි අනුග්‍රහය දක්වනු ඇත.

» CAASL හි සේවා ලාභීන්ට සපයන සේවාවන් හිදී විශිෂ්ඨයන් වනු ඇත.

» භාරගන්නා සියලුම කාර්යයන් හිදී "කළ හැකිය" යන ආකල්පයෙන් කටයුතු කරනු ඇත.

» යථාර්ථවාදී සහ විශ්වාස කටයුතු පුද්ගලයින් බවට පත් වීම අරමුණු කරනු ඇත.

» අඛණ්ඩ වර්ධනය සොයා යාමේදී වෙනස් වීමට කැමැත්ත සහ හැකියාව ඇති කර ගනු ඇත.

» සාර්ථකත්වය ළඟා කර ගැනීම සඳහා එක්ව වැඩ කරනු ඇත.

» විවෘතව, අවංකව හා විනිවිද භාවයෙන් යුක්තව කටයුතු කරනු ඇත.

» සෑම කටයුත්තකදීම කාර්යක්ෂමතාව සහ ක්‍රමවත් භාවය පවත්වා ගනු ඇත.

- සගයන්ට ගරු කිරීමෙන් සහ ඔවුන් විශ්වාස කිරීමෙන් කණ්ඩායමක් ලෙස කටයුතු කරනු ඇත.
- සැමගේ දායකත්වය අගය කරනු ඇත.
- සමාජ වගකීම් හා බැඳීම් හඳුනා ගනු ඇත.
- කරනු ලබන කාර්යයන්ගෙන් සතුට ලබනු ඇත.
- වෘත්තීය ප්‍රවේශය පිළිබඳව ආඩම්බර වනු ඇත.
- රාජකාරී පරිසරයත් ගෘහ ජීවිත පරිසරයත් තුලනය කර ගනු ඇත.

## CAASL හි ආසන්න ඉලක්ක

- වාණිජ ගුවන් සේවා අංශයෙහි මාරක අනතුරු වැළැක්වීම.
- ගුවන් යානා බලහත්කාරයෙන් පැහැර ගැනීම් සහ ගුවන් සේවා කාර්යයන්හි නීති විරෝධී ලෙස මැදිහත් වීම් වැළැක්වීම.
- පොදු ගුවන් සේවා අනතුරු වැළැක්වීම.
- ගුවන් තොටුපොළ භූමිය මත සිදුවන මාරක අනතුරු වැළැක්වීම.
- ඉංජිනේරු /නඩත්තු වැඩපොළ තුළ සිදු වන අනතුරු අඩු කිරීම.
- වාණිජ පියසර අනපේක්ෂිත සිදුවීම් අනුපාතය පියසර පැය 10,000 ට 1 ප්‍රමාණයෙන් පහත හෙලා පවත්වා ගැනීම.
- පොදු ගුවන් සේවා පියසර අනපේක්ෂිත සිදුවීම් අනුපාතය පියසර පැය 5000 ට 1 ප්‍රමාණයෙන් පහත හෙළීම.
- පියසර පාසල්හි පියසර අනපේක්ෂිත සිදුවීම් අනුපාතය පියසර 10,000ට 1 ප්‍රමාණයෙන් පහත හෙළීම.
- භූමි සහාය සහිත වාණිජ පියසර අනපේක්ෂිත සිදුවීම් ප්‍රමාණය පියසර පැය 20,000 ට 1 ප්‍රමාණයෙන් පහත හෙළීම.
- භූමි සහාය සහිත පොදු ගුවන් සේවා පියසර අනපේක්ෂිත සිදුවීම් ප්‍රමාණය පියසර 10,000 ට 1 ප්‍රමාණයෙන් පහත හෙළීම.
- ගුවන් ගමන් සේවා (ATS) සහය සහිත පියසර අනපේක්ෂිත සිදුවීම් අනුපාතය පියසර 50,000 ට 1 ප්‍රමාණයෙන් පහත හෙළීම.
- "නියමිත වෙලාවට" පිටත්වීම් හි සිදුවන ප්‍රමාද අවම කිරීම.
- ගුවන් ගමන් යාම සාමාන්‍ය පංතියේ පුද්ගලයන්ට ඔරොත්තු දෙන තත්වයට පත් කිරීම.
- ගුවන් ගමන් වලදී සැපයෙන සේවාවන්හි තත්වය දියුණු කිරීම.
- ආරක්ෂක අවශ්‍යතා සිහි තබා ගනිමින් ගුවන් තොටුපොළ තුළ සිදුවන තදබදය අවම කිරීම සහ මගීන් හැසිරවීමේ කටයුතු කඩිනම් කිරීම.
- ගුවන් ප්‍රවාහනයෙහි මෙහෙයුම් පිරිවැය අවම කිරීම සහ නාස්තිය නැති කිරීම සහ
- ගුවන් සේවාවෙන් පරිසරයට එල්ලවන අහිතකර බලපෑම් අවම කිරීම.

## ප්‍රතිඵල

- රාජ්‍යය වෙත පැවරී ඇති සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයට අදාළ ජාත්‍යන්තර බැඳීම් ඉටුකිරීම සහ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් නිතිපතා ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම.
- සම්භාධක /සීමා පැනවීම් රහිත ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා පද්ධතිය ජාත්‍යන්තර පිළිගැනීමට ලක්වීම.
- සිවිල් ගුවන් සේවාවෙහි නිරුපද්‍රිතතාව, සුරක්ෂිතතාවය, කාර්යක්ෂමතාවය සහ ක්‍රමවත්භාවය වර්ධනය වීම සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ගුවන් ප්‍රවාහන පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය ඇති වීම.
- ශ්‍රී ලංකා ගුවන් තලය ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ යහපත උදෙසා උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීම.
- රටේ සමාජ ආර්ථික සංවර්ධනය.
- අහේතුක තරඟකාරීත්වය නිසා ඇතිවන ආර්ථික අපතේ යාම් වැළැක්වීම.
- පුද්ගලයින්ගේ හා භාණ්ඩ වල පිවිසුම හා චලනය වැඩි දියුණු කිරීම.
- සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රය තුළ විශ්වාසය තැබිය හැකි සේවා සැපයීම.
- සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයෙහි අධ්‍යාපනය.
- සිවිල් ගගන නාවික කාර්යයන්හි සියලු අංශ කෙරෙහි අනුග්‍රහය දැක්වීම.
- පොදු සෞඛ්‍ය ආරක්ෂා කිරීම සහ වැඩි දියුණු කිරීම.
- ප්‍රබලකර නියාමනයක් හා නීති ක්‍රියාත්මක කිරීමක් සඳහා අවශ්‍ය ඊට උචිත නීතිමය රාමුවක් සකස් කිරීම.
- පරිසර සංරක්ෂණය.

## ප්‍රතිදාන

| ප්‍රතිදාන වර්ගය | | ප්‍රතිදානය |
|---|---|---|
| ප්‍රතිපත්ති උපදෙස් | • | රජයට හා වෙනත් සංවිධානයන්ට උපදෙස් දීම |
| | • | ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ |
| | • | රීති විකාශනය |
| | • | ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති විකාශනය සහ පළකිරීම |
| | • | ගුවන් සේවා ප්‍රතිපත්ති විකාශනය |
| | • | කාර්ය පටිපාටි අත්පොත් විකාශනය |
| | • | ගුවන් සේවා යටිතල පහසුකම් පිළිබඳ මනා සැලසුම් සකස් කිරීම |
| නිරුපද්‍රිතතා තක්සේරුව සහ සහතික කිරීම | | පහත සඳහන් කරුණු වලට අදාළ අවදානම් කළමණාකරණය: |
| | • | ගුවන් තොටුපොළ, ගුවන් පිටිය අංශයෙහි නිරුපද්‍රිතතාව |
| | • | ගුවන් සාමාගම් අංශයෙහි නිරුපද්‍රිතතාව |
| | • | පොදු ගුවන් සේවා අංශයෙහි නිරුපද්‍රිතතාව |
| | • | පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමේ නිරුපද්‍රිතතාව |
| | • | පියසර පුහුණු නිරුපද්‍රිතතාව |
| | • | ගුවන් යානා නඩත්තු නිරුපද්‍රිතතාව |
| | • | ගුවන් සේවා අංශයෙහි නිරුපද්‍රිතතා අවදානම් කළමණාකරණය |
| නිරුපද්‍රිතතා විශ්ලේෂණය, තොරතුරු සහ අනුග්‍රහය | • | නිරුපද්‍රිතතා විමර්ශනය |
| | • | නිරුපද්‍රිතතා විශ්ලේෂණය |
| | • | නිරුපද්‍රිතතා තොරතුරු, අධ්‍යාපනය සහ අනුග්‍රහය |
| | • | ගුවන් යානා අනතුරු සහ සිදුවීම් විමර්ශනය සහ නිරුපද්‍රිතතා නිර්දේශ ක්‍රියාත්මක කිරීම |
| බලය පැවරීම | • | ගුවන් සමාගම් උපලේඛන අනුමත කිරීම |
| | • | ගුවන් ගමන් ගාස්තු අනුමත කිරීම |
| | • | සංචාරක නියෝජිතයන් සහතික කිරීම |
| | • | ගුවන් යානා ලියාපදිංචි කිරීම |
| | • | ගුවන් යානා අමතර කොටස් ආනයනය සඳහා බලය දීම |
| | • | උස් ගොඩනැගිලි/නිර්මාණ සඳහා අවසර දීම |
| | • | පොදු අලෙවි නියෝජිතයන්ට බලය පැවරීම |
| | • | ජාත්‍යන්තර මෙහෙයුම් සඳහා දේශීය ගුවන් ප්‍රවාහන සමාගම් නම් කිරීම |
| සුරක්ෂිතතා තක්සේරුව | • | සිවිල් ගුවන් සේවා අංශයෙහි සුරක්ෂිතතා අවදානම් කළමණාකරණය |
| බලාත්මක කිරීම | • | නීති කඩකිරීම් කෙරෙහි දක්වන ප්‍රතිචාර |
| | • | පොදු සෞඛ්‍යය සහ සනීපාරක්ෂක අවශ්‍යතා බලාත්මක කිරීම |
| රජයට සහාය වීම | • | ගුවන් සමාගම් වෙතින් නැව් නැගීමේ ගාස්තු අය කර දීම |

### නියාමන විෂය ක්ෂෙත්‍රය

2012 වර්ෂයේ අවසානය වන විට සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි නියාමන විෂය ක්ෂෙත්‍රය පහත සඳහන් පරිදි විය:-

| නියාමන ක්ෂෙත්‍රය | 2012 | 2011 | වැඩිවීම (%) |
|---|---|---|---|
| **ගුවන් තොටුපොළ** | | | |
| දේශීය භූමි ගුවන් තොටුපොළ | 12 | 12 | - |
| දේශීය ජලාශ ගුවන් තොටුපොළ | 15 | 15 | - |
| ජාත්‍යන්තර ගුවන් තොටුපොළ (RMA සමග) | 02 | 02 | - |
| ජාත්‍යන්තර ගුවන් තොටුපොළ (ගොඩ නගමින් පවතින) | 01 | 01 | - |
| **ගුවන් ප්‍රවාහන සමාගම්** | | | |
| දේශීය ගුවන් ප්‍රවාහන සමාගම් | 08 | 08 | - |
| ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සමාගම් | 30 | 28 | 07% |
| **පුහුණු සංවිධාන** | | | |
| පියාසර පාසල් | 06 | 06 | - |
| ඉංජිනේරු/නඩත්තු පාසල් | 03 | - | - |
| ගුවන් ගමන් සේවා ආශ්‍රිත | 01 | 01 | - |
| **ගගන නාවික සේවා සැපයුම්කරුවන්** | | | |
| ගගන යාත්‍රාංගන | 01 | 01 | - |
| ගුවන් ගමන් සේවා | 01 | 01 | - |
| ගගන නාවික සේවා භූමි ආධාරක | 01 | - | - |
| ගගන නාවික විදුලි සංදේශ සේවා | 01 | - | - |
| ගුවන් සේවා සුරක්ෂිතතා සේවා | 01 | - | - |
| බිම් මෙහෙවර සේවා | 01 | - | - |
| ආහාර පාන සැපයුම් සේවා | 01 | - | - |
| ගුවන් යානා සඳහා ඉන්ධන සහ ලිහිසි තෙල් සැපයුම | 01 | - | - |
| **ගුවන් යානා** | | | |
| අති සැහැල්ලු ගුවන් යානා | 02 | - | - |
| සැහැල්ලු ගුවන් යානා | 08 | 08 | - |
| මධ්‍යම ප්‍රමාණයේ ගුවන් යානා | 03 | 03 | - |
| බර ගුවන් යානා | 32 | 27 | 18.5% |
| හෙලිකොප්ටර් යානා | 07 | 06 | 16.67% |
| උණු වා බැලුන | 07 | 07 | - |

| නියාමන ක්ෂෙත්‍රය | 2012 | 2011 | වැඩිවීම (%) |
|---|---|---|---|
| **පියසර පුහුණු උපක්‍රමික** | | | |
| දේශිය අනුකාරක (simulators) | 01 | - | |
| විදේශ පාදක අනුකාරක | 06 | 11 | -45.45% |
| **පුද්ගලයින්** | | | |
| ආධුනික ගුවන් නියමු බලපත්‍රධාරීන් | 202 | 177 | 14.12% |
| පෞද්ගලික ගුවන් නියමු බලපත්‍රධාරීන් | 146 | 127 | 14.96% |
| වාණිජ ගුවන් නියමු බලපත්‍රධාරීන් | 325 | 270 | 20.37% |
| ගුවන් ප්‍රවාහන ගුවන් නියමු බලපත්‍රධාරීන් | 319 | 371 | -14.01% |
| ගුවන් ගමන් පාලක බලපත්‍රධාරීන් | 76 | 60 | 26.6% |
| ගුවන් යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍රධාරීන් | 175 | 283 | -38.16% |
| ගුවන් යානා නඩත්තු බලපත්‍රධාරීන් | 397 | 265 | 49.81% |
| පියසර පිටත් කරන්නා බලපත්‍රධාරීන් | 175 | 175 | - |
| ගගන නාවික ස්ථාන මෙහෙයුම්කරු බලපත්‍රධාරීන් | 04 | 04 | - |
| මැදිරි සේවක පිරිස් සාමාජික සහතික දරන්නන් | 1134 | 1013 | 11.09% |
| පියසර උපදේශකවරුන් | 20 | 15 | 33.33% |
| සහකාර පියසර උපදේශකවරුන් | 17 | 16 | 6.25% |
| භූමි උපදේශකවරුන් | 22 | 22 | - |
| පියසර පරීක්ෂකවරුන් | 08 | 08 | - |
| නම් කරන ලද පරීක්ෂක නියමුවන් | 32 | 27 | 18.51% |
| නම් කරන ලද ගගන නාවික වෛද්‍ය පරීක්ෂකවරුන් | 06 | 06 | - |
| සහතික කරන ලද ගුවන් සේවා සුරක්ෂිතතා නිවාරකයින් | 470 | - | - |
| **ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරුවන්** | | | |
| ගෝලීය බෙදාහැරීමේ සේවා සැපයුම්කරුවන් | 04 | 04 | - |
| ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරුවන් (බලපත්‍ර කාණ්ඩය A) | 425 | 356 | 19.38% |
| ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරුවන් (බලපත්‍ර කාණ්ඩය B) | 25 | 49 | -48.97% |
| පොදු වෙළද නියෝජිතයන් | 32 | 28 | 14.28% |
| **උස් ගොඩනැගිලි/නිර්මාණ** | | | |
| විදුලි සංදේශ කුළුණු | 5871 | 5220 | 12.47% |

# මෙහෙයවීම හා කළමණාකරණය

## අධිකාරිය හා එහි කමිටු

### අධ්‍යක්ෂ මණ්ඩලය

ගරු සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා 2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ විධිවිධාන ප්‍රකාර සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩලය පත් කළේය. ජෙනරාල් රොහාන් ද සිල්වා දළුවත්ත සහ ජේ.එම්.එස්.ඩබ්ලිව්. ජයසුන්දර මහතා පිළිවලින් එහි සභාපති සහ උප සභාපති වශයෙන් පත් කරන ලදී.

### CAASL රැස්වීම්

සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් එහි රැස්වීම් දොළහක්(12) පවත්වන ලද අතර අධිකාරියේත්, අධිකාරිය විසින් නියාමනය කරනු ලබන සිවිල් ගුවන් සේවා කර්මාන්තයේත් ප්‍රගතිය හා යහපත උදෙසා යෝජනා එකසිය හැට නවයක්(169) සම්මත කරන ලදී. සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ කාර්ය මණ්ඩල කමිටු රැස්වීම් දෙකකුත්(02) විගණන කමිටුව රැස්වීම් අටකුත්(08) පවත්වා ඇත.

## ජ්‍යෙෂ්ඨ කළමනාකරණය

### ශ්‍රී ලංකා ගුවන් සේවාවේ ශත සංවත්සර උත්සවය

පසුගිය වසරේ(2012) ශ්‍රී ලංකාව එහි සිවිල් ගුවන් සේවාවට වසර සියයක්(100) සම්පූර්ණ වීමේ ඓතිහාසික කඩඉම පසු කළේය. ප්‍රථම වරට ශ්‍රී ලංකාව තුළට ගුවන් යානයක් ගෙනවුත් ඇත්තේ 1911 සැප්තැම්බර් 12 වනදා බව ඓතිහාසික වාර්තාවන්හි සඳහන් වේ. ශ්‍රී ලංකාවට නැවකින් ගෙනවුත් ඇති මෙම ගුවන් යානය "බ්ලෙරියොට් මොනොප්ලේන්" (Bleriot Monoplane) වර්ගයේ ආසන දෙකේ යානයකි. මෙම ගුවන් යානය පළමුව 1911 දෙසැම්බර් මාසයේදීත් පසුව කිහිප අවස්ථාවකදීත් කඩින් කඩ පියාසර කර ඇති නමුත් ප්‍රථම වරට පවත්වා ගත හැකි සාර්ථක පියසරයක යොදවා ඇත්තේ 1912 දෙසැම්බර් 07 වන දින ප්‍රංශ ජාතිකයින් දෙදෙනෙකු විසිනි. එදා පටන් වසර 100 ක් ගතවී ඇති අද ශ්‍රී ලංකාව උසස් නිරුපද්‍රිතතා වාර්තාවක් ද සහිත සැහෙන දුරකට වැඩුනු ගුවන් සේවා පද්ධතියක් සාක්ෂාත් කර ගැනීමට සමත් වී ඇත.

ගරු සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමන්ගේත්, සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේත් මග පෙන්වීම යටතේ ක්‍රියාත්මක කරන ලද සක්‍රිය වැඩ සටහනක් මගින් වසර 100 ක් පිරුණු ශ්‍රී ලංකා ගුවන් සේවා ඉතිහාසයේ ජයග්‍රහණ හා අතීත සිදුවීම් යළි සිහි ගන්වමින් ඒ සියල්ල උත්සවාකාරයෙන් සමරන ලදි. මීට ගුවන් සේවා හා වෙනත් අදාළ ආශ්‍රිත කර්මාන්ත හවුල් කරුවන්ගේ සහභාගීත්වය නොමදව ලැබිණි. සමස්ත වැඩසටහනම සංවිධානය කරමින් මෙහි මූලික කාර්යභාරය උසුලන ලද්දේ සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ය.

කපිතාන් එල්මෝ ජයවර්ධනගේ කර්තෘත්වයෙන් ගුවන් සේවා ඉතිහාසයේ වැදගත් අවස්ථා සහ වර්තන ලක්ෂ්‍යයන් සිහිගැන්වූ "A Centenary Sky" නැමැති ග්‍රන්ථය මුද්‍රණය කර තුටු පඬුරු වශයෙන් බෙද දීමත්, ශ්‍රව්‍ය/දෘශ්‍ය සංගීතමය වැඩසටහනක් සහ ගුවන් සේවා ඉතිහාසය පිළිබඳ වාර්තා චිත්‍රපටයක් එළිදැක්වීමත් මෙම වැඩසටහනට ඇතුළත් විය. මීට අමතරව පාසල් සිසුන් සහ පොදු මහජනයා සඳහා චිත්‍ර තරගයක් ද පවත්වන ලද අතර ඊට චිත්‍ර 2000කට අධික සංඛ්‍යාවක්

ඉදිරිපත් වී තිබිණ. මුද්‍රිත, ගුවන් විදුලිය සහ රූපවාහිනී මාධ්‍ය හරහා භාෂා තුනෙන්ම ප්‍රචාරක වැඩ සටහන් මාලාවක් ද ක්‍රියාත්මක කරන ලදි. 2012 දෙසැම්බර් 07 වන දින ප්‍රධාන අමුත්තා වශයෙන් අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ සහභාගිත්වය සහිතව අරලිය ගහ මන්දිරයේ දී පවත්වන ලද ප්‍රධාන උත්සවය මෙම වැඩසටහනෙහි උච්චතම අවස්ථාව වීය. ගරු සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමන් ද ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන් ද අමාත්‍යංශයේ කාර්‍ය මණ්ඩලය සමග ඊට සහභාගී වූහ. උත්සවයට සහභාගී වූවන් 1500කට අධික සංඛ්‍යාවක් අතරට ගුවන් සේවා කර්මාන්ත හවුල්කරුවන් ද වෙනත් ආරාධිතයින් ද ඇතුළත් වීය. රටේ අනාගතයත් එහි ගුවන් සේවාවේ අනාගතයත් භාර ගැනීමට සිටින පාසැල් සිසුහු 800ක් ද ඊට සහභාගී වූහ. වීඩියෝ දර්ශන, පාසැල් සිසුන්ගේ කථා, සැමරුම් මුද්දර හතරක්(04) නිකුත් කිරීම සහ ජනාධිපති තුමන්ට සමරු තිළිණයක් පිළිගැන්වීම උත්සවය වර්ණවත් කළ අංග වීය. මීට අමතරව ශත සංවත්සරය වෙනුවෙන් පුවත්පත් අතිරේකයක් ද, සිහිවටනයක් සහ "ගුවන්සර" සඟරාවේ විශේෂ කළාපයක් ද මුද්‍රණය කර බෙදා හරින ලදි.

# අනතුරු විමර්ශන ඒකකය

සමස්ථයක් වශයෙන් ගුවන් යානා අනතුරු විමර්ශන පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා ඉහළ වැදගත් කමකින් යුත් පියවර ගණනාවක් අනතුරු විමර්ශන ඒකකය විසින් ක්‍රියාත්මක කරන ලදී. මෙම ක්‍රියාවලිය ඇතුළත, ගරු අමාත්‍ය තුමන් විසින් පනවන ලද 2012 - ගුවන් යානා අනතුරු සහ සිදුවීම් විමර්ශන රෙගුලාසි පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ද ලැබුණි. මෙම රෙගුලාසි 2010 අංක 14 දරණ නව සිවිල් ගුවන් සේවා පනත යටතේ පනවන ලද ප්‍රථම රෙගුලාසි කාණ්ඩය වේ.


ගුවන් යානා අනතුරු සිදුවීම් විමර්ශනය පුහුණුව සඳහා මෙම අංශය සමාන වැදගත් කමක් ලබා දුන්නේය. මීට අදාළව ගුවන් යානා අනතුරු විමර්ශනය පිළිබඳ දෙසති වැඩමුළුවක් කොළඹ දී පවත්වන ලදී. මෙම වැඩමුළුව පවත්වන ලද්දේ අනතුරු විමර්ශන ක්ෂේත්‍රයේ දශක ගණනාවක ප්‍රායෝගික පළපුරුද්ද ඇති, එමෙන්ම උසස් නිළ දරණ ජාත්‍යන්තර කීර්තියට පත් වූ වෘත්තිකයින් දෙදෙනෙකු වන කාජ් ෆ්‍රොස්ටෙල් (Caj Frostell) සහ කීත් මැක්ගයර් (Keith Mcguire) මහතුන් විසිනි. මෙයින් CAASL විමර්ශන නිලධාරීන්ට විමර්ශන ශිල්ප ක්‍රම පිළිබඳ සම්පූර්ණ පුහුණුවකුත් ගුවන් යානා අනතුරු විමර්ශනයට අදාළ සංවිධානමය සාධක සහ කළමනාකරණ ගැටළු පිළිබඳ අවබෝධයකුත් ලබාගත හැකිවිය. මෙම වැඩමුළුව 2010 ICAO-USOAP විගණනයේදී මතු කළ ඌණතාවක් සඳහා වූ නිවැරදි කිරීමේ පියවරක් ද විය. CAASL හි නිලධාරීන් ද, කර්මාන්තයේ පුද්ගලයින් ද COSCAP-SA සාමාජික රාජ්‍යයන්හි ආරාධිත පුද්ගලයින් ද සහභාගි වීය.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සහ ප්‍රංශයේ BEA(Bureau d' Enquēteset d' Aílyses) ආයතනය අතර ගුවන් යානා අනතුරු සහ සිදුවීම් විමර්ශනයට අදාළ සහයෝගිතා වැඩපිළිවෙලකට අත්සන් තබන ලදී. එක්සත් රාජධානියේ ගුවන් අනතුරු විමර්ශන ශාඛාව සමග ද එවැනිම සහයෝගිතා වැඩපිළිවෙළක් ගිවිස ගැනීම සූදානම් කර ඇත.

දේශීය නියෝජිත ආයතයන සමග යොදාගෙන ඇති අවබෝධතා වැඩ පිළිවෙල සම්බන්ධව සළකන කළ, ගුවන් යානා අනතුරු විමර්ශන කාර්‍යාවලිය ඵලදායී අන්දමින් සමායෝජනය කිරීම සඳහා CAASL සහ අධිකරණ අමාත්‍යාංශය අතර අත්සන් කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් විකාශනය කිරීමට පියවර ගෙන ඇති බව සඳහන් කළ යුතුව ඇත. තව දුරටත් අනතුරු විමර්ශකයන්ගේ සහ ප්‍රතීක නියෝජිතයින්ගේ හදිසි විදේශ ගමන් සඳහා කඩිනමින් වීසා ලබා දීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට විදේශ කටයුතු අමාත්‍යාංශය සමග සාකච්ඡා පවත්වා ඇත.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ අනතුරු හෝ බරපතල සිදුවීම් හෝ කිසිවක් වාර්තා වී නැත. කෙසේ වුවද ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද ගුවන් යානා සම්බන්ධ විවිධ කරුණු වලට අදාළ සිදුවීම් 137 ක් වාර්තා වී ඇත. 2012 ඔක්තෝබර් 09 වන දින කුවෙට් බලා ගිය පියසරය අතරමග තද බල කැළඹුමකට මුහුණ දුන් ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් පියාසර අංක UL 229, A 330 ගුවන් යානයට අදාළව වාර්තා වූ සිදුවීම් පිළිබඳ විමර්ශනය සිදු කරමින් පැවතුණි.

2012 ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් යානාවන්ට අදාළ ගුවන් සේවා සිදුවීම්
(ශ්‍රී ලංකාව තුළට සහ පිටතට)




**සංක්ෂිප්ත යෙදුම්**

F-NI - ගිනි/දුම් (බලපෑම් රහිත)

FUEL - ඉන්ධන ආශ්‍රිත

RAMP - බිම් මෙහෙවර

SCF-PP - බලෝත්පාදක ක්‍රියාකාරීත්වය දුර්වල වීම

SEC - සුරක්ෂිතතාව ආශ්‍රිත

TURB - කැළඹුමකට මුහුණ පෑම

LALT - පහත් උන්නතාංශ මෙහෙයුම්

MAC - ගුවනේදී සමීපවීම/ගැටුමකට ආසන්න/ගුවනේදී ගැටුම

RE - ධාවන පථයේ ගමන අතර

SCF/NP - පද්ධති/සංරචක අක්‍රියවීම හෝ දුර්වල වීම (බලෝත්පාදක නොවන)

ADRM - ගගන යාත්‍රාංගන

NOC - සන්නිවේදන බිඳවැටීම

CABIN - මැදිරි නිරුපද්‍රතා සිදුවීම්


BIRD - කුරුළු ගැටීම්

OTHER - වෙනත්

# අභ්‍යන්තර විගණන ඒකකය

අභ්‍යන්තර විගණන ඒකකය CAASL කළමනාකරණයේ මැදිහත් වීම හරහා අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් බව සහ සඵලතාව සමාලෝචනය කිරීමට පියවර ගෙන ඇත. තව දුරටත් එම අංශය CAASL හි සියළු කාර්‍යයන් නීති සහ රෙගුලාසි වලට අනුව සිදු වන බවට සහතික වෙමින් CAASL සඳහා ප්‍රතිපත්ති සහ කාර්‍ය පටිපාටි පිහිටු වීමට කටයුතු කර ඇත. අභ්‍යන්තර විගණන අංශය 2012 වර්ෂය තුළ තාක්‍ෂණික විගණන හතක්(07) සහ මූල්‍ය විගණන දහයක්(10) ඇතුළු විගණන 34 ක් පවත්වා ඇත.

| අංශ | 2012 නිකුත් කරන ලද වාර්තා සංඛ්‍යාව | සොයා ගැනීම් | යෝජනා |
|---|---|---|---|
| මූල්‍ය කළමනාකරණ | 03 | 37 | 02 |
| මානව සම්පත් සහ කාර්‍යාල කළමනාකරණය | 02 | 04 | 04 |
| පුද්ගල බලපත්‍ර | 01 | 04 | 01 |
| ගුවන් ප්‍රවාහන සහ නීති කටයුතු | 01 | 03 | - |
| ගගන යාත්‍රාංගන සහ ගුවන් සංතරණ සේවා | 01 | 02 | 01 |
| එකතුව | 08 | 50 | 08 |



# ගගන නාවික සේවා ශාඛාව


## ගුවන් සේවා සුරක්ෂිතතා අංශය

### ICAO විශ්ව සුරක්ෂිතතා විගනණය(USAP) - 2 වටය - ශ්‍රී ලංකා විගණනය

සාමාජික රාජ්‍යයන් ගුවන් සේවා සුරක්ෂිතතා ප්‍රමිති සමග අනුවෘත්‍යය පවත්වන ප්‍රමාණය තක්සේරු කිරීම සඳහා ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය එහි සාමාජික රාජ්‍යයන් සම්බන්ධව USAP වැඩසටහන යටතේ නිතිපතා විගණන පවත්වයි. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වඩාමත් මෑතකදී එවැනි විගණනයක් පවත්වන ලද්දේ සමාලෝචනයට භාජනය වන වර්ෂයේ මැයි මස 24 සිට 31 දක්වා කාලය අතරතුරදීය. මෙම විගණනයේ ප්‍රතිඵල අනුව ශ්‍රී ලංකාව ගුවන් සේවා සුරක්ෂිතතා ප්‍රමිති සමග අනුවෘත්‍යය පැවැත්වීමේ ප්‍රමාණය 87% ක් බව පෙනී ගොස් ඇත. විගණනයට භාජනය කරන ලද රාජ්‍යයන් 145 ක ප්‍රතිඵල අනුව මෙම ප්‍රමාණයේ ගෝලීය සාමාන්‍යයට සාපේක්ෂව ශ්‍රී ලංකාව ලබාගෙන ඇත්තේ සැළකිය යුතු උසස් මට්ටමක කාර්‍ය්‍ය සාධනයක් බව පෙනී යයි.

මෙම විගණන ප්‍රතිඵලය "ශ්‍රී ලංකා අහස්තලය හොඳින් සුරක්ෂිතය" යන පණිවිඩය ගුවන් ගමන් යන මහජනතාවට දෙයි. විගණනයේදී හඳුනා ගන්නා ලද ඌණතා සහිත ක්ෂේත්‍ර නිවැරදි කිරීම සඳහා ශ්‍රී ලංකාව දැනටමත් නිවැරදි කිරීමේ සැළැස්මක් සකස් කර ICAO වෙත යවා ඇති අතර එම සැළසුම සතුටුදායක බව ICAO විසින් පිළිගනු ලැබ ඇත.

අවධි අංග අනුව විගණන ප්‍රතිඵල ප්‍රස්තාරික නිරූපණය



## ගුවන් සේවා සුරක්ෂිතතා උපදේශකයින් පත් කිරීම

ජාතික මට්ටමේ ගුවන් සේවා සුරක්ෂිතතා අධීක්ෂණ කාර්‍යයන් සඳහා බෙහෙවින් අවශ්‍යය වූ තාක්ෂණික විශේෂඥතාව සැලකිල්ලට ගනිමින් ගුවන් තොටුපොළ සුරක්ෂිතතාව, ගිණි නිවීම හා මුදගැනීම, ගුවන් ප්‍රවාහන සමාගම්, ගුවන් නැව් බඩු සහ ආහාර පාන සැපයීම ආදී අංශ වල දැනුම සම්භාරයක් සහ පළපුරුද්ද සහිත සුරක්ෂිතතා උපදේශකයින් දෙදෙනෙකු(02) 2012 ජනවාරි-පෙබරවාරි මාස තුළදී ගුවන් සේවා සුරක්ෂිතතා අංශයට බඳවා ගන්නා ලදි. මෙම අංශයේ දැන් තාක්ෂණික නිළධාරීන් සිව්(04) දෙනෙකු ඇත.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පවත්වන ලද ICAO-(USAP) විගණනය -2 වටය විගණන කණ්ඩායම විසින් ඉහත කී උපදේශකයින් බඳවා ගැනීම ඇගයීමට ලක්කර තිබිණි.

## අති විශේෂ AVSEC සෝදිසි වැඩසටහන ක්‍රියාත්මක කිරීම

බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේදී ශ්‍රී ලංකාව තුළට සහ ඉන් පිටතට මෙහෙයුම් සිදු කරන විදේශ ගුවන් ප්‍රවාහන සමාගම් ගුවන් යානා සඳහා සුරක්ෂිතතාව සැපයීමේ දී කෙතරම් දුරකට සුරක්ෂිතතා ප්‍රමිති අවශ්‍යතා සමග අනුවර්‍තනය පවත්වන්නේදැයි තක්සේරු කිරීම සඳහා 2012 ජූනි සහ ජූලි මාස තුළ දී අතිවිශේෂ ගුවන් සේවා සුරක්ෂිතතා සෝදිසි සැලසුමක් ක්‍රියාත්මක කරන ලදී. මෙම සෝදිසි සැලසුම ක්‍රියාත්මක කිරීමේ දී ගුවන් සේවා සුරක්ෂිතතා පරීක්ෂකවරුන් විසින් විදේශ ගුවන් ප්‍රවාහන සමාගම් විසි එකක්(21) පරීක්ෂා කරන ලද අතර ඒ සියල්ලෙහි සුරක්ෂිතතා අවශ්‍යතා සතුටුදායක අන්දමින් ඉටු කෙරෙන බව සොයාගන්නා ලදී.

## ජාත්‍යන්තර සංසදයන්හි රාජ්‍ය නියෝජනය

ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ (AVSEC) 2012 ජනවාරි මස 11-12 දිනයන්හි මැලේසියාවේ ක්වාලාලම්පූර් හි දී පවත්වන ලද කළාපීය ගුවන් සේවා සුරක්ෂිතතා සම්මන්ත්‍රණයට සහභාගී වූහ. මීට අමතරව නියෝජ්‍ය අධ්‍යක්ෂ (AVSEC), සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ දී ගුවන් සේවා සුරක්ෂිතතාවට අදාළ වෙනත් සම්මන්ත්‍රණ සහ රැස්වීම් කීපයකට ද සහභාගී විය.

## AVSEC පිළිබඳ ICAO ඉහළ මට්ටමේ සම්මේලනයේ ශ්‍රී ලංකා නියෝජනය

ගුවන් සේවා සුරක්ෂිතතාව පිළිබඳ ICAO ඉහළ මට්ටමේ සම්මේලනය 2012 සැප්තැම්බර් 12-14 දිනයන්හි කැනඩාවේ මොන්ට්‍රියෙල් හි දී පවත්වන ලදී. මෙම සම්මේලනයේ අරමුණ වූයේ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් සහ කර්මාන්ත හවුල්කරුවන් රැස් කරවා සිවිල් ගුවන් සේවාවෙහි සුරක්ෂිතතාවට එරෙහිව පවතින හා නැගී එන තර්ජන වලට මුහුණ පෑම සඳහා අවශ්‍ය වැදගත් ගුවන් සේවා සුරක්ෂිතතා ප්‍රමුඛතා සහ අදාළ කරුණු පිළිබඳ ගෝලීය වශයෙන් එකඟතාවයකට එළඹ අවශ්‍ය නිර්දේශ විධිමත්ව සකස් කිරීම ය.

මෙහිදී සාකච්ඡාවට භාජනය වූ, ගුවන් සේවා සුරක්ෂිතතාවට අදාළ ප්‍රධාන කරුණු වූයේ ඇතුළත සිටින්නන්ගේ තර්ජනයන්ට එරෙහිව කටයුතු කිරීම, ගුවන් නැව් බඩු සුරක්ෂිතතාව වර්ධනය කිරීම, ගුවන් සේවා සුරක්ෂිතතා පියවර සහ සමතාව පවත්වාගෙන යාම සහතික කිරීම, ගුවන් සේවා සුරක්ෂිතතා විගණන ක්‍රියාවලියේ විකසනය - විනිවිදභාවය, ධාරිතා වර්ධනය සහ තාක්ෂණික සහාය, වැඩි දියුණු කළ තාක්ෂණය සහ නව තාක්ෂණය, උසස් මගී තොරතුරු (API) සහ මගී නාම වාර්තාව (PNR) සමග යාන්ත්‍රිකව කියවිය හැකි ගමන් ලියවිලි (MRTD) වැඩ සටහනෙහි කාර්යභාරය සහ ගුවන් සේවා සුරක්ෂිතතාවට අදාළ කළාපීය ප්‍රයත්නයන්හි සහ ICAO අවදානම් සන්දර්භ ප්‍රකාශනයෙහි සාපේක්ෂ වැදගත්කමය.

ශ්‍රී ලංකා ඉහළ මට්ටමේ නියෝජිත පිරිසේ නායකත්වය දැරුවේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් නියෝජනය කළ සිවිල් ගුවන් සේවා අමාත්‍යංශයේ ලේකම්වරයාය. ශ්‍රී ලංකා නියෝජිත පිරිස, මෙම සම්මේලනයේ දී සාකච්ඡා කර එකඟතාවයකට පැමිණි සියළු කරුණු ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවාවේ යහපත සඳහා උපරිම වශයෙන් යොදා ගැනීමට සමත් වී ඇත.

## සී/ස එක්ස්පෝ ඒවියේෂන් (පුද්) සමාගම සම්බන්ධ AVSEC සුරක්ෂිතතා විගණනය

බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ ස්වයං-මෙහෙවර තත්වය සහිත එකම නැව් බඩු පමණක් ප්‍රවාහනය කරන ගුවන් නැව් බඩු මෙහෙයුම්කරු වන සී/ස එක්ස්පෝ ඒවියේෂන් (පුද්) සමාගම සම්බන්ධ ගුවන් සේවා සුරක්ෂිතතා

විගණනයක් 2012 දෙසැම්බර් 11-17 දිනයන්හි දී පවත්වන ලදී. එහිදී නිරීක්ෂණය කරන ලද AVSEC අවශ්‍යතා යොදා ගැනීම පිළිබඳ ඌනතා එක්ස්පෝ ඒවියේෂන් කළමනාකරණය සමග සාකච්ඡා කරන ලදී. නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කෙරෙනු ඇත.

එක්ස්පෝ ඒවියේෂන් සමාගමෙහි ජ්‍යෙෂ්ඨ කළමනාකරණය විගණන ක්‍රියාවලිය අතරතුර මහත් උද්යෝගයක් පෙන්නුම් කළහ.

### සී/ස එක්ස්පෝ ඒවියේෂන් (පුද්) සමාගම උපදේශකයින් සහතික කිරීම

සමාගමේ සේවකයින්ට ගුවන් සේවා සුරක්ෂිතතා පුහුණුව ලබාදීමට හැකිවන පරිදි එහි ජ්‍යෙෂ්ඨ කළමනාකාර (සුරක්ෂිතතා) ලලිත් වීරරත්න මහතාට 2012 දෙසැම්බර් මස 17 වන දින සිට බලපැවැත්වෙන පරිදි "ගුවන් සේවා සුරක්ෂිතතා උපදේශක" වරයෙකු වශයෙන් කටයුතු කිරීමට බලය පවරන ලදී. ජාතික සිවිල් ගුවන් සේවා සුරක්ෂිතතා පුහුණු වැඩසටහනෙහි (NCASTP) නියම කර ඇති ආකාරයට පුහුණු විෂය නිර්දේශය, පාඩම් සැලසුම්, අත්පත්‍රිකා, ඉදිරිපත් කිරීමේ ක්‍රම සහ දේශනා මාධ්‍යය පිළිබඳ ඇගයීමක් සිදු කරන ලදී.

### සුරක්ෂිතතා සෝදිසි කාර්‍යයන්

ගුවන් තොටුපොළ සහ ශ්‍රී ලංකාව තුළට මෙහෙයුම් සිදුකරන ගුවන් ප්‍රවාහන සංගම් සම්බන්ධව, අනුමත සෝදිසි සැලසුමට අනුකූලව සුරක්ෂිතතා සෝදිසි කාර්‍යයන් ඉටු කරන ලදී.

## විශේෂ ව්‍යාපෘති අංශය

### COSCAP-SA ව්‍යාපෘතියට සහය

COSCAP-SA ව්‍යාපෘතිය සකස් කළ මුල් අවස්ථාවේ සාමාජික රාජ්‍යයන් අතර ඇති කරගත් ගිවිසුම අනුව එම ව්‍යාපෘතියට අනුයුක්ත විශේෂඥයින්ගේ නිල ගමන් වලදී ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් ප්‍රවාහන සමාගම් මගින් හෝ ලංකාව තුළට මෙහෙයුම් සිදු කරන ගුවන් ප්‍රවාහන සමාගම් මගින් හෝ සාමාජික රාජ්‍යයන් අතර ගමන් කිරීම සඳහා නොමිලේ ගුවන් ප්‍රවේශ පත්‍ර (Gratis Air Tickets) ලබා දුන්නේය. මෙහිදී විශේෂ ව්‍යාපෘති අංශය 2012 වර්ෂය තුළ COSCAP-SA විශේෂඥයින්ට පහත සඳහන් පරිදි නොමිලේ ගුවන් ප්‍රවේශ පත්‍ර 10 ලබා දී ඇත.

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් | - | ගුවන් ප්‍රවේශ පත්‍ර 04 |
| මිහින් ලංකා | - | ගුවන් ප්‍රවේශ පත්‍ර 06 |

### ප්‍රදර්ශන

#### දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය AN 24 වර්ගයේ ගුවන් යානයක් අනුරාධපුර ඔයාමඩුවේදී ප්‍රදර්ශන භාණ්ඩයක් වශයෙන් යොදා ගත්තේ ය. ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශයට ඉහළින් පියාසර කරන ව්‍යාජ පියසරයක් ආදර්ශනය කිරීමට මෙම ගුවන් යානය යොදා ගන්නා ලදී. වීරවිලින් ගමන් ආරම්භ කර ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශයට ඉහළින් පියාසර කර නැවත එම ගුවන් තොටුපොළේම ගොඩ බෑම සිදුකරන සත්‍ය පියසරයක ගමන් කරන ගුවන් මගියෙකුට දක්නට ලැබෙන සැබෑම පසුතල දසුන් අනුකරණය කරමින් පෙන්වීම සඳහා ගුවන් යානයේ සෑම කවුළුවකමත් මැදිරිය මධ්‍යයේත් වීඩියෝ චිත්‍රපටියක් ප්‍රදර්ශනය කරන ලදී.

මෙම සුවිශේෂී අවස්ථාවට ආශාවෙන් එක්රොක් වූ අති විශාල පිරිසකට මෙම ටර්බෝ-ප්‍රොප් වර්ගයේ මගී ප්‍රවාහන ගුවන් යානය සමීපයෙන් නිරීක්ෂණය කිරීමටත් වියදමකින් තොරව අනුකරණ පියාසර අත්දැකීමක් විඳ ගැනීමටත් හැකි විය.


#### "මොරටු උදාන" වෙළඳ ප්‍රදර්ශනය

2012 දෙසැම්බර් 22 සිට 26 දක්වා මොරටුව වේල්ස් කුමාර විද්‍යාලයේදී පවත්වන ලද "අධ්‍යාපන සහ වෙළඳ ප්‍රදර්ශනයේ" දී ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන ගියේය.

### ගුවන් සේවා ඉන්ධන මිල නිරීක්ෂණය

ගුවන් සේවා ඉන්ධන මිල පිළිබඳ මාසික වාර්තා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ලබාගත් විශේෂ ව්‍යාපෘති අංශය 2012 වර්ෂය තුළදී ද ඉන්ධන මිල උස් පහත් වීම් නිරීක්ෂණය කළේය. මෙම ක්‍රියාවලිය ඉදිරියේදී ද නොකඩවා පවත්වාගෙන යනු ඇති අතර තීරණ ගන්නන්ට සහ මේ සම්බන්ධව උනන්දු වන්නන්ට අවශ්‍යය තොරතුරු ලබා දෙනු ඇත.

BIA හි ගුවන් සේවා ඉන්ධන (Jet A - 1) මිල වෙනස්වීම් (ගිවිසුම්ගත ගණුදෙනු කරුවන්ට)
2008-2012 දක්වා




ප්‍රභවය - ලංකා ඛණිජතෙල්

## ප්‍රකාශන/වාර්තා

පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහාත් අදාළ රාජ්‍ය ආයතන වෙත සහ ගණුදෙණුකරුවන් වෙත ලබාදීම සඳහාත් 2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ ප්‍රකාර 2011 වාර්ෂික වාර්තාව සම්පාදනය කරන ලදී.

මීට අමතරව විශේෂ ව්‍යාපෘති අංශය භෞතික සහ ප්‍රගති වාර්තා, කාරක සභා අවස්ථා අයවැය ලේඛන වාර්තාව, ව්‍යාපෘති සංවර්ධන වාර්තා ආදිය අමාත්‍යාංශයටත් මහ බැංකුවටත් යවා ඇත.

## සිවිල් ගුවන් සේවා සංවර්ධන හා අධ්‍යාපන කමිටුව (CADEC)

විශේෂ ව්‍යාපෘති අංශය යටතේ ක්‍රියාත්මක වන සිවිල් ගුවන් සේවා සංවර්ධන සහ අධ්‍යාපන කමිටුව (CADEC) "දැයට කිරුළ" ජාතික ප්‍රදර්ශනයට සමගාමීව අනුරාධපුර, කැකිරාව, තඹුත්තේගම, ගලෙන් බිඳුනු වැව සහ කැබිතිගොල්ලැව යන අධ්‍යාපන කළාප පහ(05) ආවරණය වන පරිදි CADEC වැඩ සටහන් 12ක් ක්‍රියාත්මක කළේය. ගුවන් සේවා ක්ෂෙත්‍රය පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුම වර්ධනය කිරීමේ අරමුණ සහිතව CAASL විසින් CADEC වැඩ සටහන යටතේ ත්‍රෛමාසිකව පළ කරනු ලබන "ගුවන්සර" සඟරාව 2012 වර්ෂය තුළදී ද, අධ්‍යාපන අමාත්‍යාංශයේ සමායෝජනය සහිතව දිවයිනේ අ.පො.ස උසස් පෙළ පංති පවත්වන පාසල් 2800ක් අතර නොමිලේ බෙදා හරින ලදී.

# ගගන යාත්‍රාංගන සහ ගුවන් සංතරණ සේවා අංශය

## ගුවන්තල කළමණාකරණය

ශ්‍රී ලංකාවේ ජාතික ගුවන් තලය ජාතිය සතු මහඟු වස්තුවකි. නිරුපද්‍රිත සහ කාර්‍යක්‍ෂම ගුවන් තලයක් රටේ යහසාධනය සහ ආර්ථික වර්ධනය සඳහා උපරිම වශයෙන් දායක වනු ඇත. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ ද ගගන යාත්‍රාංගන සහ ගුවන් සංතරණ සේවා අංශය ඉහත කී සාධකය කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වමින් ජාතියේ විවිධ සුරක්ෂිතතා අවශ්‍යතා පිළිබඳවද දැනුවත්ව, ශ්‍රී ලංකා ගුවන් තළයෙන් උපරිම ඵල ලබා ගැනීමට හැකිවන අයුරින් එය නිරුපද්‍රිත සහ ඵලදායි ලෙස කළමනාකරණය කළේය.

ANS අංශය, ගුවන් තලයේ නිරුපද්‍රතාව සහ කාර්‍යක්‍ෂමතාව වර්ධනය කිරීමටත් ICAO විසින් සාමාජික රාජ්‍යයන් සඳහා නිර්දේශ කර ඇති චන්ද්‍රිකා පාදක කරගත් සංතරණ ක්‍රමයක් වන Performance Based Navition (PBN) ක්‍රමය ක්‍රියාත්මක කිරීමටත් ගුවන් තලය යළි සැලසුම් කිරීමට ගුවන් සංතරණ සේවා සැපයුම්කරු වන සී/ස ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම සමග සාකච්ඡා කර එක්ව කටයුතු කර ඇත. මීට අමතරව PBN ක්‍රමයේ වාසි සහ එය ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව ගුවන් තලය පාවිච්චි කරන හවුල්කරුවන් දැනුවත් කිරීම සඳහා එකී පුද්ගලයින් වෙනුවෙන් වැඩමුළුවක් ද පවත්වන ලදී.

## බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ ගගන යාත්‍රාංගන සහතිකය අළුත් කිරීම

2010 මාර්තු මස 01 වන දින, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ එවකට පැවති රෙගුලාසි යටතේ සහතික කරන ලද අතර වසර දෙකක් සඳහා ගගන යාත්‍රාංගන සහතිකය නිකුත් කරන ලදී. 2012 පෙබරවාරි මාසයේ දී එම සහතිකයේ කල් ඉකුත් වූ හෙයින් දින පහක(05) විගණනයක් පවත්වා එකී සහතිකය තවත් වසර දෙකක් සඳහා අළුත් කරන ලදී.

## මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ගොඩනැගීම සහ සහතික කිරීම සඳහා නියාමන සහය

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ මෙම අංශය මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ අසල ආරක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සඳහා රෙගුලාසි පැනවීමටත් එකී ආරක්ෂිත ප්‍රදේශ ඇතුළත තැනිය හැකි ගොඩනැගිලි වල උස සීමා කිරීමේ උපදෙස් නිකුත් කිරීමටත් පියවර ගෙන ඇත.

මීට අමතරව මෙම අංශය මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය වන නියාමන මග පෙන්වීම් සැපයීමට ද කටයුතු කළේය. තවද මෙම ගුවන් තොටුපොළට ගගන යාත්‍රාංගන සහතිකයක් නිකුත් කිරීම සඳහා එය ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ ප්‍රමිති සහ දේශීය රෙගුලාසි සමග අනුකූල වන්නේදැයි නිශ්චය කිරීම සඳහා අවශ්‍ය පරීක්ෂණ/විගණන පැවැත්වීමේ ක්‍රියාවලිය ද ආරම්භ කර ඇත.

## ATC ප්‍රමාණන තක්සේරුව

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ ANS අංශය, සේවාස්ථ පුහුණුව (OJT) අධීක්ෂණය කිරීමෙන්, ප්‍රමාණන තක්සේරු කිරීම් පැවැත්වීමෙන් සහ ගුවන් ගමන් පාලක පාඨමාලාවන්හි අවසාන ප්‍රායෝගික විභාග පරීක්ෂා කිරීමෙන් AASL විසින් පවත්වනු ලබන ගුවන් ගමන් පාලන පුහුණු පාඨමාලාවන්හි තත්ත්වය පවත්වා ගැනීම සඳහා මූලික කාර්යභාර්යයක් ඉටු කළේය.

මෙම අංශයේ පහත සඳහන් පරිදි ගුවන් ගමන් පාලක වරුන්ට ATC ප්‍රමාණන නිකුත් කිරීම සඳහා ATC ප්‍රමාණන පරීක්ෂණ සහ ATC පුහුණුවන්නන් සඳහා වූ ATC අනුකාරක ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්විය.

| | |
|---|---|
| පවත්වන ලද ATC ප්‍රමාණන පරීක්ෂණ | 23 |
| ATC අනුකාරක ප්‍රායෝගික පරීක්ෂණ | 05 |

මීට අමතරව මෙම අංශය ගුවන් ගමන් පාලකවරුන් සහ ගුවන් නියමුවන් සඳහා පවත්වන ලද පහත සඳහන් පරීක්ෂණ වලට ද සහභාගී විය.

| | |
|---|---|
| භාෂා ප්‍රවීණතා විභාග | 54 |
| ගුවන් විදුලි දුරකථන විභාග | 40 |

## සෝදිසි කටයුතු

ගගන යාත්‍රාංගන සහ ගුවන් සංතරණ සේවා අංශයෙහි සෝදිසි වැඩසටහන අනුව ගුවන් ගමන් සේවා, ගගන යාත්‍රාංගන සහ ගගන නාවික තොරතුරු සේවා සම්බන්ධව මාස්පතා පරීක්ෂණ පැවැත්විය යුතුව ඇත. මේ අනුව මෙම අංශය 2012 වර්ෂය තුළ ගුවන් ගමන් සේවා පිළිබඳ පරීක්ෂණ විසිහතරක් ද (24), ගගන යාත්‍රාංගන පරීක්ෂණ දහනවයක් ද (19), ගගන නාවික තොරතුරු සේවා පිළිබඳ පරීක්ෂණ දොළහක් ද (12) වශයෙන් පරීක්ෂණ පනස් පහක් (55) පවත්වා ඇත. මෙම පරීක්ෂණ වලදී සොයාගන්නා ලද ඌණතා අදාළ සේවා සැපයීමේ වගකීම දරණ සී/ස ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම වෙත අවශ්‍ය නිරුපද්‍රිතතා නිර්දේශ ද සමග දන්වා යවා ඇත. හඳුනාගත් ඌණතා නිසි කල්හි නිවැරදි කරන බවට සහතික වීම සඳහා අවශ්‍ය පසු කටයුතු ද ඉටුකර ඇත.

## ATC සිදුවීම් විමර්ශනය

CAASL වෙත වාර්තා වන ATC සිදුවීම් විමර්ශනය කර අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග සේවා සපයන්නා වෙත නිර්දේශ කිරීමේ වගකීම පැවරී ඇත්තේ ගගන යාත්‍රාංගන සහ ගුවන් සංතරණ සේවා අංශයට ය. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ මෙම අංශය එවැනි ATC සිදුවීම් දෙකක්(02) විමර්ශනය කර අනාගතයේ එවැනි සිදුවීම් යළි ඇතිවීම වැළැක්වීම සඳහා අවශ්‍ය නිරුපද්‍රිතතා නිර්දේශ ගුවන් ගමන් සේවා සැපයුම්කරු වන සී/ස ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම වෙත දන්වා යවා ඇත.

## උස් ගොඩනැගිලි තැනීම සඳහා අවසර දීම

ගගන යාත්‍රාංගන අවට ප්‍රදේශ තුළ තනන ගොඩනැගිලි/නිර්මාණ ආදියෙහි උස ප්‍රමාණය සීමා කරමින් පනවන ලද කළාප රෙගුලාසි අනුව මෙම වර්ෂය තුළ ගගන යාත්‍රාංගන සහ ගුවන් සංතරණ සේවා අංශය උස් ගොඩනැගිලි/නිර්මාණ හයසිය පනස් තුනක් (653) සඳහා අවසර ලබා දී ඇත.

## ඉහළින් පියාසර කිරීමේ සහ ගොඩ බෑමේ අවසරය

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ ගගන යාත්‍රංගන සහ ගුවන් සංතරණ සේවා අංශය ජාත්‍යන්තර පියසර 1030 කට ශ්‍රී ලංකා දේශයට ඉහළින් පියාසර කිරීමට අවසර දී ඇති අතර තවත් අනියම් ජාත්‍යන්තර පියසර 655 කට ශ්‍රී ලංකාව තුළ ගොඩබෑමට අවසර දී ඇත. කාර්යාල වේලාවෙන් බැහැර වේලාවන්හි දී AASL සමාගම ද CAAL වෙනුවෙන් මෙවැනි අවසර ලබා දෙන හෙයින් ශ්‍රී ලංකාවට ඉහළින් පියාසර කළ/ශ්‍රී ලංකා දේශය තුළ ගොඩබාන ලද සම්පූර්ණ පියසර සංඛ්‍යාව ඉහත දැක් වූ සංඛ්‍යාවන්ගෙන් පිළිබිඹු නොවේ.

## ගගන නාවික තොරතුරු සේවාව

නෝටැම් (NOTAMS), ගගන නාවික තොරතුරු ප්‍රකාශන සංශෝධන, ගගන නාවික තොරතුරු ප්‍රකාශන අතිරේක සහ ගගන නාවික තොරතුරු චක්‍රලේඛ ඇතුළත් ගගන නාවික තොරතුරු ප්‍රකාශන පැකේජය නිකුත් කිරීමේ වගකීම පැවරී ඇත්තේ මෙම අංශයටය. මේ අනුව වර්ෂය තුළ මෙම අංශය පහත සඳහන් ගගන නාවික ප්‍රකාශන නිකුත් කර/ආරම්භ කර ඇත.

| | | |
|---|---|---|
| NOTAM නිකුත් කිරීමට අවසර | - | 261 |
| ගගන නාවික තොරතුරු ප්‍රකාශන සංශෝධන | - | 01 |
| ගගන නාවික තොරතුරු අතිරේක | - | 08 |
| ගගන නාවික තොරතුරු චක්‍ර ලේඛ | - | 10 |

## හෙළිකොප්ටර් - ගුවන් ගත කාර්‍යයන්

2012 වර්ෂය තුළ හෙළිකොප්ටර් මෙහෙයුම් කරුවන් මගී ප්‍රවාහනයට අමතරව, ඡායාරූපකරණය, වීඩියෝ චිත්‍ර ගත කිරීම්, විද්‍යුත් ඡායාකරණය සඳහා ගුවන් මැනීම්, මල් විසිරවීම්, පත්‍රිකා විසිරවීම් සහ සංස්ථාගත ආයතනයන්හි වෙළඳ ලකුණු ප්‍රචාරක වැඩ ආදී ගුවන්ගත කාර්‍යයන්හි ද නිරත වී ඇත. අවශ්‍ය නිරුපද්‍රිතතා මට්ටම පවත්වා ගැනීම සඳහා උචිත පියවර ගැනීමෙන් පසු මෙම අංශය 2012 වර්ෂය තුළ එවැනි මෙහෙයුම් සඳහා 20 වාරයකදී අනුමැතිය දී ඇත.

# පියසර නිරුපද්‍රිතතා ශාඛාව

## පුද්ගල බලපත්‍ර අංශය

සිවිල් ගුවන් සේවා අධිකාරියේ පුද්ගල බලපත්‍ර අංශය 2012 වර්ෂය තුළ ද සේවා ලාභීන් සතුටට පත්වන අයුරු ගුවන් සේවා ප්‍රජාවගේ යම් යම් අවශ්‍යතා සැපයීමට කටයුතු කරමින් වැඩිදුර වර්ධනයක් පෙන්නුම් කර ඇත. එසේ වර්ධනය වූ වැදගත් අංශ පහත සඳහන් වේ.

### පියසර පිරිස් විභාග සේවා

සිවිල් ගුවන් සේවා අධිකාරිය මාලදිවයින් ජනරජයේ අපේක්ෂකයින් වෙනුවෙන් ද වාණිජ ගුවන් නියමු බලපත්‍රය (CPL) දක්වා ගුවන් නියමු බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලිඛිත විභාග පැවැත්වීම මෙතෙක් කරගෙන ගියේය. මෙයින් දෙරටටම ප්‍රතිලාභ අත් වීය. 2012 වර්ෂයේ මෙම සේවාව ගුවන් ප්‍රවාහන ගුවන් නියමු බලපත්‍රය (ATPL) දක්වා දීර්ඝ කරන ලදී.

### ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ( SLAL) වර්ග ප්‍රමාණන පුහුණු සංවිධානය (TRTO) සහතික කිරීම

ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගමට Airbus A 320 පූර්ණ පියසර අනුකාරකය හඳුන්වා දීමත් සමග ගුවන් නියමු බලපත්‍ර ධාරීන්ට A 320 වර්ග ප්‍රමාණන නිකුත් කිරීම සඳහා ඔවුන් පුහුණු කරවීමට බලපත්‍රයක් අවශ්‍ය වීය. 2012 වර්ෂය තුළ මෙම බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර අවසන් කරන ලදී.

### විදේශ පියසර පාසලක් පිළිගැනීම (නවසීලන්ත ජාත්‍යන්තර ගුවන් සේවා ඇකඩමිය)

විදේශ ගුවන් නියමු බලපත්‍ර ශ්‍රී ලංකන් ගුවන් නියමු බලපත්‍ර බවට පරිවර්තනය කිරීම සඳහා විදේශ පියසර පාසල් සහතික කිරීමේ ක්‍රමවේදයක් මෙතෙක් නොතිබුණි. මෙම අඩුපාඩුව සහ අවශ්‍යතාව හඳුනාගත් පුද්ගල බලපත්‍ර අංශය මේ සඳහා සුදුසු කාර්‍ය පටිපාටියක් හඳුන්වා දී ඇත. ඒ යටතේ දැනටමත් නවසීලන්තයේ පියසර පාසලක් මෙම සහතිකය ලබාගෙන ඇති අතර මෙයින් දෙරටටම ප්‍රතිලාභ අත්වී තිබේ. පියසර ප්‍රජාවට ඇති පුහුණු පහසුකම් ද පුළුල් වී ඇත.

### පුද්ගල බලපත්‍ර නිකුත් කිරීම ස්වයංකරණය ආරම්භ කිරීම

යුරෝපා ගුවන් සේවා නිරුපද්‍රිතතා ඒජන්සිය (EASA) විසින් නිර්දේශ කරන ලද ස්වේච්ඡා සංවිධානයක් හරහා නිරුපද්‍රිතතා අධීක්ෂණ පහසුකම් සහිත සමෝධාන යෙදුම (Safety Oversight Facilitated Integration Application (SOFIA) නැමැති පද්ධතියක් මගින් CAASL ට කිසිදු වියදමකින් තොරව පුද්ගල බලපත්‍ර අංශයේ වැඩ ප්‍රවාහය ස්වයංකරණය කිරීමටත් ඒ මගින් මිනිස් ශ්‍රම අවශ්‍යතා අවම කිරීමටත් පියවර අරඹා ඇත. 2012 වර්ෂය තුළ SOFIA වැඩ සටහනෙන් 80% ක් පමණ නිම කර ඇත. 2012 වර්ෂයේ දී තවත් මෙවැනිම වැඩ සටහනක් කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යයන අංශය හරහා ද ආරම්භ කර ඇති අතර එහි වැඩ ද 50%ක් පමණ නිම කර ඇත.

### 5 වන දකුණු ආසියා කළාපීය ආරම්භනය 66/147 කොටස් (SARI)

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සත්කාරකත්වය දරන ලද 5 වන දකුණු ආසියා කළාපීය ආරම්භනය (SARI) 66 සහ 147 කොටස් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ රැස්වීම් 2012 පෙබරවාරි 28-මාර්තු 02 දක්වා කොළඹ දී පවත්වන ලදී. මෙය සංවිධානය කරන ලද්දේ පුද්ගල බලපත්‍ර අංශය විසින්ය. ක්‍රියාකාරී කණ්ඩායමේ සාමාජිකයින් සහ ඉන්දියාව,

පකිස්තානය, මාලදිවයින, බංගලාදේශය, නේපාලය, භූතානය සහ ශ්‍රී ලංකාව යන රාජ්‍යයන්හි දේශීය ගුවන් සේවා සංවිධාන ගණනාවක් යුරෝපා ගුවන් සේවා නිරුපද්‍රිතතා ඒජන්සියේත් (EASA) නියෝජිතවරු මෙම සිව් දින රැස්වීමට සහභාගී වූහ.

සමස්තයක් වශයෙන් SARI වැඩ පිළිවෙලෙහි අරමුණ වන්නේ දකුණු ආසියා රාජ්‍යයන්හි සිවිල් ගුවන් සේවා නියාමන අභිසාරිතාවක් ගොඩනැගීම සඳහා එකී රාජ්‍යයන්හි සිවිල් ගුවන් සේවා බලධාරීන්ගේ සංසදයක් නිර්මාණය කිරීමය. SARI-66 කොටස ගුවන් යානා නඩත්තු බලපත්‍රය සහ SARI-147 කොටස නඩත්තු පුහුණු සංවිධානය සහ කොටස් දෙකේ ප්‍රථම රෙගුලාසි කෙටුම්පත 2012 දෙසැම්බර් අවසානයට පෙර පළකිරීම SARI 66/147 ක්‍රියාකාරී කණ්ඩායමෙන් අපේක්ෂා කෙරේ.

## SARI-66 කොටස - රෙගුලාසි

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය යුරෝපා ගුවන් සේවා නිරුපද්‍රිතතා ඒජන්සියෙහි (EASA) ගුවන් යානා නඩත්තු බලපත්‍රය සඳහා වූ රෙගුලාසි 66 කොටස පාදක කර ගනිමින් සුසංගත රෙගුලාසියක් වන SARI-66 කොටස විකාශනය කළේය. SARI-66 ක්‍රියාකාරී කණ්ඩායම මගින් විකාශනය කරන ලද මෙම රෙගුලාසි මාලාවෙහි ප්‍රථම මුද්‍රණය නිකුත් කරන ලද්දේ 2012 දෙසැම්බර් මාසයේදී ය.

SARI යනුවෙන් හඳුන්වනු ලබන්නේ 2006 වර්ෂයේ දී අවසන් වූ යුරෝපා-දකුණු ආසියා සිවිල් ගුවන් සේවා සහයෝගීතා වැඩසටහන අතරතුර සාදන ලද දකුණු ආසියානු සිවිල් ගුවන් සේවා බලධාරීන් කණ්ඩායමකි.

එක් සාමාජික රාජ්‍යයක සිදු කරනු ලබන ගුවන් යානා නඩත්තු වැඩ තවත් සාමාජික රාජ්‍යයක සිවිල් ගුවන් සේවා අධිකාරියකට ගැළපෙන ලෙස සහ පිළිගත හැකි වන පරිදි පොදු සුපර්යාප්ත ගුවන් සේවා රෙගුලාසි මාලාවක් සකස් කිරීමට SARI සාමාජික රාජ්‍යයන්හි සිවිල් ගුවන් සේවා බලධාරීන් එකඟ වී ඇත. EASA සහ යුරෝපා ගුවන් අවකාශ කර්මාන්තය SARI කාර්‍යයන්ට අනුග්‍රහය දක්වයි.

2007 වර්ෂය ආරම්භයේදී SARI හවුල්කරුවෝ ප්‍රමුඛතාවක් වශයෙන් දකුණු ආසියානු නඩත්තු රෙගුලාසි අභිසරණයකට එකඟ වූහ. සමහර රාජ්‍යයන් EASA රෙගුලාසි එලෙසම සම්මත කරගෙන හෝ EASA රෙගුලාසි ආදර්ශ කරගෙන තමන්ගේම රෙගුලාසි විකාශනය කරගෙන හෝ තිබිණ. මෙම විවිධ ජාතික රෙගුලාසි වලට පදනම් වී ඇති සංකල්ප සර්වසම වුව ද ඒවායේ ව්‍යුහය, ආශ්‍රිත මග පෙන්වීම් ලේඛන හෝ ක්‍රියාත්මක කාර්‍ය පටිපාටි අතර තවමත් වෙනස්කම් පවතී. මෙකී ඉතිරිව ඇති වෙනස්කම් සහ බාධක ඉවත් කර දකුණු ආසියානු රාජ්‍යයන්හි ගුවන් යානා නඩත්තු රෙගුලාසි වල ස්ථිර අභිසරණයක් ගොඩනැගීම සඳහා EASA පදනම් කරගත් සුසංගත රෙගුලාසි මාලාවක් විකාශනය කිරිමට SARI රාජ්‍යයන් අතර එකඟත්වයක් ඇති කර ගත්තේය. මේ අනුව SARI සිවිල් ගුවන් සේවා අධිකාරී 7 න් එක් සාමාජිකයෙකු බැගින් පත් කරගත් සාමාජිකයින් 7 දෙනෙකුගෙන් SARI-66/147 ක්‍රියාකාරී කණ්ඩායම විසින් මෙම රෙගුලාසි මාලාව විකාශනය කරන ලදී.

SARI-66 කොටස-ගුවන් යානා නඩත්තු බලපත්‍ර නිකුත් කිරිම සඳහා වන අවශ්‍යතා විකාශනය කර ඇත්තේ විශාල ගුවන් යානා හෝ වාණිජ ගුවන් යානා ප්‍රවාහනය සඳහා යොදා ගනු ලබන ගුවන් යානා සහ එකී ගුවන්යානාවන්හි සවි කරනු ලබන සංරචක නඩත්තු කිරීමේ කාර්‍යයන්හි නිරත වන පුද්ගලයිනට ඒ සඳහා බලපත්‍ර නිකුත් කිරීම සඳහා ය.

## පියසර පාසල් සහ ගුවන් සේවා පුහුණු සංවිධාන සෝදිසිය

පුද්ගල බලපත්‍ර අංශය පහත සඳහන් පරිදි ගුවන් සේවා පුහුණු සංවිධාන සම්බන්ධ සෝදිසි පරීක්ෂණ පවත්වා ඇත.

1. ඒෂියන් ඒවියේෂන් සෙන්ටර් - 1
2. ස්කයිලයින් ඒවියේෂන් - 2
3. ඕපන් ස්කයිස් - 4
4. කොස්මෝස් ඒවියේෂන් - 2
5. SAAS ෆලයිට් ඇකඩමි - 2
6. ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් (වර්ග ප්‍රමාණන සංවිධානය) - 1
7. ඉන්ටර්නැෂනල් ඒවියේෂන් ඇකඩමි (පියසර මෙහෙයුම් නිලධාරී පුහුණුව) - 2

## ජාත්‍යන්තර පුහුණු පාඨමාලා වලට සහභාගී වීම

අමෙරිකා එක්සත් ජනපදයේ ෆෙඩරල් ඒවියේෂන් ඇඩ්මිනිස්ට්‍රේෂන් (FAA) විසින් ඔක්ලහෝමා හි ඔක්ලහෝමා නගරයේ දී පවත්වන ලද ICAO අනුමත රජයේ නිරුපද්‍රිතතා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර) පාඨමාලාවට පුද්ගල බලපත්‍ර ශාඛාවේ පරීක්ෂකවරු දෙදෙනෙකු සහභාගී වූහ.

### ගුවන් සේවා වෛද්‍ය ඒකකය සඳහා කැඳවුම් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම

CAASL ප්‍රධාන කාර්යාලයෙහි පිහිටුවා ඇති ගුවන් සේවා වෛද්‍ය මධ්‍යස්ථානයෙහි වෛද්‍ය පරීක්ෂණ පවත්වන විට ඒ සඳහා පැමිණෙන සේවාලාභීන්ට තම තමන්ගේ වාරය එළඹෙන තුරු ආලින්දයෙහි රැඳී සිටීමට සිදුවේ. ගුවන් සේවා වෛද්‍ය මධ්‍යස්ථානය සහ ආලින්දය අතර සන්නිවේදනය පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියට ගැළපෙන පරිදි සකස් කරන ලද කැඳවීම් ක්‍රමයක් මගින් සංඛ්‍යාංකනය කරන ලදී. මෙය CAASL ප්‍රතිරූපය වර්ධනය වීමට ද හේතුවක් විය.

### ගගන නාවික තොරතුරු චක්‍රලේඛයක් (AIC) නිකුත් කිරීම

"ගුවන් නියමු බලපත්‍ර පරිවර්තනය කිරීම සඳහා දැනුම අවශ්‍යතා" සම්බන්ධ ගගන නාවික තොරතුරු චක්‍රලේඛයක් මෙම අංශය විසින් කරන ලදී.

### බහු-එන්ජින් පුහුණු වැඩසටහන් අනුමත කිරීම

මෙහෙයුම් අංශයේ පරීක්ෂකවරුන්ගේ තාක්ෂණික සහාය සහිතව මාලදිවයිනේ ඒෂියන් ඇකඩමි ඔෆ් ඒරොනොටික්ස් ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන බහු-එන්ජින් පුහුණු වැඩ සටහනකට මෙම අංශය විසින් අනුමැතිය දෙන ලදී.

### විදේශ ගුවන් නියමුවන් බඳවා ගැනීම

ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සමාගම් වලට සහ දේශීය ගුවන් ප්‍රවාහන සමාගම් වලට විදේශ ගුවන් නියමුවන් හැට දෙදෙනෙකු(62) බඳවා ගැනීමට මෙම අංශය අනුමැතිය දී ඇත.

### වෛද්‍ය පරීක්ෂණ වෛද්‍ය මණ්ඩල රැස්වීම්

පුද්ගල බලපත්‍ර අංශයේ ගුවන් වෛද්‍ය මධ්‍යස්ථානය ගුවන් නියමුවන්ට සහ ගුවන් ගමන් පාලක වරුන්ට පුද්ගල බලපත්‍ර නිකුත් කිරීම සඳහා 2012 වර්ෂය තුළ පහත සඳහන් පරිදි වෛද්‍ය පරීක්ෂණ පවත්වා ඇත.

1. ප්‍රථම වරට වෛද්‍ය පරීක්ෂණ - 213
2. වෛද්‍ය පරීක්ෂණ අළුත් කිරීම් - 653

මේ හැරුණු විට මෙම මධ්‍යස්ථානය වෛද්‍ය සහතික වල අවිනිශ්චිත තත්වයන් නිරාකරණය කිරීම සඳහා වෛද්‍ය මණ්ඩල රැස්වීම් පහක් (05) ද පවත්වා ඇත.

### නම් කරන ලද රෝහල් සමග ගිවිසුම් අළුත් කිරීම

ගුවන් නියමුවන් සහ ගුවන් ගමන් පාලකවරුන් සම්බන්ධ වෛද්‍ය විමර්ශන පැවැත්වීම සඳහා ආසිරි ශල්‍ය රෝහල සහ ලංකා හොස්පිටල් සමග අත්සන් කර තිබුණු ගිවිසුම් අළුත් කරන ලදී.

## මෙහෙයුම් අංශය

### රෙගුලාසි විකාශනය

2012, වර්ෂය තුළ මෙහෙයුම් අංශය ICAO ඇමුණුම් කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති ප්‍රසිද්ධ කර ඇත.

6-ඇමුණුම -1 කොටස -1 පරිච්ඡේදය - පියසර අනුකාරක අනුමත කිරීම සඳහා සුදුසුකම්, 6 ඇමුණුම-2 කොටස, 18 ඇමුණුම- අන්තරායකාරී ද්‍රව්‍ය ගුවනින් ප්‍රවාහනය කිරීම සහ 9 ඇමුණුම-සුසාධනය මෙකී ඇමුණුම් වේ.

### මග පෙන්වීම් ලේඛන විකාශනය

2012 වර්ෂය තුළ මෙහෙයුම් අංශයට පහත සඳහන් මගපෙන්වීම් ලේඛන විකාශනය කළ හැකි විය.

1. SLCAP -4400 ට සංශෝධන
2. CLCAP -4410 ට සංශෝධන
3. සිවිල් ගුවන් සේවා නිරුපද්‍රිතතා තක්සේරුව (CASA)-රැම්ප් පරීක්ෂණ සඳහා මගපෙන්වීම
4. අන්තරායකාරී ද්‍රව්‍ය ගුවනින් ප්‍රවාහනය කිරීම-කාර්ය උපදෙස්
5. නිරුපද්‍රිතතා සහ හදිසි අවස්ථා කාර්ය පටිපාටි (SEP) සංග්‍රහය විකාශනය කිරීම සඳහා සැසඳුම් ලැයිස්තුව
6. ද්වි-එන්ජින් මෙහෙයුම් පරාසය දීර්ඝ කිරීම (ETOPS) සහ CAT 11/111 යෙදුම් සම්බන්ධව නව න්‍යායයක් විකාශනය කිරීම
7. පියාසර අනුකාරක පුහුණු උපක්‍රමිකය (FSTD) සඳහා යාවත්කාල කරන ලද සැසඳුම් ලැයිස්තුව

### කාර්ය මණ්ඩල පුහුණුව

2012 වර්ෂය තුළ මෙම අංශයේ පරීක්ෂක වරුන්ට සහ සාමාන්‍ය කාර්ය මණ්ඩලයට දේශීය පුහුණුව මෙන්ම විදේශ විශේෂඥ පුහුණුව ද ලබා දී ඇත.

### ගුවන් යානා මෙහෙයුම්කරුවන් සහතික කිරීම

2012 වර්ෂය තුළ මෙහෙයුම් අංශය තවත් විදේශ ගුවන් ප්‍රවාහන සමාගම් දෙකක් (02) (ටයිගර් එයාර්වේස්,

වින්ඩ්රෝස් ඒවියේෂන්) ශ්‍රී ලංකාව තුළට සහ ඉන් පිටතට මෙහෙයුම් සිදුකිරීම සඳහා සහතික කළේය.

මේ වන විට මෙසේ නිකුත් කර ඇති බලපත්‍ර සම්පූර්ණ සංඛ්‍යාව 52 කි. දැනට නොයෙකුත් විදේශ ගමනාන්තයන්හි සිට කොළඹට මෙහෙයුම් සිදු කරන විදේශ මෙහෙයුම් කරුවන්ගේ සංඛ්‍යාව 36 කි.

ගුවන් යානා මෙහෙයුම්කරු සහතික ලබා ගැනීම සඳහා මෙම වර්ෂය තුළ අයදුම්පත් හතරක් (04)- (සැෆ්රන් ඒවියේෂන්, ලක්වින් එයාර්, හයිබ්‍රිඩ් ඒවියේෂන් සහ ෆලයම් එයාර්ලයින්) මෙම අංශය වෙත ලැබී ඇති අතර දැනට එම අයදුම් පත්‍ර සම්බන්ධව කටයුතු කරමින් පවතියි. සහතික අපේක්ෂා කරන අයදුම්කරුවන් තිදෙනෙකු (03) පූර්ව-අයදුම් රැස්වීම් පවත්වන ලද අතර සී/ස සැෆ්රන් ඒවියේෂන් (පුද්) සමාගම සමග විධිමත් අයදුම් රැස්වීමක් පවත්වන ලදී.

ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම පුහුණු කාර්‍යයන් සඳහා එහි A320 අනුකාරකය (Simalator) ස්ථාපනය කර තිබුණු අතර 2012 වර්ෂය තුළ පුහුණු කටයුතු සඳහා එහි සුදුසුකම් ඇගයීමට පරීක්ෂකවරුන් යොදවන ලදී. මීට අමතරව ස්කයිලයින් සමාගමේ පියසර සංතරණ කාර්‍ය පටිපාටි පුහුණුකාරකයක් ද මෙම අංශයේ පරීක්ෂක වරුන්ගේ ඇගයීමකින් පසු පුහුණු කාර්‍යයන් සඳහා අනුමත කරන ලදී.

සවුත් ඒෂියා ඒවියේෂන් සර්විසස් (පුද්) සමාගමේ භූමි පාසලට අදාළ අත්පොත් ඇගයීමට භාජනය කළ මෙම අංශය 2012 වර්ෂයේ දී ඒ සඳහා අනුමැතිය ලබා දී ඇත.

මීට අමතර මෙම අංශය විසින්, පුහුණුව, භූමි මෙහෙයුම්, සර්ව-කාලගුණ මෙහෙයුම්, පියසර මෙහෙයුම්, භාරය සහ තුලනය, පියසර පිටත් කිරීම, නිරුපද්‍රිතතා කළමනාකරණය ආදියට අදාළ විවිධ අත්පොත් ගණනාවක් 2012 වර්ෂය තුළ ඇගයීමෙන් පසු අනුමත කරන ලදී.

දේශීය ගුවන් සේවාවන්හි නිරත වන ගුවන් ප්‍රවාහන සමාගම් සංඛ්‍යාව වැඩි වී ඇත. මෙම අංශයේ පරීක්ෂකවරු, සහතික කිරීමේ අවශ්‍යතා සම්පූර්ණ වී ඇත්දැයි නිශ්චය කිරීම සඳහා සෙස්නා 20 සහ MA 60 වර්ගයන්හි ගුවන් යානා සම්බන්ධ ඔප්පු කිරීමේ පියසර පැවැත්වූහ. මීට අමතරව සිවිල් ගුවන් සේවා අධිකාරිය ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගමේ ඉපිලියානා මෙහෙයුම් (Float Plane Operations) සඳහා ජලාශ ගුවන් තොටුපොළ වශයෙන් සහතික කිරීමට මහවිලච්චිය, මඩකලපුව, පාසිකුඩා සහ දඹුගම ජලාශ සම්බන්ධ ඔප්පු කිරීමේ පියසර ද පැවැත්වී ය.

## සෝදිසි කටයුතු

මෙම අංශය මෙහෙයුම් කරුවන්ගේ අනුවෘත්‍යය පරීක්ෂා කිරීම සඳහා නොකඩවා සෝදිසි කාර්‍යයන් ඉටු කරන ලද අතර අනතුරු/සිදුවීම් විමර්ශනය කාර්‍යයන්හි එලදායී අන්දමින් නිරතවීය. රැම්ප් (RAMP) පරීක්ෂණ, ප්‍රධාන මූලස්ථාන පරීක්ෂණ DCP අධීක්ෂණය, නියාමන විගණන, පුහුණු කිරීමේ නිරීක්ෂණ සහ ස්ථාන පහසුකම් නිරීක්ෂණ ඉහත කී සෝදිසි කාර්‍යයන් වීය. මීට අමතරව මෙම අංශයේ පරීක්ෂකවරු දේශීය ඉපිලියානා (Float Plane) මෙහෙයුම් සහ හෙලිකොප්ටර් මෙහෙයුම් සඳහා පහසුකම් සැපයීම පිණිස ජලාශ ගගන යාත්‍රාංගන සහ හෙලිපැඩ් සහතික කිරීමේ පරීක්ෂණ වල ද නිරත වූහ.

දිනෙන් දින වර්ධනය වෙමින් පැවති පුහුණු කිරීමේ නියමුවන් සහ සැසඳුම් නියමුවන් සඳහා ඉල්ලුමට මුහුණ දීමේ අරමුණෙන් කුඩා මෙහෙයුම් කරුවන් කටයුතු සඳහා නම් කරන ලද පරීක්ෂක නියමුවන් තිදෙනෙකු (03) හඳුන්වා දෙන ලදි. සැසඳුම් පියසර පැවැත්වීමේ කාර්‍යය මෙකී නම් කරන ලද පරීක්ෂක නියමුවන්ට (DPE) පවරා ඇත. 2012 වර්ෂය තුළ මීට අමතරව නම් කරන ලද සැසඳුම් නියමුවන් හත් දෙනෙක් ද (07) අළුතෙන් පත් කරන ලදී. CAASL විසින් නියම කරන ලද මැදිරි නිරුපද්‍රිතතා අවශ්‍යතා ගැන සලකමින් නිරුපද්‍රිතතා පරීක්ෂකවරුන් හතර (04) දෙනෙක් ද පත් කරන ලදී.

පරීක්ෂකවරුන්ට කාලය ඉතිරි කරගනිමින් ඔවුන්ගේ පරීක්ෂණ වාර්තා පරිගණක මාධ්‍යයෙන් (ONLINE) ඉදිරිපත් කළ හැකි විද්‍යුත් සැසඳුම් ලැයිස්තු (E'CHECKLIST) පද්ධතියක් හඳුන්වා දෙමින් සෝදිසි කාර්‍යයන් වඩා හොඳින් ඉටු කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දුන්නේය.

## බලාත්මක කිරීමේ පියවර

කර්මාන්තයේ වාර්තා වූ සිදුවීම් දෙකක් විමර්ශනය කළ මෙම අංශයේ පරීක්ෂකවරු එවැනි සිදුවීම් යළි ඇති වීම වැළැක්වීම සඳහා අදාළ ගුවන් ප්‍රවාහන සමාගම් වෙත නිවැරදි කිරීමේ නිර්දේශ ඉදිරිපත් කළහ.

1998 වර්ෂයේදී AN 26 වර්ගයේ ගුවන් යානයට සිදු වූ අනතුර විමර්ශනය කිරීම සඳහා පත්කරන ලද අනතුරු විමර්ශන මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් මෙම අංශයේ පරීක්ෂකවරුන් දෙදෙනෙකු පත් කරන ලදී.

### සංවිධානමය කරුණු

2012 වර්ෂයේදී සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලදි. ගුවන් සේවා ශත සංවත්සර උත්සව කටයුතු වලට මෙම අංශය ද සහභාගී වීය. පසුගිය දස වසර තුළ සිදු වූ වෙනස්කම් වලට ගැළපෙන පරිදි මෙම අංශයේ කාර්‍ය්‍ය පටිපාටි වෙනස් කිරීම සඳහා කාර්‍ය්‍ය පටිපාටි අත්පොතක් කෙටුම්පත් කරන ලදී. මෙය තව දුරටත් දියුණු කිරීමට අංශයේ සැලකිල්ල යොමු වී ඇත.

තවදුරටත්, සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි සහ වෙනත් සංවිධාන වල පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමේ කාර්‍ය්‍යයන්ටද මෙම අංශය සහය වී ඇත.

## ගුවන් යෝග්‍යතා අංශය

### අඛණ්ඩ ගුවන් යෝග්‍යතාව

ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගමේ එයාර් බස් Airbus A-320 ගුවන් යානා 08 ක්, A-330 ගුවන් යානා 07ක් සහ A-340 ගුවන් යානා 06ක් වශයෙන් වූ ගුවන් යානා 21ක ඇණියකත්, මිහින් ලංකා සමාගමේ A-320 ගුවන් යානා 04 කින් නඩත්තු කටයුතු සම්බන්ධ සෝදිසි කාර්යයන් ගුවන් යෝග්‍යතා අංශය විසින් ඉටු කරන ලදී. 2012 වර්ෂය තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ගුවන් යෝග්‍යතා සහතික අටක් (08) මුල්වර නිකුත් කරන ලද අතර ගුවන් යෝග්‍යතා සහතික දාහතක් (17) අළුත් කරනු ලැබ ඇත. ගුවන් යෝග්‍යතා අංශය දේශීය ගුවන් සේවාවන් හි නිරත වන සමාගම් සම්බන්ධ සෝදිසි කටයුතු ඉටු කර ඇත.

### ගුවන් යානා නඩත්තු සංවිධාන

2012 වර්ෂය තුළ ගුවන් යෝග්‍යතා අංශය, අවශ්‍ය ඇගයීම් සිදු කිරීමෙන් පසු ගුවන් යානා නඩත්තු සංවිධාන දහයකට මුල් වර අනුමැතිය ලබා දී ඇත. විදේශ-මූල සහ රේඛීය නඩත්තු සංවිධාන තිස් හතරකත් (34) දේශීය නඩත්තු සංවිධාන අටකත් (08) බලපත්‍ර අළුත් කර ඇත.

### තෙවන පාර්ශවයේ නඩත්තු වැඩ

CAASL විසින් නඩත්තු පහසුකම් නිරීක්ෂණය කිරීමෙන් පසු, තායි එයාර්වේස් සහ සිංගප්පූර් එයාර්ලයින්ස් සමාගම් සතු, ශ්‍රී ලංකාව තුළට හා ඉන් පිටතට මෙහෙයුම් සිදුකරන ගුවන් යානාවන් හි තෙවන පාර්ශවයේ නඩත්තු වැඩ ඉටු කිරීම සඳහා එමිරේට්ස් එයාර්ලයින් සමාගමට අනුමැතිය ප්‍රදානය කරන ලදී.

### ගුවන් යානා ලියාපදිංචි කිරීම

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ CAASL විසින් ගුවන් යානා අටක් (08) මුල්වරට ලියාපදිංචි කරන ලද අතර ගුවන් යානා පනස් එකක (51) ලියාපදිංචි කිරීමේ සහතික අළුත් කරන ලදී. අයිතිකරුගේ ඉල්ලීම මත සී/ස ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගමේ ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකය යටතේ මෙහෙයුම් කිරීමට හැකිවෙන පරිදි ගුවන් යානා දෙකකත් (02), එක් (01) බැලූනයකත් අයිතිය මාරු කරන ලදී.

### නිරුපද්‍රිතතා අධීක්ෂණය

අනුමත රැම්ප් (Ramp) පරීක්ෂණ උප ලේඛනයට අනුකූලව 2012 වර්ෂය තුළ රැම්ප් පරීක්ෂණ එකසිය දෙකක් (102) පවත්වන ලදී. මෙම පරීක්ෂණ වලදී හෙළිවූ ඌණතා විසි හතරක් (24) වහාම නිවැරදි කිරීම සඳහා අදාළ මෙහෙයුම්කරුවන් වෙත දන්වා යවන ලදී.

### වීසා සඳහා නිර්දේශ

සිවිල් ගුවන් සේවා අධිකාරිය භූමි ඉංජිනේරුවන්ට ගොඩබැසීමේ පිටසන් සහ නේවාසික වීසා සඳහා නිර්දේශ නිකුත් කළේය. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ භූමි ඉන්ජිනේරුවරුන් හතලිස් තුන් (43) දෙනෙකු සඳහාත් නඩත්තු පුහුණු ශිෂ්‍යයින් විසි නව (29) දෙනෙකු සඳහාත් මෙවැනි නිර්දේශ නිකුත් කර ඇත.

### නඩත්තු ඉංජිනේරු බලපත්‍ර

ගුවන් යෝග්‍යතා අංශය AME (BL) විභාග දෙකක් (02), AML විභාග දෙකක් (02), AME(BL)-AML පරිවර්තන විභාග දෙකක් (02) සහ විශේෂ මානව සාධක (Module 09) විභාග දහතුනක් ද (13), 2012 වර්ෂය තුළ පවත්වා ඇත. ගුවන් යානා වර්ග සඳහා විභාග-කොස්මෝස් ඒවියේෂන් සඳහා රොබින්සන්-R-66 එකක් (01), එක්ස්පෝ ඒවියේෂන් සඳහා DC-8 එකක් (01), එක්ස්පෝ ඒවියේෂන් සඳහා සෙස්නා 208 තුනක් (03), ඩෙකෑන් ඒවියේෂන් සඳහා GA-08 එකක් (01) සහ සෙනොක් ඒවියේෂන් සඳහා AS 350-B එකක් (01) ද නඩත්තු කාර්‍ය්‍යයන්හි නිරතවන පුද්ගලයින් වෙනුවෙන් පවත්වා තාවකාලික සහතික නිකුත් කර ඇත.

## අමතර කොටස් සඳහා අනුමැතිය දීම

ගුවන් යෝග්‍යතා අංශයේ නිර්දේශ මත DGCA විසින් ගුවන් යානා අමතර කොටස් ආනයනය කිරීමට සහ අපනයනය කිරීමට අනුමැතිය දෙනු ලැබේ. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ ගුවන් යෝග්‍යතා අංශය එක්ස්පෝ ඒවියේෂන් සමාගමේ අයදුම්පත් හැට නවයක් ද (69), ඩෙකෑන් ඒවියේෂන් සමාගමේ අයදුම්පත් පහළොවක් ද (15), ඒෂියන් ඒවියේෂන් සෙන්ටර් හි අයදුම්පත් අටක් (08) ද, දයා ඒවියේෂන් සමාගමේ අයදුම්පත් දහයක් ද (10), කොස්මොස් ඒවියේෂන් සර්විසස් සමාගමේ අයදුම්පත් විසි අටක් (28) ද, ස්කයිලයින් ඒවියේෂන් සමාගමේ අයදුම්පත් හයක් ද (06), ඕපන් ස්කයිස් සමාගමේ අයදුම්පත් හතලිස් හතක් (47) සහ සෙනොක් ඒවියේෂන් සමාගමේ අයදුම්පත් දහසයක් (16) නිර්දේශ කර ඇත.

ගුවන් යෝග්‍යතා ශාඛාව

# ඒකාබද්ධ ශාඛාව

## ගුවන් ප්‍රවාහන හා නීති කටයුතු අංශය

### ගුවන් සේවා සංඛ්‍යා ලේඛන

සමාලෝචනයට භාජනය වන කාලසීමාව තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය ශ්‍රී ලංකාවේ ගුවන් සේවා කටයුතු පිළිබඳ දත්ත සහ තොරතුරු කලට වේලාවට ICAO වෙත ලබා දෙමින් එහි වගකීම නිසි පරිදි ඉටු කර ඇත.

### ගුවන් ප්‍රවාහන සමාගම් මෙහෙයුම්


තායි-එයාර් ඒෂියා සමාගම සහ ටයිගර් එයාවේස් සමාගම 2012 වර්ෂය තුළ ශ්‍රී ලංකාව තුළ මෙහෙයුම් සිදු කිරීම ආරම්භ කරන ලදී. ටයිගර් එයාවේස් සමාගම සිංගප්පූරුව මූලස්ථානය කරගත් අඩු වියදම් ගුවන් ප්‍රවාහන සමාගමකි. තායි එයාර් ඒෂියා සමාගම ජනප්‍රිය අඩු වියදම් ගුවන් ප්‍රවාහන සමාගමක් වන මැලේසියාවේ එයාර් ඒෂියා බර්හාඩ් සමාගමේ තායිලන්ත ශාඛාවය. අළුත් කුලී මෙහෙයුම්කරුවකු වන යුක්රේනයේ වින්ඩ්රෝස් සමාගම ද 2012 ඔක්තෝබර් මාසයේ සිට ශ්‍රී ලංකාව තුළට මෙහෙයුම් ආරම්භ කළේය. මව් සමාගමේ පරිපාලනමය තීරණයක් නිසා 2012 මුල් භාගයේ ශ්‍රී ලංකාව තුළට මෙහෙයුම් සිදු කිරීම අත්හිටුවා තිබුණු ඉන්දියානු අඩු වියදම් ගුවන් ප්‍රවාහන සමාගමක් වන එයාර් ඉන්ඩියා එක්ස්ප්‍රෙස් සමාගම ද 2012 ඔක්තෝම්බර් මාසයේ දී ශ්‍රී ලංකාව තුළට මෙහෙයුම් සිදු කිරීම යළි ආරම්භ කළේ ය.

2012 වර්ෂය තුළ මිහින් ලංකා සමාගම ඉංදුනීසියාවට සහ බංග්ලාදේශයට මගී ප්‍රවාහන මෙහෙයුම් ආරම්භ කළේ ය. ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම ජපානයට සහ චීනයට මෙහෙයුම් කළ ගමන් වාර සංඛ්‍යාව වැඩි කළ අතර සූරිච් දක්වා මෙහෙයුම් යළි ආරම්භ කළේ ය.


### මගී හා නැව් බඩු චලන

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ මගී සහ නැව් බඩු චලන ප්‍රමාණයෙහි සැළකිය යුතු වර්ධනයක් වාර්තා වී තිබුණි. බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ (BIA) වෙත පැමිණි සහ ඉන් පිටත් වූ මගීන්ගේ සම්පූර්ණ සංඛ්‍යාවන් පිළිවෙලින් 3,554,969 ක් සහ 3,590,122 ක් වීය. මෙම මගීන් සංඛ්‍යාවන්ගෙන් පිළිවෙලින් මගීන් 1,948,216ක් සහ 1,946,556ක් ප්‍රවාහනය කර ඇත්තේ ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගම විසිනි. BIA වෙත පැමිණි සහ ඉන් පිට වූ මගීන්ගෙන් පිළිවෙලින් සියයට පනස් පහක් (55%) සහ සියයට පනස් හතරක් (54%) ක් මෙයින් නියෝජනය වේ.

2012 වර්ෂය තුළ BIA හි පටවන ලද ගුවන් නැව් බඩු මෙට්‍රික් ටොන් 108,043කින් සියයට හතලිස් නවයක (49%) වෙළඳපොළ කොටසක් නියෝජනය කරන මෙට්‍රික් ටොන් 52,872 ක් පටවා ඇත්තේ ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම විසින් ය. BIA හි ගොඩබාන ලද ගුවන් නැව් බඩු මෙට්‍රික් ටොන් 66,602 කින් සියයට හැට පහක් (65%) වන මෙට්‍රික් ටොන් 42,245 ක් ගොඩ බා ඇත්තේ ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම විසින් ය.




| | මගීන් | | | නැව් බඩු (මෙට්‍රික් ටොන්) | | | ගුවන්යානා චලන |
|---|---|---|---|---|---|---|---|
| | ගෙනගිය | ගොඩබාන ලද | එකතුව | පටවන ලද | ගොඩබාන ලද | එකතුව | |
| 2009 | 2,136,055 | 2,100,361 | 4,236,416 | 84,242 | 47,392 | 131,634 | 28,602 |
| 2010 | 2,657,532 | 2,609,237 | 5,266,769 | 101,207 | 59,631 | 160,838 | 33,907 |
| 2011 | 3,101,915 | 3,085,768 | 6,187,683 | 95,506 | 63,161 | 158,667 | 43,673 |
| 2012 | 3,590,122 | 3,554,969 | 7,145,091 | 108,043 | 66,602 | 174,645 | 48,734 |





ඒකාබද්ධ ශාඛාව

## සංක්‍රමණ මගීන් - BIA

කළාපයේ දියුණුවෙමින් පවතින කේන්ද්‍ර ගුවන් තොටුපොළක් වශයෙන් BIA සංක්‍රමණ මගීන් විශාල සංඛ්‍යාවකට සේවා සපයයි. සංක්‍රමණ මගීන් වැඩිම සංඛ්‍යාවක් ගෙන එන ගුවන් ප්‍රවාහන සමාගම් පහත දැක්වේ.

| ගුවන් ප්‍රවාහන සමාගමේ නම | මගීන් ප්‍රතිශතය (%) |
|---|---|
| ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් | 88% |
| මිහින් ලංකා | 8% |
| චයිනා ඊස්ටර්න් | 1% |
| ජෙට් එයාර්වේස් | 1% |
| රෝයල් ජොර්දනියන් | 1% |
| වෙනත් සමාගම් | 1% |

BIA වෙතින් පිටත්ව ගිය සංක්‍රමණ මගීන් 2012




සමාලෝචනයට භාජනය වන කාලය තුළ BIA හා සම්බන්ධ වූ වඩාත් ජනප්‍රිය නගර 05 පහත දැක්වේ.

| නගරය | පිටත්වීම් | පැමිණීම් |
|---|---|---|
| චෙන්නායි | 386473 | 414428 |
| ඩුබායි | 328532 | 336151 |
| සිංගප්පූර් | 244670 | 244487 |
| මාලේ | 244456 | 236259 |
| ඩෝහා | 237092 | 232436 |

## දේශීය ගුවන් සේවාව

2012 ජනවාරි මාසයේ සිට එක්ස්පෝ ඒවියේෂන් සමාගම ඔවුන්ගේ රත්මලාන යාපනය අතර මෙහෙයුම් නිත්‍ය උපලේඛන ගත මෙහෙයුමක් වශයෙන් යළි ආරම්භ කළේය. ඔවුන් රත්මලාන-යාපනය අතර මගීන් 5,334 දෙනෙකු ප්‍රවාහනය කරමින් රටේ දේශීය ගුවන් සේවාවේ වර්ධනයට ඔවුන්ගේ දායකත්වය ලබා දී ඇත.

ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගම සංචාරක කර්මාන්තයේ වර්ධනයට ද සැහෙන දායකත්වයක් ලබා දෙමින් 2012 වර්ෂය තුළ ද ඔවුන්ගේ AIRTAXI-ඉපිලියානා (Float-Plane) මෙහෙයුම් නොකඩවා පවත්වාගෙන ගියේය. දයා ඒවියේෂන් සමාගම ද ඔවුන්ගේ පෞද්ගලික/වාණිජ මෙහෙයුම් නොකඩවා පවත්වාගෙන ගියේය.

### ස්තබ්ධ තටු (Fixed Wing) දේශීය මෙහෙයුම්

| ගමන් ඛාණ්ඩය | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| රත්මලාන-යාපනය | 986 | 88 | 2,734 |
| යාපනය-රත්මලාන | 1,256 | 06 | 2,588 |
| රත්මලාන-ත්‍රිකුණාමලය | 39 | 83 | 52 |
| ත්‍රිකුණාමලය-රත්මලාන | 23 | 47 | 62 |

## හෙලිකොප්ටර් සහ බැලූන් මෙහෙයුම්

2004 ජූනි මාසයේ දී හෙලිකොප්ටර් මෙහෙයුම් ආරම්භ කළ සී/ස ඩෙකෑන් ඒවියේෂන් (ලංකා) සමාගම රටේ ගමනාන්ත කිහිපයකටම ඔවුන්ගේ මෙහෙයුම් නොනවත්වා පවත්වාගෙන ගියේය. කොස්මෝස් ඒවියේෂන් සමාගම ද 2011 අග භාගයේ මෙහෙයුම් ආරම්භ කළ සෙනොක් ඒවියේෂන් සමාගම ද ඔවුන්ගේ හෙලිකොප්ටර් මෙහෙයුම් නොකඩවා පවත්වාගෙන ගියහ.


එම ප්‍රදේශ වල සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයට සහයක් වන බැලුම් මෙහෙයුම් දඹුල්ල, අහුංගල්ල ආදී සංචාරක ප්‍රදේශ වල දැනට නොකඩවා පවත්වාගෙන යනු ලැබේ.

| ගුවන් යානා වර්ග | සම්පූර්ණ පියසර සංඛ්‍යාව 2011 | 2012 | සම්පූර්ණ පියසර පැය සංඛ්‍යාව 2011 | 2012 | ගමන් කළ මගීන් සංඛ්‍යාව 2011 | 2012 |
|---|---|---|---|---|---|---|
| හෙලිකොප්ටර් | 517 | 596 | 738 | 884.2 | 1809 | 2130 |
| බැලූන් | 195 | 141 | 190 | 142 | 1274 | 947 |


## සංචාරක නියෝජිතවරු

1992 අංක 55 දරණ ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනත යටතේ පනවන ලද රෙගුලාසි අනුව ශ්‍රී ලංකාවේ සියලුම සංචාරක නියෝජිතවරුන් (CAASL) විසින් නිකුත් කරනු ලබන සහ වසරක් පාසා අලුත් කරනු ලබන බලපත්‍රයක් ලබා ගත යුතු වේ. 2012 වර්ෂය තුළ මෙවැනි සංචාරක නියෝජිතවරුන්ගේ සංඛ්‍යාව වැඩිවිය. මෙහි කැපී පෙනෙන ලක්ෂණය වූයේ වේගවත් යටිතල පහසුකම් සංවර්ධනය සමග රටේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ වල සංචාරක නියෝජිත ආයතන වැඩිවීමයි. පහත දැක්වෙන ප්‍රස්ථාරයන්හි දක්වෙන්නේ මෙම සංචාරක නියෝජිත වරුන් විසින් සේවයෙහි යොදවාගෙන ඇති සේවකයින් සංඛ්‍යාවයි.


සමස්ත කාර්යය මණ්ඩලය




ස්ථිර කාර්යය මණ්ඩලය




අනියම් කාර්යය මණ්ඩලය




## ද්වි පාර්ශවීය ගුවන් සේවා සාකච්ඡා

විදේශ ගුවන් සේවා බලධාරීන් සමග පවත්වන ලද ද්වි පාර්ශවීය ගුවන් සේවා ගිවිසුම් නිගමනය කිරීමේ සාකච්ඡාවන්ට CAASL ද සහභාගී විය. 2012 වර්ෂය තුළ ඉංදුනීසියාව සහ ජපානය සමග මෙවැනි ද්වි පාර්ශවීය සාකච්ඡා පවත්වන ලද අතර එම අවස්ථා දෙකටම සිවිල් ගුවන් සේවා අධිකාරිය සහභාගී විය. ඉන්දුනිසියාව සමග අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමෙන් ගමන් වාර සංඛ්‍යාව 6 සිට 10 දක්වා වැඩි කරන ලද අතර දෙරටේම නම් කරන ලද ගුවන් ප්‍රවාහන සමාගම් වල මෙහෙයුම් නම්‍යතාව සහතික කිරීම සඳහා හවුල් සංකේත වැඩ පිළිවෙල පුළුල් කරන ලදී. ශ්‍රී ලංකාව සහ ජපානය අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමෙන් ශ්‍රී ලංකාවේ නම් කරන ලද ගුවන් ප්‍රවාහන සමාගම් වලට නරීටා ගුවන් තොටුපොළට වැඩි පිවිසුමක් ලබාදෙන පරිදි සහ දේශීය හවුල් සංකේත වැඩ පිළිවෙලට අවසර ලැබෙන පරිදි මෙහෙයුම් කොන්දේසි තව දුරටත් ලිහිල් කරන ලදී.

## ආසන වෙන්කිරීමේ සහ ගාස්තු ගණනය කිරීමේ පාඨමාලාව

2009 වර්ෂයේ දී ආරම්භ කරන ලද ආසන වෙන් කිරීමේ සහ ගාස්තු ගණනය කිරීමේ පාඨමාලාව සංචාරක කර්මාන්තයට පුහුණු ශ්‍රමිකයින් සපයාදීම අතින් ස්ථිර ප්‍රගතියක් ලබා ඇත. 2012 වර්ෂය තුළ මෙම පාඨමාලාව හැදෑරූ 5 වන සහ 6 වන කණ්ඩායම් වල සිසුහු 29 දෙනෙක් පාඨමාලාව සම්පූර්ණ කළහ.

## වාර සමායෝජනය

BIA හි ගමන් වාර වෙන් කර දීම සිදු කරනු ලබන්නේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්ගේ ප්‍රධානත්වයෙන් යුත් වාර සමායෝජන කමිටුව (SLOT Committee) මගින් එකඟ වූ නිර්ණායකයන්ට අනුවය. BIA දනට ඇති යටිතල පහසුකම් සැලකිල්ලට ගනිමින් ඕනෑම පැයක් ඇතුළත ගුවන් යානා පිටත්වීම් 10 ක සහ පැමිණීම් 12ක නිර්ණායකයකට වාර සමායෝජන කමිටුව එකඟ විය.

## පොදු ගුවන් සේවා සංවර්ධනය

පොදු ගුවන් සේවා සංවර්ධනට අදාළ කායයීයන් භාර වී ඇත්තේ ගුවන් ප්‍රවාහන අංශයටය. උණු වා බැලුන් මෙහෙයුම් වලට අමතරව වෙනත් විනෝදාත්මක ගුවන් සේවා ක්‍රියාකාරකම් වාණිජ පදනමක් මත වර්ධනය කිරීම කෙරෙහි ද උනන්දුවක් ඇති වී තිබේ.

සී/ස ස්කයි ක්ලබ් (පුද්) සමාගම විසින් ප්‍රථම වරට පැරා මෝටරිං ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදී. එම සමාගම කොග්ගල, සීගිරිය සහ පුත්තලම ප්‍රදේශ වල සිදුකරන මෙහෙයුම් වලට අමතරව පෞද්ගලික පැරා මෝටරිං මෙහෙයුම් යාපනයේ සහ නුවර එළියේ ද සිදු කරයි. නුදුරු අනාගතයේ මෙය වාණිජ ව්‍යාපාරයක් වශයෙන් දියුණු කිරීමට අදහස් කෙරේ. පැරා මෝටරිං මෙහෙයුම් සඳහා කල්පිටියේ නව පැරා මෝටරිං පිටියක් අනුමත කරන ලදී. ස්වදේශිකයින්ට අයත් අති සැහැල්ලු ගුවන් යානා දෙකක් කටුකුරුන්දේ සිට පෞද්ගලික මෙහෙයුම් සිදු කිරීම සඳහා අනුමත කරන ලදී. දුරස්ථ පාලක ආදර්ශ ගුවන් යානා පියාසර කිරීම සඳහා මීට පෙර අනුමත කර තිබුණු මීගමුව, කළුතර සහ කටුකුරුන්ද බිම් පෙදෙස් වලට අමතරව නාවල ප්‍රදේශයේ ද නව බිම් පෙදෙසක් අනුමත කරන ලදී.

### පාරිභෝගික පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීම

පාරිභෝගික කටයුතු අධිකාරියේ සහයෝගය සහිතව 2011 දී විකාශනය කරගත් පාරිභෝගික පැමිණිලි පිළිබඳ කටයුතු කිරීමේ යාන්ත්‍රණය මතභේද නිරවුල් කරමින් තව දුරටත් කර්මාන්තයට සහයක් විය. මෙම අංශය ගුවන් ප්‍රවාහන සමාගම් වලට/සංචාරක නියෝජිත වරුන්ට විරුද්ධව ලැබුණු පැමිණිලි දහ අටක් (18) සම්බන්ධව කටයුතු කර ඇත. තව දුරටත් මෙම අංශය ගුවන් ගමන් වලට අදාළ සංචාරකයින්ගෙන් සංචාරක පොලිසියට ලැබුණු පැමිණිළි සම්බන්ධව කටයුතු කිරීමට සංචාරක පොලිසියට ද සහය විය.

### ගුවන් ප්‍රවාහන කර්මාන්තයේ හවුල්කරුවන් සමග රැස්වීම්/වාණිජ දෙපාර්තමේන්තුව

ගුවන් ප්‍රවාහන කර්මාන්තයේ ධනාත්මක වර්ධනයක් සහතික කිරීම සඳහා මෙම අංශය, ගුවන් ප්‍රවාහන සමාගම් නියෝජිත මණ්ඩලය, ගුවන් ප්‍රවාහන සමාගම් නියෝජිතයින්ගේ ශ්‍රී ලංකා සංගමය, ශ්‍රී ලංකා සංචාරක නියෝජිතවරුන්ගේ සංගමය, IATA නියෝජිතවරුන්ගේ සංගමය ආදී කර්මාන්තයට සම්බන්ධ සංවිධාන සමග ද වාණිජ දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතන සමග ද නිතිපතා රැස්වීම් පැවැත්විය.

### උපාධි අපේක්ෂකයන්ට සේවාස්ථ පුහුණුව

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ මොරටු සහ කොළඹ විශ්ව විද්‍යාල වලින් පැමිණි උපාධි අපේක්ෂකයින් දෙදෙනෙකු CAASL හි හය මසක සේවාස්ථ පුහුණුවක් ලබා ගත්හ. මෙම පුහුණු වැඩ සටහන සමායෝජනය කරන ලද්දේ මෙම අංශය විසින්ය. මෙම පුහුණුව අතරතුර උපාධි අපේක්ෂකයින්ට ස්ථාන නැරඹීම සඳහා අධ්‍යාපන චාරිකා සුදානම් කර දීමෙන් ඔවුන් කර්මාන්තයට නිරාවරණය කරන ලදී. DD(ATαLA) ඔවුන්ගේ අධීක්ෂණ නිලධාරී ලෙස කටයුතු කළේය. මේ වන විට මොරටු විශ්ව විද්‍යාලයේ ප්‍රවාහන හා සහාය සේවා කළමණාකරණ අධ්‍යායනාංශයේ සිසුන් අට (08) දෙනෙකුටත් කොළඹ විශ්ව විද්‍යාලයේ සිසුන් හතර (04) දෙනෙකුටත් මෙම පුහුණුව ලබා දී ඇත.

## මානව සම්පත් හා කාර්යාල කළමණාකරණ අංශය


### CAASL හි 10වන සංවත්සරය

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය 2012 දී එහි දස වන වසර සම්පූර්ණ කළේය. ඊට සමගාමීව එම වර්ෂයේදී ම ශ්‍රී ලංකාවේ ගුවන් සේවාවට සිය වසරක් සම්පූර්ණ වීම ද සිදු වීය. ගුවන් සේවා ශත සංවත්සර සැමරුම් උත්සව අතර ප්‍රධාන උත්සවය පවත්වන ලද්දේ අතිගරු ජනාධිපතිතුමන්ගේ අනුග්‍රහය සහිතව අරලියගහ මන්දිරයේදී ය. CAASL හි සේවා වනිතා ඒකකය මේ නිමිත්තෙන් ලේ දන් දීමේ ව්‍යාපාරයක් සංවිධානය කළ අතර සිවිල් ගුවන් සේවා අධිකාරිය පසුගිය දස වසර තුළ අත්කරගත් කැපීපෙනෙන ජයග්‍රහණ පිළිබඳ පොත් පිංචක් එළි දැක්වීමට කටයුතු ආරම්භ කර ඇත.

### කාර්ය මණ්ඩලය

CAASL හි වර්තමාන අනුමත සේවක සංඛ්‍යාවෙහි තනතුරු එකසිය හැට හයක් (166) ක් ඇත. එක් ප්‍රධාන විධායක නිලධාරියෙකු ඇතුළු ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් විසි පස් දෙනෙකු (25), විධායක නිලධාරීන් තිස් පස් දෙනෙකු (35), කාර්යය භාර නිලධාරීන් පනස් පස් දෙනෙකු (55) සහ සහයක කාර්යය මණ්ඩලය තිස් තුන් දෙනෙකු (33) මීට ඇතුළත්ය. 2012 දෙසැම්බර් අවසානය වන විට CAASL හි සේවයෙහි යෙදී සිටි සේවකයින් සංඛ්‍යාව එකසිය හතලිස් අටකි (148).

## ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය - කාර්‍ය බද්ධ වගකීම් සටහන



## කාර්‍ය මණ්ඩල සුභසාධනය

සේවකයින්ට සහ ඔවුන්ගේ ආසන්න පවුල් සාමාජිකයන්ට පිරිනමන සුභ සාධක පහසුකමක් වශයෙන් සිවිල් ගුවන් සේවා අධිකාරිය එහි වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය නොකඩවා පවත්වාගෙන ගියේය. 2012 මැයි මාසයේ පටන් කාල සීමාව තුළ මෙම යෝජනා ක්‍රමය යටතේ ගෘහස්ථ පහසුකම් වශයෙන් රු.1,277,065.71/= ක මුදලක් ද බාහිර පහසුකම් වශයෙන් රු.2,541,819.04/= ක මුදලක් ද සේවකයින් එකසිය විසිහය දෙනෙකුට ද (126) ගෙවා ඇත.

මෙම වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයට අමතරව CAASL වැඩ බිම් අවදානම ආවරණය කිරීම සඳහා අනතුරු රක්‍ෂණ සහතිකයක් ලබාගැනීමට ද පියවර ගෙන ඇත.

සේවකයින්ට සහය වීමක් වශයෙන් සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් රු. 3,705,886/= මුදලක් ආපදා ණය වශයෙන් සේවකයන් විසි අට දෙනෙකුට (28) රු. 5,145,500/=ක මුදලක් දේපොළ ණය වශයෙන් සේවකයින් හතර (04) දෙනෙකුට ද සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ ගෙවන ලදී. මීට අමතරව 2012 වර්ෂය තුළ වාහන හා යතුරු පැදි මිලට ගැනීම සඳහා ණය මුදල් වශයෙන් රු 8,794,610/= ක මුදලක් ද ගෙවා ඇත. එක් සේවකයෙකුට ත්‍රීරෝද රථයක් මිලදී ගැනීම සඳහා රු 380,700/=ක ණය මුදලක් ද ගෙවා ඇත.

## පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ, වැඩමුළු, රැස්වීම් සහ සම්මේලන

CAASL හි අරමුණු ඉටුකර ගැනීම සඳහා ඊට ගැළපෙන නිපුණතා සහිත වෘත්තියමය කාර්යය මණ්ඩලයක් සිටිය යුතු හෙයින් සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ එහි කාර්යය මණ්ඩලයේ දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා සම්මන්ත්‍රණ, වැඩමුළු, රැස්වීම් සහ සම්මේලන සඳහා රු. 36,928,683.25/= ක මුදලක් වැය කර ඇත. 2012 වැඩසටහන් අයවැයෙහි සහ 2012 පුහුණු වැඩසටහනෙහි හඳුනා ගන්නා ලද පුහුණු අවශ්‍යතා සඳහා වාර්ෂික අයවැය ප්‍රතිපාදන ඇතුළත පහසුකම් සලස්වන ලදී.

විධායක නිලධාරීන්ට සහ කාර්‍යභාර නිලධාරින්ට පිරිනමන ලද විදේශ පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ, රැස්වීම්, සාකච්ඡා හා සම්මේලන ඇතුළු මිනිස් දින හාරසිය හතක් (407) ආවරණය වන මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් අසූවක් (80) මෙම වර්ෂය තුළ සිදුකර ඇත. මිනිස් දින අටසිය අනූ එකක් (891) ආවරණය වන දේශීය පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ, වැඩමුළු රැස්වීම් හා සම්මේලන ඇතුළු දේශිය ක්‍රියාකාරකම් එකසිය දාහතක් (117) විධායක නිලධාරීන්ට හා කාර්යය භාර නිලධාරීන්ට පිරිනමා ඇත. මේ අනුව සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ මිනිස් දින 1298ක් ආවරණය වන පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ, වැඩමුළු, රැස්වීම් හා සාකච්ඡා අවස්ථා එකසිය අනූ හතක් (197) කාර්‍ය මණ්ඩලයට ප්‍රදනය කර ඇත.

## තාක්ෂණික පුස්තකාලය

CAASL තාක්ෂණික පුස්තකාලයේ ප්‍රධාන අරමුණ වන්නේ ගුවන් සේවාව කෙරෙහි උනන්දු වන පුද්ගලයන්ගේ දැනුම වර්ධනය කිරීමට සහය වීමයි. CAASL හි කාර්යය මණ්ඩලයට අයත් පුද්ගලයන් මෙන්ම ගුවන් සේවා කර්මාන්තයේ නිරත වන පිටස්තර පුද්ගලයින් ගණනාවක් තාක්ෂණික පුස්තකාලය පරිහරණය කරමින් ඊට අනුග්‍රහය දක්වා ඇත.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ තාක්ෂණික පුස්තකාලය පරිහරණය කරන පිටස්තර පුද්ගලයින්ගේ සංඛ්‍යාව 23% කින් වැඩි වී තිබිණ. එය සම්පත් සහ දැනුම් මධ්‍යස්ථානයක් වශයෙන් සේවය කරයි. 2012 වර්ෂය තුළ පුස්තකාලයට අළුත් ප්‍රකාශන මිලදී ගැනීම සඳහා රු. 181,147/= ක මුදලක් වැය වී ඇත. මීට අමතරව කාර්‍ය මණ්ඩලය අතර තොරතුරු බෙදා හැරීම වඩාත් කාර්‍යක්‍ෂම අන්දමින් සිදු කිරීම පිණිස තාක්‍ෂණික පුස්තකාලය විසින් කාර්‍යාලයේ ඒ ඒ අංශ වල පුස්තකාල ද විවෘත කරනු ලැබ ඇත.

## CAASL වෙබ් අඩවිය

www.caa.lk- CAASL වෙබ් අඩවිය නව පෙනුමක් සහිත අන්තර්ගත කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දෙමින් නව තාක්ෂණය යොදා යාවත්කාලීන කරන ලදී. වර්තමාන අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් එහි ඇතුළත් වී ඇති තොරතුරු ප්‍රතිසංවිධානය කර ඇත. අළුත් තොරතුරු එකතු කරමින් වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම ද නොකඩවා සිදු කරන ලදී.

## CAASL ඒකාබද්ධ සැලැස්ම සහ ක්‍රියාත්මක වැඩසටහන්

2012-2013 වර්ෂය සඳහා වූ ඒකාබද්ධ සැලැස්ම සකස් කර එය අවසාන වශයෙන් සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇත. විකසනය වෙමින් පවතින රාජ්‍ය

ප්‍රතිපත්ති සහ CAASL පරිචයන් සමග ගැළපෙන පරිදි ඉටුකළ යුතුව ඇති කාර්යයන් නියෝජනය වන පරිදි සැලැස්මේ වැදගත් අංශ සමහරක් සංශෝධනය කරන ලදී. මේ අනුව, ඉටු කළ යුතුව ඇති කාර්යයන් සඳහා කාල වකවානු නියම කරමින් ඒ ඒ ශාඛා, අංශ සහ ඒකක වලට අයත් වාර්ෂික ක්‍රියාත්මක වැඩසටහන් ද විකාශනය කරන ලදී.

### කාර්යාල නඩත්තුව පිළිබඳ කාර්යයන්


2012 වර්ෂයේදී ද සිවිල් ගුවන් සේවා අධිකාරියේ ප්‍රධාන කාර්යාලය ඊට පෙර පැවති ස්ථානයේ පවත්වා ගෙන යන ලදී. 2012 වර්ෂය තුළ ප්‍රධාන ගොඩනැගිල්ල නිසි පරිදි නඩත්තු කරන ලද අතර සිත් ගන්නා සුළු පෙනුමක් ඇතිවන පරිදි උසස් තත්වයකින් පවත්වාගෙන යන ලදී.

වර්ෂයේ මුල් කාර්තුව තුළ රත්මලානේ පිහිටි කාර්යාල නිල නිවාසය රු.1,768,500/= + VAT 12% වියදමකින් අළුත් වැඩියා කරන ලදී.

### CAASL ස්වයංකරණය

සිවිල් ගුවන් සේවා අධිකාරිය එහි අභ්‍යන්තර සංදේශනයේදී M.S හුවමාරු පද්ධතිය මත වැඩියෙන් යැපෙමින් IT පද්ධති සහ කාර්යයන් පවත්වාගෙන ගියේය. තවදුරටත් CAASL පරීක්ෂකයින්ගේ ප්‍රායෝජනය සඳහා ඔවුන් විදේශගතව සිටියදී පවා පිවිසිය හැකි විද්‍යුත් සැසඳුම් ලැයිස්තුවක් (E - check List) හඳුන්වා දෙන ලදී. මූල්‍ය කළමණාකරණ අංශය විසින් වෙනම මූල්‍ය කළමනාකරණ පද්ධතියක් ද CAASL තුළ හඳුන්වා දෙන ලදී.

### CAASL කාර්යය මණ්ඩලය ලබාගත් නිවාඩු




## මූල්‍ය කළමනාකරණ අංශය

### වැඩසටහන් අයවැය

සිවිල් ගුවන් සේවා අධිකාරිය, එළඹෙන වර්ෂයේ වියදම පෙන්නුම් කෙරෙන 2012 වැඩසටහන් අයවැය මෙහෙයවීම සහ කළමනාකරණය, ගගන නාවික සේවා, පියසර නිරුපද්‍රිතතාව සහ ඒකාබද්ධ වශයෙන් හැඳින්වෙන ප්‍රධාන වැඩ සටහන් හතරක් යටතේ පිළියෙල කළේය. ප්‍රක්ෂේපිත ආදායම රුපියල් මිලියන 809 ක් වූ අතර ඇස්තමේන්තු කළ වියදම රුපියල් මිලියන 566 ක් විය. 2011 වර්ෂයට සාපේක්ෂව ඇස්තමේන්තු කළ වියදමෙහි 52% ක අඩුවීමකුත් ප්‍රක්ෂේපිත ආදායමෙහි 62% ක වැඩිවීමකුත් පෙනෙන්නට තිබුණි.

### CAASL ආදායම

ඊට පෙර වසර සමග සසඳන විට 2012 ආදායමෙහි පෙර වසර සත්‍ය ආදායමට වඩා 31% ක වැඩිවීමක් දක්නට ලැබුණි. මෙම සැළකිය යුතු ආදායම් වර්ධනයට හේතු වූයේ විදේශ විකුණුම් අධිභාරය

ඒකාබද්ධ ශාඛාව

නැව් නැගීමේ ගාස්තු රැස්කිරීමේ සේවා ගාස්තු සහ නියාමක සේවාවන්ගෙන් ලැබුණු ආදායම ආදියයි.


### කළමනාකරණ තොරතුරු

සේවා ලාභීන්ට පහසුවෙන් තොරතුරු ලබා ගත හැකි කළමනාකරණ තොරතුරු පද්ධතියක් සහ විද්‍යුත් කාඩ් පත් මගින් ගෙවීම් සිදු කිරීමේ පහසුකම් ලබාදෙන සුපර්යාප්ත කළමනාකරණ ක්‍රමයක් සාර්ථකව විකාශනය කර 2012 වර්ෂයේ තුළ ක්‍රියාත්මක කර ඇත. මීට පෙර වසර වල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLAS) අනුව පිළිවෙල කරන ලද මූල්‍ය කළමනාකරණ තොරතුරු ප්‍රකාශන 2012 වර්ෂයේදී ශ්‍රී ලංකා මූල්‍ය වර්තාකරණ ප්‍රමිති (SLFRS) අනුව පිළිවෙළ කර ඇත.


### වාහන ඇණි කළමනාකරණය

බාධාවකින් තොරව CAASL හි නියාමක කාර්යයන් ඉටුකිරීම සඳහා විශ්වාසය තැබිය හැකි ප්‍රවාහන පහසුකම් අවශ්‍යතාවක් කලක සිට දැනෙන්ට තිබුණි. 2012 දී CAASL වාහන ඇණියට අලුත් කැබ් රථ දෙකක් (02) සහ එක් මිනිබස් (Mini Bus) රථයක් එක් කිරීමෙන් මෙම අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීමට හැකි වී ඇත.

**2012 වර්ෂයේ වියදම්**




**2012 වර්ෂයේ ආදායම්**



# 2012 - කාර්ය සාධක දර්ශක

## 2012 CAASL කාර්ය සාධනය

| | 2012 | 2011 |
|---|---|---|
| නිරුපද්‍රිතතා හා සුරක්ෂිතතා අධීක්ෂණ හා රාජකාරි සහ කාර්යයන් | | |
| (රෙගුලාසි / නිවේදන / රීති සංඛ්‍යාව) | | |
| ගුවන් ප්‍රවාහන | 01 | 00 |
| සංවිධාන/ පුද්ගලයින් සඳහා මුල්වර නිකුත් කළ බලපත්‍ර | | |
| ගුවන් ප්‍රවාහන සමාගම් | 02 | 01 |
| නඩත්තු සංවිධාන | 10 | 03 |
| පියසර පුහුණු පාසල් | 00 | 01 |
| ගුවන් නියමු | 199 | 273 |
| ගුවන් ගමන් පාලක | 16 | 09 |
| ගුවන් යානා නඩත්තු ඉංජිනේරු | 01 | 04 |
| ගුවන් යානා නඩත්තු බලපත්‍ර | 158 | 56 |
| පියසර පිටත් කරන්නන් | 01 | 01 |
| පියසර උපදේශක | 07 | 10 |
| සහකාර පියසර උපදේශක | 04 | 11 |
| භූමි උපදේශක | 10 | 25 |
| මැදිරි පිරිස් සාමාජික | 187 | 252 |
| සහතික කළ සංවිධාන /පුද්ගලයින් පිළිබඳ සෝදිසි කාර්යයන් | | |
| රැම්ප් පරීක්ෂණ - ගුවන් යෝග්‍යතා | 102 | 65 |
| රැම්ප් පරීක්ෂණ - මෙහෙයුම් | 36 | 105 |
| ගගන යාත්‍රාංගන පරීක්ෂණ | 19 | 20 |
| ගගන නාවික සේවා සැපයුම් කරුවන් පිළිබඳ පරීක්ෂණ | 23 | 36 |
| නඩත්තු සංවිධාන පරීක්ෂණ | 42 | 10 |
| පියසර පාසල් පරීක්ෂණ - පුද්ගල බලපත්‍ර | 14 | 13 |
| ගුවන් සේවා සුරක්ෂිතතා පරීක්ෂණ | 42 | 00 |
| සිමියුලේටර් පරීක්ෂණ | 02 | 02 |
| අතරමග පරීක්ෂණ - මෙහෙයුම් | 04 | 12 |
| අන්තරායකාරී ද්‍රව්‍ය පරීක්ෂණ | 18 | 35 |
| ස්ථාන පහසුකම් පරීක්ෂණ - ගුවන් යෝග්‍යතා | 00 | 10 |
| ස්ථාන පහසුකම් පරීක්ෂණ - මෙහෙයුම් | 02 | 04 |
| සම්පූර්ණ කරන ලද විගණන | | |
| ගුවන් සංතරණ සේවා | 01 | 00 |
| ගුවන් සේවා සුරක්ෂිතතා | 01 | 00 |

## 2012 අංශ විශේෂිත කාර්යයන්

| වර්ගය | 2012 | 2011 |
|---|---|---|
| **මෙහෙයවීම සහ කළමනාකරණය** | | |
| පවත්වන ලද අධිකාරියේ රැස්වීම් | 13 | 09 |
| පවත්වන ලද විගණන කමිටු රැස්වීම් | 08 | 04 |
| පවත්වන ලද කාර්යය මණ්ඩල කමිටු රැස්වීම් | 02 | 09 |
| පවත්වන ලද DPIG රැස්වීම් | 06 | 05 |
| පවත්වන ලද කර්මාන්ත උපදේශන රැස්වීම් | 201 | 169 |
| බාහිර සංවිධාන / පුද්ගලයන් හමුවීම් | 249 | 248 |
| ලැබුනු ලිපි සංඛ්‍යාව | 5839 | 6216 |
| **ගුවන් සේවා සුරක්ෂිතතා ශාඛාව(AVSEC)** | | |
| ගුවන් තොටුපළ පිවිසුම් අවසර පත්‍ර සඳහා නිර්දේශ | 19 | 11 |
| ගුවන් යානා තුළ/නැව් බඩු ගබඩා තුළ අවි ආයුද රැගෙන යාමට අනුමැතිය | 171 | 77 |
| පියසර තට්ටුවේ ගමන් කිරීමට බලය පැවරීම | 01 | 15 |
| ජාතික ගුවන් සේවා සුරක්ෂිතතා වැඩසටහනට සංශෝධන/ප්‍රතිශෝධන | 29 | - |
| අනුමත කරන ලද නව මෙහෙයුම්කරු අත්පොත් | 00 | 04 |
| පවත්නා මෙහෙයුම්කරු අත්පොත් ප්‍රතිශෝධන/ සංශෝධන | 29 | 04 |
| ප්‍රතිශෝධනය කරන ලද ගුවන් සේවා සුරක්ෂිතතා නිවේදන | 07 | 00 |
| ඉටු කරන ලද සුරක්ෂිතතා සෝදිසි කටයුතු | 36 | 25 |
| කර්මාන්තය වෙනුවෙන් පවත්නා ලද සුරක්ෂිතතා පුහුණු පාඨමාලා | 05 | 00 |
| සහතික කරන ලද සුරක්ෂිතතා සෝදිසි කරුවන් | 429 | 229 |
| සහභාගී වූ සුරක්ෂිතතා පුහුණු පාඨමාලා/සම්මන්ත්‍රණ | 02 | 03 |
| පවත්වන ලද AVSEC විභාග | 07 | 35 |
| පවත්වන ලද AVSEC දේශන/ඉදිරිපත් කිරීම් | 01 | 04 |
| **විශේෂ ව්‍යාපෘති අංශය** | | |
| COSCAP-SA කාර්යය මණ්ඩලයට ලබා දුන් ගුවන් ගමන් පහසුකම් | 11 | 46 |
| ආරම්භ කළ විශේෂ ව්‍යාපෘති | 03 | 03 |
| පවත්වන ලද CADEC වැඩසටහන් | 12 | 18 |
| **ගුවන් සංතරණ සේවා අංශය (ANS)** | | |
| උස් ගොඩනැගිලි තැනීම සඳහා අනුමැතිය | 653 | 648 |
| NOTAM නිකුත් කිරීම අනුමැතිය | 264 | 206 |
| ගගන නාවික තොරතුරු චක්‍රලේඛ නිකුත් කිරීම | 09 | 12 |
| නිකුත් කරන ලද AIP අතිරේක | 08 | 08 |
| ඉහළින් පියාසර කිරීමට අනුමැතිය | 1030 | 940 |
| අනියම් පියසර සඳහා ගොඩබෑමේ අවසර | 655 | 630 |
| සහභාගී වූ පුහුණු පාඨමලා/සම්මන්ත්‍රණ | 34 | 19 |
| නිකුත්කරන ලද නව මගපෙන්වීම් ලේඛන | 00 | 02 |
| ප්‍රතිශෝධන කරන ලද මගපෙන්වීම් ලේඛන | 00 | 01 |
| ජලාශ ගගන යාත්‍රාංගන සඳහා අනුමැතිය | 00 | 15 |
| පවත්වන ලද ගගන යාත්‍රාංගන සෝදිසි පරීක්ෂණ | 19 | 20 |
| පවත්වන ලද ATS සෝදිසි පරීක්ෂණ | 24 | 36 |
| පවත්වන ලද ATC ප්‍රමාණන පරීක්ෂණ | 23 | 06 |
| පවත්වන ලද ATC සිමියුලේටර් පරීක්ෂණ | 05 | 17 |

| | | |
|---|---|---|
| භාෂා ප්‍රවීණතා විභාග | 54 | 19 |
| දේශන (COSCAP සහාය සහිත) | 00 | 05 |
| **පුද්ගල බලපත්‍ර අංශය (PL)** | | |
| ආධුනික ගුවන් නියමු බලපත්‍ර (SPL) (නිකුත් කළ/අළුත් කළ) | 155 | 115 |
| පෞද්ගලික ගුවන් නියමු බලපත්‍ර (PPL) (නිකුත් කළ+අළුත් කළ) | 94 | 98 |
| වාණිජ ගුවන් නියමු බලපත්‍ර (CPL) (නිකුත් කළ+අළුත් කළ) | 264 | 317 |
| ගුවන් ප්‍රවාහන ගුවන් නියමු බලපත්‍ර (ATPL) (නිකුත් කළ+අළුත් කළ) | 414 | 382 |
| ගුවන් ගමන් පාලක බලපත්‍ර (ATC) (නිකුත් කළ+අළුත් කළ) | 44 | 81 |
| ගුවන් යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍ර (නිකුත් කළ+අළුත් කළ) | 113 | 173 |
| ගුවන් යානා නඩත්තු බලපත්‍ර (නිකුත් කළ+අළුත් කළ) | 397 | 221 |
| ගුවන් යානා නඩත්තු බලපත්‍ර-වර්ග ප්‍රමාණන (නිකුත් කළ) | 38 | 00 |
| ගුවන් යානා නඩත්තු බලපත්‍ර-ප්‍රවර්ග (නිකුත් කළ) | 14 | 00 |
| මැදිරි සේවක පිරිස් සහතික (නිකුත් කළ) | 225 | 252 |
| මැදිරි සේවක පිරිස් සහතික (යළි නිකුත් කළ) | 50 | 00 |
| පියසර මෙහෙයුම් නිලධාරී බලපත්‍ර (නිකුත් කළ) | 00 | 01 |
| විදේශ බලපත්‍ර වලංගු කිරීම (ගුවන් නියමු) (නිකුත් කළ+අළුත් කළ) | 73 | 97 |
| නිදහස් බැලූන් නියමු බලපත්‍ර (නිකුත් කළ+අළුත් කළ) | 05 | 01 |
| පියසර ඉංජිනේරු බලපත්‍ර (නිකුත් කළ+අළුත් කළ) | 00 | 01 |
| පියසර යාත්‍රික බලපත්‍ර (නිකුත් කළ+අළුත් කළ) | 00 | 01 |
| විදේශ බලපත්‍ර වලංගු කිරීම (AME) (නිකුත් කළ+අළුත් කළ) | 11 | 19 |
| වාණිජ ගුවන් නියමු බලපත්‍ර (CPL) ගුවන් ප්‍රවාහන ගුවන් නියමු බලපත්‍ර (ATPL)- වර්ග ප්‍රමාණන (නිකුත් කිරීම්) | 140 | 146 |
| සහකාර පියසර උපදේශක (AFI) /පියසර උපදේශක (FI)- ප්‍රමාණන (නිකුත් කළ+අළුත් කළ) | 28 | 21 |
| පියසර පාසල් බලපත්‍ර (අළුත් කළ) | 06 | 04 |
| භූමි උපදේශ බලපත්‍ර | 00 | 06 |
| භූමි උපදේශක අනුමත කිරීම | 12 | 24 |
| ගුවන් ගමන් පාලක-ප්‍රමාණන | 100 | 103 |
| පියසර පාසල් බලපත්‍ර (නිකුත් කළ) | 00 | 01 |
| ගුවන් යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍ර (AME) ප්‍රවර්ග (නිකුත් කළ) | 01 | 07 |
| විදේශ ගුවන් නියමුවන් බඳවා ගැනීමේ අනුමැතිය | 62 | 56 |
| වීසා නිර්දේශ (නිකුත් කළ) | 92 | 92 |
| විදේශ බලධාරීන්ගේ පෞද්ගලික බලපත්‍ර නිකුත් කිරීම් | 349 | 125 |
| NIB පැහැයුම් නිකුත් කිරීම | 359 | 373 |
| වෛද්‍ය පරීක්ෂණ | 866 | 1350 |
| විභාග | | |
| 1. PPL විභාග | 89 | 120 |
| 2. විශේෂ ගුවන් නීතියේ විභාග | 06 | 10 |
| 3. AME විභාග | 00 | 02 |
| 4. AML විභාග | 02 (අයදුම්කරුවන් 411) | 03 (අයදුම්කරුවන් 762) |
| 5. CPL/IR(A) විභාග | 06 | 15 |
| 6. CPL(H) විභාග | 00 | 01 |
| 7. ATPL විභාග | 56 | 13 |
| 8. ATPL(H) විභාග | 06 | 20 |
| 9. විදේශ බලපත්‍ර පරිවර්තන විභාග | 04 | 57 |

| | | |
|---|---|---|
| 10. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා පරීක්ෂණ | 117 | 124 |
| 11. කල් ඉකුත් වූ බලපත්‍ර ප්‍රතිසක්‍රියන විභාග (CPL/IR) | 12 | 02 |
| 12. ගුවන් විදුලි දුරකථන ප්‍රායෝගික පරීක්ෂණ | 55 | 31 |
| 13. සහකාර පියසර උපදේශන විභාග | 00 | 04 |
| 14. පියසර විභාග පරීක්ෂක විභාග | 00 | 03 |
| 15. AML පරිවර්තන විභාග | 02 (අයදුම්කරුවන් 11) | 02 (අයදුම්කරුවන් 40) |

## මෙහෙයුම් අංශය (OPS)

| | | |
|---|---|---|
| සහභාගී වූ පුහුණු පාඨමාලා/සම්මන්ත්‍රණ | 13 | 07 |
| නිකුත් කරන ලද නව මගපෙන්වීමේ ලේඛන | 03 | 00 |
| විශේෂ මෙහෙයුම් | 11 | 10 |
| මැදිරි පිරිස් බලය පැවරීම් | 266 | 252 |
| විදේශ ගුවන් යානා මෙහෙයුම්කරු සහතික - මුල්වර | 02 | 05 |
| විදේශ ගුවන් යානා මෙහෙයුම්කරු සහතික - අළුත් කිරීම් | 26 | 27 |
| අන්තරායකාරී ද්‍රව්‍ය ප්‍රවාහන බලපත්‍ර - මුල්වර | 00 | 01 |
| අන්තරායකාරී ද්‍රව්‍ය ප්‍රවාහන බලපත්‍ර - අළුත් කිරීම් | 13 | 10 |
| DCP- මුල්වර | 09 | 05 |
| DCP- අළුත් කිරීම් | 23 | 22 |
| ගුවන් යානා මෙහෙයුම්කරු සහතික - මුල්වර | 00 | 01 |
| ගුවන් යානා මෙහෙයුම්කරු සහතික - අළුත් කිරීම් | 08 | 07 |
| සිමියුලේටර් ස්ථාන පහසුකම් සඳහා අනුමැතිය | 00 | 01 |
| සිමියුලේටර් අළුත් කිරීම් | 05 | 10 |
| පරීක්ෂණ (Check) සඳහා බලය පැවරීම් | 220 | 244 |
| ඉටු කරන ලද සෝදිසි කාර්‍යයන් | 92 | 181 |
| නිරුපද්‍රිතතා සිදුවීම් නිශ්චය කිරීම් | 02 | 00 |

## ගුවන් යෝග්‍යතා අංශය (AW)

| | | |
|---|---|---|
| නිකුත් කරන ලද නව ගුවන් සේවා නිරුපද්‍රිතතා නිවේදන | 00 | 01 |
| සහභාගී වූ පුහුණු පාඨමාලා / සම්මන්ත්‍රණ | 06 | 05 |
| ඉටු කරන ලද සෝදිසි කාර්‍යයන් (රැම්ප් - විගණන) | 102 | 56 |
| ගුවන් යානා ගුවන් යෝග්‍යතා සහතික - මුල්වර | 08 | 16 |
| ගුවන් යානා ගුවන් යෝග්‍යතා සහතික - අළුත් කිරීම් | 40 | 28 |
| ගුවන් යානා නඩත්තු සංවිධාන වැඩපොළ අනුමැතිය | 10 | 09 |
| ගුවන් යානා ලියාපදිංචි කිරීමේ සහතිකය - මුල්වර | 06 | 22 |
| ගුවන් යානා ලියාපදිංචි කිරීමේ සහතිකය - අළුත් කිරීම් | 51 | 34 |
| පහසුකම් පරීක්ෂණය සමග නඩත්තු සංවිධාන අනුමත කිරීම් | 42 | 57 |
| ගුවන් සේවා සිදුවීම් නිශ්චය කිරීම් | 32 | 38 |

## ගුවන් ප්‍රවාහන සහ නීති කටයුතු අංශය (AT&LA)

| | | |
|---|---|---|
| සම්පාදනය කරන ලද නව රෙගුලාසි කෙටුම්පත් | 01 | 02 |
| සහභාගි වූ පුහුණු පාඨමාලා/සම්මන්ත්‍රණ | 02 | 02 |
| සම්පාදනය කළ නව මගපෙන්වීම් ලේඛන | 01 | 01 |
| ප්‍රතිශෝධනය කරන ලද මගපෙන්වීම් ලේඛන | 01 | 01 |
| අනුමත කරන ලද දේශීය පියසර උප ලේඛන | 03 | 00 |
| ඉටු කරන ලද සෝදිසි කාර්‍යයන්- ගුවන් ප්‍රවාහන සැපයුම් කරුවන් | 18 | 04 |
| අනුමත කරන ලද ජාත්‍යන්තර පියසර උපලේඛන | 25 | 32 |

| | | |
|---|---|---|
| තාක්ෂණික නොවන විශේෂඥ කාර්යය මණ්ඩලය සඳහා වීසා නිර්දේශ | 16 | 11 |
| ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් ප්‍රවාහන සමාගම් සඳහා කුලී ප්‍රවාහන බලපත්‍ර | 08 | 06 |
| ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් ප්‍රවාහන සමාගම් සඳහා ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍ර | 03 | 03 |
| කුලී බලපත්‍ර - ජාත්‍යන්තර මෙහෙයුම් | 04 | 03 |
| කුලී බලපත්‍ර - දේශීය නිත්‍ය මෙහෙයුම් | 06 | 05 |
| ගුවන් ප්‍රවාහන සැපයුම්කරු බලපත්‍ර | 450 | 405 |
| පෞද්ගලික මෙහෙයුම් බලපත්‍ර | 02 | 02 |
| අත්සන් කරන ලද නව ගුවන් ප්‍රවාහන සේවා ගිවිසුම් | 00 | 01 |
| ප්‍රතිශෝධනය කරන ලද ගුවන් ප්‍රවාහන සේවා ගිවිසුම් | 02 | 14 |
| වර්ෂය අවසන් වන විට "විවෘත ගුවන් තල" ගුවන් සේවා ගිවිසුම් | 06 | 06 |
| **මානව සම්පත් හා කාර්යයාල කළමනාකරණ අංශය (HR & OM)** | | |
| HR & OM අදාළ නව රීති - නිකුත් කරන ලද | 06 ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති | 05 ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති |
| HR & OM අදාළ රීති - ප්‍රතිශෝධනය කරන ලද | 02 | 03 |
| නිලධාරීන් බඳවා ගැනීම් | 09 | 36 |
| ලබා දුන් පුහුණු අවස්ථා - සම්පූර්ණ සංඛ්‍යාව (විදේශ) | 80 (මිනිස් දින - 407) | 90 (මිනිස් දින - 486) |
| ලබා දුන් දේශීය පුහුණු අවස්ථා - සම්පූර්ණ සංඛ්‍යාව | 117 (මිනිස් දින - 891) | 135 (මිනිස් දින - 314) |
| කාර්‍යය මණ්ඩලය - සම්පූර්ණ සංඛ්‍යාව | 148 | 148 |
| පවත්වන ලද පොදු කාර්යය මණ්ඩල රැස්වීම් | 00 | 01 |
| පවත්වන ලද කාර්‍යය සාධක ඇගයීම් | 70 | 68 |
| විශ්‍රාම ගැනීම් | 01 | 03 |
| ලබා දුන් කාර්යය මණ්ඩල ණය මුදල් | රු. මි. 18.02 | රු. මි. 23.9 |
| පවත්වන ලද වැඩමුළු | 00 | 03 |
| තාක්ෂණික පුස්තකාලයට සකස් කරන ලද නව ප්‍රකාශන/ලේඛන | 137 | 117 |
| වෙබ් අඩවි - ප්‍රතිශෝධන | 13 | 12 (HR&OM) |
| මෘදුකාංග වැඩි දියුණු කිරීම් (යන්ත්‍ර) | 08 | 460 |
| **මූල්‍ය කළමණාකරණ අංශය (FM)** | | |
| රැස් කළ මුළු ආදායම | රු. මි. 988 | රු. මි. 744 |
| දැරීමට සිදු වූ සම්පූර්ණ වියදම | රු. මි. 370 | රු. මි. 315 |
| කාර්‍යය මණ්ඩල වැටුප්-මුළු මුදල | රු. මි. 148 | රු. මි. 125 |
| මිල දී ගත් වාහන | 03 | 05 |
| මිල දී ගත් පරිගණක | 09 | 74 |
| **අභ්‍යන්තර විගණන අංශය (AI)** | | |
| පවත්වන ලද විගණන | 34 | 15 |
| ඉදිරිපත් කළ සොයා ගැනීම් | 50 | 95 |
| **ගුවන් යානා අනතුරු හා සිදුවීම් විමර්ශන අංශය (AAII)** | | |
| වාර්තා වූ සිදුවීම් | 06 | 01 |

| | | |
|---|---|---|
| වාර්තා වූ අනතුරු | 00 | 00 |
| වාර්තා වූ සුළු සිදුවීම් | 137 | 114 |
| මගීන්ට හෝ සේවක පිරිසට හෝ බරපතල තුවාල සිදුවීම් | 00 | 00 |
| මගීන්ට හෝ සේවක පිරිසට හෝ සුළු තුවාල සිදුවීම් | 19 | 00 |
| සම්පාදනය කරන ලද නව රෙගුලාසි කෙටුම්පත් | 01 | 01 |
| සහභාගී වූ පුහුණු පාඨමාලා /සම්මන්ත්‍රණ | 01 | 01 |
| සම්පාදනය කරන ලද නව මගපෙන්වීම් ලේඛන | 00 | 01 |
| ප්‍රතිශෝධනය කළ මගපෙන්වීම් ලේඛන | 01 | 01 |

## කර්මාන්තයෙහි කාර්යය සාධනය - 2012

| ගුවන් ගමන් පිළිබඳ තොරතුරු<br>ජාත්‍යන්තර ගුවන් ගමන් | 2012 | 2011 |
|---|---|---|
| මගීන් | 8,290,668 | 6,885,082 |
| පිටත් වූ | 3,554,969 | 3,095,089 |
| ගොඩ බසින ලද | 3,590,122 | 3,079,126 |
| සංක්‍රමණ | 1,145,577 | 710,867 |
| නැව් බඩු (මෙට්‍රික් ටොන්) | 174,645 | 158,572 |
| ගෙන ආ | 66,602 | 63,161 |
| ගෙන ගිය | 108,043 | 95,411 |
| ගුවන් යානා චලන | 48,734 | 43,673 |
| නිත්‍ය පියසර | 46,616 | 41,891 |
| කුලී පියසර | 2,118 | 1,782 |
| මෙහෙයුම් සිදු කළ ගුවන් ප්‍රවාහන සමාගම් සංඛ්‍යාව | 40 | 36 |
| නිත්‍ය සේවා | 30 | 28 |
| කුලී සේවා | 07 | 04 |
| නැව් බඩු ප්‍රවාහන | 03 | 04 |
| දේශීය ගුවන් ගමන් | | |
| මගීන් (ගෙනගිය) | 8,421 | 2,047 |
| නැව් බඩු (මෙට්‍රික් ටොන්) | 00 | 00 |
| ගුවන් යානා චලන | 1,715 | 392 |
| මෙහෙයුම් සිදු කළ ගුවන් ප්‍රවාහන සමාගම් සංඛ්‍යාව | | |
| නිත්‍ය සේවා | 01 | 00 |
| කුලී සේවා | 02 | 02 |

## විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

*2012 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා*

| | සටහන | SLFRS 31.12.2012 රු. සත. | SLFRS 31.12.2011 රු. සත. | SLAS 31.12.2011 රු. සත. |
|---|---|---|---|---|
| **ආදායම** | | **988,991,622.16** | **746,974,839.73** | **744,057,943.73** |
| ආදායම | (4) | 918,524,428.11 | 687,539,179.30 | 687,539,179.30 |
| වෙනත් ආදායම් | (5) | 70,467,194.05 | 59,435,660.43 | 56,518,764.43 |
| **වියදම** | | **(370,804,177.77)** | **(518,077,112.69)** | **(515,160,216.69)** |
| කාර්යය මණ්ඩල වියදම් | (6) | (148,638,658.02) | (131,741,781.67) | (128,824,885.67) |
| රැස්වීම් සම්මන්ත්‍රණ හා වැඩමුළු | (7) | (26,794,066.10) | (18,970,807.98) | (18,970,807.98) |
| පුහුණු කිරීමේ වියදම් | (8) | (20,106,117.69) | (22,380,262.52) | (22,380,262.52) |
| පරිපාලන සහ වෙනත් වියදම් | (9) | (148,764,416.90) | (120,735,518.27) | (120,735,518.27) |
| ක්ෂය වීම් | | (26,500,919.06) | (24,248,742.25) | (24,248,742.25) |
| විමර්ශන අරමුදල සඳහා ප්‍රතිපාදන | | - | (200,000,000.00) | (200,000,000.00) |
| **බදු ගෙවීමට පෙර සාමාන්‍ය කාර්යයන්ගෙන් ලාභය/අලාභය** | | **618,187,444.39** | **228,897,727.04** | **228,897,727.04** |
| බදු | (10) | (94,722,505.91) | (199,054,612.09) | (197,292,954.44) |
| **වසර සඳහා ශුද්ධ ලාභය/අලාභය** | | **523,464,938.48** | **29,843,114.95** | **31,604,772.60** |
| **වෙනත් සුපර්යාප්ත ආදායම්** | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණන වැඩිවීම | | - | - | - |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ජීව ගණන ලාභය /(අලාභය) | | - | - | - |
| විදේශ මෙහෙයුමක මූල්‍ය වාර්තා පරිවර්තනය කිරීමෙන් ලාභය /(අලාභය) | | - | - | - |
| විකිණීමට තිබෙන මූල්‍ය වත්කම් වලින් ලාභය/(අලාභය) | | - | - | - |
| ලාභ/(අලාභ) අයිතමයන්ට අදාළ අදායම් බදු | | - | - | - |
| **වාර්ෂික සුපර්යාප්ත ආදායම** | | **523,464,938.48** | **515,329,686.44** | **29,843,114.95** |

## මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

*2012 දෙසැම්බර් 31 දිනට*

| | සටහන | SLFRS 31.12.2012 රු. සත. | SLFRS 31.12.2011 රු. සත. | SLAS 31.12.2011 රු. සත. |
|---|---|---|---|---|
| **වත්කම්** | | **1,202,805,871.50** | **1,086,262,271.26** | **1,086,262,271.26** |
| **ජංගම නොවන වත්කම්** | | **114,891,490.00** | **110,099,478.51** | **110,099,478.51** |
| දේපොළ පිරියත හා උපකරණ | (11) | 114,891,490.00 | 110,099,478.51 | 110,099,478.51 |
| **ජංගම වත්කම්** | | **1,087,914,381.50** | **976,162,792.75** | **976,162,792.75** |
| තොග | (12) | 6,934,256.43 | 1,586,231.16 | 1,586,231.16 |
| ලැබිය යුතු දෑ (වෙළඳ) සහ කාර්යය මණ්ඩල ණය | (13) | 180,555,880.06 | 138,910,733.59 | 151,575,041.59 |
| වෙනත් මූල්‍ය වත්කම් | (14) | 543,528,106.43 | 502,513,280.00 | 502,513,280.00 |
| අත්තිකාරම්, පෙරගෙවුම් සහ වෙනත් ලැබිය යුතු දෑ | (15) | 136,448,863.07 | 124,274,758.74 | 111,610,450.74 |
| මුදල් සහ මුදල් සමාන දෑ | (16) | 220,447,275.51 | 208,877,789.26 | 208,877,789.26 |
| **ස්කන්ධය සහ වගකීම්** | | **1,202,805,871.50** | **1,086,262,271.26** | **1,086,262,271.26** |
| **මූලධනය සහ සංචිත** | | **511,349,053.86** | **442,135,945.87** | **448,066,527.96** |
| රජයේ ප්‍රදාන | (17) | 8,562,380.05 | 9,168,434.05 | 9,168,434.05 |
| ප්‍රත්‍යාගණන අතිරික්ත | (18) | 13,485,465.44 | 13,485,465.44 | 13,485,465.44 |
| සමුච්චිත ලාභය | | 489,301,208.37 | 419,482,046.38 | 425,412,628.47 |
| **ජංගම නොවන වගකීම්** | | **274,709,426.94** | **274,584,323.09** | **268,653,741.00** |
| කල් තැබූ බදු වගකීම් | (19) | 4,762,194.44 | 5,930,582.09 | - |
| ප්‍රතිපාදන සහ වෙනත් වගකීම් | (20) | 259,676,305.00 | 259,413,871.00 | 259,413,871.00 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම | (21) | 10,270,927.50 | 9,239,870.00 | 9,239,870.00 |
| **ජංගම වගකීම්** | | **416,747,390.70** | **369,542,002.30** | **369,542,002.30** |
| ගෙවිය යුතු දෑ(වෙළඳ) | (22) | 282,872,312.57 | 254,868,404.05 | 254,868,404.05 |
| වෙනත් ගෙවිය යුතු දෑ | (23) | 43,274,312.31 | 8,513,660.54 | 8,513,660.54 |
| ආදායම් බදු වගකීම් | (24) | 90,566,586.22 | 106,159,937.71 | 106,159,937.71 |

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලදී.

**ජෙනරල් රෝහාන් ද සිල්වා දළුවත්ත**
සභාපති
2013 පෙබරවාරි 28

**එච්.එම්.සී නිමල්සිරි**
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්
සහ ප්‍රධාන විධායක නිලධාරී

## ස්කන්ධ වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශය

*2012 දෙසැම්බර් මස 31 දිනයෙන් අවසන් වූ වර්ෂය සඳහා*

| | සටහන | රජයේ ප්‍රදාන | ප්‍රත්‍යාගණන සංචිතය | සමුච්චිත ලාභය | එකතුව |
|---|---|---|---|---|---|
| | | රු. සත. | රු. සත. | රු. සත. | රු. සත. |
| **2011 ජනවාරි 1 දිනට ශේෂය** | | **9,774,488.05** | **13,652,001.91** | **629,983,379.77** | **653,409,869.73** |
| කාලසීමාව සඳහා ලාභය | | - | - | 29,843,114.95 | 29,843,114.95 |
| පෙර වසර ගැලපුම | | - | - | 9,855,551.66 | 9,855,551.66 |
| ශුද්ධ අතිරික්තය විසර්ජනය | | - | - | (250,000,000.00) | (250,000,000.00) |
| වසර සඳහා ක්‍රමක්ෂය | | (606,054.00) | - | - | (606,054.00) |
| 2009 - සඳහා අයකිරීම් | | - | (166,536.47) | - | (166,536.47) |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **9,168,434.05** | **13,485,465.44** | **419,482,046.38** | **442,135,945.87** |
| කාල සීමාව සඳහා ලාභය | | - | - | 523,464,938.48 | 523,464,938.48 |
| පෙර වසර ගැලපුම | (25) | - | - | (103,645,776.49) | (103,645,776.49) |
| ශුද්ධ අතිරික්තය - විසර්ජනය | (26) | - | - | (350,000,000.00) | (350,000,000.00) |
| වසර සඳහා ක්‍රම ක්ෂය | | (606,054.00) | - | - | (606,054.00) |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **8,562,380.05** | **13,485,465.44** | **489,301,208.37** | **511,349,053.86** |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

*2012 දෙසැම්බර් මස 31 අවසන් වූ වර්ෂය සඳහා*

| | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් කාර්යන්ගෙන් /(කායර්යන්හි යෙදූ) මුදල් ප්‍රවාහය** | | |
| බදු ගෙවීමට පෙර සාමාන්‍ය කාර්යන්ගෙන් ලාභය/(අලාභය) | 618,187,444.39 | 428,897,727.04 |
| **ගැලපුම්** | | |
| ක්ෂය වීම | 26,500,919.06 | 24,248,742.25 |
| රජයේ ප්‍රදානය ක්‍රමක්‍ෂය කිරීම | (606,054.00) | - |
| ආයෝජන ආදායම | (64,756,055.37) | (55,832,002.10) |
| රක්ෂණ අරමුදල සඳහා ප්‍රතිපාදන | 67,450.00 | 66,150.00 |
| පෙර වසර ගැලපුම් | 6,986,497.51 | 9,911,534.70 |
| දේපළ පිරියත සහ උපකරණ විකිණීමෙන් ලාභය/අලාභය | 225,842.59 | (440,519.25) |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම මත අවසර දිය නොහැකි VAT බදු | (3,030,221.66) | - |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ප්‍රතිපාදන | 1,767,642.50 | 1,390,920.00 |
| **ක්‍රියාත්මක මූලධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය/ (ආලාභය)** | **585,343,465.02** | **408,242,552.64** |
| තොග වැඩිවීම | (5,348,025.27) | (392,933.84) |
| ලැබිය යුතු දෑ(වෙළඳ) වැඩිවීම | (41,645,146.47) | (100,651,627.63) |
| අත්තිකාරම්, පෙර ගෙවුම් සහ වෙනත් ලැබිය යුතු දෑ වැඩිවීම | (12,872,922.05) | |
| ප්‍රතිපාදන සහ වෙනත් වගකීම් අඩුවීම | 262,434.00 | - |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම | 62,764,560.29 | (11,088,530.04) |
| **මෙහෙයුම් වලින් ජනනය වූ මුදල්** | **588,504,365.52** | **296,109,461.13** |
| ගෙවන ලද නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | (736,585.00) | - |
| ගෙවන ලද ආදායම් බදු | (222,082,339.45) | (164,317,513.17) |
| **මෙහෙයුම් කායර්යන්ගෙන්/(කායර්යන්හි යෙදූ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | **365,685,441.07** | **131,791,947.96** |
| **ආයෝජන කායර්යන්ගෙන්/(කායර්යන්හි යෙදූ) මුදල් ප්‍රවාහය** | | |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම | (28,926,051.48) | (86,221,947.76) |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලත් මුදල් | 437,500.00 | 1,735,335.00 |
| වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම | (210,303,036.52) | 184,822,750.44 |
| වෙනත් ආයෝජන විකිණීමෙන් ලත් මුදල් | 169,402,178.19 | (1,593,570.57) |
| ලැබුණු පොළිය | 65,135,454.99 | 54,869,651.40 |
| බැංකු ඇපකර | 138,000.00 | 4,278,936.00 |
| **ආයෝජන කායර්යන්ගෙන් /(කායර්යන්හි යෙදූ) ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(4,115,954.82)** | **157,891,154.51** |
| **මූල්‍යන කටයුතු වලින් /(කටයුතු වල යෙදූ) ශුද්ධ මුදල් ප්‍රවාහ** | | |
| ඒකාබද්ධ අරමුදල | (350,000,000.00) | (250,000,000.00) |
| **මූල්‍යන කටයුතු වලින්/(කටයුතු වල යෙදූ) ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(350,000,000.00)** | **(250,000,000.00)** |
| **මුදල් සහ මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | **11,569,486.25** | **39,683,102.47** |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | 208,877,789.26 | 169,194,686.80 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | **220,447,275.51** | **208,877,789.27** |
| **මුදල් සහ මුදල් සමාන දෑ විශ්ලේෂණය** | | |
| බැංකුවේ ඇති මුදල් | 40,447,275.51 | 18,883,655.94 |
| කෙටිකාලීන ආයෝජන | 180,000,000.00 | 189,994,133.32 |
| | **220,447,275.51** | **208,877,789.26** |

# 2012 මූල්‍ය ප්‍රකාශ

### මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධිකාරියේ සාමාජිකයින්ගේ වගකීම

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 14 වන සහ 15 වන වගන්ති ප්‍රකාර සිවිල් ගුවන් සේවා අධිකාරියේ සාමාජිකයින් පහත සඳහන් කරුණු සම්බන්ධව වගකීමට බැඳී ඇත.

I. අධිකාරියේ ආදායම හා වියදම, වත්කම් හා වගකීම් සහ අනෙකුත් සියළුම මූල්‍ය ගණුදෙනු නිසි පරිදි ගිණුම් ගත කිරීම.

II. අධිකාරියේ මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මූල්‍ය තත්වය පිළිබඳ සත්‍ය හා පැහැදිලි දසුනක් ඉදිරිපත් කිරීම සඳහා, 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් සම්මත කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් සකස් කිරීම.

III. අධිකාරියේ වත්කම් ආරක්ෂා කිරීමටත්, වංචා සහ වෙනත් අක්‍රමිකතා අනාවරණය කිරීම සහ වැළැක්වීම සඳහා උචිත අභ්‍යන්තර පාලන ක්‍රම පිහිටු වීමටත් නිසි පියවර ගැනීම.

ජෙනරල් රෝහාන් ද සිල්වා දළුවත්ත
සභාපති
2013 පෙබරවාරි 28

එච්.එම්.සී. නිමල්සිරි
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්
සහ ප්‍රධාන විධායක නිලධාරී

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 01. පොදු ප්‍රතිපත්ති

### 1.1 අනුවෘතා ප්‍රකාශය

සිවිල් ගුවන් සේවා අධිකාරියේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය විස්තීර්ණ ආදායම, ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සටහන් ද ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය ද (මූල්‍ය ප්‍රකාශ) ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) නියෝජනය කරන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) වලට අනුකූලව සකස් කර ඇත.

### 1.2 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ වගකීම්

මූල්‍ය ප්‍රකාශ පිළිවල කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි කළමනාකරණය මත පැවරී ඇත.

### 1.3 සාර්ථක ව්‍යාපාරයක්

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කරන විට කළමනාකරණය, සිවිල් ගුවන් සේවා අධිකාරිය ලාභ ලබන සාර්ථක ව්‍යාපාරයක් වශයෙන් දිගින් දිගට නොකඩවා පවත්වාගෙන යාමට ඇති හැකියාව තක්සේරු කර ඇත. සිවිල් ගුවන් සේවා අධිකාරියට නීත්‍යානුකූලව පැවරී ඇති රාජකාරි සහ කාර්‍යයන් ඉටුකරමින් පෙනෙනතාක් දුර අනාගතයට එහි මෙහෙයුම් පැවැත්ම රඳවා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් සම්පත් එය සතුව තිබෙන බවට සාධාරණ බලාපොරොත්තුවක් කළමනාකරණයට ඇත. අනාගතය පිළිබඳව උපයෝජ්‍ය වශයෙන් ඇති තොරතුරු සලකා බලන විට අධිකාරියට එහි මෙහෙයුම් නවතා දැමීමට හෝ වසා දැමීමට හෝ සිදුවිය හැකි බවක් පෙනෙන්නට නැත. මේ අනුව අධිකාරිය එහි මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී තව දුරටත් ලාභ ලබන ස්ථාවර ව්‍යාපාරයක පදනම (Going Concern Basis) යොදා ගනියි.

### 1.4 SLFRS /LKAS ප්‍රථම වරට භාවිතා කිරීම

LKAS 1 මගින් අර්ථකථනය කර ඇති පරිදි ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ පිළිවෙල කර ඇත. ඒ සමගම ඒවා පිළිවෙල කර ඇත්තේ ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ ය.

ආරම්භයේ පටන් 2011 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වූ වර්ෂය ඇතුළු සෑම කාල වකවානුවක් සඳහාම මෙම අධිකාරිය මූල්‍ය ප්‍රකාශ සකස් කරන ලද්දේ දේශීය වශයෙන් පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන් අනුවය (SLAS). අධිකාරිය ප්‍රථම වරට SLFRS අනුකූලව පිළිවෙල කර ඇත්තේ 2012 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මෙම මූල්‍ය ප්‍රකාශ වේ.

මේ අනුව අධිකාරිය, ගිණුම්කරණ ප්‍රතිපත්ති වල විස්තර කර ඇති පරිදි 2011 දෙසැම්බර් 31 දිනට සහ එම දිනයෙන් අවසන් වන වර්ෂයට අදාළ සාපේක්ෂ තොරතුරු ද සමග 2012 දෙසැම්බර් 31 වන දිනයෙන් හෝ ඉන්පසුව හෝ අවසන් වන කාළ පරිච්ඡේද සඳහා අදාළ වන මූල්‍ය ප්‍රකාශ SLFRS අනුකූලව සම්පාදනය කර ඇත. අධිකාරියේ මුදල් තත්ත්වය පිළිබඳ ආරම්භක ප්‍රකාශය SLFRS වෙත මාරු වූ දිනය වන 2011 ජනවාරි මස 01 දිනට සකස් කරන ලදී. 2011 ජනවාරි මස 01 වන දිනට සකස් කරන ලද මුදල් තත්ත්වය පිළිබඳ SLAS ප්‍රකාශය සහ ඊට පෙර පළ කරන ලද 2011 දෙසැම්බර් 31 වන දිනට සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ SLAS මූල්‍ය ප්‍රකාශ යළි ප්‍රකාශ කිරීමේ දී සිදු කරන ලද ප්‍රධාන ගැලපුම් සටහන් අංක 26 විස්තර කර ඇත.

පෙර කාල සීමාවන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය SLFRS - 1 - ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ප්‍රථම වරට යොදා ගැනීම අනුව සිදු කර ඇත.

### 1.5 පෙර GAAP (SLAS) SLFRS සමග සැසඳීම

SLFRS - 1 අනුව අධිකාරිය SLFRS වෙත මාරු වූ දිනයට සහ ඊට පෙර ආසන්නතම මූල්‍ය වාර්තාකරණ කාලසීමාව වන 2011 ජනවාරි 01 සිට 2011 දෙසැම්බර් 31 දක්වා වූ කාල සීමාව සඳහා SLAS යටතේ වාර්තා කරන ලද ස්කන්ධය සහ (SLFRS) යටතේ වාර්තා කරන ලද ස්කන්ධය අතර සැසඳුමක්

සිදු කළ යුතුව ඇත. 2011 වර්ෂයේ විස්තීර්ණ ආදායම සම්බන්ධව ද මෙවැනිම සැසඳුමක් අවශ්‍ය වේ. මීට අමතරව SLFRS - 1 අනුව වැදගත් ගැලපුම් තිබේනම් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සම්බන්ධව ද වැඩිමනක් සැසඳුමක් ලබා දිය යුතුව ඇත. SLFRS යොදාගැනීම හේතුවෙන් අධිකාරියෙහි නියම මුදල් ප්‍රවාහයන් හි වෙනසක් සිදු වී නැත. කෙසේ වුවද එහි ප්‍රතිඵලයක් වශයෙන් අධිකාරියෙහි වාර්තා කර ඇති මූල්‍ය තත්ත්වයෙහි සහ මෙහෙයුම් ප්‍රතිඵල වල යම් යම් වෙනස්කම් සිදු වී ඇත. SLFRS නිසා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ ආකෘතියට අදාළ වෙනස්කම් කීපයක් ද සිදු වී ඇත.

### 1.6 අළුතෙන් නිකුත් කරන ලද එහෙත් ශේෂ පත්‍රය දිනය වන විටත් බලාත්මක නොවුනු ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නව ප්‍රමිති, සංශෝධන සහ පවත්නා ප්‍රමිති වලට අර්ථ දැක්වීම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති නමුත් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කළ දිනය වන විටත් බලාත්මකව නොතිබුණි. මෙම නව ප්‍රමිති ආදාළ කර ගැනීමෙන් මූල්‍ය ප්‍රකාශ කෙරෙහි ඇතිවිය හැකි බලපෑම් තව වන තුරුත් තක්සේරු කර නැති අතර අධිකාරියේ මූල්‍ය ප්‍රකාශ වලට අදාල වනු ඇතැයි අපේක්ෂා කරනු ලබන මෙම ප්‍රමිති, සංශෝධන සහ පවත්නා ප්‍රමිති වලට අර්ථ දැක්වීම් බලාත්මක වූ කල්හි ඒ අනුව කටයුතු කිරීමට අධිකාරිය අපේක්ෂා කරයි.

SLFRS 9 - මූල්‍ය මෙවලම්

SLFRS 12 - වෙනත් සංවිධාන සමග ඇති සම්බන්ධතා හෙළිදරව් කිරීම

SLFRS 13 - සාධාරණ අගය - මිණුම්

### 1.7 වැදගත් ගිණුම්කරණ මත, නිමාන සහ උපකල්පන

අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශ පිළිවෙල කිරීමේදී වාර්තා කරන දිනයට වාර්තා කළ ආදායම් ප්‍රමාණය, වියදම, වත්කම් සහ වගකීම් සහ අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීම ආදිය කෙරෙහි බලපෑම් ඇතිවන මත, නිමාන සහ උපකල්පන ගොඩනගා ගැනීමට කළමනාකරණයට සිදු වේ. කෙසේ වුව ද මෙකී මත සහ උපකල්පන වල ඇති අනියතතාව හේතුවෙන් අනාගතයේ දී කිසියම් වත්කමක හෝ වගකීමක හෝ ඉදිරියට ගෙන යන ප්‍රමාණයට වැදගත් ගැලපුමක් සිදු කිරීම අවශ්‍ය විය හැකිය.

**මත**

අධිකාරියෙහි ගිණුමකරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියාවලියේ දී ගොඩනගන මාන සහ උපකල්පන හැරුණු විට මූල්‍ය ප්‍රකාශයන් හි පිළිගෙන ඇති ප්‍රමාණයන් කෙරෙහි වඩාත් සැළකිය යුතු බලපෑම් ඇති කරන පහත සඳහන් මත කළමනාකරණය විසින් ගොඩනගාගෙන ඇත.

**බදු**

හිමිකමේ අවදානම සහ ප්‍රතිලාභ සියල්ල සාරානුකූලව අධිකාරිය වෙතම තබා ගන්නා බදු මූල්‍ය බදු වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ.

හිමිකමේ අවදානම සහ ප්‍රතිලාභ ප්‍රමාණයෙන් සැහෙන කොටසක් බදු ගන්නා විසින් රඳවා ගනු ලබන බදු මෙහෙයුම් බදු වශයෙන් වර්ග කරනු ලැබේ.

**නිමාන සහ උපකල්පන**

එළඹෙන මූල්‍ය වර්ෂය ඇතුළත වත්කම් සහ වගකීම්වල ඉදිරියට ගෙනයන ශේෂයන්ට ගැලපුම් අවශ්‍ය වීමේ සැලකිය යුතු අවදානමක් ඇති කරවන අනාගතය සහ නිමාන අනියතතාව ඇති කරන වෙනත් ප්‍රධාන ප්‍රභවයන් පිළිබඳ වැදගත් උපකල්පන සම්බන්ධව පහත සාකච්ඡා කෙරේ.

**(අ) මූල්‍ය මෙවලම් වල සාධාරණ අගය**

මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශයෙහි වාර්තා කර ඇති මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වල සාධාරණ අගය සක්‍රිය වෙළඳ පොළෙන් ව්‍යුත්පන්න කර ගත නොහැකි වන විට වට්ටම් කළ මුදල් ප්‍රවාහ මොඩලය සහ / හෝ ගණිත මොඩල ඇතුළත් විවිධ ඇගයීමේ ශිල්පක්‍රම භාවිතා කිරීමෙන් එය ගණනය කරනු ලැබේ. මෙම මොඩලයන්ට අවශ්‍ය යෙදවුම් එසේ කළ හැකි අවස්ථාවන්හි නිරීක්ෂණය කළ හැකි වෙළඳ පොළ දත්ත තුළින් උකහා ගනු ලබන අතර නිරීක්ෂණය කළ හැකි වෙළඳ පොළ දත්ත නොමැති විට සාධාරණ අගය ස්ථාපනය කිරීම

සඳහා මාන (විනිශ්චයන්) අවශ්‍ය වේ. මෙම සාධක පිළිබඳ උපකල්පනයන් හි වෙනස්කම් නිසා මූල්‍ය මෙවලම් වල වාර්තා කරන ලද අගයන් කෙරෙහි බලපෑම් ඇති විය හැකිය. ශේෂ පත්‍රය දිනට මූල්‍ය වත්කම් වල ඉදිරියට ගෙන ආ අගය රු. 953,093,212/- කි. (2011 - රු. 960,408,130/-)

**(ආ) නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ඇගයීම**

නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලසුම් වල පිරිවැය නිශ්චය කරනු ලබන්නේ සූත්‍ර ක්‍රමය (Formula Method) භාවිතා කිරීමෙන් ය. ශේෂ පත්‍ර දිනයට නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ ඉදිරියට ගෙන ආ අගය රු. 10,270,928/- කි. (2011 - රු. 9,239,870/-)

**(ඇ) සාධාරණ අගය**

සාධාරණ අගය වනුයේ අතේ දුර ගණුදෙනුවකදී පිටස්තර බලපෑම් රහිත දැනුම සහ කැමැත්ත සහිත දෙපාර්ශවයක් අතර එකගත්වයට එළඹෙනු ලබන ප්‍රතිෂ්ඨාවේ අගයයි. මූල්‍ය මෙවලමක් ආරම්භයේදී පිළිගනු ලබන විට එහි සාධාරණ අගය වනුයේ සාමාන්‍යයෙන් ඒ සඳහා ගෙවන ලද හෝ භාරගන්නා ලද හෝ ප්‍රතිෂ්ඨාවේ අගයයි. ආරම්භක පිළිගැනීමෙන් අනතුරුව සක්‍රිය වෙළඳ පොළක මිල සඳහන් කර ඇති මූල්‍ය වත්කමක සාධාරණ අගය වනුයේ සාමාන්‍යයෙන් එහි විකුණුම් මිල යි. සක්‍රිය වෙළඳ පොළක මිල සඳහන් මූල්‍ය වගකීමක සාධාරණ අගය වනුයේ සාමාන්‍යයෙන් එහි ඉල්ලුම් මිලයි. මුදල් සමාන දෑ සහ කෙටිකාලීන ආයෝජන වැනි කෙටි කාලීන මූල්‍ය මෙවලම් වල ගෙන යන අගය එහි සාධාරණ අගය ලෙස සාමාන්‍යයෙන් පිළිගත හැකිය.

**(ඈ) ආදායම් බදු**

අධිකාරිය ආදායම් බද්දට යටත් වන අතර ආදායම් බදු සඳහා අවශ්‍ය සමස්ථ ප්‍රතිපාදන ප්‍රමාණය නිශ්චය කිරීම සඳහා සැලකිය යුතු ප්‍රමාණයක විනිශ්චයක් අවශ්‍ය වේ.

### 1.8 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්

අධිකාරියේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල් වර්ගය ශ්‍රී ලංකා රුපියල් බවට නිශ්චය කර ඇති අතර මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබන්නේ ද ශ්‍රී ලංකා රුපියල් වලිනි.

## 02. විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 මූල්‍ය වත්කම්

අධිකාරිය එහි මූල්‍ය වත්කම් පහත සඳහන් ප්‍රවර්ග වලට වර්ගීකරණය කරයි. ණය සහ ලැබිය යුතු දෑ, කල්පිරෙන තුරු තබාගන්නා සහ විකිණීමට තිබෙන වත්කම් වශයෙනි. කළමනාකරණය විසින් ආරම්භක පිළිගැනීමේදී මෙම වර්ගීකරණය නිශ්චය කරනු ලබන අතර එය අදාළ ආයෝජන අත්සන් කර ගත් අවශ්‍යතාව මත රඳා පවතියි.

### 2.1.1 වර්ගීකරණය

**(අ) ණය සහ ලැබිය යුතු දෑ**

ණය සහ ලැබිය යුතු දෑ සක්‍රිය වෙළඳපොලක මිළ සඳහන් කර නොමැති නියමිත දිනට ගෙවිය යුතු හෝ නිශ්චය කල හැකි හෝ ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ය. සාමාන්‍ය ගනුදෙණු වලින් ඉස්මතු වන ලැබිය යුතු දෑ ද මෙම ප්‍රවර්ගය යටතේ වර්ගීකරණය කර ඇති අතර එවැනි වත්කම් වලට සිදුවන හානි පිළිබඳව සමාලෝචනය කරනු ලැබේ.

**(ආ) කල් පිරෙන තුරු තබාගන්නා මූල්‍ය වත්කම්**

කල්පිරෙන තුරු තබාගන්නා මූල්‍ය වත්කම් යනු අධිකාරියේ කළමනාකරණයට කල්පිරෙන තුරු රඳවා ගැනීමේ හැකියාවක් සහ ස්ථිර චේතනාවක් ඇති නියමිත දිනට ගෙවිය යුතු සහ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ය. එහෙත් පහත සඳහන් මූල්‍ය වත්කම් මෙම ප්‍රවර්ගයට ඇතුළත් නොවේ.

- ආරම්භක පිළිගැනීමෙන් පසු අධිකාරිය විසින් ලාභය හෝ අලාභය හරහා නිගමනය කරනු ලබන සාධාරණ අගය සහිත වත්කම් වශයෙන් නම් කරනු ලබන වත්කම්
- අධිකාරිය විසින් විකිණීමට තිබෙන වත්කම් වශයෙන් නම් කරනු ලබන වත්කම්
- ණය සහ ලැබිය යුතු දෑ බවට අර්ථකතනය කළ හැකි වත්කම්

කල් පිරෙන තුරු තබාගන්නා ආයෝජන වලින් ලැබෙන පොළිය ආදායම් ප්‍රකාශයෙහි ඇතුළත් කරනු ලබන අතර "ආයෝජන ආදායම" වශයෙන් වාර්තා කරනු ලැබේ.

**(ඇ) විකිණීමට තිබෙන මූල්‍ය වත්කම්**

විකිණීමට තිබෙන මූල්‍ය වත්කම් වශයෙන් හඳුන්වනු ලබන්නේ අවිනිශ්චිත කාල සීමාවක් සඳහා රඳවා ගැනීමට අපේක්ෂා කරනු ලබන, ඇවර කිරීමේ අවශ්‍යතාවට හෝ පොලී අනුපාත, විනිමය අනුපාත හෝ ස්කන්ධ වෙනස්වීම් නිසා හෝ උද්ගත වන අවශ්‍යතාවට ප්‍රතිචාරයක් වශයෙන් විකිණීමට සිදු විය හැකි, ණය සහ ලැබිය යුතු දෑ, කල්පිරෙන තුරු තබාගන්නා ආයෝජන හෝ ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට පිළිගනු ලබන මූල්‍ය වත්කම් හෝ නොවන මූල්‍ය වත්කම් ය.

### 2.1.2 පිළිගැනීම සහ මානය

මූල්‍ය වත්කම් මූලික වශයෙන් සාධාරණ අගයට පිළිගනු ලබන අතර ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය මත ඉදිරියට ගෙන නොයන සියළු මූල්‍ය වත්කම් ඒවා අත්පත් කර ගැනීම සඳහා ඍජුව වැයවූ ගණුදෙනු පිරිවැයට පිළිගනු ලැබේ. ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට ඉදිරියට ගෙන යන මූල්‍ය වත්කම් මූලික වශයෙන් සාධාරණ අගයට පිළිගනු ලබන අතර ගණුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශයේ වැයක් වශයෙන් සටහන් කරනු ලැබේ.

මූල්‍ය වත්කම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහයන් භාරගැනීමේ අයිතිය අවසන් වූ කල්හි හෝ, මූල්‍ය වත්කම් මාරු කරනු ලැබ හිමිකමේ වරප්‍රසාද සහ අවදානම් සියල්ල ද අධිකාරිය විසින් සාරානුකූලව මාරු කරනු ලැබූ කල් හි හෝ එවැනි මූල්‍ය වත්කම් පිළිගැනීම අත්හැර දමනු ලැබේ (derecognized). විකිණීමට තිබෙන මූල්‍ය වත්කම්, අනතුරුව සාධාරණ අගයට පවත්වාගෙන යනු ලැබේ. කල්පිරෙන තුරු තබාගන්නා මූල්‍ය වත්කම් ද, ණය සහ ලැබිය යුතු දෑ ද බලාත්මක පොලී ක්‍රමය භාවිතා කිරීමෙන් ක්‍රමක්ෂය කළ පිරිවැයට පවත්වාගෙන යනු ලැබේ. විකිණීමට තිබෙන මූල්‍ය වත්කම් වශයෙන් වර්ගීකරණය කර ඇති මුදල් සහ මුදල් නොවන ඇප වල සාධාරණ අගයේ වෙනස් වීම් වෙනත් විස්තීර්ණ ආදායම යටතේ පිළිගනු ලැබේ. විකිණීමට තිබෙන වත්කම් වශයෙන් වර්ගීකරණය කර ඇති ඇප විකුණූ කල්හි හෝ ඒවාට හානි සිදු වූ කල්හි හෝ වෙනත් විස්තීර්ණ ආදායම යටතේ පිළිගෙන ඇති සමුච්චිත සාධාරණ අගය ගැළපුම් මූල්‍ය වත්කම් වලින් ලද ශුද්ධ ලාභයක්/අලාභයක් ලෙස ආදායම් ප්‍රකාශයෙහි ඇතුළත් කරනු ලැබේ. විකිණීමට තිබෙන ඇප සඳහා බලාත්මක පොළි ක්‍රමය භාවිතා කරමින් ගණනය කරන ලද පොලී ප්‍රමාණය ආදායම් ප්‍රකාශයෙහි පිළිගනු ලැබේ.

### 2.1.3 සාධාරණ අගය නිශ්චය කිරීම

ණය සහ අත්තිකාරම් වල මෙන්ම බැංකු සහ ගණුදෙනුකරුවන් වෙත පවතින වගකීම් වල සාධාරණ අගය නිශ්චය කරනු ලබන්නේ ණය තත්ත්වය ද්‍රවශීලතාව සහ පිරිවැය සැලකිල්ලට ගනිමින් ගිවිසුම් මගින් එකඟ වූ මුදල් ප්‍රවාහයන් පදනම් කර ගනිමින් වර්තමාන අගය මොඩලයක් භාවිතා කරමින් ය.

ලැබිය යුතු දෑ (වෙළඳ) හි, හානි සඳහා ප්‍රතිපාදන අඩුකර ඉදිරියට ගෙනයන අගය එකී වත්කම් වළ සාධාරණ අගය වශයෙන් සාමාන්‍යයෙන් සැළකිය හැකිය.

### 2.1.4 පිළිගැනීම අත්හැරීම (Derecognition)

පහත සඳහන් අවස්ථාවන් හි කිසියම් මූල්‍ය වත්කමක හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයකින් කොටසක හෝ පිළිගැනීම අත්හරිනු ලැබේ.

- අදාළ වත්කමෙන් ලැබෙන මුදල් ප්‍රවාහයන් භාර ගැනීමේ අයිතිවාසිකම අවසන් වූ විට
- වත්කමෙන් ලැබෙන මුදල් ප්‍රවාහයන් භාරගැනීමේ අයිතිවාසිකම අධිකාරිය විසින් මාරු කර ඇති හෝ අධිකාරිය භාරගන්නා මුදල් "අතින් අතට" (Pass through) වැඩ පිළිවෙලක් යටතේ වැඩි ප්‍රමාදයකින් තොරව තුන්වන පාර්ශවයකට ගෙවීමට බැඳී ඇති අවස්ථාවක දී සහ

(අ) අධිකාරිය විසින් වත්කමේ ප්‍රතිලාභ සහ අවදානම් සියල්ල සාරානුකූලව මාරු කර ඇත්නම් හෝ

(ආ) අධිකාරිය විසින් වත්කමේ ප්‍රතිලාභ සහ අවදානම් සියල්ල සාරානුකුල මාරු කිරීමක් හෝ රඳවා ගැනීමක් හෝ නොකර ඇති නමුත් වත්කමේ පාලනය මාරුකර ඇත්නම්

අධිකාරිය විසින් කිසියම් වත්කමකින් ලැබෙන මූල්‍ය ප්‍රවාහයන් භාර ගැනිමේ අයිතිය මාරු කර ඇත්නම් හෝ "අතින්-අත" (Pass through) වැඩ පිළිවෙලකට ඇතුල් වී අදාළ වත්කමේ සියළු ප්‍රතිලාභ සහ අවදානම මාරුකර හෝ සාරානුකුලව රඳවාගෙන හෝ නොමැතිව එහි පාලනය මාරු කිරීමක් ද සිදු නොකර ඇත්නම් හෝ එවැනි වත්කමක් පිළිගැනිම සිදු කරනු ලබන්නේ අධිකාරිය එම වත්කමට තවදුරටත් මැදිහත් වන තාක් දුරකට පමණකි. එවැනි අවස්ථාවක අධිකාරිය එකී වත්කම ආශ්‍රිතව ඇති වගකීම ද පිළිගනියි. මාරු කරන ලද වත්කම සහ ඒ ආශ්‍රිත වගකිම, අධිකාරිය රඳවාගෙන ඇති වරප්‍රසාද සහ වගකීම් පිලිබිඹුවන පදනමක් මත මනිනු ලැබේ. මාරු කරන ලද වත්කම සඳහා වන ඇපයක ස්වරූපය ගත් අධිකාරියේ මැදිහත් වීම මනිනු ලබන්නේ වත්කමේ ආරම්භක අගය සහ අධිකාරියට ආපසු ගෙවීමට සිදුවිය හැකි උපරිම ප්‍රතිෂ්ඨා අගය යන දෙකෙන් අඩු අගයට ය.

## 03. දේපළ පිරියත හා උපකරණ

### 3.1 පිරිවැය / ප්‍රත්‍යාගණනය

අයිතිකරු පදිංචි වී සිටින දේපොළ ඇතුළු දේපොළ සහ උපකරණ එදිනෙදා සේවා වියදම් හැර සමුච්චිත ක්ෂය වීම සහ සමුච්චිත හානි අලාභ අඩුකර පිරිවැයට දක්වනු ලැබේ. ප්‍රතිසම්පාදන හෝ ප්‍රධාන පෙළේ පරීක්ෂණ වියදම් දරු කල්හි අයිතමයේ පිරිවැය විශ්වාසයකින් යුතුව මිනිය හැකි නම් සහ අදාළ අයිතමය ආශ්‍රිතව අනාගතයේ දී ආයතනයට ආර්ථික ප්‍රතිලාභ ලැබිය හැකි නම් එවැනි පිරිවැය මූලධන ගත කරනු ලැබේ.

දේපොළ සහ උපකරණ වල පිරිවැය වශයෙන් සලකනු ලබන්නේ ඒවා අත්පත් කර ගැනීමේ හෝ ගොඩනැගීමේ හෝ පිරිවැයක් ඒවා අවශ්‍ය පරිදි පාවිච්චි කළ හැකි තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද වියදමත් ය. දේපොළ සහ උපකරණ ඒකක ප්‍රත්‍යාගණනය කරන විට අදාළ වත්කම් වර්ගයට අයත් සියල්ල එක්වර ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. අධිකාරිය සෑම වසර තුනකට (03) වරක් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රතිපත්තියක් සම්මත කරගෙන ඇත. කෙසේ වුවද ප්‍රත්‍යාගණනයට යටත් වන වත්කම් වල සාධාරණ අගය ඉදිරියට ගෙන ආ ප්‍රමාණයෙන් විශාල වශයෙන් වෙනස් වුවහොත් එවැනි වත්කම් යළි ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.

වත්කමක් ප්‍රත්‍යාගණනය කළ විට එහි ඉදිරියට ගෙන යන අගයේ කිසියම් වැඩිවීමක් සිදුවුවහොත් එකී වැඩිවීම කෙළින්ම ප්‍රත්‍යාගණන සංචිතයට භර කරනු ලැබේ. එහෙත් එම වැඩි වීම නිසා එම වත්කමේම, ආදායම් ප්‍රකාශයෙහි පෙර පිළිගත් ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්ත වන්නේ නම් එවැනි වැඩිවීමක් ආදායම් ප්‍රකාශයෙහි පිළිගනු ලැබේ. කිසියම් වර්තමාන ප්‍රත්‍යාගණන හිඟයක් නිසා එම වත්කමේම ඊට පෙර ප්‍රත්‍යාගණන අතිරික්තයක් හිලව් වන්නේ නම් කෙළින්ම ප්‍රත්‍යාගණන සංචිතයේ ඇති අතිරික්තයට එරෙහිව එය හිලව් කරනු ලැබේ. කිසියම් ඉතිරියක් වෙතොත් එය වැයක් වශයෙන් පිළිගනු ලැබේ. වත්කමක් විකුණූ විට හෝ ඉවත් කළ විට හෝ ඊට අදාළ ප්‍රත්‍යාගණන සංචිතය රඳවාගත් ඉපැයුම් වලට මාරු කරනු ලැබේ.

### 3.2

භාණ්ඩාගාරයෙන්/රජයෙන් අධිකාරියට මාරු කරන ලද දේපොළ සහ උපකරණ එකී වත්කම් භාරගත් දිනයේ තිබුණු සාධාරණ අගයට ප්‍රකාශ කර ඇත. (ඇගයීම සිදු කරන ලද්දේ 2003 දීය) IFRS වෙත පරිවර්තනය වීමේ කාර්‍යය සඳහා එකී වත්කම් වල ප්‍රත්‍යාගණන අගයන් 2011 ජනවාරි 01 දිනට තිබුණු පිරිවැය වශයෙන් සළකා ඇත.

### 3.3 ක්ෂය කිරීම

දේපොළ, පිරියත සහ උපකරණ වල පිරිවැය/තක්සේරු වටිනාකම මත සරල මාර්ග පදනම යොදා (වත්කමේ පිරිවැයෙන්/තක්සේරු වටිනාකමින් 10%ක් අඩුකර) ක්ෂය වීම ගණනය කරනු ලැබේ. ඉඩම් හැර සියළු වත්කම්, පිරිවැය සහ උපකරණ, ඵලදායී ජීව කාලය අවසන් වන විට කපා හල හැකි වන ආකාරයට වාර්ෂිකව ක්ෂය කර ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | 6 $2/_3$ % |
| මෝටර් වාහන | 12.5% |
| පිරියත යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 25% |

ගෘහ භාණ්ඩ හා සවිකිරීම් 25%

තොරතුරු තාක්ෂණ මෘදුකාංග 50%

වත්කම් මිල දී ගත් දින සිටම ක්‍ෂය කිරීම ගණන් බලා ඇති අතර එකිනෙක වත්කමේ ක්‍ෂය කළ යුතු මුල් අගය නිශ්චය කිරීමේදී එහි පිරිවැයෙන් / ප්‍රත්‍යාගණන අගයෙන් 10%ක් ශේෂ අගය වශයෙන් රඳවාගෙන ඇත. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ LKAS-16 නියමිත පරිදි දේපොළ, පිරියත සහ උපකරණ වල ආර්ථික ජීව කාලයක් ලබා ගත හැකිව තිබුණු හොඳම තොරතුරු මත පදනම්ව යළි තක්සේරු කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමහර දේපොළ පිරියත සහ උපකරණ වල ක්‍ෂය කිරීමේ අනුපාතය වෙනස් කරන ලදී. වත්කම් වල ආර්ථික ජීව කාල වෙනස් වීමෙන් ඇතිවන බලපෑම අනුව 2012 සිට මූල්‍ය ප්‍රකාශයන් හි ගැළපුම් යොදනු ඇත.

2008 වර්ෂයෙන් පසුව මිලදී ගන්නා ලද වාහන සඳහා ඵලදායිකව භාවිතා කළ හැකි කාලය සැලකිල්ලට ගනිමින් ක්ෂය කිරීමේ ප්‍රතිශතය වාර්ෂිකව 25% සිට 12.5% දක්වා අඩු කරන ලදී. 2008 ට ඉහත මිලදී ගන්නා ලද වාහන ඉවත් කිරීම සඳහා කටයුතු යොදමින් පවතින හෙයින් ක්ෂය කිරීමේ ප්‍රතිශතයේ වෙනසක් සිදු නොකරන ලදී.

### 3.4 පිළිගැනීම අත් හැරීම

දේපොළ සහ උපකරණ අයිතමයන් ඉවත් කළ විට හෝ ඒවා පාවිච්චි කිරීමෙන් තවදුරටත් අනාගත ආර්ථික ප්‍රතිලාභ බලාපොරොත්තු විය නොහැකි තත්ත්වයට පත් වූ විට හෝ එවැනි දේපොළ සහ උපකරණ පිළිගැනීම අත්හරිනු ලැබේ. දේපොළ, පිරියත සහ උපකරණ අයිතමයන් පිළිගැනීම අත්හැරීමෙන් සිදුවන ලාභය හෝ අලාභය වශයෙන් නිශ්චය කරනු ලබන්නේ එවැනි වත්කමක් විකුණා ලත් මුදලත් එහි ඉදිරියට ගෙන ආ අගයත් යන දෙකේ වෙනස වන අතර එම ලාභය හෝ අලාභය හෝ ආදායම් ප්‍රකාශයෙහි පෙන්වනු ලැබේ.

### 3.5 ස්පෘශ්‍ය වත්කම් වලට හානි සිදුවීම

අධිකාරිය සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේදීම එහි ස්පෘශ්‍ය වත්කම් වලට හානි සිදු වීම නිසා කිසියම් අලාභයක් සිදු වී ඇති බවට පෙනෙන්නට ඇත්දැයි නිශ්චය කිරීම සඳහා එම වත්කම් වල ඉදිරියට ගෙන ආ අගයන් සමාලෝචනය කරයි. එවැන්නක් පෙනෙන්නට තිබේ නම් හානි අලාභය කොපමණදැයි නිශ්චය කිරීම සඳහා අදාළ වත්කමෙන් අයකරගත හැකි මුදල කොපමණදැයි තක්සේරු කරනු ලැබේ. එක් තනි වත්කමක අයකරගත හැකි මුදල ඇස්තමේන්තු කළ නොහැකි අවස්ථාවකදී එම වත්කම අයත් වන සම්පූර්ණ මුදල් උත්පාදන ඒකකය සඳහාම අයකරගත හැකි මුදල නිශ්චය කරනු ලැබේ. ඒ සඳහා හේතු සහිත සහ යථායෝග්‍ය වෙන් කිරීමේ පදනමක් හඳුනා ගැනීමට හැකි වන අවස්ථාවන් හි වත්කම් මුදල් උත්පාදන ඒකක වශයෙන් ද වෙන් කරනු ලැබේ. එසේ නැතහොත් එවැනි හේතු සහිත සහ යථායෝග්‍ය වෙන් කිරීමේ පදනමක් හඳුනාගත හැකි නම් ඒවා කුඩාම මුදල් උත්පාදන ඒකක කාණ්ඩයට ද වෙන් කරනු ලැබේ.

අයකරගත හැකි මුදල වනුයේ විකිණීමේ පිරිවැය අඩුකළ සාධාරණ අගය හෝ පාවිච්චි කරන අතරතුර අගය යන දෙකෙන් වැඩි අගයයි. පාවිච්චිය අතරතුර අගය තක්සේරු කිරීමේදී මුදලේ කාල අගය පිළිබඳ වර්තමාන වෙළඳ පොළ තක්සේරුව සහ අනාගත මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු ගැලපුම් කර නැති වත්කමකට විශේෂිත වූ අවදානම පිළිබිඹු කෙරෙන පූර්ව-බදු වට්ටම් අනුපාතයක් යොදමින්, ඇස්තමේන්තු කරන ලද අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ.

වත්කමක (හෝ මුදල් උත්පාදන ඒකකයක) අයකර ගත හැකි මුදල එහි ඉදිරියට ගෙන ආ අගයට වඩා අඩු බවට ඇස්තමේන්තු කර ඇති අවස්ථාවක එකී වත්කමේ (මුදල් උත්පාදන ඒකකයේ) ඉදිරියට ගෙන යන අගය අයකරගත හැකි ප්‍රමාණය දක්වා අඩු කරනු ලැබේ. එවිට වහාම ආදායම් ප්‍රකාශයෙහි හානි අලාභයක් පිළිගනු ලැබේ. එහෙත් අදාළ වත්කම ඉදිරියට ගෙනවුත් ඇත්තේ ප්‍රත්‍යාගණන අගයකට නම් අදාළ හානි අලාභය ප්‍රත්‍යාගණන අඩු වීමක් ලෙස සළකනු ලැබේ.

## 04. තොග

තොග අගය කර ඇත්තේ පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධ අගය යන දෙකෙන් අඩු අගයටය. පිරිවැය නිශ්චය කරනුයේ First In First Out (FIFO) පදනම මතය.

## 05. වෙනත් වත්කම්

වෙනත් වත්කම් අතරට වෙනත් ණයගැතියෝ සහ ලැබිය යුතු දෑ, අත්තිකාරම්, තැන්පතු සහ බදු ලැබිය යුතු දෑ අයත් වේ.

### (අ) අත්තිකාරම්, තැන්පතු, පෙර ගෙවූ වියදම්

එක් මුදල් වර්ෂයකට වැඩි කාලයකට ප්‍රතිලාභ ලැබෙන හෝ සම්බන්ධකමක් ඇති බවට සැලකිය හැකි වියදම් අත්තිකාරම්, තැන්පතු සහ පෙර ගෙවූ වියදම් වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ. එවැනි වියදම් ඒවාට අදාළ වන කාල සීමාව තුළ සමාන කාල පදනමකින් කපා හරිනු ලැබේ.

### (ආ) වෙනත් ණය ගැතියෝ

වෙනත් ණය ගැතියෝ හානි අලාභ අඩු කළ පිරිවැයට පිළිගනු ලැබේ.

### (ඇ) බදු - ලැබිය යුතු දෑ

බදු ලැබිය යුතු දෑ පිරිවැයට පිළිගනු ලැබේ.

### (ඈ) පෙර ගෙවූ කාර්‍ය මණ්ඩල පිරිවැය

අධිකාරියේ සේවකයින්ට සහන පොලී අනුපාත මත ලබා දී ඇති කාර්‍ය මණ්ඩල ණය ඉතිරිය මෙයින් නියෝජනය වේ.

## 06. මුදල් සහ මුදල් සමාන දෑ

කලින් දන්නා මුදල් ප්‍රමාණයන්ට පහසුවෙන් පරිවර්තනය කළ හැකි සහ අගය වෙනස් වීමේ සුළු අවදානමකට පමණක් යටත් අධි ද්‍රවශීලතාවක් සහිත කෙටිකාලීන ආයෝජන වලින් සහ අත ඇති මුදල් වලින් මුදල් සහ මුදල් සමාන දෑ සැදුම් ලබයි. මේවා තබාගන්නේ කෙටි කාලීන මුදල් අවශ්‍යතා පිරිමසා ගැනීමට ය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්‍යයන් සඳහා මුදල් සහ මුදල් සමාන දෑ වශයෙන් සළකනු ලබන්නේ අත ඇති මුදල් සහ තවමත් ගෙවීමට ඇති බැංකු අයිරාව අඩු කළ බැංකු තැන්පත් ය. කෙටි කලකින් කල්පිරෙන (අත්පත් කර ගත් දිනයේ සිට මාස තුනකින් හෝ ඊට අඩු කාලයකින්) ආයෝජන ද මුදල් සමාන දෑ වශයෙන් සලකනු ලැබේ. බැංකු අයිරාවන් ඒකාබද්ධ ශේෂ පත්‍රයෙහි ජංගම වගකීම් යටතේ ණය ගැනීම් ඇතුළත පෙන්වනු ලැබේ.

## 07. ප්‍රතිපාදන

අදාළ වගකීම නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත සම්පත් ගලනයක් අවශ්‍ය විය හැකි එමෙන්ම වගකීමේ ප්‍රමාණය පිළිබඳ විශ්වාස කළ හැකි ඇස්තමේන්තුවක් ද සකස් කළ හැකි වර්තමාන වගකීමක් (නීතිමය හෝ අනුමිත) පෙර සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් අධිකාරිය මත පැවරී ඇති කල්හි ප්‍රතිපාදන පිළිගනු ලැබේ. මුදලෙහි කාල අගයෙහි බලපෑම වැදගත් වන්නේ නම් මුදලෙහි කාල අගය පිළිබඳ වර්තමාන වෙළඳපොළ තක්සේරුව සහ උචිත අවස්ථාවන් හි වගකීමට විශේෂිත වූ අවදානම ද පිළිබිඹු කෙරෙන පූර්ව බදු වට්ටම් අනුපාතයකින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙන් ප්‍රතිපාදනය නිශ්චය කරනු ලැබේ.

### 7.1 සේවක ප්‍රතිලාභ

#### නිශ්චිත දායක මුදල් සැලසුම්

පිළිවෙලින් අදාළ වන ව්‍යවස්ථා සහ රෙගුලාසි වලට අනුකූලව සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලට (ETF) දායක වීමේ හිමිකම ලැබී ඇත. අධිකාරිය සේවකයින්ගේ දළ වැටුප අනුව නිශ්චිත දායක මුදල් ප්‍රමාණයන් සේවක අර්ථසාධක අරමුදලටත්, සේවක භාරකාර අරමුදලටත් ගෙවන අතර ඊට අමතර කිසිවක් ගෙවීමට නීතිමය වශයෙන් හෝ අනුමිත වශයෙන් හෝ බැඳී නැත.

#### නිශ්චිත ප්‍රතිලාභ සැළසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් යනු නිශ්චිත දායක මුදල් සැළසුම් වලට අමතර පශ්චාත් රැකියා සැලසුම් ය. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම පනත යටතේ අධිකාරිය සේවකයින්ට පාරිතෝෂික ගෙවීමට නීතියෙන් බැඳී ඇත. මෙම වගකීම ඉටුකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය සේවකයෙකු සේවයෙහි යෙදෙන සෑම එක් වර්ෂයක් වෙනුවෙන් ම මාස භාගයක වැටුප බැගින් ගණනය කිරීමෙන් නිශ්චය කරනු ලැබේ.

### 7.2 අනතුරු විමර්ශන අරමුදල

ගුවන් යානා අනතුරු වලට අදාළ අනතුරු විමර්ශන පැවැත්වීම සහ සෙවීම සහ මුදාගැනීම පිළිබඳ රාජ්‍යයේ වගකීම පැවරී

ඇත්තේ සිවිල් ගුවන් සේවා අධිකාරිය මතය. මේ සඳහා රු. මිලියන 250 ක ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශයන්හි වෙන් කර ඇත. මෙම ප්‍රතිපදනයෙහි අගය නිශ්චය කර ඇත්තේ අධිකාරියේ කළමණාකරණයේ විනිශ්චය අනුවය.

7.3 **කායර්‍ මණ්ඩල සුහසාධන සහ සමාජ රක්‍ෂණ අරමුදල**

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 20(5) වගන්තිය ප්‍රකාර, රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා සිවිල් ගුවන් සේවා අධිකාරියට බැඳුනු රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් කායර්‍ මණ්ඩල සුහසාධන සහ සමාජ රක්‍ෂණ අරමුදල පිහිටුවා ඇත. එක් එක් විශ්‍රාමික නිලධාරියා නමින් මෙම අරමුදලෙහි තැන්පත්ව ඇති මුදල් ඒ ඒ නිලධාරියා සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් විශ්‍රාම ලබන විට සමුච්චිත පොලිය ද සමග නිදහස් කර දෙනු ඇත.

## 08. මූල්‍ය වගකීම්

8.1 **මූලික පිළිගැනීම සහ මිණුම**

LKAS 39 විෂය පථය තුළට ගැනෙන මූල්‍ය වගකීම්, ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට පිළිගනු ලබන මූල්‍ය වගකීම් හෝ උචිත පරිදි ණය මුදල් සහ ණයට ගැනීම් වශයෙන් වර්ග කරනු ලැබේ.

සියළු මූල්‍ය වගකීම් මූලික වශයෙන් සාධාරණ අගයට පිළිගනු ලබන අතර ණය මුදල් සහ ණයට ගැනීම් ක්‍රමක්‍ෂය කල පිරිවැයට පවත්වනු ලැබේ. මීට ඍජු ගණුදෙනු පිරිවැය ද ඇතුළත් වේ.

වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දැද අධිකාරියේ මූල්‍ය වගකීම් වලට ඇතුළත් වේ.

## 09. වෙනත් වගකීම්

උපචිත වියදම් ඇතුළු වෙනත් ණය හිමියෝ වෙනත් වගකීම් වලට ඇතුළත් වේ. මෙම වගකීම් ඒවායේ සාධාරණ අගය වශයෙන් සලකණු ලබන ඓතිහාසික අගයට ප්‍රකාශ කරනු ලැබේ.

## 10. අදායම පිළිගැනීම

10.1 **විදේශ විකුණුම් අධිභාරය/නැව් නැගීමේ ගාස්තු රැස්කිරීමේ සේවා ගාස්තුව/බලපත්‍ර මුල්වර නිකුත් කිරීම සහ අළුත් කිරීම/ ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍ර අළුත් කිරීම/නියාමක සේවා ගාස්තු/විභාග ගාස්තු**

ඉහත සඳහන් සේවා/ගාස්තු වලින් ලැබෙන ආදායම අදාළ සේවා සපයන ලද කාල සීමාව තුළ සාධාරණ අගයට පිළිගනු ලැබේ.

10.2 **පොළී ආදායම**

ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට පිළිගනු ලබන මූල්‍ය මෙවලම් ඇතුළු සියලු පොළී උත්පාදන මූල්‍ය මෙවලම් වල පොළී ආදායම බලාත්මක පොළී අනුපාත ක්‍රමය යොදාගෙන ආදායම් ප්‍රකාශයෙහි "ආයෝජන ආදායම" වශයෙන් පිළිගනු ලැබේ. ආයතනයට ලැබිය යුතු මුදලක් ලැබීමේ හැකියාව අඩු වී ඇති අවස්ථාවක එම ලැබිය යුතු මුදල අනාගතයේ ලැබේ යැයි සිතා මුදලේ වර්තමාන අගයට වාර්තා කරනු ලැබේ. වර්තමාන අගය ගණනය කරනු ලබන්නේ අනාගතයේ ලැබේ යැයි සිතන මුදල නිශ්චිත පොළී අනුපාතයකින් අවප්‍රමාණය කිරීමෙනි.

10.3 වෙනත් ආදායම් උපචිත පදනමකින් පිළිගනු ලැබේ.

## 11. වියදම් පිළිගැනීම

සියළු වියදම් ඒවා අදාළ වන කාලසීමාව තුළ දක්වන ලද සහ පිළිගන්නා ලද ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයට මනිනු ලැබේ.

වත්කමක ඵලදායී ජීවකාලයේ වෙනස් වීම් හෝ එහි අන්තර්ගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීමට අපේක්‍ෂිත රටාවේ වෙනස්කම් වලට සරිලන පරිදි ක්‍ෂය කිරීමේ කාල පරාසය වෙනස් කරන අතර එවැනි වෙනස්කම් ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් වශයෙන් ද සලකණු ලැබේ.

## 12. ණයට ගැනීමේ පිරිවැය

ණයට ගැනීමේ පිරිවැය වනුයේ අරමුදල් ණයට ගැනීමේ දී අධිකාරි විසින් දරණු ලබන පොළිය සහ වෙනත් පිරිවැයයි. එකී වියදම් දරණ ලද කාල සීමාව තුළ සිදු වූ වියදම් ලෙස පිළිගනු ලැබේ.

## 13. ප්‍රවර්තන සහ කල් තැබූ ආදායම් බදු

කාල සීමාව සඳහා වූ බදු වියදම තුළට

ප්‍රවර්තන බදු සහ කල් තැබූ බදු අයත් වේ. බදු ආදායම් ප්‍රකාශයෙහි පිළිගනු ලැබේ. එහෙත් කිසියම් බදු මුදලක් වෙනත් විස්තීර්ණ ආදායම තුළ හෝ ඍජුව ස්කන්ධ තුළ පිළිගෙන ඇති අයිතමයන්ට අදාළ වන්නේ නම් එවැනි බදු පිළිවෙලින් වෙනත් විස්තීර්ණ ආදායමෙහි හෝ ඍජු ලෙස ස්කන්ධයෙහි හෝ පිළිගනු ලැබේ.

ප්‍රවර්තන බදු වත්කම් සහ වගකීම් සැලූම්ලන්නේ ප්‍රවර්තන වර්ෂයට මෙන්ම පෙර වර්ෂ වලට අදාළව බදු අයකරන බලධාරීන්ගෙන් අයකර ගැනීමට ඇති හෝ ඔවුනට ගෙවීමට ඇති මුදල් ප්‍රමාණයන් ය. මෙකී බදු ප්‍රමාණයන් ගණනය කිරීමට යොදා ගනු ලබන්නේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනයට පෙර හෝ ඉන් පසුව හෝ සම්මත කරනු ලබන බදු නීති සහ බදු අනුපාතයන්ය. මේ අනුව 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ සහ එහි සංශෝධනයන් හි විධිවිධාන වලට අනුකූලව බදු කායෳයන් සඳහා ගැළපුම් කරන ලද වාර්ෂික ලාභය මත පදනම්ව බදු ගෙවීම සඳහා ප්‍රතිපාදන සලස්වනු ලැබේ. වත්කම් සහ වගකීම් වල බදු පාදක සහ මූල්‍ය ප්‍රකාශයන්හි ඉදිරියට ගෙන යන අගයන් අතර පැනනගින තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමය යොදමින් කල් තැබූ අදායම් බදු පිළිගනු ලැබේ. කෙසේ වුවද අදාළ කල් තැබූ ආදායම් බද්ද පැනනගින්නේ ගණුදෙනුව සිදුකරන අවස්ථාවේ ගිණුම් තැබීම කෙරෙහි හෝ බදු අයකළ හැකි පොලිය කෙරෙහි හෝ බලපෑමක් සිදු නොවන ව්‍යාපාර හවුලක් නොවන ගණුදෙනුවකට අදාළ වත්කමක හෝ වගකීමක හෝ මූලික පිළිගැනීමේදී නම් එය ගිණුම් ගත කරනු නොලැබේ. කල් තැබූ ආදායම් බදු නිශ්චය කරනු ලබන්නේ වාර්තාකරණ කාලය අවසන් වන විට හෝ ඊට පසුව හෝ සම්මත කර තිබුණු සහ අදාළ කල් තැබූ ආදායම් බදු වත්කම් උපලබ්ධි වන විට හෝ අදාළ කල් තැබූ ආදායම් බදු වගකීම නිරවුල් කරන විට හෝ අදාළව පවතී යයි අපේක්ෂා කරනු ලබන බදු අනුපාත (සහ නීති) උපයෝගී කරගෙනය.

කල් තැබූ ආදායම් බදු වත්කම් පිළිගනු ලබන්නේ, තාවකාලික කල් තැබීම් ඊට එරෙහිව පාවිච්චි කළ හැකි අනාගත බදු අයකළ හැකි පොළියක් ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වන තාක් දුරකටය. තාවකාලික කල් තැබීම ප්‍රතිවර්තනය කිරීමේ කාලය අධිකාරිය විසින් පාලනය කරන සහ පෙනෙන අනාගතයේදී එය ප්‍රතිවර්තනය නොවිය හැකි බවට විශ්වාස කළ හැකි අවස්ථාවන්හිදී හැර පාලිත සමාගම් වල සහ සංසට සමාගම් වල කරන ලද ආයෝජනයන්ගෙන් පැන නගින තාවකාලික කල් තැබීම් මත කල් තැබූ බදු ප්‍රතිපාදනය කරනු ලැබේ.

ප්‍රවර්තන බදු වත්කම් වලට එරෙහිව ප්‍රවර්තන බදු වගකීම් හිලව් කිරීම සඳහා නීත්‍යානුකූලව ක්‍රියාත්මක කළ හැකි අයිතිවාසිකමක් තිබේ නම් සහ කල් තැබූ ආදායම් බදු වත්කම් සහ වගකීම් එකම බදු අයකිරීමේ බලධාරියෙකු බදු ගෙවිය යුතු එකම ආයතනයක් මත හෝ ශුද්ධ පදනමකින් ශේෂ නිරවුල් කිරීමට අපේක්ෂා කරන වෙන් වෙන් වූ බදු ගෙවිය යුතු ආයතන මත හෝ පනවන ලද බදු මුදල් වලට අදාළ වන්නේ නම් හෝ එවැනි වත්කම් සහ වගකීම් එකිනෙකට හිලව් කරනු ලැබේ.

කටයුතු නොකළ අලාභ සහ කටයුතු නොකළ බදු ණය ඉදිරියට ගෙන ආ ශේෂයන්හි බදු බලපෑම් එකී අලාභ හිලව් කිරීමට ප්‍රමාණවත් බදු ගෙවිය යුතු ලාභ අනාගතයේ දී ලැබෙනු ඇතැයි සිතිය හැකි නම් වත්කම් වශයෙන් පිළිගනු ලැබේ.

## 14. විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය/ගණුදෙනු

ක්‍රියාකාරී ව්‍යවහාර මුදල් නොවන වෙනත් ව්‍යවහාර මුදල් වර්ග යොදාගෙන සිදු කරනු ලබන සියලු ගණුදෙනු එකී ගණුදෙනු සිදු කරන අවස්ථාවේ පැවති විනිමය අනුපාත යොදාගෙන ශ්‍රී ලංකා රුපියල් වලින් වාර්තා කරනු ලැබේ. සෑම මූල්‍ය තත්ත්ව ප්‍රකාශ දිනයකදීම විදේශ ව්‍යවහාර මුදලින් අගය දක්වා ඇති මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් ශේෂ පත්‍ර දිනයේ බල පැවැත්වූ විනිමය අනුපාතය මත ශ්‍රී ලංකා රුපියල් දක්වා යළි පරිවර්තනය කරනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදලින් අගය දක්වා ඇති මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් අදාළ ගණුදෙනුව සිදු කළ දිනයේ පැවති විනිමය අනුපාත මත ශ්‍රී ලංකා රුපියල් දක්වා පරිවර්තනය කරනු ලැබේ. මූල්‍ය අයිතම නිරවුල් කිරීමේදී සහ මූල්‍ය අයිතම යළි පරිවර්තනය කිරීමේදී පැන නගින විනිමය වෙනස්කම් එකී වෙනස්කම් පැනනැගුනු වර්ෂයේ ආදායම් ප්‍රකාශයෙහි පෙන්වනු ලැබේ.

## 15. ශේෂ පත්‍ර දිනයට පසු සිදුවීම්

අධ්‍යක්ෂ මණ්ඩලය සියළු සිදුවීම් සමීපයෙන් නිරීක්ෂණය කරන අතර ශේෂ පත්‍රය දිනෙන් පසු වැදගත් සිදුවීම් සම්බන්ධව ප්‍රවර්තන මූල්‍ය ප්‍රකාශයන්හි උචිත ගැළපුම් සහ හෙළදරව් කිරීම් සිදු කරනු ලැබේ.

## 16. අසම්භාව්‍ය වගකීම්

පෙර සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් අනාගත වගකීමක් උද්ගත විය හැකි නම් හෝ පෙර සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන වගකීමක් පැවරී ඇත්නම් සහ ඒ සඳහා ගෙවීමක් සිදු කළ නොහැකි නම් හෝ ගෙවිය යුතු මුදල සාධාරණ අන්දමින් ඇස්තමේන්තු කළ නොහැකි නම් හෝ ඒවා අසම්භාව්‍ය වගකීම් ලෙස හෙළිදරව් කරනු ලැබේ.

## 17. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය නොවන ස්වභාවයේ ගණුදෙනු, මෙහෙයුම් මුදල් ලැබීම් හෝ ගෙවීම් වල කල් තැබීම් කිසිවක් හෝ උපචිත වීම් කිසිවක් ද එමෙන්ම මුදල් ප්‍රවාහයන් ආයෝජනය කිරීම හෝ මූල්‍යනය කිරීම ආශ්‍රිත ආදායම් හෝ වියදම් අයිතම ආදියෙහි බලපෑම් මත ගැලපුම් කරන ලද ලාභය හෝ අලාභය මෙකී වක්‍ර ක්‍රමයෙන් හෙළිදරව් වේ.

## 18. රජයේ ප්‍රදාන

අධිකාරිය පිහිටුවන ලද අවස්ථාවේදි සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවෙන් මාරු කරන ලද වත්කම් වල සමුච්චිත ක්‍රමක්ෂය අඩුකර රජයේ ප්‍රදානයන්හි අගය වශයෙන් පෙන්වා ඇත.

| | | |
|---|---|---|
| 2011.01.01 දිනට රජයේ ප්‍රදාන | රු. | 9,774,488.05 |
| අඩුකළා - 2011 වර්ෂයට ක්‍රමක්ෂය | රු. | 606,054.00 |
| 2011.12.31 දිනට රජයේ ප්‍රදාන | රු. | 9,168,434.05 |
| අඩුකළා - 2012 වර්ෂයට ක්‍රමක්ෂය | රු. | 606,054.00 |
| 2012.12.31 දිනට රජයේ ප්‍රදාන | රු. | 8,562,380.00 |

# මුදල් ප්‍රකාශවලට අදාළ සටහන්

*2012 දෙසැම්බර් මස 31 අවසන් වූ වර්ෂය සඳහා*

| සටහන් අංක | | 2011 රු. | 2010 රු. |
|---|---|---|---|

1. **කාර්යාල මණ්ඩල ණය**

LKAS 39 අනුව කාර්යාල මණ්ඩල ණය පිළිගනු ලබන්නේ භාවිත පොළී අනුපාතය යොදා ගනිමින් ක්‍රම ක්ෂය කළ පිරිවැයටය. මෙහිදී කිසියම් හානියක් නිසා සිදු වූ අලාභය අඩු කරනු ලැබේ. මේ අනුව 2011 ජනවාරි 01 දින වන විට ඉතිරිව තිබුණු කාර්යාල මණ්ඩල ණය ක්‍රමක්ෂය කළ පිරිවැයට පිළිගෙන ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් රු.7,314,918/= පෙර ගෙවූ කාර්‍ය මණ්ඩල පිරිවැයක් සහ IFRS ගැළපුම් ගිණුමක් අධිකාරියේ ගිණුම් පොත් තුළ ස්ථාපනය වී ඇත.

1.1 ඒ ඒ ශේෂයන් පහත සඳහන් පරිදි මූල්‍ය ප්‍රකාශ වල පෙන්නුම් කර ඇත. IFRS ගැළපුම් ගිණුමේ ශේෂය කාර්‍ය මණ්ඩල ණය ගිණුමෙන් අඩු කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් දැන් ශේෂ පත්‍රයේ කාර්යය මණ්ඩල ණය පෙන්වා ඇත්තේ සාධාරණ අගයටය.

| | |
|---|---|
| කාර්‍ය මණ්ඩල ණය | 29,303,171.13 |
| IFRS ගැළපුම් | (7,314,918.00) |
| | 21,988,253.13 |

1.2 ඉහත ගැළපුම නිසා මතු වූ පෙර ගෙවූ කාර්යය මණ්ඩල පිරිවැය ජංගම වත්කම් යටතේ පෙන්වා ඇත.

| | |
|---|---|
| පෙර ගෙවූ කාර්‍ය මණ්ඩල පිරිවැය | 7,314,918.00 |

2. **2011 ජනවාරි 01 දිනට සමුච්චිත ලාභය**

2011 ජනවාරි 01 දින වන විට සමුච්චිත ලාභය සම්බන්ධව පහත සඳහන් ගැළපුම සිදු කරන ලදී.

| | |
|---|---|
| SLAS අනුව 2011 ජනවාරි 01 දිනට සමුච්චිත ලාභය | 634,152,304.21 |
| අංක 03 සටහන අනුව කල් තැබූ බදු | (4,168,924.44) |
| 2011 ජනවාරි 01 දිනට IFRS ගැළපුම් වලින් පසු සමුච්චිත ලාභය | 629,983,379.77 |

3. **කල් තැබූ බදු**

| | |
|---|---|
| 2010.12.31 දිනට දේපළ පිරියත සහ උපකරණ වල අඩු කළ අගය | 50,449,662.26 |
| 2010.12.31 දිනට දේපළ, පිරියත සහ උපකරණ වල බදු අඩු කළ අගය | 38,538,449.57 |
| වෙනස | (11,911,212.69) |
| 35% බැගින් කල්තැබූ බදු | (4,168,924.44) |

ඉහත සඳහන් දෑ 2011 ජනවාරි 31 දිනට රඳවාගත් ඉපයීම් ලෙස ගැළපුම් කරන ලදී.

| | | SLFRS 31.12.2012 Rs. Cts. | SLFRS 31.12.2011 Rs. Cts. | SLAS 31.12.2011 Rs. Cts. |
|---|---|---|---|---|
| 4. | **ආදායම** | **918,524,428.11** | **687,539,179.30** | **687,539,179.30** |
| | විදේශ විකුණුම් අධිභාරය | 777,079,501.28 | 559,570,672.40 | 559,570,672.40 |
| | නැව් නැගීමේ ගාස්තු- සේවා ගාස්තු | 92,897,230.67 | 84,632,690.14 | 84,632,690.14 |
| | බල පත්‍ර නිකුත් කිරීම සහ අළුත් කිරීම | 17,118,445.73 | 15,896,296.50 | 15,896,296.50 |

| | | SLFRS 31.12.2012 රු. සත. | SLFRS 31.12.2011 රු. සත. | SLAS 31.12.2011 රු. සත. |
|---|---|---|---|---|
| | විභාග ගාස්තු | 4,546,056.19 | 2,532,726.75 | 2,532,726.75 |
| | වෙනත් නියාමන ගාස්තු | 19,510,535.24 | 17,994,188.00 | 17,994,188.00 |
| | වෙනත් මෙහෙයුම් ආදයම් | 7,372,659.00 | 6,912,605.51 | 6,912,605.51 |
| **5.** | **වෙනත් ආදයම්** | **70,467,194.05** | **59,435,660.43** | **56,518,764.43** |
| | විවිධ ආදායම් | 879,972.43 | 165,959.33 | 165,959.33 |
| | කුලී ආදායම් | 115,503.25 | 80,283.75 | 80,283.75 |
| | ස්ථාවර වත්කම් විකිණීමෙන් ලත් ලාභය | - | 440,519.25 | 440,519.25 |
| | කාර්‍ය මණ්ඩල ණය පොලී ආදායම (IFRS) | 4,109,609.00 | 2,916,896.00 | - |
| | රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම | 606,054.00 | - | - |
| | **පොලී ආදායම** | | | |
| | කාර්‍ය මණ්ඩල ණය පොලිය | 2,928,507.31 | 2,153,770.85 | 2,153,770.85 |
| | භාණ්ඩාගාර බිල්පත් පොලිය | 20,433,433.92 | 43,505,705.82 | 43,505,705.82 |
| | ස්ථාවර තැන්පතු පොලිය | 31,142,884.22 | 831,276.71 | 831,276.71 |
| | ඇමතුම් තැන්පතු පොලිය | 8,842,495.67 | 9,341,248.72 | 9,341,248.72 |
| | නැව් නැගීමේ ගාස්තු පොලිය | 1,408,734.25 | - | - |
| **6.** | **කාර්‍ය මණ්ඩල වියදම්** | **148,638,658.02** | **131,741,781.67** | **128,824,885.67** |
| | වැටුප් හා වේතන | 59,821,258.92 | 53,145,019.80 | 53,145,019.80 |
| | වෙනත් දීමනා | 46,761,582.30 | 37,533,224.62 | 37,533,224.62 |
| | සේවක අර්ථසාධක අරමුදල | 14,963,426.50 | 12,133,292.52 | 12,133,292.52 |
| | සේවකභාර අරමුදල | 2,991,966.01 | 2,427,978.38 | 2,427,978.38 |
| | උපයන විට ගෙවීම් බදු | 2,324,857.76 | 2,967,595.83 | 2,967,595.83 |
| | ප්‍රසාද දීමනා | 3,543,736.03 | 3,685,959.32 | 3,685,959.32 |
| | ශුභ සාධන වියදම් | 8,993,452.88 | 11,191,509.98 | 11,191,509.98 |
| | පාරිතෝෂිත | 1,767,642.50 | 1,781,080.00 | 1,781,080.00 |
| | අතිකාල සහ නිවාඩු දින වැටුප් | 3,361,126.12 | 3,959,225.22 | 3,959,225.22 |
| | ණය ප්‍රතිලාභ සඳහා කාර්‍ය මණ්ඩල පිරිවැය IFRS ගැළපුම් | 4,109,609.00 | 2,916,896.00 | - |
| **7.** | **රැස්වීම්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු** | **26,794,066.10** | **18,970,807.98** | **18,970,807.98** |
| | වැඩමුළු සහ සම්මන්ත්‍රණ වියදම් | | | |
| | දේශීය | 6,384,027.94 | 2,781,417.45 | 2,781,417.45 |
| | විදේශ | 20,410,038.16 | 16,189,390.53 | 16,189,390.53 |
| **8.** | **පුහුණු කිරීමේ වියදම්** | **20,106,117.69** | **22,380,262.52** | **22,380,262.52** |
| | පුහුණු කිරීමේ වියදම් | | | |
| | දේශීය | 2,955,351.00 | 968,788.48 | 968,788.48 |
| | විදේශ | 16,914,549.50 | 20,172,546.78 | 20,172,546.78 |
| | සිවිල් ගුවන් සේවා පුහුණු මධ්‍යස්ථානයේ වියදම් | 236,217.19 | 1,238,927.26 | 1,238,927.26 |

| | | SLFRS 31.12.2012 | SLFRS 31.12.2011 | SLAS 31.12.2011 |
|---|---|---|---|---|
| | | රු. සත. | රු. සත. | රු. සත. |
| 9. | **පරිපාලන සහ වෙනත් වියදම්** | **148,764,416.90** | **120,735,518.27** | **120,735,518.27** |
| | අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 1,556,250.00 | 617,500.00 | 617,500.00 |
| | ලිපිද්‍රව්‍ය සහ පාරිභෝගික ද්‍රව්‍ය සඳහා වියදම් | 5,006,745.34 | 4,757,560.74 | 4,757,560.74 |
| | වෙනත් සැපයුම් | 501,358.59 | 650,560.18 | 650,560.18 |
| | විදුලි සංදේශනය | 4,260,690.86 | 3,889,075.73 | 3,889,075.73 |
| | තැපැල් ගාස්තු | 216,215.23 | 157,056.22 | 157,056.22 |
| | දේශීය/විදේශීය සංවිධාන වලට වාරික/දායක මුදල් | 16,280,565.63 | 15,486,426.19 | 15,486,426.19 |
| | විභාග ගාස්තු | 216,308.43 | 579,209.57 | 579,209.57 |
| | මුද්‍රණ වියදම් | 2,201,553.24 | 1,362,503.46 | 1,362,503.46 |
| | ගුවන් ගාස්තු සහ ප්‍රවේශ පත්‍ර පාඨමාලාවේ වියදම් | 361,031.89 | 380,268.09 | 380,268.09 |
| | ගෘහස්ත සහ එළිමහන් රැස්වීම් වියදම් | 1,190,651.48 | 1,217,637.80 | 1,217,637.80 |
| | පරිවර්තන සහ යතුරු ලියන වියදම් | 106,991.11 | - | - |
| | දේපළ, පිරියත සහ උපකරණ නඩත්තුව | 1,160,536.65 | 1,401,512.36 | 1,401,512.36 |
| | ඉන්ධන | 7,595,356.24 | 4,791,129.40 | 4,791,129.40 |
| | වාහන නඩත්තුව | 6,904,174.63 | 4,811,114.27 | 4,811,114.27 |
| | කුලිය සහ කුලී ගාස්තු | 1,055,532.26 | 1,462,288.08 | 1,462,288.08 |
| | කාර්යාල ගොඩනැගිල්ල සහ නිල නිවාස සඳහා වියදම | 47,657,085.98 | 55,116,397.34 | 55,116,397.34 |
| | NBT | 569,702.00 | 595,128.00 | 595,128.00 |
| | "දයට කිරුළ" ප්‍රදර්ශනය | 6,309,271.99 | 5,473,873.16 | 5,473,873.16 |
| | ගුවන් සේවා සංවර්ධනය | 4,583,246.91 | 5,802,932.19 | 5,802,932.19 |
| | තොරතුරු තාක්ෂණ සංවර්ධනය | 273,558.85 | 6,986,497.51 | 6,986,497.51 |
| | පරිත්‍යාග | 350,000.00 | - | - |
| | ගුවන් සේවා සමරු උත්සවය | 11,385,293.44 | - | - |
| | නියාමන සංවර්ධනය | 27,752,849.25 | - | - |
| | විවිධ වියදම් | 1,043,604.31 | 5,196,847.98 | 5,196,847.98 |
| | ස්ථාවර වත්කම් ඉවත් කිරීමෙන් අලාභය | 225,842.59 | - | - |
| 10. | **බදු ගෙවීම** | **94,722,505.91** | **199,054,612.09** | **197,292,954.44** |
| | ආදායම් බදු | 173,092,484.43 | 197,292,954.44 | 197,292,954.44 |
| | ආදායම් බදු - පෙර වසර අතිරික්ත ප්‍රතිපාදන | (77,201,590.87) | - | - |
| | කල් තැබූ බදු | (1,168,387.65) | 1,761,657.65 | - |

11. දේපොළ, පිරියත සහ උපකරණ

| | 2012/01/01 දිනට ශේෂය | එකතු කිරීම්/මාරු කිරීම් | ඉවත් කිරීම් | 2012/12/31 දිනට ශේෂය | 2011/12/31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| **පිරිවැය/අගය** | | | | | |
| ඉඩම් | 5,359,200.00 | - | - | 5,359,200.00 | 5,359,200.00 |
| ගොඩනැගිලි | 11,382,182.05 | 1,883,500.00 | - | 13,265,682.05 | 11,382,182.05 |
| වාහන | 69,551,758.49 | 18,376,874.66 | - | 87,928,633.15 | 69,551,758.49 |
| පිරියත සහ යන්ත්‍ර සූත්‍ර | 50,831,115.44 | 2,861,002.28 | (1,547,614.00) | 52,144,503.72 | 50,831,115.44 |
| IT මෘදුකාංග | - | 8,680,747.51 | - | 8,680,747.51 | - |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 28,573,765.62 | 157,148.69 | (2,314,296.01) | 26,416,618.30 | 28,573,765.62 |
| වෙනත් ස්ථාවර වත්කම් | 999,079.00 | - | - | 999,079.00 | 999,079.00 |
| | **166,697,100.60** | **31,959,273.14** | **(3,861,910.01)** | **194,794,463.73** | **166,697,100.60** |

| | 2012/01/01 දිනට ශේෂය | වර්ෂය සඳහා අය කිරීම | ඉවත් කිරීම් සඳහා ක්ෂය කිරීම | 2012/12/31 දිනට ශේෂය | 2011/12/31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| **ක්ෂය වීම්** | | | | | |
| ගොඩනැගිලි | 5,594,057.74 | 751,854.13 | - | 6,345,911.87 | 5,594,057.74 |
| වාහන | 18,940,155.35 | 10,314,192.61 | - | 29,254,347.96 | 18,940,155.35 |
| පිරියත සහ යන්ත්‍ර සූත්‍ර | 22,895,982.42 | 5,948,971.47 | (1,346,211.25) | 27,498,742.64 | 22,895,982.42 |
| IT මෘදුකාංග | - | 3,835,088.51 | - | 3,835,088.51 | - |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 8,218,390.58 | 5,650,812.34 | (1,849,356.17) | 12,019,846.75 | 8,218,390.58 |
| වෙනත් ස්ථාවර වත්කම් | 949,036.00 | - | - | 949,036.00 | 949,036.00 |
| | **56,597,622.09** | **26,500,919.06** | **(3,195,567.42)** | **79,902,973.73** | **56,597,622.09** |
| **අඩුකළ අගය** | **-** | **-** | **-** | **114,891,490.00** | **110,099,478.51** |

| | | SLFRS 31.12.2012 රු. සත. | SLFRS 31.12.2011 රු. සත. | SLAS 31.12.2011 රු. සත. |
|---|---|---|---|---|
| 12. | **තොග** | **6,934,256.43** | **1,586,231.16** | **1,586,231.16** |
| | පාරිභෝගික අයිතම | 2,104,256.43 | 1,586,231.16 | 1,586,231.16 |
| | සිදු කරමින් පවතින වැඩ | 4,830,000.00 | - | - |
| 13. | **ලැබිය යුතු දෑ (වෙළඳ) සහ කාර්‍ය මණ්ඩල ණය** | **180,555,880.06** | **138,910,733.59** | **151,575,041.59** |
| | විදේශ විකුණුම් අධිභාරය සහ නියාමක සේවා ආදායම - ලැබිය යුතු | 144,073,407.09 | 101,053,047.85 | 101,053,047.85 |
| | වෙනත් ණය ගැතියෝ | 1,013,855.11 | 5,039,897.72 | 5,039,897.72 |
| | කාර්‍ය මණ්ඩල ණය | 53,176,212.86 | 45,482,096.02 | 45,482,096.02 |
| | අඩු කළා - කල් තැබූ කාර්‍ය මණ්ඩල පිරිවැය | (17,707,595.00) | (12,664,308.00) | - |
| 14. | **මූල්‍ය වත්කම්** | **543,528,106.43** | **502,513,280.00** | **502,513,280.00** |
| | ස්ථාවර තැන්පතු | 84,657,875.00 | 8,289,242.00 | 8,289,242.00 |
| | භාණ්ඩාගාර බිල්පත් | 458,870,231.43 | 494,224,038.00 | 494,224,038.00 |
| 15. | **අත්තිකාරම්, පෙරගෙවුම් සහ වෙනත් ලැබිය යුතු දෑ** | **136,448,863.07** | **124,274,758.74** | **111,610,450.74** |
| | අත්තිකාරම් | 4,357,584.24 | 2,675,560.86 | 2,675,560.86 |
| | පෙර ගෙවුම් | 46,378,640.19 | 41,546,415.51 | 41,546,415.51 |
| | ලැබිය යුතු VAT බදු | 32,688,455.07 | 31,692,486.18 | 31,692,486.18 |
| | ලැබිය යුතු පොලී ආදායම | 35,316,588.57 | 35,695,988.19 | 35,695,988.19 |
| | පෙර ගෙවූ කාර්‍ය මණ්ඩල පිරිවැය | 17,707,595.00 | 12,664,308.00 | - |
| 16. | **මුදල් හා මුදල් සමාන දෑ** | **220,447,275.51** | **208,877,789.26** | **208,877,789.26** |
| | බැංකුවේ ඇති මුදල් | 40,447,275.51 | 61,877,789.26 | 61,877,789.26 |
| | කෙටි කාලීන ආයෝජන | 180,000,000.00 | 147,000,000.00 | 147,000,000.00 |
| 17. | **ලැබුනු ප්‍රදාන** | **8,562,380.05** | **9,168,434.05** | **9,168,434.05** |
| | ඉඩම් | 5,359,200.00 | 5,359,200.00 | 5,359,200.00 |
| | ගොඩනැගිලි | 3,620,539.95 | 4,226,593.95 | 4,226,593.95 |
| | වෙනත් ස්ථාවර වත්කම් | 188,694.10 | 188,694.10 | 188,694.10 |
| | එකතුව | 9,168,434.05 | 9,774,488.05 | 9,774,488.05 |
| | වර්ෂය සඳහා ක්‍රමක්ෂය | (606,054.00) | (606,054.00) | (606,054.00) |
| | 2012/12/31 දිනට ශේෂය | 8,562,380.05 | 9,168,434.05 | 9,168,434.05 |
| 18. | **ප්‍රත්‍යාගණන අතිරික්තය** | **13,485,465.44** | **13,485,465.44** | **13,485,465.44** |
| | වාහන | 4,720,625.00 | 4,720,625.00 | 4,720,625.00 |
| | පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 3,855,992.93 | 3,855,992.93 | 3,855,992.93 |
| | ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 4,908,847.51 | 4,908,847.51 | 4,908,847.51 |

| | | SLFRS 31.12.2012 රු. සත. | SLFRS 31.12.2011 රු. සත. | SLAS 31.12.2011 රු. සත. |
|---|---|---|---|---|
| 19. | **කල් තැබූ බදු වගකීම්** | **4,762,194.44** | **5,930,582.09** | **-** |
| | 2012 ජනවාරි 01 ට ශේෂය | 5,930,582.09 | 4,168,924.44 | - |
| | වර්ෂය සඳහා ප්‍රතිවර්තනය | (1,168,387.65) | 1,761,657.65 | - |
| | 2012/12/31 දිනට ශේෂය | | | |
| 20. | **ප්‍රතිපාදන සහ වෙනත් වගකීම්** | **259,676,305.00** | **259,413,871.00** | **259,413,871.00** |
| | රක්‍ෂණ සඳහා ප්‍රතිපාදන | 630,300.00 | 562,850.00 | 562,850.00 |
| | කාර්‍ය මණ්ඩල ශුභ සාධන අරමුදල | 418,005.00 | 361,021.00 | 361,021.00 |
| | අනතුරු විමර්ශන අරමුදල සඳහා ප්‍රතිපාදන | 250,000,000.00 | 250,000,000.00 | 250,000,000.00 |
| | ලැබුණු තැන්පතු | 8,628,000.00 | 8,490,000.00 | 8,490,000.00 |
| 21. | **විශ්‍රාම ප්‍රතිලාභ වගකීම** | **10,270,927.50** | **9,239,870.00** | **9,239,870.00** |
| | 2012 ජනවාරි 01 දිනට ශේෂය | 9,239,870.00 | 7,848,950.00 | 7,848,950.00 |
| | වර්ෂය සඳහා ප්‍රතිපාදන | 1,767,642.50 | 1,781,080.00 | 1,781,080.00 |
| | වර්ෂය තුළ ගෙවීම් | (736,585.00) | (390,160.00) | (390,160.00) |
| 22. | **ගෙවිය යුතු දෑ (වෙළඳ)** | **282,872,312.57** | **254,868,404.05** | **254,868,404.05** |
| | තැන්පතු පරීක්‍ෂණ ගාස්තු සහ මෙහෙයුම | 8,418,271.41 | 8,853,968.31 | 8,853,968.31 |
| | AASL වෙත සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු මුදල් | 270,521,941.16 | 246,014,435.74 | 246,014,435.74 |
| | වෙනත් ණය හිමියෝ | 3,932,100.00 | - | - |
| 23. | **වෙනත් ගෙවිය යුතු දෑ** | **43,274,312.31** | **8,513,660.64** | **8,513,660.64** |
| | උපචිත වියදම් | | | |
| | - කාර්‍ය මණ්ඩල වියදම් | 4,070,880.75 | 3,744,960.52 | 3,744,960.52 |
| | - පොදු වියදම් | 39,203,431.56 | 4,768,700.12 | 4,768,700.12 |
| 24. | **ආදායම් බදු වගකීම්** | **90,600,765.82** | **106,159,937.71** | **106,159,937.71** |
| | 2012 ජනවාරි 01 දිනට ශේෂය | 106,159,937.71 | 73,184,496.45 | 73,184,496.45 |
| | වර්ෂය සඳහා ප්‍රතිපාදන | 95,890,893.56 | 197,292,954.44 | 197,292,954.44 |
| | වර්ෂය තුළ ගෙවන ලද මුදල් | (111,450,065.45) | (164,317,513.18) | (164,317,513.18) |
| | 2012/12/31 දිනට ශේෂය | | | |

**25. පෙර වසර ගැළපුම්**

පෙර වසර ගැළපුම් සංයුතිය පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| ගෙවූ බදු | (25.1) | 110,632,274.00 |
| ප්‍රාග්ධනය බවට පත්කළ වියදම් | (25.2) | 6,986,497.51 |

25.1 දේශීය ආදායම් පනතේ 62C වගන්තිය යටතේ 2009 සහ 2010 වර්ෂ සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවන ලද මුදල මෙයින් නියෝජනය වේ.

**25.2** 2011 වර්ෂයේ මිලදී ගත් පරිගණක මෘදුකාංග සඳහා දරන ලද රු. මිලියන 6 ක ප්‍රාග්ධන වියදම අධිකාරියේ 2011 මූල්‍ය ප්‍රකාශයන් හි වියදමක් ලෙස පෙන්වා ඇත. මෙම වරද ප්‍රවර්තන මුදල වර්ෂයේදී නිවැරදි කරන ලදී.

**26.** 1971 අංක 58 දරන මුදල් පනතේ 10(5) වගන්තියෙහි නියමිත පරිදි සිවිල් ගුවන් සේවා අධිකාරියේ අතිරේක ආදායම් විසර්ජනය මෙයින් නියෝජනය වේ.

**26. IFRS ගැළපුම්**

| | | |
|---|---|---|
| 2011/01/01 දිනට SLAS ශේෂ පත්‍රය අනුව රඳවා ගත් ලාභය | | 634,152,304.21 |
| 2010 IFRS ගැලපුම් (කල් තැබූ බදු) | (3) | (4,168,924.44) |
| 2011 SLFRS ශේෂ පත්‍රය අනුව රඳවාගත් ලාභය | | 629,983,379.77 |
| වසර සඳහා ලාභය | | 29,843,114.95 |
| පෙර වසර ගැළපුම් | | 9,855,551.66 |
| ශුද්ධ අතිරික්ත විසර්ජනය | | (250,000,000.00) |
| 2012/01/01 දිනට SLFRS ශේෂ පත්‍රය අනුව රඳවා ගත් ලාභය | | 419,482,046.38 |
| වසර සඳහා ලාභය | | 523,464,938.48 |
| පෙර වසර ගැළපුම් | | (103,645,776.49) |
| ශුද්ධ අතිරික්ත විසර්ජනය | | (350,000,000.00) |
| 2012/12/31 දිනට SLFRS ශේෂ පත්‍රය අනුව රඳවා ගත් ලාභය | | 489,301,208.57 |

**26.1 2011 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂ පත්‍රය**

| | සටහන | SLFRS 01.01.2011 රු. සත. | ගැළපුම් රු. සත. | SLAS 01.01.2011 රු. සත. |
|---|---|---|---|---|
| **වත්කම්** | | **1,068,151,620.35** | | **1,068,151,620.35** |
| **ජංගම නොවන වත්කම්** | | 50,449,662.26 | | 50,449,662.26 |
| දේපොළ, පිරියත සහ උපකරණ | | 50,449,662.26 | | 50,449,662.26 |
| **ජංගම වත්කම්** | | **1,017,701,958.09** | | **1,017,701,958.09** |
| තොග | | 1,193,297.32 | | 1,193,297.32 |
| ලැබිය යුතු දෑ (වෙළඳ) සහ කායර්‍ය මණ්ඩල ණය | (1.1) | 98,156,065.13 | (7,314,918.00) | 105,470,983.13 |
| ප්‍රවර්තන ආයෝජන | | 685,742,459.97 | | 685,742,459.97 |
| අත්තිකාරම්, පෙරගෙවුම් සහ වෙනත් ලැබිය යුතු දෑ | (1.2) | 63,415,448.87 | 7,314,918.00 | 56,100,530.87 |
| මුදල් සහ මුදල් සමාන දෑ | | 169,194,686.80 | | 169,194,686.80 |
| **ස්කන්ධය සහ වගකීම්** | | **1,068,151,620.35** | | **1,068,151,620.35** |
| **ප්‍රාග්ධනය සහ සංචිත** | | **653,409,869.73** | | **657,578,794.17** |
| රජයේ ප්‍රදාන | | 9,774,488.05 | | 9,774,488.05 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 13,652,001.91 | | 13,652,001.91 |
| සමුච්චිත ලාභය | (2) | 629,983,379.77 | (4,168,924.44) | 634,152,304.21 |
| **ජංගම නොවන වගකීම්** | | **67,086,659.44** | | **62,917,735.00** |
| ප්‍රතිපාදන සහ වෙනත් වගකීම් | | 55,068,785.00 | | 55,068,785.00 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම | | 7,848,950.00 | | 7,848,950.00 |
| කල්තැබූ බදු වගකීම | (3) | 4,168,924.44 | 4,168,924.44 | - |
| **ජංගම වගකීම්** | | **347,655,091.18** | | **347,655,091.18** |
| ගෙවිය යුතු දෑ (වෙළඳ) | | 268,312,766.87 | | 268,312,766.87 |
| වෙනත් ගෙවිය යුතු දෑ | | 6,157,827.86 | | 6,157,827.86 |
| ආදායම් බදු වගකීම් | | 73,184,496.45 | | 73,184,496.45 |

**ස්කන්ධය සැසඳීමේ ප්‍රකාශය**

| | |
|---|---|
| 2011 ජනවාරි 01 දිනට සමුච්චිත ලාභය | 634,152,304.21 |
| අඩු කළා : කල් තැබූ බදු වගකීම | (4,168,924.44) |
| IFRS ගැළපුමට පසු 2011.01.01 දිනට රඳවා ගත් ලාභය | 629,983,379.77 |

**26.2** 2011 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වූ වර්ෂය සඳහා පහත සඳහන් ගැළපුම් කරන ලදී.

**(අ) කායර්‍ය මණ්ඩල ණය**

2011 දෙසැම්බර් 31 දිනට අයවීමට තිබුණු කායර්‍ය මණ්ඩල ණය ක්‍රමක්‍ෂය තුළ පිරිවැයට ගණනය කරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් කල් තැබූ කායර්‍ය මණ්ඩල ණය ශේෂය සහ IFRS ගැළපුම් ගිණුම් ශේෂය වැඩිවීම 2011 දෙසැම්බර් 31 දින ගැළපුමට හේතු විය.

සහන පොලී අනුපාත මත දෙන ලද කාර්‍ය මණ්ඩල ණය මගින් සලස්වා දෙන ලද කාර්‍ය මණ්ඩල ප්‍රතිලාභය රු. 2,916,896/- ක් වශයෙන් අගය කර ඇති අතර 2011 වර්ෂය තුළ එම මුදල කාර්‍ය මණ්ඩල පිරිවැය වශයෙන් පෙන්වා ඇත. තවදුරටත් මෙම මුදල වෙනත් ආදායමක් වශයෙන් ද පිළිගෙන ඇත. අධිකාරියේ 2011 මූල්‍ය ප්‍රකාශ වල IFRS ගැළපුම -

**(ආ) කල්තැබූ බදු**

2011 වර්ෂය සඳහා කල්තැබූ බදු ගණනය කරන ලදී. 2011 වර්ෂය සඳහා රු. 1,761,657.65 වන කල් තැබූ වගකීමක් ප්‍රතිවර්ත වී ඇති බව පෙනෙන්නට තිබුණි.

## විගණකාධිපති වාර්තාව

ඊසි/බී/සිජ්ජ්එස්එල්/එෆ්ජ්/2012 2014 පෙබරවාරි 17 දින

සභාපති,
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය.

### ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 14(4) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්ථාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2013 නොවැම්බර් 22 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නනේ ද යන්න සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරි වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම් කරන ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට සිවිල් ගුවන් සේවා අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා මූල්‍ය ප්‍රකාශන වාර්තා කිරීමේ ප්‍රමිති 01 හි 24 ඡේදය ප්‍රකාරව ඉකුත් වර්ෂයේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව පිළියෙල කළ ස්කන්ධය නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට පරිවර්තනය කිරීමේ දී ඇති වූ බලපෑම් සමග සසඳා සැසඳුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළයුතු වුවත්, ඒ අනුව සැකසූ සැසඳුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

නිලධාරීන්ට ලබා දී තිබූ ණය ප්‍රමාණයන් කාර්ය මණ්ඩල ණය ලේඛනය සහ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව රු.175,742 ක පැහැදිලි නොකරන ලද වෙනසක් විය.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දක්වෙන එක් එක් විෂයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|
| ණයගැතියෝ | 259,470,945 | ශේෂ සනාථ කිරීම් හා කාල විශ්ලේෂණය |
| ණයහිමියෝ | 322,075,745 | -එම- |
| පෙර වර්ෂ ගැළපීම් | 103,646,766 | විස්තරාත්මක උපලේඛන හා උපකාරක ලියකියවිලි |

2.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) පාර්ලිමේන්තු පනත් | |
| (i) 1971 අංක 38 දරන මුදල් පනත 10 (5) වගන්තිය | විසර්ජනයෙන් පසුව ඉතිරිවන ආදායම් අතිරික්තය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත් 2003 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා රු.489,967,146 ක් වූ සමුච්චිත ලාභය විධිමත් පරිදි ඒකාබද්ධ අරමුදලට බැරකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 111(අ) වගන්තිය | සිවිල් ගුවන් සේවා අධිකාරියේ නිළධාරීන් විසින් ඔවුන්ගේ වැටුප් සහ අතිකුත් ඉපයීම් වෙනුවෙන්, උපයන විට ගෙවීම් බදු මුදල් පුද්ගලික වැටුපෙන් ගෙවිය යුතු වුව ද 2007 සිට 2012 වසර දක්වා වසර 06 කට එකතුව රු.14,241,598 ක් වූ උපයන විට ගෙවීම් බදු මුදල් අධිකාරියේ අරමුදල් ගෙවා තිබුණි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| (i) | 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන චක්‍රලේඛය | නිලධාරීන් සඳහා වෙන්කර ඇති නිල වාහන හැර අනෙකුත් සියලුම වාහන එම ආයතනයේ නම පින්තාරු කළයුතු වුවත්, වාහන 04ක එසේ කර නොතිබුණි. |
| (ii) | 2008 ජූනි 26 දිනැති අංක 14/2008 දරන චක්‍රලේඛය | (i) යථෝක්ත චක්‍රලේඛයට පටහැනිව නිල වාහනයන් සඳහා හිමිකම් නොමැති නිලධාරීන්ට මසකට රු.20,000 ක් සහ කාර්යාල සහයකයින් ඇතුළු අනෙකුත් නිලධාරීන්ට මසකට රු.13,250 ක් වන පරිදි මාසික ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. ඉකුත් වර්ෂයයේ දී හා සමාලෝචිත වර්ෂයේ දී චක්‍රලේඛයට පටහැනිව ගෙවන ලද මුදල් පිළිවෙලින් රු.20,967,837 ක් සහ රු.28,348,259 ක් විය.<br>(ii) චක්‍රලේඛ උපදෙස් වලට පටහැනි නිල වාහන ලබා ගැනිමට හිමිකම් නොමැති නිලධාරීන් දෙදෙනෙකුට මසකට රු. 20,860 බැගින් රු. 500,640 ක් ද තවත් නිලධාරීන් 08 දෙනෙකුට මසකට රු. 17,880 බැගින් රු. 1,716,480 ක් ද වශයෙන් එකතුව රු. 2,217,120 ක් වූ මුදලක් ඉන්ධන දීමනා ලෙස ගෙවා තිබුණි. |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.14.1 මාර්ගෝපදේශය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව රු. මිලියන 50 ක් ඉක්මවන ගනුදෙනු සඳහා අමාත්‍යංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, අධිකාරිය සඳහා රු.106,021,080 ක ගොඩනැගිල්ලක් කුලියට ගැනීමේ දී ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | |
| (i) | 1994 ජූනි 14 දිනැති අංක 95 දරන චක්‍රලේඛය | (i) යතෝක්ත චක්‍රලේඛයට පටහැනිව විධිමත් වූ අනුමැතියකින් තොරව නිලධාරින් 05 දෙනෙකුට වෘත්තීය දීමනා ලෙස රු.10,000 සිට රු.25,000 දක්වා වූ දීමනාවක් ද තවත් නිලධාරින් 04 දෙනෙකුට රු.750 සිට රු.5,000 දක්වා වූ විශේෂ දිමනාවක් මාසිකව ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී ගෙවන ලද මුළු දීමනාව රු.1,912,880 ක් විය.<br>(ii) එවකට අධ්‍යක්ෂ ධූරයේ වැඩ බැලීම වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයාට ගෙවන ලද රු.17,625 ක් වූ වැඩ බැලීමේ දීමනාව 2010 මැයි සිට ඔහු තනතුරේ වැඩ බැලීමෙන් ඉවත් කිරීමෙන් පසුව ද විශේෂ දීමනාවක් ලෙස වැටුපට එකතු කර ගෙවා තිබුණි. 2010 මැයි මස සිට සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් ගෙවීම් කර තිබුණු මුළු දීමනාව රු.528,750 ක් විය. |

| | | |
|---|---|---|
| (ii) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 9.12 වගන්තිය | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව අධිකාරියේ සේවකයන් හා ඔවුන්ගේ සියලුම පවුලේ සාමාජිකයන් වෙනුවෙන් රෝහල් හා ශල්‍යකර්මයන් වෙනුවෙන් පූර්ණ රක්ෂණ ආවරණයක් ලබා ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.5,494,638 ක දායක මුදලක් ගෙවා තිබුණි. මෙම රක්ෂණ ආවරණය සඳහා එක් සේවකයෙකු වෙනුවෙන් වාර්ෂික රක්ෂණ වාරිකය රු.38,400 සිට රු.60,600 දක්වා වූ ප්‍රමාණයක් විය. |
| (iii) | 2006 ඔක්තෝබර් 9 දිනැති අංක පීඊඩී 39 දරන චක්‍රලේඛය | (i) චක්‍රලේඛයෙන් අනුමත ඉන්ධන සීමාව නොසලකා අධිකාරියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 04 දෙනෙකුට සීමාවකින් තොරව ඉන්ධන ලබා දී තිබුණි. වැඩිපුර ලබා දී තිබූ ඉන්ධන වල වටිනාකම රු.1,598,004 ක් විය.<br><br>(ii) උක්ත චක්‍රලේඛයට පටහැනිව අනුක්ත කල නිල වාහනයට අමතරව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පෞද්ගලික කටයුතු සඳහා තවත් එක් වාහනයක් භාවිතා කර තිබුණි. එම වාහනය සඳහා සමාලෝචිත වර්ෂය තුළ ඉන්ධන වෙනුවෙන් රු.464,850 ක් වැය කර තිබුණි. |
| (ඉ) | කළමනාකරණ සේවා චක්‍රලේඛ | |
| | 2012 දෙසැම්බර් 24 දිනැති අංක 49 දරන චක්‍රලේඛය | චක්‍රලේඛ ප්‍රකාරව ව්‍යවස්ථාපිත මණ්ඩලවල උපරිමය රු.10,000 කට සමාන ප්‍රසාද දීමනාවක් ගෙවිය හැකි වුවත් එය නොසලකා මසක මූලික වැටුපට සමාන මුදලක් ප්‍රසාද දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබුණි. ඒ අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රසාද දීමනා රු.79,750 ක මුදලක් ලබාගෙන තිබුණි. කෙසේ වෙතත් චක්‍ර ලේඛයට පටහැනිව ගෙවා තිබූ මුළු ප්‍රසාද දීමනා රු.3,543,736 ක් විය. |
| (ඊ) | භාණ්ඩාගාර චක්‍රලේඛ | |
| | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑෆ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා උපාංග ඇතුළත් වෙනමම ලේඛනයක් පවත්වාගෙන යායුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 3 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය බදු වලට පෙර රු.618,187,444 ක ලාභයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා බදු වලට පෙර ලාභය රු.228,897,727 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.389,289,717 ක වාසිදායක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙහෙයුම් ආදායම සහ සේවා සැපයීමෙන් ලැබූ ආදායම වැඩිවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ගුවන් මගී සංචලන වැඩිවීමෙන් විදේශ විකුණුම් අධිභාර ආදායම් වැඩිවීම නිසා සමස්ථ ආදායම සියයට 32.40 කින් හා කාර්ය මණ්ඩල වියදම්, විදේශ සම්මන්ත්‍රණ පුහුණු හා වැඩමුළු සඳහා වියදම හා පරිපාලන හා අනෙකුත් වියදම් සියයට 16.57 කින් වැඩි

වුවද ඉකුත් වර්ෂයට සමගාමීව සමාලෝචිත වර්ෂයේ සමස්ථ වියදම සියයට 28.43 කින් අඩු වී තිබුණි. එහෙයින් සමාලෝචිත වර්ෂයේ බදු වලට පෙර මෙහෙයුම් කටයුතු වලින් ලද ලාභය ද ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 170.07 කින් වැඩිවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ඉකුත් වර්ෂ දෙක හා සසඳා සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ ප්‍රධාන මෙහෙයුම් කාර්යයන්ගේ ප්‍රගතිය පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| | විෂයය | විස්තරය | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|---|
| (අ) | ගුවන් යානා චලන | (i) කුලී පියාසර පැය | 1,782 | 1,782 | 1,317 |
| | | (ii) නිත්‍ය ගුවන් ප්‍රවාහන පියාසර පැය | 46,616 | 41,891 | 32,590 |
| (ආ) | සම්පූර්ණ කරන ලද විගණන (සංඛ්‍යාව) | (i) ගුවන් යෝග්‍යතාව | -- | 01 | -- |
| | | (ii) මෙහෙයුම් | -- | -- | 01 |
| | | (iii) ඒකාබද්ධ (මෙහෙයුම් හා යෝග්‍යතාව) | -- | -- | -- |
| | | (iv) ගගන යාන්ත්‍රංගනය | -- | -- | -- |
| | | (v) ගුවන් සංතරණ සේවා | 01 | 01 | -- |
| (ඇ) | ඉටුකරන ලද නිරුපද්‍රිත/සුරක්ෂිත හා අධීක්ෂණ කාර්යයන් (සංඛ්‍යාව) | (i) රෑම්ප් පරීක්ෂණ ගණන (ගුවන් යෝග්‍යතාවය) | -- | 65 | 30 |
| | | (ii) රෑම්ප් පරීක්ෂණ | -- | -- | -- |
| | | (iii) ගගන යාත්‍රාංගනය | -- | 20 | 09 |
| | | (iv) අන්තරාකාරී භාණ්ඩ | -- | 35 | 08 |
| | | (v) පියාසර පාසැල් පරීක්ෂණ (ගුවන් යෝග්‍යතාව) | -- | -- | -- |

ගුවන් මෙහෙයුම් කටයුතු වලදී සිදුවන ගුවන් අනතුරු හා ඒ පිළිබඳ වාර්තා කිරීම්, පරීක්ෂණ පැවැත්වීම්, අදාළ ලිපිගොනු හා එම සිද්ධීන් අවම කිරීම් සඳහා අධිකාරිය ගෙන තිබූ ක්‍රියාමාර්ග මඟ පෙන්වීම් හා නියෝගයන් පිළිබඳ විස්තර විගණනයෙන් ඉල්ලා තිබුණත් ඒ සම්බන්ධ කිසිදු විස්තරයක් විගණනයට ලබා දී නොතිබුණු නිසා අධිකාරියේ මෙහෙයුම් කාර්ය සාධනය සම්බන්ධව පුළුල් විග්‍රහයක් කළ නොහැකි විය.

ගුවන් යානා අනතුරු පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් අදාළ තොරතුරු කෙරෙහි බලපවත්වන 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ 57 සහ 61 වගන්ති අනුව එම පනතේ දෙවන වගන්තියෙන් බලාත්මක කර ඇති අන්තර් ජාතික සිවිල් ගුවන් සේවා පනතේ 19 ඇමුණුමේ සඳහන් ප්‍රමිතීන් ප්‍රකාර ගුවන් යානා අනතුරු හා සිදුවීම් පිළිබඳ පරීක්ෂණ හා දත්ත වලට අදාළ තොරතුරු විගණනය සඳහා ඉල්ලා තිබුණි. එම පනතේ සඳහන් කාර්යයන්ට පරිබාහිර කටයුතු සඳහා යොදා ගැනීම් නීතියෙන් අසුරා ඇති බවත් එම තොරතුරු ලබාදීම් සම්බන්ධයෙන් වූ ඉල්ලීම උපදෙස් ලබා ගැනීම සඳහා අමාත්‍යංශ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර ඇති බව අධ්‍යක්ෂ ජනරාල්වරයා මා වෙත දන්වා තිබුණි.

### 4.2 සිවිල් ගුවන් සේවා අධිකාරිය ඉටුකරන සේවා සඳහා ගාස්තු සංශෝධනය නොකිරීම

අධිකාරිය විසින් ගුවන් නියමු බලපත්‍ර ලබාදීම, උස් ගොඩනැගිලි සඳහා අනුමැතිය ලබාදීම ආදී වූ විවිධ සේවාවන් සැපයීම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු පසුගිය වසර 07 ක කාලය තුළ කිසිදු

සංශෝධනයකට ලක්කර නොතිබුණි. අවසන් වරට ගාස්තු සංශෝධනයක් 2006 වර්ෂයේ දී සිදුකර තිබුණි.

(අ) <u>ගාස්තු අයකිරීම්</u>

| බලපත්‍ර වර්ගය | මූලික බලපත්‍ර ගාස්තුව | ඇගයීම් ගාස්තු | අළුත් කිරීම් | අළුත් කිරීම් ඇගයීම් |
|---|---|---|---|---|
| | රු | රු | රු | රු |
| නියමු-ශිෂ්‍ය | 690 | 500 | 345 | 250 |
| නියමු-පෞද්ගලික | 1,380 | 500 | 690 | 250 |
| නියමු-වාණිජ | 4,140 | 1,500 | 1,035 | 750 |
| නියමු-ගුවන් ප්‍රවාහන | 6,900 | 2,000 | 1,725 | 1,000 |
| ගුවන් සංඥා පාලන | 1,380 | 500 | 345 | 750 |
| ගුවන් යානා මෙහෙයුම් ඉංජිනේරු | 2,070 | 1,500 | -- | -- |

(ආ) <u>බලපත්‍ර නිකුත් කිරීම් හා අළුත් කිරීම්</u>

| බලපත්‍ර වර්ග | 2012 සංඛ්‍යාව | 2011 සංඛ්‍යාව | 2010 සංඛ්‍යාව |
|---|---|---|---|
| නියමු-ශිෂ්‍ය | 155 | 115 | 142 |
| නියමු-පෞද්ගලික | 94 | 98 | 76 |
| නියමු-වාණිජ | 264 | 317 | 300 |
| නියමු-ගුවන් ප්‍රවාහන | 414 | 382 | 359 |
| ගුවන් සංඥා පාලන | 44 | 81 | 91 |
| ගුවන් යානා මෙහෙයුම් ඉංජිනේරු | 113 | 173 | 283 |

### 4.3 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරියට හිමිකාරිත්වයක් නොමැති කුලියට ගන්නා ලද ගොඩනැගිල්ලක වෙනස් කිරීම් වෙනුවෙන් රු. මිලියන 3.5 කට අධික මුදලක් අධිකාරිය විසින් වැයකර තිබුණි. එකී වියදම් අදාළ ගොඩනැගිලි කුලියෙන් හිලව් කර ගැනීම පිළිබඳව සළකා බලා නොතිබුණි.

(ආ) අධිකාරිය සඳහා කුලී පදනමට ගත් ගොඩනැගිල්ලෙහි කුලී ගිවිසුමෙන් වාර්ෂිකව වැඩිවන වරිපනම් ගාස්තු අධිකාරිය විසින් දැරිය යුතු බවට අවාසිදායක කොන්දේසියක් ඇතුළත් කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.317,100 ක අතිරේක වරිපනම් අධිකාරියේ අරමුදල් වලින් දරා තිබුණි.

(ඇ) අවුරුදු 3ක කෙටි කාලපරිච්ඡේදයක් සඳහා කුලියක් ගෙන තිබුණු ගොඩනැගිල්ලෙහි ගබඩා කාමර සහ රියදුරු විවේකාගාර ඉදිකිරීම්, පළමු හා තුන්වන මහල් වල පිවිසුම් දොරවල් සවිකිරීම ආදි ඉදිකිරීම් වෙනුවෙන් එකතුව රු. 28,214,123 ක් අධිකාරියේ අරමුදල් වලින් දරා තිබුණි.

(ඈ) ගුවන් සේවා පරීක්ෂකවරුන් සඳහා 2011 වර්ෂයේ දී එකක් රු.475 ක් බැගින් කරපටි 525 ක් රු. 249,375 ක මුදලකට මිලදී ගෙන තිබුණ ද එම කරපටි නියමිත ප්‍රමිතියට නොවීම හේතුවෙන් නිකුත් නොකර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ඒවා ගබඩාවේ තබා තිබුණි.

(ඉ) අධිකාරියේ කාර්ය මණ්ඩලයට අයත් නොවූ බාහිර පුද්ගලයෙක් වෙනුවෙන් හමුවීම් පත්‍ර (Visiting Card) මුද්‍රණය කිරීම සඳහා රු.11,000 ක් අධිකාරියේ අරමුදලින් වැයකර තිබුණි.

(ඊ) ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවාවට 2011 වර්ෂයේ දී වසර සියයක් සපිරීම නිමිත්තෙන් වූ උත්සවය එම වර්ෂයේ දී නොපවත්වා එය රේඛීය අමාත්‍යාංශයේ සහ අනෙකුත් සමගාමී ආයතනවල සහයෝගයකින් තොරව 2012 වර්ෂයේ දී පැවැත්වීම වෙනුවෙන් රු.14,000,000 කට අධික මුදලක් වැය කර තිබුණි.

(උ) සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගගණ යාත්‍රා) හා නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගුවන් සංතරණ) යන තනතුරු වලට බඳවා ගැනීමේ පටිපාටිය (SOR) අනුව ගුවන් ගමන් පාලන බලපත්‍රය (ATC) අනිවාර්යෙන්ම තිබිය යුතු වුවත් එම සුදුසුකම මත බඳවාගත් නිළධාරීන් සිව් දෙනෙකු මසකට රු.25,000 බැගින් වෘත්තිය දීමනාවක් ගෙවා තිබුණ ද වාර්ෂිකව අළුත් කළ යුතු මෙම බලපත්‍රය වසර ගණනාවකින් අළුත් කිරීමක් කර නොතිබුණි. එපරිදිම හිටපු තවත් නිලධාරීන් දෙදෙනෙකුට ගුවන් ප්‍රවාහන නියමු බලපත්‍රය (ATPL) තිබීම මත මසකට රු.75,000 බැගින් වෘත්තිය දීමනාවක් ගෙවා තිබුණි.

(ඌ) අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාජිකයන් 5 දෙනෙකු ඇතුළුව කැලි පදනම මත බඳවාගත් නිලධාරීන් 02 දෙදෙනෙකු හා ඔවුන්ගේ පවුල්වල සියළුම සාමාජිකයින් වෙනුවෙන් රෝහල් හා ශල්‍යකර්ම සඳහා රක්ෂණය කිරීම වෙනුවෙන් රු.426,200 ක් අධිකාරිය විසින් වැය කර තිබුණි.

(එ) අමාත්‍ය කාර්ය මණ්ඩලයට බඳවාගත් නිලධාරියෙකු එහි සක්‍රීය සේවයේ සිටිය දී අධිකාරියේ නිත්‍ය කාර්ය වූ පත්වීමක් ලබා දී වැටුප්, ඉන්ධන, වෛද්‍ය රක්ෂණ හා විදේශ ගමන් වෙනුවෙන් ඉකුත් හා සමාලෝචිත වර්ෂ වෙනුවෙන් රු.3,051,897 ක් වැය කර තිබුණි. කෙසේ නමුත් මෙම නිලධාරියා එකම දිනයක්වත් අධිකාරියේ සේවයට වාර්තා කර නොතිබුණි.

(ඒ) ගුවන් සේවා නියාමන කටයුතු සඳහා පමණක් පිහිටුවා ඇති අධිකාරියට අලෙවි ප්‍රවර්ධන උපදේශකයකු බඳවාගෙන මසකට රු.80,000 බැගින් මාස 03 ක කාලයක් සඳහා රු.240,000 ක් ගෙවා තිබුණි. කෙසේ නමුත් නිලධාරියා එකම දිනයක් හෝ සේවයට පැමිණ නොතිබූ අතර කිසිදු සේවයක් ද ඉටු කර නොතිබුණි. තවද මෙම පත්වීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුවෙන් අනුමැතිය පවා ලබාගෙන නොතිබුණි.

(ඔ) ගුවන් යෝග්‍යතා උපදේශකයෙකු ලෙස බඳවා ගැනීමේ පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව සංචාරක වීසා මත ශ්‍රී ලංකාවට පැමිණි ශ්‍රී ලාංකික පුරවැසියෙක් නොවන හා කැනඩා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සේවය කරන නිලධාරියෙකු අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව උපදේශකයකු ලෙස තෙමසක කාලයකට බඳවා ගෙන තිබුණි. ඔහු පසු දිනම සේවා ගිවිසුමෙන් ඉවත් වන බව දනුම් දී තිබියදීත් මසක කාලයක් සඳහා රු.172,250 ක් අධිකාරිය විසින් ගෙවා තිබුණි.

(ඕ) අධිකාරියේ නිලධාරිණියන් 06 දෙනෙකුට රියදුරු බලපත්‍ර ලබා ගැනීම වෙනුවෙන් අධිකාරියේ අරමුදලින් රු.78,000 ක් ගෙවා තිබුණි.

## 4.4 වෙනත් රාජ්‍ය ආයතන වලට ලබා දුන් අධිකාරියේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක පිඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.8.9 වගන්තියට පටහැනිව අමාත්‍යාංශයට අයත් විවිධ වියදම් වෙනුවෙන් රු.290,084 ක් අධිකාරිය විසින් දරා තිබුණු අතර අධිකාරිය සතු වාහන 05 ක්ද අමාත්‍යාංශයේ පරිහරණය සඳහා ලබා දී තිබුණි. එම වාහනවලට ඉන්ධන සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී රු.1,225,657 ක් අධිකාරිය විසින් වැය කර තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනට අනුමත සහ තථ්‍ය කාර්යය මණ්ඩල පිළිබඳ තත්ත්වයන් පහත පරිදි විය.

| කාර්ය මණ්ඩල වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව |
| --- | --- | --- | --- |
| අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක නිලධාරී | 01 | 01 | -- |
| ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් | 34 | 23 | 11 |
| විධායක නිලධාරීන් | 42 | 35 | 07 |
| ක්‍රියාකාරි නිලධාරීන් | 55 | 54 | 01 |
| කාර්යාල සහයක | 34 | 33 | 01 |
| එකතුව | 166 | 146 | 20 |

5 ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය


5.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ දී ඇස්තමේන්තු ගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර, සියයට 142 සිට සියයට 186 දක්වා වූ පරාසයක් සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

6 පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් රැස්කිරීම
(ඇ) ගුවන් යානා සිද්ධි පරීක්ෂා කිරීම
(ඈ) අයවැය පාලනය
(ඉ) වියදම් පාලනය
(ඊ) කොන්ත්‍රාත් පාලනය
(උ) මානව සම්පත් කළමනාකරණය



එච්.ජේ.එස්.සමරවීර
විගණකාධිපති

# විගණකාධිපතිගේ වාර්තාව සම්බන්ධව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ පිළිතුරු

FN/12/4 2014.03.13

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
බත්තරමුල්ල.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

උක්ත වාර්තාවේ ඔබ විසින් දක්වා ඇති නිරීක්ෂණයන් සම්බන්ධයෙන් අපගේ අදහස් හා පැහැදිලි කිරීම් මේ සමග ඉදිරිපත් කරනු කැමැත්තෙමු.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ඔබගේ නිරීක්ෂණය ස්තුති පූර්වකව පිළිගනිමි.

2012 වර්ෂය සඳහා නව ගිණුම් ප්‍රමිති අනුව ගිණුම් සැකසීම සඳහා වරලත් ගණකාධිකාරී වරයෙකුගේ සහාය ලබා ගත් අතර ඔබගේ නිරීක්ෂණය ඔහු වෙත ඉදිරිපත් කර අදාළ සටහන ඇතුළත් කර සංශෝධනය කරන ලද මූල්‍ය ප්‍රකාශන නැවත ඉදිරිපත් කර ඇත.

### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

ඔබගේ නිරීක්ෂණය ස්තුතිපූර්වකව පිළිගනිමි. මෙම වෙනස හඳුනා ගනු ලැබ 2013 අවසාන ගිණුම් පිළියෙල කිරීමේ දී අදාළ ගැළපීම් සිදුකරනු ලැබ ඇත.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

ශේෂ සනාථ කිරීමේ ලිපි "සහකාර විගණන අධිකාරී" වෙත සෘජුවම ඉදිරිපත් කරන ලෙස සියලු ණය ගැතියන් හා ණය හිමියන් වෙත 2013.02.06 දින ලිඛිතව දන්වා යවා ඇත. (ලිපිනය ලියන ලද ලිපි කවරයක් ද සහිතව) අදාළ මුදල් වර්ෂයට පෙර වර්ෂයේ ගැළපීම් සම්බන්ධව විස්තරාත්මක උප ලේඛණ ඉල්ලා නොමැත.

### 2.2.4 නීති රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අදාළ නොවීම

(අ) පාර්ලිමේන්තු පනත්

(i) ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්යය හා කර්තව්‍ය සිදු කිරීම සඳහා සහ පවත්වාගෙන යාම අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ජාතික වාර්ෂික අය වැය ලේඛනයෙන් සම්පාදනය කෙරෙන්නේ නැත. ඒ සඳහා අවශ්‍ය මුදල් අධිකාරිය විසින්ම ස්වයකීය කටයුතු මගින් සම්පාදනය කරනු ලබයි. එසේම 1971 අංක 38 දරන මුදල් පනතේ අංක 07 දරන වගන්තිය ප්‍රකාර අධිකාරියේ කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීමට සහ පවත්වා ගෙන යාමට අවශ්‍ය වන ප්‍රතිපාදන අවම වශයෙන් ඉදිරි වසර 05 ක කාලයකට තිබෙන බව තහවුරු කිරීමට අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී ඇත.

තවද අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර භාණ්ඩාගාරය වෙත යවා ඇති ව්‍යාපාර සැලැසුමේ සඳහන්ව ඇති අධිකාරියේ ප්‍රධාන ගොඩනැගිල්ල ඉදි කිරීම, මත්තල කාර්යාලය ඉදි කිරීම හා වීරවිල නිල නිවාස ඉදි කිරීම වැනි ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අවශ්‍ය භාණ්ඩාගාර අනුමැතිය ලබා දී ඇති අතර එම කටයුතු සඳහා

අවශ්‍ය ප්‍රාග්ධනය ද අධිකාරිය විසින්ම සම්පාදනය කර ගත යුතු බව ද භාණ්ඩාගාරය විසින් දන්වා ඇත. ඉහත කී ව්‍යාපෘති වල වැඩ කටයුතු මේ වනවිටත් ආරම්භ කර ඇති බැවින් එම කටයුතු සඳහා වු ගෙවීම් අදාළ ගිවිස්නා ප්‍රකාර ප්‍රමාදයකින් තොරව කිරීමට හැකි වන පරිදි අධිකාරියේ අතිරික්ත මුදල් රඳවා ගෙන ඇත.

අධිකාරියේ ප්‍රධාන කාර්යාලය ඉදි කිරීම සඳහා පමණක් ඇස්තමේන්තු ගත වියදම රු. මි.1080 පමණ වන අතර එයට අවශ්‍ය ගෘහ භාණ්ඩ සහ උපකරණ සඳහා ද සැලකිය යුතු මුදලක් වැය වේ යැයි ඇස්තමේන්තු ගත කර ඇත. ඉහත කී ව්‍යාපෘති වල ඉදිරි ඉතිරි වැඩ නිම කිරීම සඳහා අවශ්‍ය සම්පූර්ණ ඇස්තමේන්තු ගත මුදල රු. මි. 1200කි. ඒ අනුව 1971 අංක 38 දරන මුදල් පනතේ අංක 10(2) වගන්තිය ප්‍රකාර අධිකාරියේ අතිරික්ත මුදල් ඉහත කී ව්‍යාපෘති කටයුතු සඳහා යෙදවීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මගින් විධිමත් ලෙස වෙන් කරනු ලැබ ඇති අතර ඒ සඳහා අවශ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ සහ මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීමට ද කටයුතු කර ඇත. තවද බදු ගෙවීම් සම්බන්ධයෙන් වු මෙම අධිකාරිය සතු වගකීම නොපිරිහෙලා ඉටුකරන අතරම මෙම අධිකාරියේ ඉතිරි ආදායමෙන් පසුගිය වර්ෂයන් තුළ දී පහත සඳහන් පරිදි භාණ්ඩාගාරයට මුදල් ප්‍රේෂණය කරනු ලැබ ඇත.

| | |
|---|---|
| 2011 | - රු. මි. 250 |
| 2012 | - රු. මි. 350 |
| 2013 | - රු. මි. 200 |

මේ අනුව ඉහත ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් හා ආයතනයේ එදිනෙදා මූල්‍ය අවශ්‍යතා වලට හැර වෙනත් අතිරික්ත මුදල් ආයතනය විසින් අනවශ්‍ය ලෙස රඳවාගෙන නොමැත.

(ii) කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහයෙහි (SLCAP 5000) ප්‍රතිපාදන අනුව ආයතනය සේවකයින්ගේ උපයන විට ගෙවීමේ බදු ආයතනය විසින් දරනු ලබයි.

තවද 2012.11.12 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කමිටුවේ උපදෙස් පරිදි අධිකාරියේ කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහය නැවත අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කළ අතර අමාත්‍ය මණ්ඩලය එය පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කරන ලදී. කමිටුවේ වාර්තාව ඉදිරිපත් කර තීරණයක් ලැබෙන තුරු දැනට බලාත්මකව ඇති කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහයෙහි ප්‍රතිපාදන වලට අනුව තවදුරටත් කටයුතු කළ හැකි බව මුදල් අමාත්‍යාංශය තීරණය කර ඇත.

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

(i) අධිකාරියේ දැනට පවතින වාහන එදිනෙදා රාජකාරී කටයුතු සඳහා යෙදවීමට ප්‍රමාණවත් නොවන බැවින් පෞද්ගලික පාවිච්චියට හිමිකම් ඇති නිලධාරීන් පාවිච්චි කරනු ලබන වාහන ද රාජකාරී වේලාව තුළ ආයතනයේ වෙනත් අවශ්‍යතා සඳහා යෙදවීමට සිදුව ඇත. ඒ අනුව මෙම වාහන පෞද්ගලික පාවිච්චියට හිමිකම් ඇති නිලධාරීන් විසින් භාවිතා කරනු ලබන හෙයින් අධිකාරියේ ලාංඡනය යොදා නොමැත.

(ii) (i) කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහයෙහි (SLCAP 5000) ප්‍රතිපාදන අනුව මෙම ගෙවීම සිදු කරනු ලබයි.

තවද 2012.11.12 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කමිටුවේ උපදෙස් පරිදි අධිකාරියේ කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහය නැවත අමාත්‍ය මණ්ඩල

අනුමැතිය සඳහා ඉදිරිපත් කළ අතර අමාත්‍ය මණ්ඩලය එය පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කරන ලදී. කමිටුවේ වාර්තාව ඉදිරිපත් කර තීරණයක් ලැබෙන තුරු දැනට බලාත්මකව ඇති කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහයෙහි ප්‍රතිපාදන වලට අනුව තවදුරටත් කටයුතු කළ හැකි බව මුදල් අමාත්‍යාංශය තීරණය කර ඇත.

(ii) ඉහත (i) පිළිතුර අදාළ වේ.

(ඇ) ගොඩනැගිල්ල කුලියට ගැනීමේදී මිල ගණන් කැඳවා ඇත්තේ වර්ග අඩියකට වර්ෂයකට අයකරනු ලබන මුදල පිළිබඳවය. ඒ අනුව තාක්ෂණික කමිටුවේ නිර්දේශ මත දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව වර්ෂයක කුලී මුදල අනුමත කර ඇති අතර රු. මි. 34.48 ක් වූ එය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවට අනුමත කළ හැකි සීමාවේ පැවතිණ.

නමුත් ගොඩනැගිල්ල භාර ගැනීම සඳහා ගිවිසුම අත්සන් කරන අවස්ථාවේදී අදාළ මිල ගණන් නොවෙනස්ව තබා ගැනීමට නම් ගිවිසුම වසර 03 ක් සඳහාවත් එළඹිය යුතු බව ගොඩනැගිලි හිමිකරු දැනුම් දුන් අතර පැවති තත්වය මත ආයතනයට එසේ කිරීමට සිදු විය. කෙසේ වුවද වසර 03 සඳහා එකවර මුදල් නොගෙවූ අතර වාර්ෂිකව බදු මුදල් ගෙවා ඇත.

කෙසේ වුවද ඔබගේ නිරීක්ෂණ සමග එකඟවන අතර මෙම කරුණ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත අවශ්‍ය සමාලෝචනය සහ සුදුසු තීරණ ගැනීම පිණිස යොමු කිරීමට කටයුතු කර ඇත.

(ඈ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ

(i)(i) කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහයෙහි (SLCAP 5000) ප්‍රතිපාදන අනුව මෙම ගෙවීම සිදු කරනු ලබයි.

තවද 2012.11.12 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කමිටුවේ උපදෙස් පරිදි අධිකාරියේ කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහය නැවත අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කළ අතර අමාත්‍ය මණ්ඩලය එය පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කරන ලදී. කමිටුවේ වාර්තාව ඉදිරිපත් කර තීරණයක් ලැබෙන තුරු දැනට බලාත්මකව ඇති කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහයෙහි ප්‍රතිපාදන වලට අනුව තවදුරටත් කටයුතු කළ හැකි බව මුදල් අමාත්‍යාංශය තීරණය කර ඇත.

(ii) අධ්‍යක්ෂ ජනරාල් තනතුර මත වගකීමෙන් බැඳෙන්නා වූ රාජකාරීන් ප්‍රමාණාත්මකව ඉතා වැඩි බැවින් එම රාජකාරී කර ගෙන යාමට සහය වීම සඳහා අවශ්‍ය ප්‍රවීණත්වයෙන් යුතු නිලධාරියෙක් සිටිය යුතු හෙයින් ද වැඩ අධීක්ෂණය පහසු කිරීමේ අරමුණින් හා ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයාගේ සේවා ප්‍රවීණත්වය හා තාක්ෂණික ඥාණය ඇගයීම පිණිස ද සිවිල් ගුවන් සේවා අධිකාරි පනතේ ප්‍රතිපාදන යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ තනතුරක් ඇති කර එයට අදාළ දීමනා තීරණය කර ඇති අතර ඒ අනුව ගෙවීම් සිදු කර ඇත. ආයතනයේ කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීමට එවැනි තනතුරක් අත්‍යවශ්‍ය වේ.

තවද මෑතකදී ජාතික වැටුප් කොමිසම සහ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග පැවති සාකච්ඡාවකදී මෙම කරුණ කෙරෙහි අවධානය යොමු කර වූ අතර එවැනි තනතුරක අවශ්‍යතාව ජාතික වැටුප් කොමිසම සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ඒකමතිකව පිළිගත් අතර දැනට අනුමතකර ඇති ප්‍රතිව්‍යුහගතකරණය කරන ලද ආයතනික සටහනට සහ කාර්ය මණ්ඩලයට එවැනි තනතුරක්, සුදුසු වැටුප් පරිමාණයක් ද සමග ඇතුළත් කිරීමට තීරණය කර ඇත.

(iii) කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහයෙහි (SLCAP 5000) ප්‍රතිපාදන අනුව අධ්‍යක්ෂ මණ්ඩලය මෙම රක්ෂණ ආවරණය අනුමත කර ඇති අතර ඒ අනුව ගෙවීම් සිදු කර ඇත.

(iv) (i) අදාළ කාල වකවානු පැහැදිලිව දක්වා එවූ මූලික විමසුමක් මේ සම්බන්ධයෙන් ලැබී නැත. එබැවින් ඔබගේ විගණන නිරීක්ෂණයන්ට පාදක වූ කරුණු පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගත නොහැකි බැවින් එහි සඳහන් මුදල පිළිබඳව අදහසක් ප්‍රකාශ කිරීමට අපහසු ය.

කෙසේ වුවද ආයතනයේ සභාපතිතුමා හැරුණු විට මේ වනතුරු කිසිදු නිලධරයකුට අධිකාරියේ නිල වාහන වෙන් කිරීමක් හෝ එකී නිල වාහන සඳහා ඉන්ධන වෙන්කිරීමක් හෝ ඉන්ධන දීමනාවක් ලබා දීමක් සිදු කර නැත. එම නිල වාහන මෙම නිලධාරින්ගේ ගමන් සඳහා පමණක් නොව සංචිත වාහන ලෙස ආයතනයේ පොදු රාජකාරි සඳහා ද නිතර යොදවනු ලැබ ඇත. එම නිසා ඔබ විසින් දක්වා ඇති සම්පූර්ණ වියදම එම නිලධාරීන් වෙනුවෙන් පමණක් දරා නැත.

ආයතනයේ වාහන සංචිතයේ ඒ ඒ අවස්ථා වලදී රාජකාරියේ අනුයුක්ත කිරීමට හැකියාව පවතින රියදුරන් හා වාහන අනුව මෙම වාහන වරින් වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ රාජකාරි කටයුතු සඳහා යොදවා ඇත.

අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉන්ධන වෙන් කිරීමක් හෝ ඔහුගේ මාසික වැටුපට අමතරව කිසිදු ඉන්ධන දීමනාවක් හෝ ප්‍රවාහන දීමනාවක් හෝ වෙන යම් ආකාරයක කිසිදු වෙනත් දීමනාවක් ඔහුට ලබා දී නැත.

තවද මෙම වාහන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ගමන් සඳහා පමණක් නොව සංචිත වාහන ලෙස ආයතනයේ වෙනත් පොදු රාජකාරි සඳහා නිතර යොදවනු ලැබ ඇති බැවින් ඔබ විසින් සඳහන් කර ඇති මුදල, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙනුවෙන් පමණක් දරා නැත.

(ඉ) කළමනාකරණ සේවා චක්‍රලේඛ

කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහයෙහි (SLCAP 5000) ප්‍රතිපාදන අනුව මෙම ගෙවීම සිදු කරනු ලබයි.

තවද 2012.11.12 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කමිටුවේ උපදෙස් පරිදි අධිකාරියේ කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහය නැවත අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කළ අතර අමාත්‍ය මණ්ඩලය එය පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා මුදල් අමාත්‍යංශයේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කරන ලදී. කමිටුවේ වාර්තාව ඉදිරිපත් කර තීරණයක් ලැබෙන තුරු දැනට බලාත්මකව ඇති කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහයෙහි ප්‍රතිපාදන වලට අනුව තවදුරටත් කටයුතු කළ හැකි බව මුදල් අමාත්‍යංශය තීරණය කර ඇත.

තවද අධිකාරියේ කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහයෙහි 9.2 වගන්තියට අනුව නිලධාරින්ට ලබා දෙන ප්‍රසාද දීමනාව මසක මූලික වැටුපක් දක්වා ලබා දිය හැකි බව සඳහන්ව ඇති අතර ඒ අනුව අධිකාරියේ සෑම සේවකයකුටම ඔහුගේ හෝ ඇයගේ මූලික වැටුපට සමාන ප්‍රසාද දීමනාවක් ගෙවීමට 2012.12.13 දින පැවති 91 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලදී. ඒ අනුව සෑම සේවකයකුටම ඔහුගේ හෝ ඇයගේ මූලික වැටුපට සමාන ප්‍රසාද දීමනාවක් ගෙවා ඇති අතර අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවනු ලැබ ඇත්තේ ඔහුගේ මූලික වැටුපට සමාන මුදලකි. එබැවින් එම මුදල ප්‍රසාද මුදල් ගෙවීමට පාදක වූ ප්‍රතිපත්තිය සමග එකඟ වන අතර එහිදී කිසිදු අක්‍රමිකතාවක් සිදුවී නැත.

(ඊ) භාණ්ඩාගාර චක්‍රලේඛ

ඔබගේ නිරීක්ෂණය ස්තුති පූර්වකව පිළිගනිමි.

දැනට වෙනත් ආකෘතියකට අනුව සකසා ඇති පරිගණක හා උපාංග පිළිබඳ තොරතුරු මෙම චක්‍රලේඛයේ සඳහන් ආකෘතියට අනුව පිළියෙල කරමින් පවතී.

## 03. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය සමාලෝචනය

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

## 04. මෙහෙයුම් සමාලෝචනය

4.1. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තිය හා 1971 අංක 38 මුදල් පනතේ 13(5) වගන්තියට අනුව විගණනය හා ඊට අදාළව පැවරී ඇති මුදල් හා ගිණුම් පිළිබඳ විගණනයට අවශ්‍ය කරනු ලබන සියළු පොත්පත් සහ අනෙක් තොරතුරු අධිකාරිය විසින් විගණන නිලධාරින්ට අප්‍රමාදව ලබාදී ඇත.

එහෙත් ගුවන් යානා අනතුරු පරීක්ෂා කිරීම් සම්බන්ධයෙන් අදාළ තොරතුරු කෙරෙහි බලපවත්වන 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 57 සහ 61 වගන්තියට අනුව සහ එම පනතේ 2 වන වගන්තියෙන් බලාත්මක කර ඇති අන්තර් ජාතික සිවිල් ගුවන් සේවා සම්මුතියේ 19 වන ඇමුණුමේ සඳහන් ප්‍රමිතීන් ප්‍රකාර ගුවන් යානා අනතුරු හා සිදුවීම් පිළිබඳ පරීක්ෂණ වලට අදාළ දත්ත සහ තොරතුරු එම පනතේ සඳහන් කාර්යයන්ට පරිබාහිර කටයුතු සඳහා යොදා ගැනීම නීතියෙන්ම අසුරා තිබූ බැවින් එම තොරතුරු ලබා දීම සම්බන්ධයෙන් වූ විගණන අධිකාරිගේ ඉල්ලීම අවශ්‍ය උපදෙස් සඳහා අමාත්‍යාංශ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර ඇති අතර අමාත්‍යාංශ ලේකම්වරයාගේ පිළිතුර මෙම අධිකාරියට ද පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත යොමු කර ඇත.

කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ අදාළ සියළු කටයුතු සම්බන්ධයෙන් වූ ක්‍රියාකාරී දත්ත සහ සංඛ්‍යා ලේඛණ විගණන නිලධාරීන් ඉල්ලා සිටි සැණින් ඔවුන් වෙත ලබා දී ඇත.

තවද ආයතනයේ කාර්යසාධනය පිළිබඳව යාවත්කාලීන තොරතුරු ඔබගේ වාර්තාවේ සටහන්ව නොමැති බැවින් එම තොරතුරු ඇමුණුම 1 වශයෙන් ඔබ වෙත එවා ඇත.

4.2 2014 වර්ෂයේ සිට සේවා ගාස්තු සංශෝධනය කිරීමට ගැසට් නිවේදන පිළියෙල කරමින් පවතී.

4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) සිවිල් ගුවන් සේවා අධිකාරිය සිය කටයුතු පවත්වාගෙන යමින් සිටි සුප්‍රීම් ගොඩනැගිල්ල ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ස්ථාපිත කිරීම සඳහා ලබා දීමට තීරණය වී ඇති බැව් දන්වමින් එවකට එහි මුල් බදුකරු වන සංචාරක අමාත්‍යාංශය දන්වා සිටි බැවින් ඉතා ඉක්මණින් වෙනත් ස්ථානයක් සොයා ගැනීමට අධිකාරියට සිදු විය. ජිනසේන ගොඩනැගිල්ලේ හිමිකරු පැවති තත්වයෙන් ගොඩනැගිල්ල බදු දීමට එකඟ වුවද වෙනත් කිසිදු වියදමක් දරා අවශ්‍ය වෙනස් කිරීම් කිරීමට එකඟ නොවීය. ලැබී තිබූ කාල සීමාව තුළ කොළඹ නගරය අවට්න් වෙනත් සුදුසු ගොඩනැගිල්ලක් සොයා ගැනීමට නොහැකි වීමත් ගොඩනැගිලි පරිශ්‍රය තුළ විශාල වාහන ප්‍රමාණයක් ගාල් කිරීම සඳහා ඉඩ කඩ නොමිලයේ ලබා දීමත් නිසා කුලී ගාස්තු වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ලිඛිත අනුමැතිය ලද පසු මෙම ගොඩනැගිල්ල බදු ගැනීමට අධිකාරිය තීරණය කරන ලදී.

කුලියට ගෙන ඇති ජිනසේන ගොඩනැගිල්ල වෙනුවෙන් ගොඩනැගිලි හිමියා කිසිදු අතිරේක පිරිවැයක් දැරීමට ඉදිරිපත් නොවීම සහ වෙනත් විකල්ප ගොඩනැගිල්ලක් දීර්ඝකාලීන භාවිතය සඳහා සොයා ගැනීමට නොහැකි වීම හේතුවෙන්, අධිකාරියේ කාර්ය, කර්තව්‍ය සහ වගකීම් නිසි

ඉටුකිරීමට හැකිවන පරිදි පමණක් නොව මෙම අධිකාරියට නිතර පැමිණෙන විදේශිකයන් ඉදිරියේ රටේ ජාතික අනන්‍යතාව, අභිමානය සහ ආයතනික ප්‍රතිමූර්තිය සුරැකෙන ලෙස කටයුතු කළ හැකි වාතාවරණයක් කුලී ගොඩනැගිල්ල තුල ඇතිකළ යුතු වූ බැවින් ආයතනික වටපිටාව දියුණු කිරීමට සිදු වූ බව කරුණාවෙන් සළකණු මැනවි.

(ආ) ඔබගේ නිරීක්ෂණයෙහි සඳහන් අවාසිදායක කරුණු ඉවත් කිරීමට බදු ගිවිසුම නැවත අළුත් කිරීමේදී සාකච්ඡා කළ ද එසේ කිරීමට ගොඩනැගිලි හිමියා එකඟ නොවීය. එසේ ඉවත් කරන්නේ නම් කුලී රේටයන් නැවත සංශෝධනය කිරීමට සිදුවන බව ඔහු දන්වන ලදී.

ගොඩනැගිලි සඳහා දැඩි වාණිජ ඉල්ලුමක් ඇති කොළඹ නගරයෙන් වර්ග අඩියකට රු. 100/- වැනි මුදලකට නැවතත් ගොඩනැගිල්ලක් සොයා ගැනීම දුෂ්කර වීමත්, ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිරි වසර දෙකක් වැනි කෙටි කාලයක් තුළ ඉදි කිරීමට කටයුතු සම්පාදනය කර තිබියදී නැවතත් වෙනත් කුලී ගොඩනැගිල්ලකට නැවත ගෙනයාම කාලය, ශ්‍රමය සහ ධනය නිරපරාදව අපතේ යන අර්ථ ශූන්‍ය කාර්යයක් බැවිනුත් මෙසේ කටයුතු කිරීමට සිදු විය.

(ඇ) ඉහත 4.3 (අ) පිළිතුර අදාළ වේ.

අධිකාරියේ කටයුතු කර ගෙන යාමට සුදුසු කාර්යාල පරිසරයක් සකස් කර ගැනීම සඳහා අවශ්‍ය වෙන් කිරීම් කිරීමට සහ ඒ ආශ්‍රිත කටයුතු සැලසීමට මෙසේ කටයුතු කිරීමට සිදු විය.

(ඈ) විශේෂ රාජකාරී අවස්ථා වලදී පැළඳීම සඳහා මෙම ටයිපටි වලින් කොටසක් දැනටමත් සිවිල් ගුවන් සේවා පරීක්ෂකයින් වෙත නිකුත් කර ඇති අතර ඉතිරිය සෙසු නිලධාරීන් හට නිකුත් කිරීමට කටයුතු කර ඇත. එමෙන්ම සමරු තිළිණ වශයෙන් අධිකාරිය විසින් සංවිධානය කරනු ලබන සම්මන්ත්‍රන වලට සහභාගීවන විදේශීය හා දේශීය නියෝජිතයන්ට එම ටයිපටි ලබා දීමට කටයුතු කරනු ඇත.

(ඉ) මේ සම්බන්ධයෙන් පූර්ව විමසුමක් ලැබී නොතිබූ අතර විගණන අධිකාරී විසින් පහත නිලධාරියාගේ නම වාචිකව දුරකතනයෙන් දන්වා තිබුණි.

ප්‍රභාත් කුලරත්න මහතා - මෙම ආයතනයේ උපදේශක (සිවිල් ගුවන් සේවා ප්‍රවර්ධන) වශයෙන් කටයුතු කරන මෙම නිලධාරියාට පැවරී ඇති රාජකාරී ස්වභාවය අනුව දේශීය හා විදේශීය මාධ්‍ය ආයතන හා පුද්ගලයින් සමග කටයුතු කිරීමට සිදුව ඇති බැවින් ඒ මහතාට හමුවීම් පත් ලබා දී ඇත.

(ඊ) ලිඛිත ඉතිහාසයට අනුව 1911 සැප්තැම්බර් 11 වන දින නැවකින් ශ්‍රී ලංකාවට ගුවන් යානයක් ගොඩ බා ඇති නමුත් ශ්‍රී ලංකා ගුවන් අවකාශය තුළ ගුවන් පියසැරියක් සාර්ථකව පළමු වරට නිම කර ඇති බවට සාක්ෂි ඇත්තේ 1912 දෙසැම්බර් 25 වන දින බැවින් එම දිනය ශ්‍රී ලංකාවේ ගුවන් සේවාවේ ආරම්භය වශයෙන් සැළකේ.

ශ්‍රී ලංකා ගුවන් සේවාවට වර්ෂ 100ක් සම්පූර්ණ වීම නිමිති කොට රාජ්‍ය අනුග්‍රහයෙන් උත්සව මාලාවක් සංවිධානය කිරීමට තීරණය කරනු ලැබුවේ එම විෂය භාර ගරු අමාත්‍යවරයා විසිනි. ඒ අනුව අදාළ කටයුතු සංවිධානය කරන ලෙස ගරු ඇමතිතුමා විසින් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට නියෝග කර තිබූ බැවින් ඒ අනුව කටයුතු කිරීමට පියවර ගනු ලැබිණි.

(උ) සිවිල් ගුවන් සේවා අධිකාරිය පිහිටුවීමේ දී ඊට අදාළ ආයතනික ව්‍යුහය, බඳවා ගැනීමේ පටිපාටිය මෙන්ම යෝජිත වැටුප් තලයන් හා අදාළ වෘත්තීය දීමනාවන් සඳහා යෝජනාවලිය ඒඩී/2/1/2 හා 2003.06.11 දිනැති සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ඊට පිළිතුරු වශයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව DMS/H/46/XXIII හා 19.08.2003 දිනැති ලිපිය මගින් ඒ සඳහා අනුමැතිය ලබා දී ඇති අතර ඒ අනුව අදාළ බලපත්‍ර/ සහතික ලබා ඇති සේවක මහත්ම මහත්මීන් සඳහා අධිකාරිය පිහිට වූ දින සිටම මෙම වෘත්තීයමය දීමනාවන් ගෙවා ඇත.

තවද එකී අනුමැතියට අමතරව කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහයෙහි ද (SLCAP 5000) මෙම වෘත්තීය දීමනාවන් සඳහා ගෙවීම් කිරීම පිළිබඳව සටහන් කර ඇත.

(ඌ) කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහයෙහි සඳහන් පරිදි වෛද්‍ය රක්ෂණ ක්‍රමයට ආයතනයේ සියලුම සේවකයින් අයත් වන බැවින් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නිලධාරීන්ට ද මෙම පහසුකම ලබා දී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් පරිදි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට ද මෙම පහසුකම ලබා දී තිබුණ ද මෑතක දී ගත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් පරිදි එම පහසුකම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට ලබා දීම නවතා ඇත.

(එ) ගරු සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ 2011 අගෝස්තු 16 දිනැති ලිපියේ සඳහන් වන පරිදි සිවිල් ගුවන් සේවාව හා අදාළ ගරු ඇමතිතුමන්ගේ කාර්යයන් පහසුවෙන් හා වඩාත් විධිමත්ව සම්බන්ධීකරණය සඳහා එතුමාගේ සේවය පිණිස සංවර්ධන සැලසුම් සම්බන්ධීකරණ නිලධාරියෙකු අවශ්‍ය බවත් ඒ සඳහා බී.එම්. දයාවංශ මහතා පත් කරන බවත් අංක 34 දරණ ශ්‍රී ලංකා සි.ගු.සේ. අධිකාරි පනතේ 31.1 වන වගන්තිය යටතේ කෙරෙන්නා වූ විධානයක් ලෙස මෙම නියමය ක්‍රියාවේ යෙදවීමට කටයුතු කරන ලෙසත් දන්වා ඇත. ඒ අනුව සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත මෙම පත්වීම ලබා දී ඇත. අධිකාරිය පිහිට වූ අවධියේ සිටම විෂය භාර අමාත්‍යවරයා විසින් කලින් කලට මෙවැනි නියෝග අධිකාරියට ලබා දී ඇති අතර එම නියෝග අධිකාරිය විසින් ක්‍රියාවට නඟා ඇති බවට පූර්වාදර්ශ ඇත.

තවද මේ සම්බන්ධයෙන් ඔබ විසින් එවනු ලැබූ විගණන විමසුම කෙරෙහි අවධානය යොමු කර සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්වරයා අදාළ කරුණ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වන ලදී. එහිදී ගරු අමාත්‍යතුමාගේ නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් දයාවංශ මහතා වෙත ලබා දිය යුතුව තිබුණේ "විධිමත් පත්වීමක්" නොව "වැඩ පැවරීමක්" බව දන්වා සිටි හෙයින් දයාවංශ මහතා වෙත නිකුත් කර තිබූ පත්වීම් ලිපිය විධිමත් වැඩ පැවරීමක් මඟින් ප්‍රතිෂ්ඨාපනය කිරීමට පියවර ගන්නා ලදී. 2012 ඔක්තොම්බර් 31 දිනෙන් වැඩ පැවරුමේ කාලය අවසන් වූ බැවින් දැනට මෙම මහතාට ගෙවීමක් සිදු කරනු නොලබයි.

(ඒ) ශත සංවත්සර උත්සවය සම්බන්ධ කර පැවැත් වූ උත්සව මාලාවේ ප්‍රධාන අරමුණු වූයේ සිවිල් ගුවන් සේවා කේෂත්‍රය පිළිබඳ අවබෝධයක් සමස්ථ ජනතාව වෙත ලබා දීමය. ඒ සඳහා මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය ප්‍රබල ලෙස යොදා ගැනීමට තීරණය වූයේ "නිල් ගුවන ජයගනිමු" යන තේමාව යටතේ රජයේ මහින්ද චින්තන ඉදිරි දැක්ම වැඩපිළිවෙලෙහි ප්‍රධාන අංගයක් ලෙස සිවිල් ගුවන් සේවාව ජාතික ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රමුඛ අංශයක් බවට පත්කර ශ්‍රී ලංකාව ගුවන් කේන්ද්‍රයක් බවට පත් කිරීමට අතිගරු ජනාධිපතිතුමා ගෙන ඇති පියවර පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ අවශ්‍යතාවක් ඇති බවට ගරු අමාත්‍යතුමා අවධාරණය කළ බැවිනි. එවැනි කටයුත්තක් අවශ්‍ය ප්‍රමිතියට ඉටු කිරීම සඳහා මාධ්‍ය පිළිබඳ මනා අවබෝධයක් ඇති මාධ්‍යවේදියෙකුගේ සේවය ලබාගත යුතු බව විෂයභාර ගරු ඇමතිතුමා මුලසුන දැරූ ශත සංවත්සර සංවිධාන කමිටුව තීරණය කළ බැවින් ඒ සඳහා මාධ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රවීනත්වය ලබා ඇති අයකුගේ සේවය කොන්ත්‍රාත් පදනම මත ලබා ගැනීමට තීරණය විණි.

එසේ බඳවා ගනු ලැබූ පළපුරුදු කෘතහස්ත මාධ්‍ය උපදේශකවරයා විසින් ඉටු කරන ලද මාධ්‍ය වැඩසටහන් විමසා බැලූ විට එම කාර්ය ඉතා මැනවින් ඉටු වී ඇති බවත් මෙමඟින් මුදල් අපතේ යාමක් සිදුව නොමැති බවත් පෙනී යනු ඇත.

(ඔ) සිවිල් ගුවන් සේවා අධිකාරියේ නවක ඉංජිනේරුවරු අතර ඔවුන් කඩිනමින් පුහුණු කිරීම සඳහා

"මෙහෙයුම් නිරුපද්‍රිතතා සහ අඛණ්ඩ ගුවන් යෝග්‍යතාවය වර්ධනය කිරීමේ දකුණු ආසියා සහයෝගිතා වැඩසටහන" (COSCAP-) යටතේ සහය ඉල්ලා සිටි අතර ඔවුන් නිර්දේශ කළ ප්‍රවීණ ගුවන් යෝග්‍යතා ඉංජිනේරුවරයා සමග ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරි පනතේ 7(ද) යටතේ උපදේශන ගිවිසුමකට එළඹෙන ලදී. මෙවන් සේවා පළපුරුද්දක් ඇති ප්‍රවීණ ගුවන් යෝග්‍යතා ඉංජිනේරුවන් ඉතා විරල අතරම ඔවුන්ට ඉතා ඉහළ ඉල්ලුමක් ඇති බැවින් ඔවුන්ගේ සේවය ලබා ගැනීමට ඉතා විශාල මුදලක් දැරීමට සිදුවේ.

මෙම පුහුණුව කැනඩාවේදී ලබා දුන්නේ නම් ඒ සඳහා රු.මි. 10 කට ආසන්න මුදලක් වැය වෙයි. ශාන්ති මෙන්ඩිස් මහතා තම විශේෂ දැනුම වෙනුවෙන් ගාස්තු අය නොකර දිනකට ඩොලර් 50ක් වැනි ඉතා අවම මුදලක් යැපීම් දීමනාවක් පමණක් වශයෙන් ලබාගෙන තම සේවය ලබා දීමට එකඟ වූයේ ශ්‍රී ලාංකිකයෙකු වශයෙන් මෙරට ගුවන් සේවාවට කරනු ලබන සේවයක් වශයෙනි. අදාල කාලය සඳහා ඔහු සේවයේ යෙදවීම වෙනුවෙන් ආගමන සහ විගමන පාලක තුමාගේ ආවරණ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත.

(ඕ) සිවිල් ගුවන් සේවා අධිකාරියේ සේවා වනිතා ඒකකය විසින් මෙම ආයතනයේ කාන්තා නිලධාරීන්ගේ සුභ සාධනය වෙනුවෙන් ඔවුන්ට රියදුරු බලපත්‍ර ලබා ගැනීමට පහසුකම් සලසා දෙන ලෙස කරනු ලැබූ ඉල්ලීම අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලදුව 2011 ජූලි 21 දින පැවති 79 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒ සඳහා අනුමැතිය ලබා දී ඇත.

කෙසේ වුවද ඔබගේ නිරීක්ෂණ සැලකිල්ලට ගෙන මෙම මුදල අදාළ නිලධාරිනියන්ගෙන් අය කර ගැනීමට කටයුතු කර ඇත.

### 4.4 වෙනත් රාජ්‍ය ආයතනවලට ලබා දුන් අධිකාරියේ සම්පත්.

ගරු අමාත්‍යතුමාගේ විධානය පරිදි මෙසේ කටයුතු කිරීමට සිදුවිය.

## 5. <u>ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය</u>

5.1 2012 වර්ෂය තුළ ඩොලරයේ අගය රු.117/- සිට රු.132/- පමණ දක්වා වැඩි වීම නිසා පෙර නිකුතු ගමන් නිවේදන ආදායම අපේක්ෂිත මට්ටමට වඩා වැඩි වීමත්, මත්තල උප කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු 2013 වර්ෂය තෙක් කල් යාම නිසා ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදම් නොදැරීමත් එම හේතුවෙන් ආයෝජන අපේක්ෂිත ලෙස අඩු නොවීමෙන් ආයෝජන පොලිය ඇස්තමේන්තු කළ ආදායමට වඩා වැඩි වීමත් මෙම විචලනයට මූලික හේතු විය.

## 6. <u>පද්ධති හා පාලන</u>

විගණනයේ පෙන්වා දුන් වැදගත් හා වටිනා කරුණු කෙරෙහි අපගේ දැඩි අවධානය යොමු කොට ඇති අතර ඉදිරියේදී හැකිතාක් දුරට පරිපාලනමය සහ මෙහෙයුම් අඩුපාඩු අවමකර ගැනීමටත් එතුළින් ආයතනයේ කාර්ය සාධනය වැඩිකිරීමටත් පිළියම් යොදන බව දන්වා සිටිමු. තවද මෙම විගණන කටයුතු ඉතා කැපවීමෙන්, දැඩි ආයාසයකින්, අපක්ෂපාතීව සහ මනා විනිවිද භාවයකින් ඉටුකරමින් මෙම ආයතනයේ උන්නතිය වෙනුවෙන් කටයුතු කළ විගණන අධිකාරී ප්‍රමුඛ ඔබගේ කාර්ය මණ්ඩලයට ස්තුති කිරීමට ද අපි මෙය අවස්ථාවක් කරගනිමු.

ජෙනරාල් රෝහාන් ද සිල්වා දළුවත්ත
සභාපති
සිවිල් ගුවන් සේවා අධිකාරිය

එච්.එම්.සී. නිමල්සිරි
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්
සහ ප්‍රධාන විධායක නිලධාරී